ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,466 - 2025 දෙසැම්බර් මස 05 වැනි සිකුරාදා - 2025.12.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

	පිටුව
තනතුරු ඇබෑර්තු	—
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—
බඩුබාහිරාදිය විකිණීම්	—
පළාත් පාලන නිවේදන	1540
අතුරු ව්‍යවස්ථා	—
පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්	—
ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	—
අයවැය ලේඛන	—
දේපළ විකිණීම්	—
විවිධ දැන්වීම්	1541

සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 දෙසැම්බර් 26 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 දෙසැම්බර් 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

එස්. ඩී. පාඩිකෝරාළ,
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ.බ.)

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1159- B 082732 — 5,403 (2025/10)
F 1 -

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

පළාත් පාලන නිවේදන

පන්විල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා එළ ගවමස් වෙළඳසැල් පවත්වාගෙන යාම වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ ඒ ස්ථානයන්හි එළ ගවමස් වෙළඳාම් කරගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ඉදිරිපත් ව සිටින බව ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරය 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍ර යේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වමි.

මෙම නිවේදනයේ සඳහන් පරිදි දින 14 ක් ඇතුළත කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවුනහොත් මෙහි උපලේඛනයේ සඳහන් ඉල්ලුම්කරුවන් වෙත එම ව්‍යාපාර ස්ථාන වල වෙළඳාම කරගෙන යාම සඳහා 2026.01.01 සිට 2026.12.31 වැනි දින දක්වා බලපත්‍රය ලබා දීම කරන බවද පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

පී. කේ. ඩී. අනුර ශාන්ත,
සභාපති,
පන්විල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 18 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම	*වෙළඳාම් කරන ස්ථානය*	*වෙළඳාමේ ස්වභාවය*
ඩබ්. සදුර්දීන් මයා	හුළුගහ පොදු වෙළඳසැල, හුළුගහ	එළ ගව මස් වෙළඳසැල
ඩබ්. සදුර්දීන් මයා	අංක 158, කබරගල පාර, මඩුල්කැලේ	එළ ගව මස් වෙළඳසැල

12-205/1

පන්විල ප්‍රාදේශීය සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරිය)

මෙහි පහත සඳහන් අය විසින් උපලේඛනයේ සඳහන් කර ඇති ස්ථානයේ 2026 වර්ෂයට ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලමින් මා වෙත ඉදිරිපත් කර ඇති බවත්, බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හෝ ජීවත්වන අයෙක් හෝ අයවලුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් පදනම් කරගෙන ද යන්න පිළිබඳව විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (අා) කොටසේ පළ වූ දා සිට දින 14 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බව මස් පිණිස සතුන් මරනන්නන් පිළිබඳව ආඥාපනතේ 272 වැනි අධිකාරිය 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම නිවේදනයේ සඳහන් පරිදි දින 14 ක් ඇතුළත කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවුනහොත් මෙහි උපලේඛනයේ සඳහන් ඉල්ලුම්කරු වෙත ගෝ ඝාතනය කරනු ලබන ස්ථානයක් කරගෙන යාම සඳහා 2026.01.01 සිට 2026.12.31 වැනි දින දක්වා බලපත්‍රය ලබා දීම කරන බවද පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

පී. කේ. ඩී. අනුර ශාන්ත,
සභාපති,
පන්විල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 18 වැනි දින,
පන්විල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

උපලේඛනය

අනු. අංකය	*ඉල්ලුම්කරුගේ නම*	*ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයේ ලිපිනය*
01	ඩබ්. සදුර්දීන් මයා	ශාන්ත ජොන් හිල් වත්ත, හුළුගඟ

12-205/2

රත්නපුර මහා නගර සභාව

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

රත්නපුර මහා නගර සභාව විසින් 2025 වර්ෂයේ නොවැම්බර් මස 04 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී අංක GM-06-06 දරන සම්මුතිය යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. 2026 වර්ෂය සඳහා පනවන ලද එකී වරිපනම් බදු මුදල් සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් මහා නගර සභාවට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා සම්පූර්ණ වරිපනම් බදු මුදල 2026 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර මහා නගර සභාව වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු මුදලෙන් සියයට දහය (10%) ක වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බදු ඒ ඒ කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් මහා නගර සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

වී. අරුණ එන්. ප්‍රේමරත්න,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
රත්නපුර.

යෝජනාව

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 238 වගන්තියේ (1) උපවගන්තියෙන් මහා නගර සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රත්නපුර මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාස වල, ගොඩනැගිලි වල, ඉඩම් වල හා ගෙපත්වල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් පනවා 2025 වර්ෂයේ එවන ලද තක්සේරු වටිනාකම 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී මහා නගර සභා ආඥාපනතේ 230 උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන්,

(අ) නේවාසික ස්ථාන මත සියයට දහයක (10%) වරිපනමක් ද,

(ආ) වෙළඳ හෝ වාණිජ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට දොළහ (12%)ක වරිපනමක් ද

2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ ඒ වරිපනම් එකී මහා නගර සභා ආඥාපනතේ 230 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමත් රත්නපුර මහා නගර සභාව යෝජනා කරන්නීය.

කේ. ඒ. ඩී. ආර්. ඉන්ද්‍රජීත් කටුගම්පල,
නගරාධිපති,
මහා නගර සභාව,
රත්නපුර.

12-11

වාරියපොල ප්‍රාදේශීය සභාව

පේරගොල්ල සුසාන භූමිය - විරෝධතා දැක්වීම

1946 අංක 57 දරන පොදු සුසාන භූමි පිළිබඳ ආඥාපනත

වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, අංක 1206 දරන දෙමටඑව ග්‍රාම සේවා වසමේ ඇඹලව ගමේ පේරගොල්ල එස්ටේට් ඉඩමේ පහත සඳහන් මායිම් තුළ පිහිටි අක්කර 01 පර්චස් 36.8 ක ප්‍රමාණයෙන් යුතු වාරියපොල ප්‍රාදේශීය සභාව සතු භූමිය, සුසාන භූමියක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට වාරියපොල ප්‍රාදේශීය සභාවේ 2025 නොවැම්බර් 11 දින මහ සභාවේ තීරණ අංක 08/2025/11/05(109) මගින් ඒකමතිකව අනුමත කර ඇත.

එකී භූමිය සුසාන භූමියක් බවට පත් කිරීම පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් මෙම ගැසට් නිවේදනයේ දින සිට දින 30 ක් ඇතුළත ලිඛිතව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

යෝජිත සුසාන භූමියට මායිම් :

උතුරට	-	අංක 13 දරන අඩි 20 ක් පළල පාර ද,
නැගෙනහිරට	-	51 සහ 52 දරන කැබලි ද,
දකුණට	-	ඩබ්. එම්. ටිකිරි බණ්ඩාගේ ඉඩම ද,
බස්නාහිරට	-	ඩී. බී. ඇඹලවට අයිති රත්කරාපිටිය ද ලොට් 49 සහ අංක 13 දරන අඩි 20 ක් පළල පාර ද වේ.

ජී. ජේ. එස්. කුමාරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

12-10

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

වර්ෂ 2026 වැඩසටහන් අයවැය ලේඛනය

මහ නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරියේ) 212 ඡේදය ප්‍රකාර, දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ 2026 වර්ෂය සඳහා වූ වැඩසටහන් අයවැය ලේඛනය 2025 වර්ෂයේ දෙසැම්බර් මස 12 දින සිට දෙසැම්බර් 18 වැනි දින පෙ. ව. 8.30 - ප.ව. 4.15 දක්වා කාලය තුළදී නාගරික කොමසාරිස් නිල කාර්යාලය තුළ මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කිල්ලපනගේ දොන් පැරකුම් ශාන්ත,
නගරාධිපති,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

2025 දෙසැම්බර් 05 මස දින,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

12-51

ගාල්ල මහා නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලා බලපත්‍ර දීමේ පනත යටතේ විරෝධතා කැඳවීම

පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන ලිපිනයේ දක්වා ඇති ස්ථානයෙහි සමාජ ශාලාවක් පවත්වාගෙන යාම සඳහා 2026 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව, 1975 අංක 17 දරන සමාජ ශාලා බලපත්‍ර දීමේ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාවේ අසල හෝ පදිංචි යම් තැනැත්තෙකු එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සති 04 ක් ඇතුළත තම විරුද්ධත්වයට හේතු පිටපත් දෙකකින් යුක්තව, ලියවිල්ලකින් මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

සුනිල් ගමගේ,
නගරාධිපති,
ගාල්ල මහා නගර සභාව.

2025 නොවැම්බර් මස 18 දින,
ගාල්ල මහා නගර සභාව.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම	*සමාජ ශාලාවේ ලේකම්/සභාපති/ කළමනාකරු ද යන වග*	*සමාජ ශාලාවේ නම*	*සමාජ ශාලාවේ පවත්නා ලිපිනය*
තිෂාන් වන්න යහතුගොඩ	ලේකම්	ගාලු සේවා සමාජය	නො. 02, රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල

12-01

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

වරිපනම් ප්‍රතිශතය පිළිගැනීම හා වරිපනම් බදු පැනවීම - 2026

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ වන අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශ සඳහා 2026 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට,2025 සැප්තැම්බර් මස 16 වැන දින සභා තීරණ අංක 18 (ඊ) 01 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 16 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
නිවිටඹුව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 453/6 හා 1987.05.12 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ නිවාස වල ,ගොඩනැගිලි වල, ඉඩම්වල,ගෙපත් වල වාර්ෂික වටිනාකම සඳහා වේයන්ගොඩ උප කාර්යාල බල ප්‍රදේශයට 2016 වර්ෂයේ තක්සේරුව ද, බෙම්මුල්ල උප කාර්යාලය සඳහා 2019 තක්සේරුවද, ඔයබඩපේරුව උප කාර්යාලය සඳහා 2022 වර්ෂයේ තක්සේරුවද අනෙකුත් උප කාර්යාල වන එගොඩපොත උප කාර්යාලය හා මෙගොඩපොත උප කාර්යාලය සඳහා 2009 තක්සේරුවේ සත්‍යාක්ෂණය 2026 වර්ෂයේ තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ134 (1) උප වගන්තියෙහි බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී තක්සේරුවට අදාල වාර්ෂික වටිනාකමින් සියයට හතක් (%7) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය බවටත්,

තවද, 2026 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2026 වර්ෂයෙහි ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නනේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10 %) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5 %) වට්ටමක් ද,අත්තනගල්ල ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

කාර්තුව	ගෙවිය යුතු දිනය	10% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය	5% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය
පළමු වන කාර්තුව	2026 මාර්තු මස 31 ට පෙර	2026 ජනවාරි මස 31	-
දෙවන කාර්තුව	2026 ජුනි මස 30 ට පෙර	-	2026 අප්‍රේල් මස 30
තුන් වන කාර්තුව	2026 සැප්තැම්බර් මස 30 ට පෙර	-	2026 ජූලි මස 31
හතර වන කාර්තුව	2026 දෙසැම්බර් මස 31ට පෙර	-	2026 ඔක්තොම්බර් මස 31

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

අක්කර බදු පැනවීම - 2026

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ වන අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සළකනු ලබන බව අංක 450/6 හා 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර

ඇති නියමයන්ට ඇතුළත් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු ස්ථීර හෝ නිතිපතා ගොවිතැන් යටතේ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ හෙක්ටයාර් එකක් සඳහා 2026 වර්ෂයට රුපියල් පනහක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු බවට, 2025 සැප්තැම්බර් මස 16 දින සභා තීරණ අංක 18 (ඊ) 02 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

ඩී. ඒ. දර්ශන දුමින්ද විජේසිංහ
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 16 දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
නිවිටඹුව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සළකනු ලබන බව අංක 450/6 හා 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති නියමයන්ට ඇතුළත් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු ස්ථීර හෝ නිතිපතා ගොවිතැන් යටතේ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ හෙක්ටයාර් එකක් සඳහා 2026 වර්ෂයට රුපියල් පනහක් බැගින් වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු බවටත්,

තවද, 2026 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර , එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්,එලෙස වාර්ෂික අක්කර බද්ද 2026 වර්ෂයෙහි ජනවාරි 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක10% වට්ටමක්ද ,එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල අත්තනගල්ල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවකට මුදලින් 5% ක වට්ටමක් ද,අත්තනගල්ල ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

කාර්තුව	ගෙවිය යුතු දිනය	10% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය	5% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය
පළමු වන කාර්තුව	2026 මාර්තු මස 31 ට පෙර	2026 ජනවාරි 31	-
දෙවන කාර්තුව	2026 ජුනි මස 30 ට පෙර	-	2026 අප්‍රේල් මස 30
තුන් වන කාර්තුව	2026 සැප්තැම්බර් මස 30 ට පෙර	-	2026 ජුලි මස 31
හතර වන කාර්තුව	2026 දෙසැම්බර් මස 31 ට පෙර	-	2026 ඔක්තොම්බර් මස 31

12-65/2

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 155,159 (1) හා 161 වගන්ති අනුව වරෙන්තු ගාස්තු පැනවීම - 2026

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ වන අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) හා 161 වගන්ති වල විධි විධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රකාශිත වරිපනම් බදු හා කුලී ගාස්තු අය කිරීමේ දී නිශ්චිත කාල සීමාව තුළ ගෙවීම පැහැර හරින්නන් වෙත වරෙන්තු ගාස්තුව පහත සඳහන් ආකාරයට විය යුතු බවට , 2025 සැප්තැම්බර් මස 16 දින සභා තීරණ අංක 18 (ඊ) 03 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 16 දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.
නිවිටඹුව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) හා 161 වගන්තිවල විධි විධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රකාශිත වරිපනම් බදු හා කුලී ගාස්තු අය කිරීමේ දී නිශ්චිත කාල සිමාව තුළ ගෙවීම පැහැර හරින්නන් වෙත වරෙන්තු ගාස්තුව පහත සඳහන් ආකාරයට විය යුතු බවට යෝජනා කරමි.

1. අය විය යුතු බද්දේ හෝ කුළියේ ප්‍රමාණයෙන් 10 % ක් ද
2. නිස්බිම හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අය විය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 15 % ක් ද
3. නිස්බිම හා නිවාස ස්ථාන නොවන දේපළ සම්බන්ධයෙන් අය විය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 20 % ක් ද

12-65/3

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකල ඉඩම් මත බදු අය කිරීම - 2026

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ වන අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% ක් (සියයට 2ක්) වන බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත් එය පහත සඳහන් ආකාරයට විය යුතු බවටත්, 2025 සැප්තැම්බර් මස 16 දින සභා තීරණ අංක 18 (ඊ) 04 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 16 දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
නිවිටඹුව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) (ආ) අනු වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදි කිරීමේ කාර්යය සඳහා සැබවින්ම ගොඩනැගිලි වලින් ආවරණය වූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1 : 5ට වඩා අඩු වන්නේ නම් හෝ එකී පනතේ 153 (1) (ඇ) අනු වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව එම ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැත්තා වූ එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම මත 2026 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 2 ක (2%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද , 2025 මාර්තු 31 දිනට පෙර අත්තනගල්ල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට යෝජනා කරමි.

12-65/4

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

රථ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම - 2026

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ වන අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය හා 148 වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව පහත උප ලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික

බද්දක් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාලව නියම කර අය කළ යුතු බවට,2025 සැප්තැම්බර් මස 16 දින සභා තීරණ අංක 18 (ඊ) 05 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

ඩී. ඒ. දර්ශන දුමින්ද විජේසිංහ
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 16 දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
නිට්ටඹුව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය හා 148 වගන්තියෙහි විධි විධාන ප්‍රකාරව පහත උප ලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව නියම කර අය කළ යුතු බවට යෝජනා කරමි.

උප ලේඛනය

	I තීරුව	**II තීරුව (රු. ශත)**
1	මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් හෝ කරත්තයක්, ජීප් රික්ෂෝවක් , බයිසිකලයක් හෝ මුයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුව	25.00
	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ කරත්තයක් සඳහා	
	(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18.00
	(ආ) වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4.00
	1. සෑම කරත්තයක් සඳහා	20.00
	2. සෑම අත් කරත්තයක් සඳහා	10.00
	3. සෑම රික්ෂෝවක් සඳහා	7.00
	4. සෑම අශ්වයෙක් ,පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15.00
	5. සෑම ඇතෙකු සඳහා	50.00

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

උපලේඛනයේ " වෙළඳ කාර්ය" යන්නට , විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-65/5

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

සේවා ගාස්තු , ආකෘති පත්‍ර ගාස්තු සහ අයදුම්පත්‍ර ගාස්තු පැනවීම - 2026

ඩී. ඒ. දර්ශන දුමින්ද විජේසිංහ වන අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108 වගන්තිය හා 126 වගන්තිය යටතේ පැවරී ඇති බලතල යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට

අදාලව සේවා ගාස්තු , ආකෘති පත්‍ර ගාස්තු සහ අයදුම්පත්‍ර ගාස්තු නියම කර අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2025 සැප්තැම්බර් මස 16 දින සහා තීරණ අංක 18 (ඊ) 06 යටතේ සභා සම්මත වූ බව නිවේදනය කරමි.

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 16 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
නිට්ටඹුව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108 වගන්තිය හා 126 වගන්තිය යටතේ පැවරී ඇති බලතල යටතේඅත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව සේවා ගාස්තු , ආකෘති පත්‍ර ගාස්තු සහ අයදුම්පත්‍ර ගාස්තු නියම කර අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවටත්,

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 හා 2015 දෙසැම්බර් 28 දිනැති අති *විශෙෂ ගැසට් පත්‍රය* යටතේ පල කරන්නට යෙදී ඇති හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජන රජයේ 2016.10.14 දිනැති අංක 1989 දරන *ගැසට් පත්‍රයේ* iv (ආ) වැනි කොටස - පළාත් පාලන යටතේ සඳහන් නිවේදනය ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභාව සඳහා වැළඳ ගන්නට යෙදී ඇති සේවා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ සඳහන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2026 වර්ෂය සඳහා අය කළ යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

		(රු. ශත)
01	සුසාන භූමි වල ස්මාරක ඉදි කිරීම - වර්ග අඩියට (අවුරුදු 05 ක උපරිමයකට යටත්ව) (රජය විසින් කලින් කලට පනවන වෙනත් බදු අදාල වේ.)	500.00
02	සුසාන භූමි වල මෘත දේහයන් තැන්පත් කිරීම සඳහා - වර්ග අඩියට (රජය විසින් කලින් කලට පනවන වෙනත් බදු අදාල වේ.)	500.00
03	ආදාහනාගාර වෙන් කිරීම :	
	බල ප්‍රදේශය තුල සිදුවන එක් ආදාහනයක් සඳහා (වෙන් කිරීම 9,700.00 + සේවා ගාස්තු 300.00)	10,000.00
	බල ප්‍රදේශයෙන් පිටත සිදු වන එක් අදාහනයක් සඳහා (වෙන් කිරීම 11700.00 + සේවා ගාස්තු 300.00)	12,000.00
04	ගලි බවුසරය වෙන් කිරීම (3000L)	
	බල ප්‍රදේශය තුල	
	- නිවස	6,000.00
	- ව්‍යාපාරික ස්ථාන	9,000.00
	-ආගමික	5,700.00
	-රාජ්‍ය	6,500.00
	(කලින් කලට රජය විසින් පනවන බදු මුදල් අදාල වේ)	

		(රු. ශත)
	බල ප්‍රදේශයෙන් පිටත	
	-නිවස	7,000.00
	- ව්‍යාපාරික ස්ථාන	10,000.00
	-ආගමික	6,000.00
	-රාජ්‍ය	7,500.00
	(කලින් කලට රජය විසින් පනවන බදු මුදල් එකතු විය යුතු අතර ප්‍රවාහන ගාස්තු ලෙස කි.මී. 01 ක් සඳහා රු. 90 ක් අදාල වේ.)	
05	ශාලා ගාස්තු - ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් ශාලාව (දිනකට)	
	බල ප්‍රදේශය තුළ	10,000.00
	බල ප්‍රදේශයෙන් පිටත	12,500.00
	ඔයබඩපේරුව උප කාර්යාලයේ රැස්වීම ශාලාව (දිනකට)	
	ආසන සමඟ ශාලාව	5,000.00
	වේයන්ගොඩ රංග ශාලාව	
	දිනක් (පැය 12 ක් සඳහා)	100,000.00
	දින½ ක් (පැය 6ක් සඳහා)	60,000.00
	නැවත ගෙවනු ලබන තැන්පත් මුදල්	25,000.00
06	1.මාර්ග පළුදු කිරීම හේතුවෙන් අය කිරීම (වර්ග මීටර් 1ක් සඳහා)	
	1.බොරළු	940.00
	2.තාර	2,860.00
	3.කොන්ක්‍රීට්	7,815.00
	4.කාපට්	9,250.00
	5.අන්තර් සම්බන්ධිත කුට්ටි ගල්	9,250.00
	11. මාර්ග භාවිතයට විශේෂ අවස්ථා වල අවසර ලබා ගැනීම සඳහා ගාස්තු අය කිරීම කිලෝ මීටරයකට (පස් / ගල් / වැලි / දැව ප්‍රවාහනය) (මාස 06 ක් සඳහා අදාල වේ.)	
	1.බොරළු	25,000.00
	2.තාර	50,000.00

	3.කොන්ක්‍රීට්	75,000.00
	4.කාපට්	100,000.00
	5.අන්තර් සම්බන්ධිත කුට්ටි ගල්	75,000.00
07	ප්‍රාදේශීය සභා භූමියේ රථ ගාල් සඳහා වාහන නැවතුම් ගාස්තු අය කිරීම (පැය භාගයකට)	
	1.මෝටර් සයිකලයක් සඳහා	30.00
	2.ත්‍රීවිල් රථයක් සඳහා	50.00
	3.කාර්/වෑන් සඳහා	50.00
	4.ලොරි / බස් සඳහා	100.00
	(වැඩිවන සෑම පැයකටම රු.20.00 බැගින් අය කළ යුතුය.)	
08.	කොම්පෝසට් පොහොර	
	ප්‍රමාණය (kg)	
	01-100	20.00
	101-500	18.00
	501-1000	16.00
	ටොන් 01 - ටොන් 05	12.00
	ටොන් 05 - ටොන් 25	10.00
	ටොන් 25 සිට	8.00
	කැට පොහොර කිලෝ 1	50.00
09.	I.ජල බවුසරය (6000l) ධාරිතාව සඳහා ප්‍රවාහන ගාස්තුව	
	නිවසක් සඳහා	6,000.00
	ව්‍යාපාරික ස්ථානයක් සඳහා	8,000.00
	ජල ගාස්තුව	1,500.00
	(මෙම ජල බවුසරය ලබා දෙනු ලබන්නේ පානීය ජලය ලබා ගැනීමේ අවශ්‍යතාවය වෙනුවෙන් පමණයි.)	
	II.ජල බවුසරය (3000l) ධාරිතාව සඳහා ප්‍රවාහන ගාස්තුව නිවසක් සඳහා	4,000.00
	ජල ගාස්තුව	800.00
	බවුසරය රදවාගෙන ජලය ලබා ගැනීමේ කටයුතු වෙනුවෙන් (3000 l) ධාරිතාව ජල බවුසරය පමණක් ලබා දෙයි. ඒ සඳහා රඳවා ගැනීමේ පළමු පැය නිදහස් වන අතර දෙවන පැයේ සිට සෑම පැයකටම රු.500/= බැගින් අය වේ. (කලින් කලට රජය විසින් පනවන ලද බදු මුදල් මෙම ගාස්තු සඳහා අදාල වේ.)	

10	පෙර පාසල් ගාස්තු එක් දරුවෙකු සඳහා මසකට	300.00
11	ඡායා පිටපත් ගාස්තු - A4 තනි පැත්ත	10.00
	A4 දෙපැත්ත	15.00
12	නිවිටඹුව හා වේයන්ගොඩ නාගරික ප්‍රදේශය තුළ පිහිටි සභාවට අයත් විවෘත බිම් කුලියට දීමට වර්ග අඩියක් සඳහා වැට් බදු රහිතව එක් දිනක් සඳහා සභාව තීරණය කරනු ලබන වෙළඳ කාර්යයන් සඳහා පමණයි (උපරිම දින 14) (කලින් කලට රජය විසින් පනවන ලද බදු මුදල් මෙම ගාස්තු සඳහා අදාල වේ.)	10.00
	අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා	20.00
13	1.ගොඩනැගිලි / බිම් කට්ටි පෝරම ගාස්තු	1,000.00
	2.සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	
	2.1 භාණ්ඩ / ද්‍රව්‍ය හා සේවා සඳහා	2,000.00
	2.2 ඉදි කිරීම් හා කොන්ත්‍රාත් සඳහා	
	රු.500,000.00 දක්වා ව්‍යාපෘති	1,000.00
	රු.500,000.00 සිට රු.1,500,000.00 දක්වා ව්‍යාපෘති	2,500.00
	රු.1,500,000.00 සිට රු.2,000,000.00 දක්වා ව්‍යාපෘති	3,000.00
	රු.2,000,000.00 ට වැඩි ව්‍යාපෘති	5,000.00
	3. පෙර පාසල් වල ඇතුළත් වීමේ අයදුම් පත්‍ර ගාස්තු	200.00
	4. පුස්තකාල අයදුම්පත් ගාස්තු	50.00
	5. පුස්තකාල සාමාජික ගාස්තු (වසර 02 කට)	200.00
	6. ඔප්පු සාරාංශ අයදුම්පත්‍ර ගාස්තු	500.00
14	1.වීථි රේඛා / නොපවරවා ගැනීමේ සහතික ගාස්තු	1,000.00
	2.වරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් සහතික ගාස්තු (උදෘත) වැඩිවන වසරක් සඳහා 100.00	500.00
	3.නිකුත් කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික ගාස්තු	500.00
15	1. සභාව සතු නිවිටඹුව /රන්පොකුණගම / වේයන්ගොඩ මහජන ක්‍රීඩාපිටිය මුදල් අය කරන කාර්යයන් සඳහා යොදවා ගැනීමේදී කුලී අය කිරීම එක් දිනක් සඳහා (කලින් කලට රජය විසින් පනවන ලද බදු මුදල් මෙම ගාස්තු සඳහා අදාල වේ.)	10,000.00
	2.සභාව සතු නිවිටඹුව , රන්පොකුණගම / වේයන්ගොඩ මහජන ක්‍රීඩා පිටිය මුදල් අය නොකරන කාර්යයක් සඳහා යොදවා ගැනීමේදී කුලී අය කිරීම එක් දිනක් සඳහා (කලින් කලට රජය විසින් පනවන ලද බදු මුදල් මෙම ගාස්තු සඳහා අදාල වේ.)	5,000.00

		(රු. ශත)
16	නිට්ටඹුව හා වේයන්ගොඩ ක්‍රීඩා භූමිය සංගීත සංදර්ශන,සැණකෙලි සඳහා එක් දිනකට වෙන් කිරීමේදී කොන්දේසි මත ආපසු ගෙවන තැන්පත් ගාස්තුව	
	1. නිට්ටඹුව මහජන ක්‍රීඩා පිටිය	100,000.00
	2. වේයන්ගොඩ මහජන ක්‍රීඩා පිටිය	25,000.00
17	ඉහත ස්ථාන හැර ප්‍රාදේශීය සභාව සතු සියලුම ක්‍රීඩා පිටි සඳහා කුලී අය කිරීම එක් දිනක් සඳහා (කලින් කලට රජය විසින් පනවන ලද බදු මුදල් මෙම ගාස්තු සඳහා අදාල වේ.)	2,500.00
18	ලියාපදිංචි ත්‍රිරෝද රථ සංගමයක එක් ත්‍රිරෝද රථයක් සඳහා මසකට	100.00
	(කලින් කළ රජය විසින් පනවන බදු මුදල් අදාල වේ)	

12-65/5

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2026

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ වන අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය හා 149 වගන්තිය යටතේ සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාලව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට, 2025 සැප්තැම්බර් මස 16 දින සභා තීරණ අංක 18 (ඊ) 07 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 16 දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
නිට්ටඹුව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය හා 149 වගන්තිය යටතේ සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහිලා පහත උප ලේඛනයෙහි 1 තීරුවේ නිරූපිත යම් කාර්යයන් සඳහා අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2025 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයේ 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් ලෙස 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් ,

තවද,එකී ස්ථානයක හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්,ආපනශාලාවක්,නවාතැන්පලක් වන විටදී,ඊට අදාල බලපත්‍ර ලබා දීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2025 වර්ෂයේ ලැබීම් වලින් 1% ක් බලපත්‍ර ගාස්තුවක් ලෙස 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

147,149 වගන්ති යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම

අනු. අංකය	*1 තීරුව*	*11 වැනි තීරුව*		
	වෙළඳාම් හෝ ව්‍යාපාරයේ විස්තරය	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1500.00 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	බේකරියක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
02	ලැගුම්නිවාසයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
03	භෝජනාගාරයක් (හෝටලයක්) පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
04	මාළු විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
05	මස් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
06	අවමංගල සේවා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
07	කිරි පට්ටියක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
08	ආපන ශාලාවක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
09	කිරි විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
10	ආහාර වෙළඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
11	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
12	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
13	ලොන්ඩරියක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
14	ගවගාලක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
15	ගෝ ඝාතක ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
16	පොදු වෙළඳසැලක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
17	කොණ්ඩා සැකසීම,සැලුන් හලක් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
18	ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන	500.00	750.00	1000.00
19	පෞද්ගලික අධ්‍යාපන ආයතන	500.00	750.00	1000.00

පීඩාකාරී ව්‍යාපාර

අනු. අංකය	*1 තීරුව*	*11 තීරුව*		
	වෙළඳාම් හෝ ව්‍යාපාරයේ විස්තරය	*රු.750.00 නොඉක්මවන අවස්ථාවක*	*රු.750.00 ඉක්මවන එහෙත් රු.1500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු.1500.00 ඉක්මවන අවස්ථාවක*
		රු.ශත	*රු.ශත*	*රු.ශත*
01	පොහොර හෝ රසායනික පොහොර ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම.	500.00	750.00	1000.00
02	සම් පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම.	500.00	750.00	1000.00
03	සම් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.	500.00	750.00	1000.00
04	සත්ව පාලනය (මස්,කිරි,බිත්තර) සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
05	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.	500.00	750.00	1000.00
06	පශු වෛද්‍ය ඖෂධාලයක් පැවැත්වීම .	500.00	750.00	1000.00
07	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.	500.00	750.00	1000.00
08	කරවල ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.	500.00	750.00	1000.00
09	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩා කර තැබීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.	500.00	750.00	1000.00
10	දුම් කොල සකස් කිරීම හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.	500.00	750.00	1000.00
11	සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම.	500.00	750.00	1000.00
12	පුන්නක්කු නිපදවීම හෝ කිලෝ ග්‍රෑම් 200 වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.	500.00	750.00	1000.00
13	සබන් නිශ්පාදනය කිරීම	500.00	750.00	1000.00
14	සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500.00	750.00	1000.00
15	අළුත් හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම	500.00	750.00	1000.00
16	ලෝහමය සුන් බුන් ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1000.00
17	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500.00	750.00	1000.00
18	වේවැල් භාණ්ඩ නිපදවීම	500.00	750.00	1000.00
19	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500.00	750.00	1000.00
20	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500.00	750.00	1000.00
21	රසකැවිලි වර්ග නිපදවීම	500.00	750.00	1000.00
22	පොල්ලෙලි පෙහවීම (හෝ පල් කිරීම)	500.00	750.00	1000.00
23	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500.00	750.00	1000.00
24	දත් බුරුසු නිපදවීම	500.00	750.00	1000.00
25	රා එකතු කිරීම	500.00	750.00	1000.00
26	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500.00	750.00	1000.00
27	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීම් ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1000.00
28	පින්තාරු තින්ත හෝ වාර්නිෂ්,ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500.00	750.00	1000.00
29	සෝඩා නිපදවීම	500.00	750.00	1000.00
30	සම්භාණ්ඩ නිපදවීම	500.00	750.00	1000.00

අනු. අංකය	1 තීරුව	11 තීරුව		
	වෙළඳාම් හෝ ව්‍යාපාරයේ විස්තරය	රු.750.00 නොඉක්මවන අවස්ථාවක	රු.750.00 ඉක්මවන එහෙත් රු.1500.00 නොඉක්මවන අවස්ථාවක	රු.1500.00 ඉක්මවන අවස්ථාවක
		රු.ශත	රු.ශත	රු.ශත
31	පළතුරු,මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින් වල ඇසිරීම	500.00	750.00	1000.00
32	මිරිස්,කෝපි,ධාන්‍ය වර්ග,මාංශ භෝග,කුළු බඩු හෝ කිරිපිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500.00	750.00	1000.00
33	ඉටි පන්දම් නිපදවීම	500.00	750.00	1000.00
34	කපුරු නිපදවීම	500.00	750.00	1000.00
35	ලියන තින්ත,අව්වු තින්ත හෝ ස්ටෙන්සිල් තින්ත නිපදවීම	500.00	750.00	1000.00
36	රෙදි සෝදන නිල් නිපදවීම	500.00	750.00	1000.00
37	ලාකඩ නිපදවීම	500.00	750.00	1000.00
38	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1000.00
39	පාසල් රට හුණු නිපදවීම	500.00	750.00	1000.00
40	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500.00	750.00	1000.00
41	ටයර් නැවත පිරවීම	500.00	750.00	1000.00
42	ටයර්,ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1000.00
43	සිමෙන්ත් කිලෝ ග්‍රෑම් 1000 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500.00	750.00	1000.00
44	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500.00	750.00	1000.00
45	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500.00	750.00	1000.00
46	යාන්ත්‍රාණුසාරයෙන් රෙදි විවීම	500.00	750.00	1000.00
47	පොහොර,හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500.00	750.00	1000.00
48	යන්ත්‍රාණුසාරයෙන් සිමෙන්ති,බ්ලොක්ගල් නිපදවීම	500.00	750.00	1000.00
49	ධාන්‍ය හෝ මාංශ භෝග කිලෝ ග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500.00	750.00	1000.00

අන්තරාදායක ව්‍යාපාර

01	තොග වශයෙන් විකිණීම සඳහා පිටි,ලුණු හෝ සීනි කිලෝ ග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500.00	750.00	1000.00
02	මැසූ ඇදුම් නිශ්පාදනය කිරීම	500.00	750.00	1000.00
03	මුද්‍රණාලයක් පැවැත්වීම	500.00	750.00	1000.00
04	කුකුලන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	500.00	750.00	1000.00
05	එළුවන් , ඌරන් 10 ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500.00	750.00	1000.00
06	ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම	500.00	750.00	1000.00
07	දර ගබඩාවක් පැවැත්වීම	500.00	750.00	1000.00
08	කළු ගල් කැනීම හෝ කැඩීම යන්ත්‍රාණුසාරයෙන් හෝ අතින්	500.00	750.00	1000.00
09	සිසිල් බීම නිශ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500.00	750.00	1000.00

අනු. අංකය	1 කාණ්ඩය	11 කාණ්ඩය		
	වෙළඳාම් හෝ ව්‍යාපාරයේ විස්තරය	රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක	රු. 1500.00 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
10	අයිස් ක්‍රීම් නිශ්පාදනය	500.00	750.00	1000.00
11	පොල් තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500.00	750.00	1000.00
12	ගිණි පෙට්ටි නිශ්පාදන හෝ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500.00	750.00	1000.00
13	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500.00	750.00	1000.00
14	පාවිච්චි කල ඇදුම් ගබඩා කිරීම	500.00	750.00	1000.00
15	ස්වර්ණාභරණ නිශ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500.00	750.00	1000.00
16	යන්ත්‍රාණුසාරයෙන් ලී ඉරීම	500.00	750.00	1000.00
17	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	500.00	750.00	1000.00
18	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම	500.00	750.00	1000.00
19	පා පැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපොලක් පැවැත්වීම	500.00	750.00	1000.00
20	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩා කර තබා ගැනීම	500.00	750.00	1000.00
21	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1000.00
22	ගිණි කෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම	500.00	750.00	1000.00
23	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500.00	750.00	1000.00
24	ශීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම.	500.00	750.00	1000.00
25	දැව ගබඩාවක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00

පිඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :

01	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුටු කරදමුංගු එනසාල් හෝ කෙදි කිරීම	500.00	750.00	1000.00
02	ඩයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500.00	750.00	1000.00
03	රෙදි මුද්‍රණය කිරීම කිරීම හෝ සායම් දැමීම	500.00	750.00	1000.00
04	විද්‍යුත් ලෝහ ආලේපණය කිරීම ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1000.00
05	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම සකස් කිරීම හෝ අළු හුණු ගබඩා කිරීම	500.00	750.00	1000.00
06	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1000.00
07	මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500.00	750.00	1000.00
08	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.	500.00	750.00	1000.00
09	වාත්තු මඩුවක් පැවැත්වීම	500.00	750.00	1000.00
10	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00

අනු. අංකය	1 තීරුව	11 තීරුව		
	වෙළඳාම් හෝ ව්‍යාපාරයේ විස්තරය	රු.750.00 නොඉක්මවන අවස්ථාවක	රු.750.00 ඉක්මවන එහෙත් රු.1500.00 නොඉක්මවන අවස්ථාවක	රු.1500.00 ඉක්මවන අවස්ථාවක
		රු.ශත	රු.ශත	රු.ශත
11	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගනෙ යෑම	500.00	750.00	1000.00
12	ආයුර්වේද ඖෂධ දේශීය ඖෂධ නිශ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500.00	750.00	1000.00
13	විදුරු භාණ්ඩ හෝ විදුරු තහඩු ගබඩා කිරීම	500.00	750.00	1000.00
14	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රීත නිශ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500.00	750.00	1000.00
15	කිලෝ ග්‍රෑම් 150 ට වැඩියෙන් තේ කුඩු ගබඩා කර තබා ගැනීම	500.00	750.00	1000.00
16	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1000.00
17	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පැවැත්වීම	500.00	750.00	1000.00
18	පැට්‍රෝල් ,ඩීසල්,තෙල් හෝ වෙනත් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
19	කෘෂි රසායනයික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500.00	750.00	1000.00
20	වායුසමන යන්ත්‍ර ශීතකරණ හෝ අධි ශීතකරණ සර්විස් කිරීම හෝ අළුත් වැඩියා කිරීම	500.00	750.00	1000.00
21	විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
22	කිරී ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1000.00

12-65/7

අත්තනගල්ල ප්‍රාදේශිය සභාව

කර්මාන්ත බදු පැනවීම - 2026

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ වන අත්තනගල්ල ප්‍රාදේශිය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට,2025 සැප්තැම්බර් මස 16 දින සභා තීරණ අංක 18 (ඊ) 08 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශිය සභාව.

2025 සැප්තැම්බර් මස 16 දින,
අත්තනගල්ල ප්‍රාදේශිය සභාව
නිට්ටඹුව.

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 150 වගන්තියේ (1) උප වගන්තියෙන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උප ලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයෙහි 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

1 තීරුව		*11 තීරුව*		
අනු අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු.750.00 නොඉක්මවන අවස්ථාව	*රු.750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන*	*රු.1500. ඉක්මවන*
		රු. ශත	*රු.ශත*	*රු.ශත*
01	පුවක් වේලා සකස් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑම සඳහා	500.00	750.00	1000.00
02	ලේ හෝ අතුණුබහන් උණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
03	ලී වෙලිම සඳහා	500.00	750.00	1000.00
04	යන්ත්‍රාණුසාරයෙන් රබර් සීට් නිපදවීම හා දුම් ගැසීම	500.00	750.00	1000.00
05	අත්යන්ත්‍ර මාර්ගයෙන් රබර් සීට් නිපදවීම හා දුම් ගැසීම	500.00	750.00	1000.00
06	ප්ලාස්ටික් වැල් හෝ වේවැල් භාණ්ඩ නිශ්පාදන ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
07	දුම්කොල වේලා සකස් කිරීම සඳහා ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
08	සුරුට්ටු නිපදවීම සඳහා ස්ථානයක් පවත්වා ගෙන යෑම	500.00	750.00	1000.00
09	පැණි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
10	බීඩි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
11	කොප්පරා නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
12	දත් බෙහෙත් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
13	කපාපු පොල් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
14	හුණු නිපදවීම සඳහා පොරණුවක් පවත්වාගෙන යෑම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
15	ගම් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
16	යන්ත්‍රාණුසාරයෙන් හෝ විදුලි බලයෙන් ක්‍රියාකරන (බලවේග, නූල් කටින) හෝ රෙදි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
17	ඇඟළුම් කම්හලක් (ගාමන්ට්) පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
18	ප්ලාස්ටික් බඩු, ප්ලාස්ටික් නාම පුවරු,ප්ලාස්ටික් ද්‍රව්‍ය නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
19	යන්ත්‍රාණුසාරයෙන් සපත්තු හෝ පාවහන් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
20	රබර් අත්වැසුම් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00

1 තීරුව		*11 තීරුව*		
අනු අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු.750.00 නොඉක්මවන අවස්ථාව	*රු.750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන*	*රු.1500. ඉක්මවන*
		රු. ශත	*රු.ශත*	*රු.ශත*
21	කුඩාරම් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
22	කාඩ්බෝඩ් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
23	ප්‍රමාණයෙන් ටොන් 10 ක් ඉක්මවන සත්ව ආහාර නිශ්පාදන ගබඩාවක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
24	වතුර බෝතල් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
25	දැව පදම් කිරීම් ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
26	මෙතිලේටට් ස්ප්‍රිතු නිපදවීම හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
27	කපු පුළුන් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
28	එක් අයෙකුට වැඩි දෙනෙකු සේවය කරන ස්ථානයක ආභරණ නිපදවීම	500.00	750.00	1000.00
29	එක් අයෙකුට වැඩි දෙනෙකු සේවය කරන ස්ථානයක යකඩ කම්හලක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
30	විදුලි බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
31	අත් යන්ත්‍ර මගින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම සඳහා	500.00	750.00	1000.00
32	තේ කොල පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම සඳහා	500.00	750.00	1000.00
33	ඩුප්ලෝ යන්ත්‍ර භාවිතා කර මුද්‍රණ කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
34	මිශ්‍ර හෝ කෘතිම පොහොර නිපදවීම සඳහා සුදුසු ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
35	විදුරු නිශ්පානය සඳහා සුදුසු ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
36	යන්ත්‍රෝපකරණ හා යන්ත්‍රාණුසාරයෙන් අමතර කොටස් එකලස් කිරීම සඳහා සුදුසු ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
37	සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම සුදුසු ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
38	කළුගල් නිපදවීම සුදුසු ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
39	කරවල වේලීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
40	මිරිස්, පිටි, ධාන්‍ය, කුළු බඩු හෝ වෙනත් ඇට වර්ග ඇඹරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
41	අත්යන්ත්‍ර මගින් ක්‍රියාකරන ලී මෝල්ක් පවත්වාගෙන යෑම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
42	අම්ලකර වායුව (ඔක්සිජන්) භාවිතා කර යකඩ කම්හලක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
43	අ.බ.10 හෝ 20 අතර වූ වී මෝල්ක් සඳහා ඇඹරුම්හලක් පවත්වාගෙන යෑම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00

1 කීරුව		*11 කීරුව*		
අනු අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු.750.00 නොඉක්මවන අවස්ථාව	*රු.750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන*	*රු.1500. ඉක්මවන*
		රු. ශත	*රු.ශත*	*රු.ශත*
44	අ.බ 20ට අධික වූ වී මෝල්ක් සඳහා ඇඹරුම්හලක් පවත්වාගෙන යෑම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
45	යන්ත්‍රාණුසාරයෙන් ගඩොල් හෝ උළු පිළිස්සීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
46	යන්ත්‍රාණුසාරයෙන් හෝ අනු අයුරකින් ගඩොල් හෝ උළු පිළිස්සීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
47	බැටරි චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
48	හුණු ගල් පිළිස්සිම,රෑස් කිරීම,වේලීම හා කැබලි වලට කැඩීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
49	යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන ටයර් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
50	ටයර් හෝ ටියුබ් වොල්කනයිසින් කිරීමේ ආයතනයක පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
51	රෙදි මුද්‍රණය කිරීම හා පින්තාරු කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
52	විද්‍යුත් ලෝහාලේපණය කිරීම සඳහා යාන්ත්‍රික බලයෙන් ක්‍රියා නොකරන ගරාජයක් හැර වෙනත් ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
53	බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
54	බෙලෙක් වැඩ කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
55	වඩුවැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
56	ගෘහ භාණ්ඩ නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
57	තෙල් නිශ්කර්ෂණය කිරීම සඳහා යන්ත්‍රයක් හෝ සෙක්කුවක් තබා ගැනීම	500.00	750.00	1000.00
58	විදුලි උපකරණ හෝ රේඩියේටර් අළුත්වැඩියා කිරීමේ සාප්පුවක් හෝ රේඩියෝ කර්මාන්ත ශාලාවක් සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
59	රසකැවිලි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
60	තේ පෙට්ටි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
61	පොල් කටු අඟුරු නිශ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
62	සෙල්ලම් බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
63	නූල් කෝන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
64	තලාතු මිණිරන් වේලීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
65	ගෙන්දගම් දුම් ගැසීමෙන් කුරුඳු එනසාල් හෝ කොහු වේලීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00

1 තීරුව		*11 තීරුව*		
අනු අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු.750.00 නොඉක්මවන අවස්ථාව	*රු.750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන*	*රු.1500. ඉක්මවන*
		රු. ශත	*රු.ශත*	*රු.ශත*
66	මාළු වරල් වේලීම හෝ සකස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
67	යන්ත්‍රාණුසාරයෙන් ලෝහ ග්‍රැනයිට් ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
68	හුණු ගල් කැඩීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
69	කපු නූල් පොගවා නිම කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
70	සයිලන්සර් නිපදවීමේ කර්මාන්ත ශාලාවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
71	මේද නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
72	යන්ත්‍රාණුසාරයෙන් තෙල් නිශ්කර්ෂණය කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
73	යන්ත්‍රාණුසාරයෙන් ඇටකටු ඇඹරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
74	තෙල් මෝල්ක් පවත්වාගෙන යෑම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
75	පෑස්සීමේ හෝ අම්ලකර පෑස්සීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
76	ලියවන පට්ටලයක් භාවිතා කර ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
77	මෝටර් ගරාජයක් සහිතව හෝ මෝටර් වාහන සර්විස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
78	කොහු හෝ කෙදි වර්ග නිපදවීම, කොහු කෙදි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
79	ලී පෙගවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
80	ඇලුමිනියම් බඩු නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
81	යන්ත්‍ර නොමැතිව ගඩොල් හෝ උළු නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
82	ගල් කැඩීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
83	යන්ත්‍රාණුසාරයෙන් ගල් කැඩීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
84	යන්ත්‍රාණුසාරයෙන් කුට්ටි ගල් කැඩීම හා ඉරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
85	මැණික් වෙළඳුන් මැණික් ඔප දමා කැපීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
86	සිනි බෝල හා ද්‍රව ග්ලූකෝස් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00

1 කීරුව		*11 කීරුව*		
අනු අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු.750.00 නොඉක්මවන අවස්ථාව	*රු.750.00 ඉක්මවා එහෙත් රු. 1500.00 නොඉක්මවන*	*රු.1500. ඉක්මවන*
		රු. ශත	*රු.ශත*	*රු.ශත*
87	යන්ත්‍ර නොමැතිව සපත්තු හෝ පාවහන් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
88	අත්යන්ත්‍ර මාර්ගයෙන් පෙට්ටි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
89	හකුරු නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
90	කම්හලක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
91	ගිණි පෙට්ටි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
92	ආයුර්වේද ඖෂධ හා තෙල් වර්ග නිෂ්පාදනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
93	සබන් නිශ්පාදනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
94	බුරුසු නිශ්පාදනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
95	ප්ලාස්ටික් පටි නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
96	විකල්ප බල ශක්ති උත්පාදනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
97	විෂබීජ නාශක හා පවිත්‍රකාරක නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
98	මැටි භාණ්ඩ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
99	පොල්ලෙලි පෙගවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
100	කොන්ක්‍රීට් උළු,බට හෝ වෙනත් කොන්ක්‍රීට් භාණ්ඩ නිපදවීම හා ගබඩාකිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
101	වේවැල් භාණ්ඩ නිශ්පාදනය හා ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
102	රා තැබෑරුමක් පවත්වාගෙන යෑම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
103	වී තම්බා වේලන ස්ථානයක් පවත්වාගෙන යෑම(වී මෝල්ක්)	500.00	750.00	1000.00
104	වතුර පොම්ප හෝ වෙනත් යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
105	කරත්ත අළුත්වැඩියා කරන හා සාදන ස්ථානයක් පවත්වාගෙන යෑම(වෑල්ඩින් වැඩපලක් රහිතව)	500.00	750.00	1000.00
106	මෝටර් රථ බොඩි සාදන ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
107	බනික් වැඩපලක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
108	ඇදුම් මහන ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
109	සිමෙන්ති ග්‍රිල් වැඩපලක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
110	රබර් සීල් සෑදීම සඳහා හා ප්ලාස්ටික් නාම පුවරු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00

1 කීරුව		*11 කීරුව*		
අනු අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු.750.00 නොඉක්මවන අවස්ථාව	*රු.750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන*	*රු.1500. ඉක්මවන*
		රු. ශත	*රු.ශත*	*රු.ශත*
111	ලී බීරළු කැපීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
112	කොහු මෝලක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
113	විදුරු ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
114	යන්ත්‍රාණුසාරයෙන් ලාම්පු විමිනි වැඩ දැමීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
115	කඩදාසි කපන ස්ථානයක් පවත්වාගෙන යෑම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
116	ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
117	ශ්‍රාන්ත්‍රික වඩු කර්මාන්ත ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
118	වාහන එන්ජින් අලුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
119	සපත්තු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
120	රෙදි විවිමේ ස්ථානයක් පවත්වාගෙන යෑම (පෞද්ගලික)	500.00	750.00	1000.00
121	මෝටර් රථ පින්තාරු කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
122	ඇස් කණ්ණාඩි රාමු කිරීම හා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
123	ගරාජයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
124	මිණිරන් චේලිම හා ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
125	කොහු නිපදවීම හා ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
126	විවිමේ යන්ත්‍රාගාර පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
127	නූල් කැටීමේ යන්ත්‍රාගාර පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
128	නිම කිරීමේ යන්ත්‍රාගාර පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
129	ඉන්ජෙක්ටර් පොම්ප අලුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
130	ජංගම දුරකතන අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
131	ප්ලාස්ටික් උපකරණ හා සෙල්ලම් බඩු නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00
132	සංගීත භාණ්ඩ නිපදවීම හා අලුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම	500.00	750.00	1000.00

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බදු පැනවීම - 2026

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ වන අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (1) උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට ,2025 සැප්තැම්බර් මස 16 දින සභා තීරණ අංක 18 (ඊ) 09 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 16 දින,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
නිට්ටඹුව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 උප වගන්තියේ (1) උප වගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන යම් ව්‍යාපාරයක් අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක් ම එම ව්‍යාපාරයේ 2025 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි 1 වන තිරුවේ නිරූපිත යම් යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

I තීරුව	*II තීරුව*	
වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම	**ගෙවිය යුතු වාර්ෂික බද්ද**	**රු.ශත**
රු.6,000 නොඉක්මන අවස්ථාවක		කිසිවක් නොමැත
රු.6,000 ඉක්මවන එහෙත් රු.12,000 නොඉක්මවන විට		90.00
රු.12,000 ඉක්මවන නමුත් රු.18,850 නොඉක්මවන විට		180.00
රු.18,850 ඉක්මවන නමුත් රු.75,000 නොඉක්මවන විට		360.00
රු.75,000 ඉක්මවන නමුත් රු.150,000 නොඉක්මවන විට		1,200.00
රු.150,000 ඉක්මවන විට		3,000.00

12-65/9

අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් ගාස්තු පැනවීම - 2026

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ වන අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තිය හා 126 වගන්ති යටතේ පැවරී ඇති බලතල යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026

වර්ෂයට අදාලව ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට,2025 සැප්තැම්බර් මස 16 දින සහා තීරණ අංක 18 (ඊ) 10 යටතේ ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කරමි.

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශිය සභාව.

2025 සැප්තැම්බර් මස 16 දින,
අත්තනගල්ල ප්‍රාදේශිය සභාව
නිට්ටඹුව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) හා 126 වගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2015 දෙසැම්බර් මස 28 දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ IV(ආ) කොටසේ පළාත් සභා *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධි විධාන හා 2016.08.03 දිනැති අංක 1978/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* සඳහන් නිවැරදි කිරීම් ප්‍රකාරව අත්තනගල්ල ප්‍රාදේශිය සභා සීමාව තුළ යම් පරිශ්‍රයකට පාරකට,ඇළකට,වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් 2026 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම පහත සඳහන් උප ලේඛනයේ ආකාරයට විය යුතු බවට යෝජනා කරමි.

උප ලේඛනය

පුවරුවේ ස්වභාවය		*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03ට අඩු මාස 03 හෝ මාස 06 අතර වසරක්		
1	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන දැන්වීම්	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින්		
2	රෙදි ඩිජිටල් බැනර් සඳහා	3ට අඩු	250.00	350.00	500.00
		3ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
3	තහඩු හෝ දැව වලින් ප්‍රදර්ශනය කරන ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500.00	750.00	1000.00
		1ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.300.00 බැගින්		
4	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන් වීම සඳහා	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
5	ඉටි රෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම සඳහා	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
6	ප්ලාස්ටික් පුවරු යොදාගෙන ෆයිබර් මගින් කරන ලබන ප්‍රචාරක දැන්වීම සඳහා	1ට අඩු	250.00	350.00	500.00
		1ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින්		
7	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	750.00	850.00	1000.00
		1ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් හෝ එයින් කොටසක් සඳහා රු. 500.00 බැගින්		

12-65/10

අත්තනගල්ල ප්‍රාදේශිය සභාව

කසල බදු පැනවීම 2026

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ වන අත්තනගල්ල ප්‍රාදේශිය සභාවේ සභාපති වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වගන්තිය හා 109 වගන්ති යටතේ ප්‍රතිපාදන සලසා ඇති පරිදි හා 2007 අංක 01 දරන බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තින් 20 වන වගන්තිය හා 01 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් පරිදි කසල බදු නියම කර අය කිරීමට ,2025 සැප්තැම්බර් මස 16 දින සභා තීරණ අංක 18 (ඊ) 11 යටතේ ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කරමි.

ඩී.ඒ.දර්ශන දුමින්ද විජේසිංහ
සභාපති,
අත්තනගල්ල ප්‍රාදේශිය සභාව.

2025 සැප්තැම්බර් මස 16 දින,
අත්තනගල්ල ප්‍රාදේශිය සභාව
නිට්ටඹුව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වගන්තිය හා 109 වගන්ති යටතේ ප්‍රතිපාදන සලසා ඇති පරිදි හා 2007 අංක 01 දරන බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තින් 20 වන වගන්තිය හා 01 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උප ලේඛනයේ සඳහන් පරිදි කසල බදු නියම කර අය කිරීමට යෝජනා කරමි.

උප ලේඛනය

දේශීය හා විදේශීකයන් සඳහා වූ හොටෙල් , නවාතැන් පහසුකම් සපයන ස්ථාන , අවන්හල්/ආහාර ලබා ගනු ලබන ස්ථාන/උත්සව ශාලා , සුපිරි වෙළඳසැල් , එළවළු/පළතුරු/මාළු හා මස් අලෙවිසැල් , කර්මාන්ත ශාලා(විෂ රහිත අපද්‍රව්‍ය සඳහා සේවාව ලබා දීම) , පුද්ගලික රෝහල්,සාත්තු නිවාස සහ බෙහෙත් ශාලා(ආසාදිත නොවන අපද්‍රව්‍ය සඳහා සේවාව ලබා දීම) , අනේකේත වාණිජ ආයතන (රාජ්‍ය/පුද්ගලික) , රාජ්‍ය/පුද්ගලික සේවා සපයනු ලබන ස්ථාන , ආගමික ස්ථාන කිලෝ ග්‍රෑම් 01 ක් සඳහා	රු.ශත 3.00

ඉහත ආයතන වර්ගීකරණයට අනුව නිර්වචන පහත සඳහන් පරිදි වේ.

නිර්වචන

1. දේශීය හා විදේශීකයන් සඳහා වූ හොටෙල්

දේශීය විදේශීය සංචාරකයින් සඳහා සේවාව සපයනු ලබන,නැවතීමේ පහසුකම් තිබෙන ස්ථාන මේ කාණ්ඩය යටතට ගැනේ.මෙම ස්ථාන මඟින් අපද්‍රව්‍ය ජනනය කර අපහරණය සඳහා පළාත් පාලන ආයතනට ලබා දෙන ප්‍රමාණය අනුව කුඩා පරිමාණ,මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් තවදුරටත් වර්ගීකරණය කර ඇත.

2. නවාතැන් පහසුකම් සපයන ස්ථාන

වාණිජ පරමාර්ථයෙන් පවත්වාගෙන යනු ලබන නවාතැන් පහසුකම් සපයනු ලබන ස්ථාන මෙම කාණ්ඩය යටතට ගැනේ.මෙම ස්ථාන වලින් අපද්‍රව්‍ය අපහරණය සඳහා පළාත් පාලන ආයතනයට යොමු කරනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය කුඩා පරිමාණ,මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් තවදුරටත් වර්ගීකරණය කර ඇත.

3. අවන්හල්/ආහාර ලබා ගනු ලබන ස්ථාන/උත්සව ශාලා

මංගල උත්සව හා වෙනත් එවැනි උත්සව පැවැත්වීම සඳහා පහසුකම් ඇති ස්ථාන, ආහාර පාන ලබා ගැනීමේ පහසුකම් ඇති විවිධ මට්ටමේ හොටෙල්,අවන්හල්,මේ යටතට ගැනේ.මෙම ස්ථාන මඟින් අපහරණය සඳහා පළාත් පාලන ආයතනට යොමු කරනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය මත කුඩා පරිමාණ,මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් තව දුරටත් වර්ගීකරණය කර ඇත.

4. සුපිරි වෙළඳසැල්

පාරිභෝගිකයින් විසින් භාණ්ඩ තෝරාගෙන මිලදී ගත හැකි වෙළඳ ආයතන මෙම ගණයට අයත් වන අතරම එම ස්ථාන වලින් ජනනය කරනු ලබන,අපහරණය සඳහා පළාත් පාලන ආයතනයට ලබා දෙනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය මත කුඩා පරිමාණ,මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් තව දුරටත් වර්ගීකරණය කර ඇත.

5. එළවළු, පළතුරු, මාළු හා මස් අලෙවිසැල්

එළවළු,පළතුරු,මාළු හා මස් අලෙවිය සඳහා තබා ඇති අලෙවි ස්ථාන මේ යටතට ගැනේ.මෙම ස්ථානවලින් ජනනය කර අපහරණය සඳහා පළාත් පාලන ආයතනයට ලබා දෙනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය මත කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් තව දුරටත් වර්ගීකරණය කර ඇත.

6. කර්මාන්ත ශාලා (විෂ රහිත අපද්‍රව්‍ය සඳහා සේවාව ලබා දීම)

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පිහිටි විමි කරන ලද විෂ රහිත සාමාන්‍ය නාගරික අපද්‍රව්‍ය සඳහා පළාත් පාලන ආයතන වල සේවාව අපේක්ෂිත කර්මාන්ශාලා මෙම කාණ්ඩය යටතට ගැනේ.මෙම ස්ථානවලින් ජනනය කර අපහරණය සඳහා පළාත් පාලන ආයතනයට ලබා දෙනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය මත කුඩා පරිමාණ,මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් තව දුරටත් වර්ගීකරණය කර ඇත.

7. පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ බෙහෙත් ශාලා(ආසාදිත නොවන අපද්‍රව්‍ය සඳහා සේවාව ලබා දීම)

පුද්ගලික අංශය මඟින් පවත්වාගෙන යනු ලබන පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පිහිටි විමි කරන ලද සාදින නොවූ සාමාන්‍ය නාගරික අපද්‍රව්‍ය අපහරණය සඳහා පළාත් පාලන ආයතන වල සේවාව අපේක්ෂිත ආරෝග්‍ය ශාලා හා සාත්තු නිවාස මෙම කාණ්ඩයට යටතට ගැනේ.මෙම ස්ථානවලින් ජනනය කර අපහරණය සඳහා පළාත් පාලන ආයතනයට ලබා දෙනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය මත කුඩා පරිමාණ,මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් තව දුරටත් වර්ගීකරණය කර ඇත.

8. අනේක්ත වාණිජ ආයතන (රාජ්‍ය/පුද්ගලික)

ඉහත විස්තර කරන ලද කාණ්ඩ හැරණූ විට වාණිජ පරමාර්ථයෙන් පවත්වාගෙන යනු ලබන අපද්‍රව්‍ය ජනනය වන හා අපහරණය සඳහා පළාත් පලාන ආයතන වල සේවාව බැංකු මූල්‍ය ආයතන,උපකාරක පංති, සිල්ලර වෙළඳසැල් ඇතුළු අනෙකුත් සියලුම ආයතන මෙම යටතට ගැනේ. මෙම ස්ථානවලින් ජනනය කර අපහරණය සඳහා පළාත් පාලන ආයතනයට ලබා දෙනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය මත කුඩා පරිමාණ,මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් තව දුරටත් වර්ගීකරණය කර ඇත.

9. රාජ්‍ය/පුද්ගලික සේවා සපයනු ලබන ස්ථාන

රාජ්‍ය හා පුද්ගලික අංශය මඟින් පවත්වාගෙන යනු ලබන සේවා සැපයීම පරමාර්ථ කරගෙන පවත්වාගෙන යනු ලබන සියළුම ආයතන මේ යටතට ගැනේ.මෙම ස්ථානවලින් ජනනය කරනු ලබන අපහරණය සඳහා පළාත් පාලන ආයතනයට ලබා දෙන අපද්‍රව්‍ය ප්‍රමාණය මත කුඩා පරිමාණ,මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් තවදුරටත් වර්ගීකරණය කර ඇත.

10. ආගමික ස්ථාන

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි පිහිටා ඇති අපද්‍රව්‍ය අපහරණය සඳහා පළාත් පාලන ආයතනයේ සේවාව අපේක්ෂිත සියලුම ආගමික ස්ථාන මෙම කාණ්ඩය යටතට ගැනේ.මෙම ස්ථානවලින් ජනනය කරනු ලබන අපහරණය සඳහා පළාත් පාලන ආයතනයට ලබා දෙන අපද්‍රව්‍ය ප්‍රමාණය මත කුඩා පරිමාණ,මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් තවදුරටත් වර්ගීකරණය කර ඇත.

බොරලැස්ගමුව නගර සභාව

2026 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 162 (1) හා 164 (1) වගන්තිය අනුව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාලව බලපත්‍ර ගාස්තු පැනවීමට 2025 වර්ෂයේ ඔක්තොබර් මස 28 වෙනි දින, පවත්වනු ලබු මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව, තීරණ අංක 5.12 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ප්‍රදීප් නිශාන්ත වෙදමුල්ල,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 21 දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වැනි අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 162(1) වගන්තිය හා 164 (1) වගන්තිය යටතේ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ආඥා පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛණයෙහි 1 තීරයේ නිරූපිත යම් කාර්යයක් සඳහා බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2026 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛණයේ II තීරයේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් ;

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර හෝ එම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ හෝටලයක්, ආපන ශාලාවක්, නවැතැන්පළක් වන විටදී ඊට අදාළ බලපත්‍රය ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2025 වර්ෂයේ ලැබීම් වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් විධාන කිරීමට බොරලැස්ගමුව නගර සභාව යෝජනා කරන්නී.

උපලේඛනය

	I තීරය	II තීරය		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	බලය දෙනු ලබන කාර්යය	රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක
1	බේකරියක් පවත්වාගෙන යාම/බේකරි නිෂ්පාදන අළෙවිය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
2	බත් කඩයක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
3	තේ, කෝපි කඩයක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
4	භෝජන ශාලාවක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
5	ලැගුම්හලක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
6	ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
7	ගිණිකෙළි භාණ්ඩ නිෂ්පාදනය හා අළෙවිය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
8	යෝගට් නිෂ්පාදනය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
9	උත්සව හා ආහාරපාන සැකසීම/බෙදා හැරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00

	I තීරය	II තීරය		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	බලය දෙනු ලබන කාර්යය	රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක
10	නූඩිල්ස් නිෂ්පාදනය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
	පීඩාකාරී ව්‍යාපාර			
11	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
12	සම් පදම් කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
13	සම් විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
14	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	රු. 500.00	රු. 750.00	රු. 1000.00
15	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
16	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
17	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
18	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
19	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
20	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
21	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
22	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
23	සබන් නිෂ්පාදනය කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
24	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
25	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
26	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
27	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
28	වේවැල් භාණ්ඩ නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
29	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
30	සිරප් හෝ පලතුරු බීම වර්ග නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
31	රස කැවිලි වර්ග නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
32	පොල්ලෙලි පෙහවීම (හෝ පල් කිරීම)	රු. 500.00	රු. 750.00	රු. 1000.00
33	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	රු. 500.00	රු. 750.00	රු. 1000.00
34	දත් බුරුසු නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
35	රා එකතු කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
36	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
37	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
38	පින්තාරු තීන්ත වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00

	I තීරය	II තීරය		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	බලය දෙනු ලබන කාර්යය	රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක
39	සෝඩා නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
40	සම් භාණ්ඩ නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
41	පලතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
42	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශබෝග, කුළු බඩු හෝ කිරි පිටි ඇඹරීම සඳහා ඇඹරුම් හලක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
43	ඉටිපන්දම් නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
44	කපුරු නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
45	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
46	රෙදි සෝදන නිල් නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
47	ලාකඩ නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
48	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
49	පාසල් රටහුණු නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
50	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
51	ටයර් නැවත පිරවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
52	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
53	සිමෙන්ති කිලෝග්‍රෑම් 1,000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
54	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
55	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
56	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
57	පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා නිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
58	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති ගල් නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
59	ධාන්‍ය හෝ මාංශ භෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
	අන්තරායදායක ව්‍යාපාර			
60	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
61	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
62	කිරි විකිණීම/කිරි හලක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
63	බාබර් සාප්පුවක්	රු. 500.00	රු. 750.00	රු. 1000.00
64	මාළු කඩයක්	රු. 500.00	රු. 750.00	රු. 1000.00
65	මස් කඩයක්	රු. 500.00	රු. 750.00	රු. 1000.00
66	අන්තරායදායී ඛනිජ තෙල් ප්‍රවාහනය - - 1,000 0	රු. 500.00	රු. 750.00	රු. 1000.00
67	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00

	I තීරය	II තීරය		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	බලය දෙනු ලබන කාර්යය	රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක
68	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
69	මුද්‍රණාලයක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
70	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
71	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
72	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
73	දර ගබඩාවක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
74	කළු ගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	රු. 500.00	රු. 750.00	රු. 1000.00
75	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
76	ගිණිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
77	කොහු හෝ වෙනත් කෙඳිවර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
78	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
79	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
80	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
81	යන්ත්‍රානුසාරයෙන් පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
82	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
83	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
84	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
85	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
86	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
87	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
88	ශීතකළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
89	දැව ගබඩා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
	පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර			
90	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
91	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
92	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
93	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
94	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අළුහුණු ගබඩා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
95	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
96	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00

	I තීරය	II තීරය		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	බලය දෙනු ලබන කාර්යය	රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක
97	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
98	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
99	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
100	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
101	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
102	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
103	කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
104	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
105	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පැවැත්වීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
106	පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛණිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
107	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
108	වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
109	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
110	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වී	රු. 500.00	රු. 750.00	රු. 1000.00

12-17/1

බොරලැස්ගමුව නගර සභාව

2026 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

255 වැනි අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 165අ (1) වගන්තිගයෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය සඳහා 2026 වරෂයට අදාලව කර්මාන්ත බදු පැනවීමට 2025 වර්ෂයේ ඔක්තොබර් මස 28 වෙනි දින, පවත්වනු ලබු මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව, තීරණ අංක 5.13 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ප්‍රදීප් නිශාන්ත වෙදමුල්ල,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 21 වැනි දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වැනි අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ අංක 165අ (1) වගන්තියෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ 1 වන තීරයේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උප ලෙඛනයේ 11 තීරයේ නිරූපත ප්‍රමාණයට කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

	I තීරය	II තීරය		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	කාර්මාන්ත	රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක
1	වාහන කුෂන් වැඩපලක්	රු. 500.00	රු. 750.00	රු. 1000.00
2	ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියාව හෝ නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
3	කම්හල් (යන්ත්‍රෝපකරණ රහිත)	රු. 500.00	රු. 750.00	රු. 1000.00
4	ලී බඩු වෙළඳාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
5	බෙහෙත් නිෂ්පාදනය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
6	සූට්කේස් නිෂ්පාදනය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
7	පින්තූර රාමු කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
8	එළවළු හා පළතුරු විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
9	ප්ලාස්ටික් භාණ්ඩ විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
10	10. උණ බම්බු ගබඩාව	රු. 500.00	රු. 750.00	රු. 1000.00
11	කබොක්, බොරළු හෝ කළුගල් ගබඩාව	රු. 500.00	රු. 750.00	රු. 1000.00
12	ඇඳුම් මැසීමේ ටේලර් සාප්පුවක්	රු. 500.00	රු. 750.00	රු. 1000.00
13	අත්යන්ත්‍ර ක්‍රමයක් හැර වෙනත් ක්‍රමයකින් නූල් කැටීම හෝ විවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
14	අත්යන්ත්‍ර ක්‍රමයකින් හැර වෙනත් ක්‍රමයකින් රෙදි විවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
15	නිමි ඇඳුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
16	සත්ත්ව මාංශාවශේෂ හෝ ලේ පැසවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
17	ට්‍රන්ක් පෙට්ටි සෑදීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
18	කෝපි, ධාන්‍ය වර්ග, කුළුබඩු හෝ පිටි, ඇසිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
19	සායම් කුඩු නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
20	මැටි බඳුන් ඔප දැමීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
21	රබර් ද්‍රව්‍ය හෝ රබර් සීල් නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
22	වීදුරු භාණ්ඩ නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
23	ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
24	සන්නායක බැටරි නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
25	සිල්ලර වෙළඳාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
26	ඉංග්‍රීසි බෙහෙත් වර්ග අලෙවි කිරීම හෝ ගබඩා කර තබා ගැනීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
27	ආයුර්වේද බෙහෙත් බඩු අලෙවිය	රු. 500.00	රු. 750.00	රු. 1000.00

	I තීරය	II තීරය		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	කාර්මාන්ත	රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක
28	ග්‍රොසරි	රු. 500.00	රු. 750.00	රු. 1000.00
29	තේ පෙට්ටි සෑදීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
30	රෙකෝඩ් බාර්	රු. 500.00	රු. 750.00	රු. 1000.00
31	දුරකථන කුටි හා ඡායා පිටපත් යන්ත්‍ර සහිත ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (කොමියුනිකේෂන්)	රු. 500.00	රු. 750.00	රු. 1000.00
32	පොත්හලක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
33	පාවහන් සෑදීම හෝ විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
34	බර වාහන ගාලක් හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
35	පාපැදි හෝ යතුරුපැදි අමතර කොටස් විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
36	වීඩියෝ කැසට් පට හා සංයුක්ත තැටි කුළියට දීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
37	ඇනිකරන මාළු විකිණීම (සුරතල් මසුන්)	රු. 500.00	රු. 750.00	රු. 1000.00
38	බෙලෙක් ඇලුමිනියම් මේස හා කැබිනට් මේස වර්ග සෑදීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
39	ඔරලෝසු අලුත්වැඩියාව හා අමතර කොටස් විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
40	ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
41	සාප්පු බඩු වෙළඳාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
42	උත්සව භාණ්ඩ කුළියට දීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
43	ත්‍රීරෝද රථ අමතර කොටස් විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
44	ලොතරැයි විකිණීමේ ස්ථාන	රු. 500.00	රු. 750.00	රු. 1000.00
45	වැලි ගොඩ දැමීමේ ස්ථානයක් කියුබ් 50ට වැඩි වන විට දී	රු. 500.00	රු. 750.00	රු. 1000.00
46	ටයර් විකිණීමේ ස්ථාන	රු. 500.00	රු. 750.00	රු. 1000.00
47	විදුලි භාණ්ඩ විකිණීමේ ස්ථාන	රු. 500.00	රු. 750.00	රු. 1000.00
48	පොදු ගබඩා (තොග) වශයෙන් ආහාර හෝ අනිකුත් භාණ්ඩ	රු. 500.00	රු. 750.00	රු. 1000.00
49	ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම/වේදිකා ආලෝකකරණය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
50	පී. වී. සී. පයිප්ප නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
51	මංගල ශාලා කුළියට දීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
52	චාරිකා සඳහා වාහන කුළියට දීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
53	ඇස් කණ්නාඩි විකිණීම හා අලුත්වැඩියා කිරීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
54	හඳුන්කූරු නිපදවීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
55	රේස් ඔට්ටුපලක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
56	මෝටර් රථ විකිණීමේ ස්ථාන	රු. 500.00	රු. 750.00	රු. 1000.00
57	ත්‍රී රෝද රථ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
58	ගෘහ කර්මාන්ත ශිල්පීය ආයතනයක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
59	මිනින්දෝරු ආයතනයක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
60	මෝටර් කොයිල් එතීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00

	I තීරය	II තීරය		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	කාර්මාන්ත	රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක
61	සාම්බ්‍රානි නිෂ්පාදනය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
62	පෞද්ගලික ආරක්ෂක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
63	රාජ්‍ය නොවන ව්‍යාපාර විෂයෙහි පවත්වාගෙන යන කාර්යාලයක් සඳහා	රු. 500.00	රු. 750.00	රු. 1000.00
64	කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන	රු. 500.00	රු. 750.00	රු. 1000.00
65	පරිගණක අලුත්වැඩියාව	රු. 500.00	රු. 750.00	රු. 1000.00
66	පොල් වෙළඳාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
67	රෙදිපිළි වෙළඳාම, නිමි ඇඳුම් වෙළඳාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
68	ගෑස් විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
69	කරවල වෙළඳාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
70	ඉන්ටර්නෙට් කැෆේ	රු. 500.00	රු. 750.00	රු. 1000.00
71	බුලත් වෙළඳාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
72	වළං වෙළඳාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
73	ටිං වැඩපල	රු. 500.00	රු. 750.00	රු. 1000.00
74	සුරාසැලක් පවත්වාගෙන යාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
75	ඇලුමිනියම් දොරවල් සෑදීම (දුරස්ථ පාලක)	රු. 500.00	රු. 750.00	රු. 1000.00
76	ලී වෙළඳාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
77	යකඩ බඩු වෙළඳාම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
78	මහන මැෂින් අලුත්වැඩියාව අමතර කොටස් විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
79	ජංගම දුරකථන අලුත්වැඩියාව	රු. 500.00	රු. 750.00	රු. 1000.00
80	පොලිතින් ප්‍රතිචක්‍රීකරණය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
81	මේස් වැඩපල	රු. 500.00	රු. 750.00	රු. 1000.00
82	සමරු ඵලක සෑදීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
83	කාර්මික උපකරණ කුළියට දීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
84	වෙළඳ ප්‍රචාරක කටයුතු	රු. 500.00	රු. 750.00	රු. 1000.00
85	ෆාව්වි වැඩපල	රු. 500.00	රු. 750.00	රු. 1000.00
86	ටයිප් සෙටින්	රු. 500.00	රු. 750.00	රු. 1000.00
87	විසිතුරු මල්පැල හා මල් පෝච්චි විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
88	සිගරට් තොග විකිණීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00
89	පුවත් පත් සහරා අලෙවි සැල	රු. 500.00	රු. 750.00	රු. 1000.00
90	විසිතුරු භාණ්ඩ සෙල්ලම් බඩු නිෂ්පාදනය හා අලෙවිය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
91	ලී වලින් කැටයම් කිරීම, ඊට අදාළ විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
92	ගමන් මළු/අත් බෑග් නිෂ්පාදනය හා අලෙවිය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
93	බෙහෙත් ශාලා	රු. 500.00	රු. 750.00	රු. 1000.00
94	වානේ ගෘහ භාණ්ඩ අලෙවිය	රු. 500.00	රු. 750.00	රු. 1000.00

	I තීරය	II තීරය		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	කාර්මාන්ත	රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක
95	කේක් බෝඩ් නිෂ්පාදනය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
96	කටු කම්බි නිෂ්පාදනය	රු. 500.00	රු. 750.00	රු. 1000.00
97	යකඩ/තහඩු ආශ්‍රිත නිෂ්පාදන	රු. 500.00	රු. 750.00	රු. 1000.00
98	කන්ටේනර් මුද්‍රා තැබීමේ උපකරණ සෑදීම	රු. 500.00	රු. 750.00	රු. 1000.00

12-17/2

බොරලැස්ගමුව නගර සභාව

2026 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

255 වැනි අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 165ආ (1) වගන්තිගයෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය සඳහා 2026 වරෂයට අදාලව ව්‍යාපාර බදු පැනවීමට 2025 වර්ෂයේ ඔක්තොබර් මස 28 වෙනි දින, පවත්වනු ලබු මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව, තීරණ අංක 5.14 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමී.

ප්‍රදීප් නිශාන්ත වෙදමුල්ල,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 21 දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 වැනි අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ අංක 165ආ (1) වගන්තියෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ යම් බලපත්‍ර ගාස්තුවක් හෝ කාර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයෙ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2025 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ I තීරයේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරයේ නිනුරූප සටහනේ නීරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් උප ලේඛන 02 හි සඳහන් ව්‍යාපාර සඳහා 2026 වර්ෂයට පනවා අය කළ යුතු යැයි යෝජනා කරමී.

උපලේඛනය අංක 01

I තීරය	II තීරය	
2026 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	ගෙවිය යුතු බද්ද	
	රු.	ශත
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත	
රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90	00

I තීරය	II තීරය	
2026 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	ගෙවිය යුතු බද්ද	
	රු.	ශත
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180	00
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360	00
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1200	00
රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3000	00

උපලේඛනය 02

1. බැංකු මූල්‍ය ආයතන හෝ රක්ෂණ සමාගම්
2. ගණන් පරීක්ෂකවරුන් (පෞද්ගලික) නොතාරිස්, නීතිඥ කාර්යාලය
3. රැකියා ඒජන්සි
4. වෙන්දේසිකරුවන්
5. බ්‍රෝකර්වරුන්
6. උකස්බඩු ගන්නන්
7. ප්‍රවාහන නියෝජිතයන්
8. රිය පුහුණු ආයතන
9. පෞද්ගලික දේපළ වෙළඳාම් ආයතන
10. පෞද්ගලික අධ්‍යාපන ආයතන පවත්වන්නන්
11. ගණන් පරීක්ෂකවරුන් හා බදු උපදේශකවරුන්
12. සැපයුම්කරුවන්
13. විදේශ රැකියා ඒජන්සි ආයතන
14. පරිගණක සේවා/පරිගණක විකිණීම හා අලුත්වැඩියා කිරීම
15. ශිල්පීය වෘත්තිකයන්
16. පරිගණක පුහුණු කිරීම්
17. බහාලුම් මධ්‍යස්ථානයක් (කන්ටේනර් යාඩ්) පවත්වාගෙන යාම
18. ජාත්‍යන්තර පාසල් පවත්වාගෙන යන ආයතන
19. දුරකථන කුළුණු පවත්වාගෙන යන ආයතන
20. ෆාම් ෂොප් පවත්වාගෙන යන ආයතන
21. තේ කොළ ඇසුරුම් මධ්‍යස්ථාන හෝ තේ කොළ කර්මාන්ත ශාලා
22. පාන් පිටි ගබඩාකර බෙදා හැරීමේ මධ්‍යස්ථාන
23. යන්ත්‍රානුසාරයෙන් රෙදි හෝ ලේබල් විවීමේ කර්මාන්තය
24. බැටරි නිෂ්පාදනය කරන ස්ථාන
25. පොලිතීන් ආශ්‍රිතව ප්ලාස්ටික් භාණ්ඩ/පොලිතීන් භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථාන
26. ඉදිකිරීම් ආයතන
27. රථ වාහන අමතර කොටස් විකිණීමේ/ගබඩාකර තැබීමේ/බෙදා හැරීමේ ස්ථාන
28. රථ වාහන ගාල් කර තැබීමේ මධ්‍යස්ථාන
29. කඩදාසි එකතු කිරීමේ හෝ ප්‍රතිචක්‍රීය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
30. රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය
31. මාළු දැල් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
32. වීදුරු/කැඩපත් විකිණීමේ හෝ සාදන ස්ථානයක් පවත්වාගෙන යාම
33. රේස් ඔට්ටු මධ්‍යස්ථාන
34. පලතුරු එකතු කිරීමේ/අපනයනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35. ඉන්ධන ගබඩා මධ්‍යස්ථාන
36. තාවකාලික ජංගම වෙළෙඳ කුටි
37. සුපිරි වෙළඳ සැල්/ෆුඩ් සිටි
38. වෛද්‍ය මධ්‍යස්ථාන
39. මෝටර් වාහන/යතුරු පැදි විකිණීමේ ස්ථාන
40. පෞද්ගලික රෝහල්
41 දන්ත ශල්‍යාගාර

42. බලපත්‍ර සහිත දේශීය, විදේශීය මත්පැන් විකුණන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
43. ව්‍යාපාරයක් හෝ සේවාවක් සඳහා කාර්යාලයක් පවත්වාගෙන යාම
44. ප්‍රකාශන ආයතන
45. සංගීත භාණ්ඩ කුළියට දීම
46. වෙළඳ අළෙවි නියෝජිත ස්ථාන
47. කොන්ත්‍රාත්කරුවන්
48. මැණික් හා ස්වර්ණාභරණ වෙළඳාම
49. නිවාස සැලසුම් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. ඛනිජ තෙල් (පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ලිහිසිතෙල්) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. දිවා සුරැකුම් මධ්‍යස්ථාන
52. පිහන් භාණ්ඩ හා සෙරමික් භාණ්ඩ අළෙවිය
53. පොල්තෙල් නිෂ්පාදනය

12 - 17/3

බොරලැස්ගමුව නගර සභාව

2026 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

255 වැනි අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ අංක 165ඇ (1) වගන්තිගයෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් වලින් එම ඉඩමේ / භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකක (0.02%) නොවැඩි ප්‍රමාණයක බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට, 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 28 දින, පවත්වනු ලබු මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව, තීරණ අංක 5.15 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ප්‍රදීප් නිශාන්ත වෙදමුල්ල,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 21 දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ අංක 165ඇ. (1) වගන්තිය යටතේ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකල ඉඩම්වලින් එම ඉඩමේ/ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකක (2%) නොවැඩි ප්‍රමාණයක බද්දක් 2026 වර්ෂයට පනවා අය කරගත යුතු බවට යෝජනා කරමි.

12 -17/4

බොරලැස්ගමුව නගර සභාව

2026 වර්ෂයට අදාළව ඇතැම් ඉඩම් විකිණීම වෙනුවෙන් බදු අය කිරීම

255 වැනි අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ අංක 165ඇ (1) වගන්තිගයෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ පිහිටි යම ඉඩමක් වෙන්දේසිකරුවෙකු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයකු නැතහොත් අනුනියෝජිතයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් යම් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබුණු මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරුගේ බ්‍රෝකර්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයා හෝ 2026 වර්ෂය සඳහා බොරලැස්ගමුව නගර සභාවට ගෙවිය යුතු බවට, 2025 වර්ෂයේ

ඔක්තෝබර් මස 28 දින, පවත්වනු ලබු මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව, තීරණ අංක 5.16 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි

ප්‍රදීප් නිශාන්ත වෙදමුල්ල,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 21 දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ අංක 165ඈ (1) වගන්තිගයෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු විසින් හෝ බ්‍රෝකර් කෙනෙකු විසින් හෝ ඔහුගේ සේවකයකු නැතහොත් අනුනියෝජිතයෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ නැතහොත් යම් ආකාරයකින් විකුණනු ලැබුවහොත් ඒ විකිණීමෙන් ලැබුණු මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් ඒ විකුණුම්කරු හෝ වෙන්දේසිකරු බ්‍රෝකර්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයා හෝ විසින් එසේ ඒ ඉඩම් විකුණා ලත් මුදලින් 2026 වර්ෂය සඳහා බොරලැස්ගමුව නගර සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

12-17/5

බොරලැස්ගමුව නගර සභාව

2026 වර්ෂයට වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 162 (1) 'අ' වගන්තියෙන් නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බොරලැස්ගමුව නගර සභා බලප්‍රදේශය තුළ 2026 වර්ෂයේ දී පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II තීරුවේ නිරූපිත බද්දක් පනවා අය කළ යුතු බවට, 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 28 දින, පවත්වනු ලැබු මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව, තීරණ අංක 5.17 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ප්‍රදීප් නිශාන්ත වෙදමුල්ල,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 21 දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 162 (1) 'අ' වන වගන්තිගයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බොරලැස්ගමුව නගර සභා බලප්‍රදේශය තුළ 2026 වර්ෂයේදී පහත උප ලේඛනයේ I තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II වන තීරුවේ නිරූපිත බද්දක් පනවා අය කළ යුතු යැයි යෝජන කරමි.

I තීරුව	II තීරුව
	රු. ශත
මෝටර් කාර් රථයක්, රෝද තුනේ මෝටර් රථයක්, ලොරි රථයක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හා ට්‍රයිසිකලයක්, නොවන සෑම වාහනයක් සඳහාම	රු. 25 0

I තීරුව	II තීරුව
සෑම බයිසිකල් හෝ ට්‍රයිසිකලයක්, හෝ බයිසිකල් කාර් රථයක් නැතහොත් බයිසිකල් කරත්තයක් හෝ ට්‍රයිසිකල් කාර් රථයක් නැතහොත් ට්‍රයිසිකල් කරත්තයක්, සඳහා -	
(අ) එය වෙළෙඳ කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම්	රු. 10.00
(ආ) එය වෙළෙඳ කටයුතු නොවන කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම්	රු. 5.00
සෑම කරත්තයක් සඳහා	රු. 20.00
සෑම අත් කරත්තයක්ම සඳහා	රු. 10.00
සෑම රික්ෂෝවක් සඳහා	රු. 7.50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	රු. 15.00
සෑම අලියකු සඳහා	රු. 50.00

12 -17/6

බොරලැස්ගමුව නගර සභාව

2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු පැනවීම

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 153 හා 157 වගන්ති අනුව නගර සභාව වෙත පැවරී ඇති අතුරු ව්‍යවස්ථා සෑදීමට අති බලතල ප්‍රකාර, බොරලැස්ගමුව නගර සභාව විසින් සාදනු ලබන අතුරු ව්‍යවස්ථා හා එම ආඥා පනතේ 150 වැනි වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් ගාස්තු 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට, 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 28 දින, පවත්වනු ලැබූ මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව, තීරණ අංක 5.18 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ප්‍රදීප් නිශාන්ත වෙදමුල්ල,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 21 දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 153 හා 157 වගන්ති අනුව නගර සභාව වෙත පැවරී ඇති අතුරු ව්‍යවස්ථා සෑදීමට අති බලතල ප්‍රකාර, බොරලැස්ගමුව නගර සභාව විසින් සාදනු ලබන අතුරු ව්‍යවස්ථා හා එම ආඥා පනතේ 150 වැනි වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් ගාස්තු පහත සඳහන් පරිදි 2026 වර්ෂය සඳහා පනවා අයකිරීමට යෝජනා කරමි.

ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු

උපලේඛනය

01.	ප්‍රචාරක කටයුතු සඳහා ඉදිකෙරෙන ස්ථිර බැඟින් දැන්වීම් පුවරු සහ බිත්ති පුවරු සඳහා පවත්නා වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා	වර්ග අඩියකට	රු. 200.00
02.	බැනර් දැන්වීම් සඳහා එක් මසක කාල සීමාවකට බැඟින්	වර්ග අඩියකට	රු. 50.00
03.	සිනමා චිත්‍රපට දර්ශනයකට අදාළ වූ යම් බැඟින්	වර්ග අඩියකට	රු. 40.00

	ප්‍රචාරක දැන්වීමක් එක් මසක කාල සීමාවට		
04.	යම් තැනැත්තෙකු විසින් රැගෙන යන්නාවූ බැගින් හෝ ධාවනය වන වාහනයකට සම්බන්ධ කර තිබෙන්නා වූ හෝ දාරයකට ප්‍රදර්ශනය කර ඇති (සිනමා චිත්‍රපට ප්‍රදර්ශනයට අදාළ වූ ප්‍රචාරක දැන්වීමක් නොවන) ප්‍රචාරක දැන්වීමක් එක් මසක කාල සීමාවකට	වර්ග අඩියකට	රු. 40.00

12 - 17/7

බොරලැස්ගමුව නගර සභාව

2026 වර්ෂයට අදාළව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු පැනවීම

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු 2026 වර්ෂය සඳහා පනවා අය කල යුතු බවට, 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 28 දින, පවත්වනු ලැබූ මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව, තීරණ අංක 5.19 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ප්‍රදීප් නිශාන්ත වෙදමුල්ල,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 21 දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1988 අංක 56 දරන පනතින් හා 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය අනුව මධ්‍යම පරිසර අධිකාරය විසින් නගර සභාව වෙත 2008.02.14 දින අංක 47 දරන පාරිසරික පනතේ 26 වෙනි වගන්ති ප්‍රකාර පවරා ඇති බලතල බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය තුළ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන පහත උප ලේඛනයේ දැක්වෙන ව්‍යාපාර සම්බන්ධයෙන් ඉහත කී පනතේ සහ අදාල සංශෝධන යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව එකී ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නන් විසින් වසර 01 සියට 03 ක් සඳහා රුපියල් 4000/- ක (රුපියල් හාරදාහක) බලපත්‍ර ගාස්තුවක් හා ඊට අදාල කාලීන වශයෙන් සංශෝධනය වන බදු (වැට්) මුදල් හා මුද්දර බදු මෙම නගර සභාවට ගෙවා අදාල පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතු බවටත්, මෙම බලපත්‍රය ලබා ගැනීමට ප්‍රථම අනිවාර්යෙන්ම වෙළඳ බලපත්‍රය හෝ කර්මාන්ත බදු හෝ ව්‍යාපාර බදු ගෙවූ ලදුපත ද ලබාගත යුතු බවටත් යෝජනා කරමි.

2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව අංක 1533/16 දරන වර්ෂ 2008 වූ ජනවාරි මස 25 දින *අති විශෙෂ ගැසට් පත්‍රයේ*(ඇ) කොටසේ නියමිත ව්‍යෘෂති ලෙස ප්‍රකාශිත පහත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මෙහි දෙවන උප ලේඛනයේ පහත සඳහන් ක්‍රියා පටිපාටියට අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අවලංගු කිරීම, ප්‍රතික්ෂේප කිරීම, සහ අත්හිටුවීමේ බලය සභාව සතුයි.

01. සියලුම වාහන ඉන්ධන පිරවුම්හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායුව)
02. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
03. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල්තෙල් සිදීමේ කර්මාන්ත
04. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මද්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
05. වියලි ක්‍රියාවලි සහිත වී මෝල්
06. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 100 කට අඩුවන ඇඹරුම්හල්

07. දුම්කොළ වේලීමේ කර්මාන්ත

08. සල්ෆර් දුම් ගැසීම සහිත එක් ක්‍රියාවලියකදී නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 500ක් හෝ එයට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත

09. කැමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත

10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනිකුත් තේ කර්මාන්ත ශාලා

11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත

12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

13. දිනකට මෙට්‍රික් ටොන් 20ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත හුණු පෝරණු

14. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයින් 25ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිහන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

15. සියළු බෙලි කටු ඇඹරීමේ කර්මාන්ත

16. උළු සහ ගඩොල් කර්මාන්ත

17. එක් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600ක නිෂ්පාදන ධාරිතාවකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදුකරනු ලබන කැනීම්

18. දිනකට ඝන මීටර් 50ට අඩු දැව ඉරුම් ධාරිතාවක් ඇති ලී මෝල් හා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත

19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයන් 05ට වැඩි 25ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත

20. නේවාසික කාමර 05ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්

21. වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා සවිකිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදු කරන ගරාජ හැර අනිකුත් වාහන අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ගරාජ

22. ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සවි කිරීම සිදුකරන ස්ථාන

23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලුම් පර්යන්ත

24. සේවකයින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියළුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන

25. ඊයම් උණු කිරීම සිදුකිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

12 -17/8

බොරලැස්ගමුව නගර සභාව

2026 වර්ෂයට අදාළව විනෝද බදු පැනවීම

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ විනෝද බදු 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට, 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 28 දින, පවත්වනු ලැබූ මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව, තීරණ අංක 5.20 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ප්‍රදීප් නිශාන්ත වෙදමුල්ල,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 21 දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ අංක 06 දරන වගන්තියට අනුකූලව, බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය සීමාව තුළ පහත උපලේඛනයේ සඳහන් ආකාරයට 2026 වර්ෂය සඳහා විනෝද බදු පනවා අයකර ගැනීමට යෝජනා කරමි.

උපලේඛනය

1. බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වන සෑම චිත්‍රපට දර්ශනයක් ආධාර චිත්‍රපට දර්ශනයක් සඳහාම නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් සියයට දහයක (10%) විනෝද බද්දක් 2026 වර්ෂය සඳහා බලපැවැත්වෙන පරිදි බොරලැස්ගමුව නගර සභාව වෙත ගෙවිය යුතුය.

12 - 17/9

බොරලැස්ගමුව නගර සභාව

2026 වර්ෂයට වරිපනම් බදු පැනවීම

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ අංක 160 (අ) වගන්තිය යටතේ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාලව වරිපනම් බදු පනවා අයකළ යුතු බවට, 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 28 දින, පවත්වනු ලැබූ මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව, තීරණ අංක 5.21 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

තව ද, 2026 වර්ෂය සඳහා වන සම්පූර්ණ වර්පනම් 2026 වර්ෂයේ ජනවාරි 31 දින හෝ එදිනට පෙර බොරලැස්ගමුව නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් 10% ක වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාල වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට මත්තෙන් බොරලැස්ගමුව නගර සභාවට ගෙවනු ලැබුව හොත් ඒ එක් එක් කාර්තුවේ වර්පනම් ප්‍රමාණයෙන් 5% ක වට්ටමක් ද බොරලැස්ගමුව නගර සභාව විසින් ගෙවනු ලබන බවත්, නියමිත වරිපනම් බද්ද නියමිත දිනයේදී බොරලැස්ගමුව නගර සභාව වෙත නොගෙවනු ලැබීමකදි වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය හැකි අතර එසේ වරෙන්තුවක් නිකුත් කිරීමකදී වරෙනුතු ගාස්තුවකට යටත් විය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ප්‍රදීප් නිශාන්ත වෙදමුල්ල,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 21 දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ අංක 160(1) වගන්තිය යටතේ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය තුල 2026 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම සඳහා,

බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපන්වල වාර්ෂික වටිනාකම ලෙස 2025 වර්ෂය සඳහා වූ තක්සේරුව/ සත්‍යෝක්ෂණය 2026 වර්ෂය සඳහා තක්සේරුව/ සත්‍යෝක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 255 අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 160 (1) වගන්තිය යටතේ බොරලැස්ගමුව නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියලුම ව්‍යාපාරික හා වාණිජමය ස්ථානවල තක්සේරු කර ඇති වාර්ෂික වටිනාකමින් 8% ක ප්‍රතිශතයක් හා අනෙකුත් සියලුම නිවාස හා තනාගෙන යන ගොඩනැගිලි, ඉඩම් හා කුඩා නිවාස පන්තිවලට වාර්ෂික වටිනාකමින් 6%ක ප්‍රතිශතයක් ද වරිපනම් බදු ලෙස පනවා අය කිරීමටත්,

තවද 2026 වර්ෂයේ පළමුවැනි, දෙවැනි, තෙවැනි සහ සිවුවැනි කාර්තුවල වරිපනම් බදු පිළිවෙලින් 2026 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් බෝරලැස්ගමුව නගර සභාව වෙත ගෙවීමට විධාන කිරීමටත් බොරලැස්ගමුව නගර සභාව යෝජනා කරන්නීය.

12 - 17/10

බොරලැස්ගමුව නගර සභාව

2026 වර්ෂයට අදාළව සේවා සඳහා ගාස්තු පැනවීම

255 අධිකාරය 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයට අදාළව සේවා සඳහා ගාස්තු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුත බවට, 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 28 දින, පවත්වනු ලැබූ මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව, තීරණ අංක 5.22 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ප්‍රදීප් නිශාන්ත වෙදමුල්ල,
සභාපති,
බොරලැස්ගමුව නගර සභාව.

2025 ක් වූ නොවැම්බර් මස 21 දින,
බොරලැස්ගමුව නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

255 අධිකාරය 1939 අංක 61 නගර සභා ආඥාපනතේ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයට අදාළව සේවා සඳහා ගාස්තු පැනවීම.

ගලි බවුසරය

3-1. 2026 වරෂයට අදාලව සේවා සඳහා ගාස්තු පැනවීම

ඒ අනුව, ගලි බවුසරයේ සේවාව ලබා දීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු අය කරනු ලැබේ.

අනු. අංකය		2026 වර්ෂයේ මිල ගණන් රු. ශත	
01	**ගලි බවුසරය**		
	ආගමික ස්ථාන, රජයේ ආයතන, රජයේ පාසල්, ළමා නිවාස හා වැඩිහිටි නිවාස සඳහා	මුදල	1,500.00
		බහලුම් ගාස්තු	1,950.00
	VAT 18%		351.00
		ඉන්ධන	500.00
		එකතුව	4,301.00
02	ගලි බවුසරය	මුදල	4,000.000
	බල ප්‍රදේශය තුළ - නේවාසික	බහලුම් ගාස්තු	1,950.00
			351.00
	VAT 18%	ඉන්ධන	200.00
		එකතුව	6,501.00
03	බල ප්‍රදේශයෙන් පිටත -නේවාසික	මුදල	8,500.00
		බහලුම් ගාස්තු	1,950.00
	VAT 18%		351.00
		ඉන්ධන	500.00
		එකතුව	11,301.00

අනු. අංකය		2026 වර්ෂයේ මිල ගණන් රු. ශත	
04	බල ප්‍රදේශය තුළ - කර්මාන්ත	මුදල	8,000.00
		බහලුම් ගාස්තු	1,950.00
	VAT 18%		351.00
		ඉන්ධන	500.00
		එකතුව	10,801.00
05	බල ප්‍රදේශයෙන් පිටත - කර්මාන්ත	මුදල	10,500.00
		බහලුම් ගාස්තු	1.950.00
	VAT 18%		351.00
		ඉන්ධන	500.00
		එකතුව	13,301.00
06	බල ප්‍රදේශය තුළ - ව්‍යාපාරික	මුදල	8,500.00
		බහලුම් ගාස්තු	1,950.00
	VAT 18%		351.00
		ඉන්ධන	500.00
		එකතුව	11,301.00
07	බල ප්‍රදේශයෙන් පිටත - ව්‍යාපාරික	මුදල	10,500.00
		බහලුම් ගාස්තු	1,950.00
	VAT 18%		351.00
		ඉන්ධන	500.00
		එකතුව	13,301.00

* ගලි සේවාව ලබාදීමේ දී බහාලුම් ගාස්තු සංශෝධනය වන සෑම අවස්ථාවකදී ම නගර සභාව විසින් අය කරනු ලබන ගාස්තුවල ද සංශෝධනයක් සිදු වේ.

* මෙයට ප්‍රවාහන ගාස්තු බල ප්‍රදේශයෙන් පිටත කි.මී. සඳහා රු. 100.00 බැගින් අය කරනු ලැබේ.

* පවත්නා ඉන්ධන මිල වෙනස්වීම මත බල ප්‍රදේශයෙන් පිටත ප්‍රවාහන ගාස්තු වෙනස් විය හැක.

3-2 2026 වර්ෂයට අදාලව ආදාහනය කිරීම හා භූමදානය කිරීම සඳහා ගාස්තු පැනවීම

ආදාහනය හා භූමදානය

ඒ අනුව, ආදාහනය කිරීම හා භූමදානය කිරීමේ සේවාව ලබා දීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු අය කරනු ලැබේ.

අනු. අංකය		2026 වර්ෂය සඳහා මිල ගණන් රු. ශත	
01.	ආදාහනාගාරය		
	බල ප්‍රදේශය තුළ		5,000.00
	බල ප්‍රදේශයෙන් පිටත		8,000.00
	සමෘද්ධිලාභීන්ට		3,500.00

අනු. අංකය		2026 වර්ෂය සඳහා මිල ගණන් රු. ශත	
02.	භූමදානය (වල කැපීම ඇතුලත්ව)		
	බල ප්‍රදේශය තුළ		8,000.00
	බල ප්‍රදේශයෙන් පිටත		10,000.00
	අඩු ආදායම් ලාභීන් හා සමෘද්ධිලාභීන්ට		6,000.00

3-3 බැකෝ යන්ත්‍රය

බැකෝ යන්ත්‍රයේ සේවාව ලබා දීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු අය කරනු ලබයි.

අනු අංකය		*2026 වර්ෂයේ මිල ගණන් රු. ශත*	
01	බැකෝ යන්ත්‍රය බල ප්‍රදේශය තුළ		
	පැය 1 1/2 ක කාල සීමාවකට	මුදල	10,000.00
		ඉන්ධන	500.00
		එකතුව	10,500.00
02	පැය 03ක කාල සීමාවකට	මුදල	17,500.00
		ඉන්ධන	500.00
		එකතුව	18,000.00
03	බැකෝ යන්ත්‍රය බල ප්‍රදේශයෙන් පිටත		
	පැය 03ක කාල සීමාවකට	මුදල	20,500.00
		ඉන්ධන	500.00
		එකතුව	21,000.00
04	බැකෝ යන්ත්‍රය බල ප්‍රදේශය තුළ හා බල ප්‍රදේශයෙන් පිටත වැඩිවන පැයකට ගාස්තුව ලෙස	මුදල	5,000.00
* මෙයට ප්‍රවාහන ගාස්තු බල ප්‍රදේශයෙන් පිටත කි.මී. සඳහා රු. 100.00 බැගින් අය කරනු ලැබේ. * පවත්නා ඉන්ධන මිල වෙනස් වීම මත බල ප්‍රදේශයෙන් පිටත ප්‍රවාහන ගාස්තු වෙනස් විය හැක.			

3-4, ප්‍රජා ශාලාව වෙන් කිරීම

ඒ, අනුව ප්‍රජා ශාලා වෙන් කිරීම ලබා දීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු අය කරනු ලබයි

අනු. අංකය	*ප්‍රජා ශාලා වෙන් කිරීම*	*2026 වර්ෂය සඳහා මිල ගණන් රු. ශත*
01.	දිනකට ප්‍රජා ශාලාව වෙන් කිරීම	1,000.00
	ජලය සහ විදුලිය සඳහා	500.00
	එකතුව	1,500.00

3-5, ක්‍රීඩා පිටටනිය වෙන් කිරීම

ඒ, අනුව ක්‍රීඩා පිටටනි වෙන් කිරීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු අය කරනු ලබයි

අනු. අංකය	*ක්‍රීඩා පිටටනි වෙන් කිරීම*	*2026 වර්ෂය සඳහා මිල ගණන් රු. ශත*
01.	දිනකට ක්‍රීඩා පිටටනිය වෙන් කිරීම	5,000.00

3-6, දිනකට බලරැස් ක්‍රීඩාංගනය වෙන් කිරීම

ඒ, අනුව බලරැස් ක්‍රීඩංගනය වෙන් කිරීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු අය කරනු ලබයි

අනු. අංකය	*බලරැස් ක්‍රීඩාංගනය*	*2026 වර්ෂය සඳහා මිල ගණන් රු. ශත*
01.	සැණකෙළි හා සංගීත සංදර්ශන නොවන (දිනකට)	10,000.00
02.	සැණකෙළි හා සංගීත සංදර්ශන සඳහා (දිනකට)	25,000.00

3-7, විථී රේඛා සඳහා අය කිරීම

ඒ, අනුව එක් විථී රේඛාවක්, නොපවරවාගැනීම්/ හිමිකම් සහතික හා වරිපනම් උදෘතයක් සඳහා අය කිරීම් වෙනුවෙන් පහත පරිදි ගාස්තු අය කරනු ලබයි

අනු. අංකය	*එක් විථී රේඛා, නොපරවා ගැනීම්, හිමි කම් සහතික හා වරිපනම් උදෘත ලබා දීම සඳහා අය කිරීම්*	*2026 වර්ෂය සඳහා මිල ගණන් රු. ශත*
01.	එක් විථී රේඛාවක් ලබා දීම සඳහා	570.00
02.	එක් නොපරවා ගැනීමක් හා හිමි කම් සහතිකයක් ලබා දීම සඳහා	570.00
03.	එක් වරිපනම් උදෘතයක් ලබා දීම සඳහා	280.00
04.	වරිපනම් නාම සංශෝධන අයදුම් පත්‍රය	500.00

3-8, ගොඩනැගිලි / බිම් කට්ටි අයදුම් පත්‍රයක් ලබා දීම සඳහා අය කිරීම්

ඒ, අනුව එක් ගොඩනැගිලි/ බිම් කට්ටි අයදුම් පත්‍රයක් ලබා දීම සඳහා අය කිරීම වෙනුවෙන් පහත පරිදි ගාස්තු අය කරනු ලබයි

අනු. අංකය	*ගොඩනැගිලි/ බිම් කට්ටි අයදුම් පත්‍රයක් ලබා දීම සඳහා අය කිරීම*	*2026 වර්ෂය සඳහා මිල ගණන් රු. ශත*
01.	එක් ගොඩනැගිලි අයදුම් පත්‍රයක් ලබා දීම සඳහා	1,000.00
02.	එක් බිම් කට්ටි අයදුම් පත්‍රයක් ලබා දීම සඳහා	1,000.00

තවලම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2025.11.04 පැවති මාසික මහ සභා රැස්වීමේදී සභා තීරණ අංක 7/1/(i) යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. දේශාන් මධුසංක,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 17 දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වගන්තියේ (1) උපවගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ I තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2026 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II තීරයේ නිරූපිත යම් සීමාවන් ඇතුළත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි තවලම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන්නීය.

ඒ අනුව වවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙළඳ බලපත්‍ර ලබාගත යුත ව්‍යාපාර /කාර්මාන්ත සඳහා 2026 වර්ෂය සඳහා පනවන ලද වෙළඳ බලපත්‍ර ගාස්තු 2026.04.01 දින හෝ ඊට ප්‍රථම ගෙවා බලපත්‍රය ලබා ගන්නා ලෙස වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

I තීරය		*II තීරය*		
කර්මාන්තය		*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 0 දක්වා	*රු. 750 0 ට වැඩි එහෙත් රු. 1,500 0 ට නොවැඩි*	*රු. 1,500 0 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	ලැහුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	හෝටල්	500 0	750 0	1,000 0
3.	බත් කඩ ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ	500 0	750 0	1,000 0
4.	බේකරි	500 0	750 0	1,000 0
5.	කිරි පට්ටි හා කිරි වෙළෙඳාම	500 0	750 0	1,000 0
6.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
7.	මස් විකිණීම	500 0	750 0	1,000 0
8.	අයිස් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
9.	සිසිල් බීම කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
10.	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
11.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
12.	ගවගාල්	500 0	750 0	1,000 0
13.	ඝාතක මඩු	500 0	750 0	1,000 0
14.	කොණ්ඩා සැකසීමේ සැලුන් සහ බාබර් සාප්පු	500 0	750 0	1,000 0
15.	කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
16.	අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන	500 0	750 0	1,000 0
17.	ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම	500 0	750 0	1,000 0

සැ. යු.- සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල්, ආපනශාලා සහ ලැහුම්හල් පෙර වර්ෂයේ ලැබීම්වලින් 1% ක බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු ය.

I කීරය කර්මාන්තය	*II කීරය* පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම		
	රු. 750 0 දක්වා	*රු. 750 0 ට වැඩි එහෙත් රු. 1,500 0 ට නොවැඩි*	*රු. 1,500 0 ට වැඩි*
57.	බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
58.	විදුලි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
59.	පොහොර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
60.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
61.	දුම්කොළ වියලීම	500 0	750 0	1,000 0
62.	සත්ත්ව ආහාර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
63.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
64.	පළතුරු බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
65.	රසකැවිලි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
66.	දේශීය ඖෂධ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
67.	පිරිපහදු ජලය නිෂ්පාදනය	500 0	750 0	1,000 0
68.	වාහන ස්ටිකර් ගැසීම	500 0	750 0	1,000 0

12 - 31/2

කැකිරාව ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට ව්‍යාපාර බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 උපවගන්තියේ (1) උපවගන්තිය යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී තීරණ අංක 2025/200 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සිදත් වාමර බණ්ඩාර මුදියන්සේ,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 24 දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 උපවගන්තියේ (1) උපවගන්තිය යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කැකිරාව ප්‍රාදේශීය සභා බල

ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2026 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට තීරණය කරමි.

උපලේඛනය

I තීරුව	*II තීරුව*
බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලැබී ආදායම	*ගෙවිය යුතු බද්ද*
	රු. ශත
1. රු. 6000 0 නොඉක්ම වන අවස්ථාවක	අයකිරීමක් නැත
2. රු. 6001 0 ඉක්මවන එහෙත් රු. 12,000 0 නොඉක්මවන අවස්ථාවක	90 0
3. රු. 12,001 0 ඉක්මවන එහෙත් රු. 18,750 0 නොඉක්මවන අවස්ථාවක	180 0
4. රු. 18,751 0 ඉක්මවන එහෙත් රු. 75,000 0 නොඉක්මවන අවස්ථාවක	360 0
5. රු. 75,001 0 ඉක්මවන එහෙත් රු. 1,50,000 0 නොඉක්මවන අවස්ථාවක	1,200 0
6. රු. 1,50,001 0 ඉක්මවන අවස්ථාවක	3,000 0

12 - 31/3

කැකිරාව ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට වාහන හා සත්ව බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වගන්ති යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී තීරණ අංක 2025/201 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සිදත් වාමර බණ්ඩාර මුදියන්සේ,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 24 දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වගන්ති යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබාගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II තීරුවේ නිරූපිත බද්දක් 2026 වර්ෂය සඳහා අයකළ යුතු යැයි තීරණය කරමි.

උපලේඛනය

I තීරුව			*II තීරුව*
			රු. ශත
(1)	I.	මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
	II.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	18 0
		(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	

I තීරුව			*II තීරුව* *රු. ශත*
		(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් සේවා ගාස්තුව	4 0 96 0
	III.	සෑම කරත්තයක් සඳහා	20 0
	IV.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
	V.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
	VI.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
	VII.	සෑම ඇතෙකු සඳහා	50 0
(2)	විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.		
(3)	මෙම උපලේඛනයෙහි වෙළෙඳ කාර්යය යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.		

12 - 31/4

කැකිරාව ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වගන්තිය යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී තීරණ අංක 2025/202 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සිදත් වාමර බණ්ඩාර මුදියන්සේ,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 24 දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වගන්තියෙන් කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි දියුණු කළ ප්‍රදේශය තුළ පවතින සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම 2023 වර්ෂයේදී සිදු කරන ලද තක්සේරුව 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට 7.5 ක (7.5%) වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 161(7) (i, ii, iii) වගන්ති ප්‍රකාරව කටයුතු කිරීමටත්,

තව ද 2026, වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද කැකිරාව ප්‍රාදේශීය සභා අරමුදල ගෙවිය යුතු බවටත් එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2026 වර්ෂයෙහි ජනවාරි මස 31 දිනට හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ III වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල කැකිරාව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5% ක වට්ටමක් කැකිරාව ප්‍රාදේශීය සභාව විසින් ලබාදෙන බවට තීරණය කරමි..

උපලේඛනය

I තීරුව	*II තීරුව*	*III තීරුව*
කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5 %වට්ටම සඳහා හිමිකම් ලබන අවසන් දිනය*
පළමුවන කාර්තුව	2026.01.31 දින හෝ ඊට පෙර	2026.01.31 දින
දෙවන කාර්තුව	2026.04.30 දින හෝ ඊට පෙර	2026.04.30 දින
තෙවන කාර්තුව	2026.07.31 දින හෝ ඊට පෙර	2026.07.31 දින
හතර කාර්තුව	2026.10.31 දින හෝ ඊට පෙර	2026.10.31 දින

12 - 31/05

කැකිරාව ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) ඊ වගන්තිය ප්‍රකාරව හා 2017.06.07 දිනැති අංක 2022/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උතුරුමැද පළාතේ, පළාත් සභාවේ, පළාත් පාලන අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමා විසින් අනුමත කර ප්‍රකාශයට පත්කොට ඇති පළාත් සභාවේ ස්ථිරත්වය නිවේදනය කිරීම මැයෙන් යුත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2025 සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී තීරණ අංක 2025/203 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සිදත් වාමර බණ්ඩාර මුදියන්සේ,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 24 දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) ඊ වගන්තිය ප්‍රකාරව හා 2017.06.07 දිනැති අංක 2022/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උතුරුමැද පළාතේ, පළාත් සභාවේ, පළාත් පාලන අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමා විසින් අනුමත කර ප්‍රකාශයට පත්කොට ඇති පළාත් සභාවේ ස්ථිරත්වය නිවේදනය කිරීම මැයෙන් යුත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව කැකිරාව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් විදියකට, පාරකට, ඇලකට, දොළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි වර්ග අඩි 01 කට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ ගාස්තු 2026 වර්ෂයට, අය කළ යුතු යැයි තීරණය කරමි.

	විස්තරය	*එක් වර්ෂයකට හෝ එක් මාසයකට හෝ ඉන් කොටසකට ගාස්තුව රු. ශ.*
1.	බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක ආධාරයෙන් ප්‍රදර්ශනය කරවා ඇති ස්ථිර (එක් පැත්තක) ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩි 1 ට	100 0
2.	බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරවා ඇති ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම	150 0
3.	සෑම වර්ගයකම ප්‍රචාරක බැනරයක් සඳහා වර්ග අඩියකට (බැනර්/කටවුට්)	50 0

12 - 31/6

කැකිරාව ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට ඉඩම් විකිණීම මත බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2025 සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී තීරණ අංක 2025/204 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සිදත් වාමර බණ්ඩාර මුදියන්සේ,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 24 දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි වගන්තියට අනුව කැකිරාව ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කාරයෙකු ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියකින් හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන වන බද්දක් විකුණුම්කරු හෝ ඒ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ නියෝජිතයා විසින් කැකිරාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කරමි.

12 - 31/7

කැකිරාව ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට සුසාන භූමි ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය හා (231 වැනි අධිකාරය) සුසාන භූමි ආඥාපනතේ 03 වගන්තිය හා 17 සිට 20 වගන්ති අනුව එම කාර්යයන් සඳහා එකී ආඥාපනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2025 සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී තීරණ අංක 2025/205 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සිදත් වාමර බණ්ඩාර මුදියන්සේ,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 24 වැනි දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය හා (231 අධිකාරය) සුසාන භූමි ආඥාපනතේ 03 වැනි වගන්තිය හා 17 සිට 2 වගන්ති අනුව එම කාර්යයන් සඳහා එකී ආඥාපනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සුසාන භූමි තුළ ස්මාරක ඉදිකිරීම සඳහා පහත සඳහන් ආකාරයට ගාස්තු 2026 ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා ලිත් වර්ෂය තුළ පනවා අයකිරීමට තීරණය කරමි.

	රු. ශත
භූමදානය සඳහා - වර්ග අඩියකට	25 0
වල බැඳීම සඳහා - වර්ග අඩියකට	50 0
ස්මාරකයක් ඉදිකිරීම	500 0

මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා :

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ	23,500 0
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිට	25,500 0

12 - 31/8

කැකිරාව ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය - අයාලේ යන ගවයින් අල්ලා ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 (i, ii, iii හා iv) වන වගන්ති යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2025 සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී තීරණ අංක 2025/206 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සිදත් වාමර බණ්ඩාර මුදියන්සේ,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 24 දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 (i, ii, iii හා iv) වන වගන්තිය අනුව අයාලේ යන ගවයින් අල්ලා ගැනීම නීත්‍යානුකූල වන බැවින්, ඒ සඳහා පහත පරිදි ගාස්තු 2026 වර්ෂයට අයකිරීමට තීරණය කරමි.

		රු. ශත
1.	එක් ගවයෙක් අල්ලා ප්‍රවාහනය කිරීම සඳහා	2,500 0
2.	එකී කම්කරුවන් සඳහා	1,000 0
3.	දිනකට නඩත්තු වියදම	700 0
	මුළු එකතුව	4,200 0

12 - 31/9

කැකිරාව ප්‍රාදේශීය සභාව

මිනින්දෝරු ගාස්තු අයකිරීම, පෙරසැරි ගාස්තු අයකිරීම - 2026 වර්ෂය

නිවාස හා නගර සංවර්ධන අඥාපනතේ (268 අධිකාරය) අංක 19 හා 20 අනුව කැකිරාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2025 සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී තීරණ අංක 2025/207 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සිදත් වාමර බණ්ඩාර මුදියන්සේ,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 24 දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

නිවාස හා නගර සංවර්ධන අඥාපනතේ (268 අධිකාරය) අංක 19 හා 20 අනුව කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ මිනින්දෝරු සැලැස්මක් මගින් කොටස් කරනු ලබන විට ඒ සෑම ඉඩමක් සඳහාම මිනින්දෝරු සැලැස්මක් ප්‍රාදේශීය සභාවෙන් අනුමත කරවා ගත යුතු අතර, ඒ සඳහා ඉඩම්වල තක්සේරු වටිනාකමෙන් 1% ක් බදු වශයෙන් ද, 0.5% පෙරසැරි ගාස්තු වශයෙන් ද අය කිරීමට තීරණය කරමි.

රු. ශත

1.	වීථිරේඛා සහතික නිකුත් කිරීමේ බලපත්‍ර ගාස්තුව	1,500 0
	වීථිරේඛා සහතික නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තුව	1,000 0
2.	ඉඩම් අනු බෙදුම් අනුමත කිරීමේ පරීක්ෂණ ගාස්තුව	2,000 0
	ඉඩම් අනුබෙදුම් අනුමත කිරීමේ ගාස්තුව	1,500 0
3.	මිනින්දෝරු සැලසුම් අනුමත කිරීමේ පරීක්ෂණ ගාස්තු	2,500 0
	මිනින්දෝරු සැලසුම් අනුමත කිරීමේ ගාස්තුව	1,000 0
	මිනින්දෝරු අයදුම්පත්‍ර ගාස්තු (UD)	500 0
4.	ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම - ගාස්තු (අය කිරීම වර්ග මීටර් ප්‍රමාණය අනුව ඵ	

ගෙබිමේ විශාලත්වය වර්ග මීටර් වලින්	*පදිංචිය සඳහා රු. ශ.*	*වාණිජ හෝ වෙනත් භාවිත රු. ශ.*	*පරීක්ෂණ ගාස්තු වාණිජ/ නේවාසික රු. ශ.*
45ට අඩු	2000 0	3000 0	3000 0
45-90	3000 0	4500 0	4500 0
91-180	4000 0	6000 0	6000 0
181-270	5000 0	7500 0	7500 0
271-450	6000 0	9000 0	9000 0
451-675	7000 0	10,500 0	10,500 0
676-900	8000 0	12,000 0	12,000 0
901-1225	9000 0	13,500 0	13,500 0
1225ට වැඩි	10,000 0		
	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 3,000 බැගින්	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 4,000 බැගින්	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 4,000 බැගින්

I.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව	රු.	500 0
5.	අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තුව	රු.	2,000 0
	අනුකූලතා සහතික ඉල්ලුම්පත්‍ර ගාස්තුව (UD)	රු.	500 0
	අනුකූලතා සහතික නිකුත් කිරීමේ පරීක්ෂණ ගාස්තුව	රු.	4,000 0

12 - 31/10

කැකිරාව ප්‍රාදේශීය සභාව

වෙනත් ගාස්තු අය කිරීම - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108 හා 109 වගන්ති යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2025 සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී තීරණ අංක 2025/208 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සිදත් වාමර බණ්ඩාර මුදියන්සේ,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 24 දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108 හා 109 වන වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 2026 වර්ෂය සඳහා වෙනත් ගාස්තු හා සේවා සඳහා පහත උපලේඛනය ආකාරයට පනවා අය කළ යුතු බවට තීරණ කරමි.

උපලේඛනය

	කාරණය	*2026 වර්ෂයේ ගෙවිය යුතු මුදල රු. ශත*
1.	ක්‍රීඩාංගනය වෙන් කිරීම දිනකට (තැන්පත් මුදල රු. 15,000.00) විදුලිය සඳහා (තැන්පත් මුදල රු. 10,000.00) වෙළඳ සැණකෙළි සඳහා තැන්පත් මුදල දිනකට රු. 20,000.00)	20,000 0
2.	නගර ශාලාව කුළියට දීම - දිනකට (නාට්‍ය හා සිනමා සංදර්ශන) (වෙනත් අලෙවි ප්‍රවර්ධන) විදුලිය සහ ජලය සඳහා තැන්පත් මුදල දින ගණන අනුව අය කෙරේ.	15,000 0
3.	නගර ශාලාව කුළියට දීම - දිනකට (රැස්වීම් වැඩමුළු සඳහා) විදුලිය සහ ජලය සඳහා තැන්පත් මුදල දින ගණන අනුව අය කෙරේ.	10,000 0
4.	ලොරි බවුසරය කුලියට දීම දිනකට (ඉන්ධන සහිතව, ජලය රහිතව)	
	දිනකට (උපරිම දුර කි. මී. 100	20,000 0
	දින භාගයක් සඳහා (උපරිම දුර කි. මී. 50	12,000 0
	ජල බවුසර් එකක් සඳහා (උපරිම දුර 20 කි. මී.)	4,000 0
	අමතර 1 කි. මී. සඳහා	330 0
5.	ට්‍රැක්ටර් ජල බවුසරය කුළියට දීම දිනකට 4500 - 5000 බකට (ඉන්ධන සහිතව, ජලය රහිතව)	
	දිනකට	12,500 0
	දින භාගයක් සඳහා	6,000 0
	ජල බවුසර් එකක් සඳහා	2,500 0
	අමතර කි. මී. 01ක් සඳහා	330 0
6.	තණකොළ කපන යන්ත්‍රය කුලියට ලබා දීම. දිනකට (ඉන්ධන සහිතව ප්‍රවාහනය වන මීටර් පැය සඳහා ගෙවිය යුතු ය.)	
	ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පාසල් සඳහා පැයකට	2,500 0
	ප්‍රදේශයෙන් පිටත පාසල් සඳහා පැයකට	2,500 0
	බල ප්‍රදේශයෙන් පිටත වෙනත් ස්ථාන සඳහා පැයකට	5,000 0
	බල ප්‍රදේශයේ වෙනත් ස්ථාන සඳහා පැයකට	4,000 0
7.	ට්‍රැක්ටරය කුලියට දීම දිනකට (ඝන අඩි 75 ට්‍රෙලරය සමග)	
	දිනක් සඳහා කුළිය	12,000 0
	දින භාගයක් සඳහා කුළිය	7,000 0
	ට්‍රැක්ටරයෙන් කසල බැහැර කිරීම (එක් ගමන් වාරයකට)	4,500 0
8.	ජෙනරේටරය කුළියට දීම 5 KW (ඉන්ධන හා ප්‍රවාහනය සපයා ගත යුතු ය. (දිනකට)	5,000 0
9.	මෝටර් ග්‍රේඩරය කුලියට දීම මීටර් පැයකට (ඉන්ධන සහිතව ප්‍රවාහනය වන මීටර් පැය සඳහා ද ගෙවිය යුතු ය.)	10,500 0

	කාරණය	*2026 වර්ෂයේ ගෙවිය යුතු මුදල රු. ශත*
10.	බැකෝ ලෝඩරය කුළියට ලබා දීම මීටර් පැයකට (ඉන්ධන සහිතව ප්‍රවාහනය වන මීටර් පැය සඳහා ද ගෙවිය යුතු ය.) අශ්ව බල 70 - 76 ඉදිරි කුල්ල $1m^3$, පසු පස කුල්ල $0.8m^3$	7,500 0
11.	ටිපර් රථය කුළියට දීම (ඉන්ධන සහිතව) කි. මී. 1කට	300 0
12.	ගල් රෝල (ප්‍රකම්පන යන්ත්‍රය) කුළියට දීම (ප්‍රවාහන ඉල්ලුම්කරු විසින් සපයා ගත යුතු ය.) ටොන් 8 - 1	8,300 0
13.	ප්‍රකම්පන රෝල ප්‍රවාහනය ප්‍රාදේශීය සභාවෙන් ලබා ගන්නේ නම් කි. මී. 10 යන තෙක් යාමට සහ ඒමට බල ප්‍රදේශය තුළ වැඩිවන සෑම කි. මී. 1 ක් සඳහා	5,000 0 330 0
14.	කුඩා ගල් රෝල කුලියට දීම. ටොන් 01 (ඉන්ධන හා ප්‍රවාහනය ඉල්ලුම්කරු විසින් සපයා ගත යුතු ය.) දිනක් සඳහා කුළිය දින භාගක් සඳහා කුළිය	 8,000 0 5,000 0
15.	කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය කුළියට දීම. දිනකට (ප්‍රවාහනය හා ඉන්ධන ඉල්ලුම්කරු විසින් සපයා ගත යුතු ය.)	7,500 0
16.	ගලි බවුසරය කුළියට දීම. (ඉන්ධන සහිතව බැහැර කිරීමේ ස්ථානය ඉල්ලුම්කරු විසින් සපයා ගත යුතු යි.) (එක් ගලියක් සඳහා) (ප්‍රවාහනය සඳහා සෑම කි. මී. 1ක් සඳහා ම රු. 200 බැගින් ගෙවිය යුතු ය)	7,500 0
17.	කොඩි කණු කුළියට දීම (එක් කණුවක් සඳහා)	150 0
18.	මහවැව කුඹුක්වැව ජල ව්‍යාපෘතියේ ජල සැපයුම් ගාස්තු ලීටර් 1 ක් සඳහා	3 0
19.	පරිසර බලපත්‍ර ගාස්තුව	4,000 0
	පරිසර අයදුම්පත්‍ර ගාස්තුව (1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අනුව)	500 0
	පරිසර බලපත්‍ර සඳහා මුද්දර ගාස්තුව	400 0
	පරිසර බලපත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තුව	
	රු. 250,000 හෝ ඊට අඩු	3,000 0
	රු. 250,000 - 500,000	3,750 0
	රු. 500,000 - 1,000,000	5,000 0
	රු. 1,000,000 ට වැඩි	10,000 0
20.	වරිපනම් ලේඛනයේ නාමය වෙනස් කිරීමේ ගාස්තුව වරිපනම් ලේඛනයේ නාමය වෙනස් කිරීමේ අයදුම්පත් ගාස්තු	500 0 100 0
21.	ආකෘති පත්‍ර ගාස්තුව (කර්මාන්ත) (එක් පිටපතක් රු. 70) කර්මාන්ත සඳහා ගිවිසුම් ගාස්තු	210 0 500 0
22.	අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා (එක් දිනකට) පොදු වෙළඳපොල භූමිය කුලියට දීම (එක් දිනකට) රථගාල භූමිය කුලියට දීම (එක් දිනකට)	2,000 0 7,500 0 7,500 0

	කාරණය	*2026 වර්ෂයේ ගෙවිය යුතු මුදල රු. ශත*
23.	පුස්තකාල සාමාජික ගාස්තු පුස්තකාල අයදුම් පත්‍ර ගාස්තු පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු පොත් භාර දීමේ ප්‍රමාද ගාස්තු (දිනකට)	150 0 25 0 100 0 2 0
24.	නැණසල පාඨමාලා ගාස්තු නැණසල අයදුම්පත්‍ර ගාස්තු	6,000 0 250 0
25.	**මාර්ගය පළුදු කිරීමේ /සිදුරු කිරීමේ ගාස්තු** බොරළු මාර්ග සඳහා කැටගල් හා කොන්ක්‍රීට් මාර්ග සඳහා තාර හා කාපට් මාර්ග සඳහා	 1,500 0 4,000 0 6,000 0
26.	**පදික වේදිකා බදු** කැකිරාව නගරයේ සහ උප නගරවල පදික වේදිකා බදු දිනකට (උත්සව සමය) දිනකට අනෙකුත් දිනවලදී දිනකට	 250 0 100 0
27.	**දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත් කිරීම සඳහා ගාස්තු**	
	පර්වස් 40 දක්වා	3,000 0
	පර්වස් 80 දක්වා නේවාසික	3,500 0
	පර්වස් 160 දක්වා	4,000 0
	පර්වස් 160 ට වැඩිවන එක් පර්වස් 01ක් සඳහා	10,000 0
	පර්වස් 40 දක්වා	3,000 0
	පර්වස් 80 දක්වා කෘෂිකාර්මික	4,000 0
	පර්වස් 160 දක්වා	5,000 0
	පර්වස් 160 ට වැඩිවන එක් පර්වස් 01ක් සඳහා	10,000 0
	පර්වස් 40 දක්වා	4,000 0
	පර්වස් 80 දක්වා වාණිජ	4,500 0
	පර්වස් 160 දක්වා	5,000 0
	පර්වස් 160 ට වැඩිවන එක් පර්වස් 01ක් සඳහා	10,000 0
28.	බොරළු ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය සභාව සතු මාර්ග භාවිතා කිරීම වෙනුවෙන් ගාස්තු අයකිරීම කි.මී.01ක් සඳහා බොරළු කියුබ් 01ක් සඳහා මාර්ග භාවිතා කිරීමට තැන්පතු මුදල් කාපට් සඳහා මාර්ග භාවිතා කිරීමට තැන්පතු මුදල බොරළු සඳහා මාර්ග භාවිතා කිරීමට තැන්පතු මුදල කොන්ක්‍රීට්/කුට්ටිගල් සඳහා මාර්ග භාවිතා කිරීමට තැන්පතු මුදල තාර සඳහා (කි.මී. 01ක් සඳහා)	 50 0 100,000 0 50,000 0 75,000 0 60,000 0

කැකිරාව ප්‍රාදේශීය සභාව

විනෝද බදු අය කිරීම - 2026 වර්ෂය

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 02 වන වගන්තියේ I උප වගන්තිය යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2025 සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී තීරණ අංක 2025/209 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සිදත් වාමර බණ්ඩාර මුදියන්සේ,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 24 දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනතේ 02 වැනි වගන්තියේ I උප වගන්තිය ප්‍රකාරව මුදල් උපයන විනෝද කටයුතු වශයෙන් ගැනෙන චිත්‍රපට දර්ශනයන්, සර්කස් සංදර්ශනයන් හා සෑම සංගීත ප්‍රසංගයක් සඳහා ම නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර වටිනාකමින් 12% ක විනෝද බද්දක් ද සිනමා ශාලාවල ප්‍රදර්ශනය කරනු ලබන චිත්‍රපට සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 8% ක විනෝද බද්දක් ද 2026 වර්ෂය සඳහා අයකළ යුතු බවට තීරණය කරමි.

12 - 31/12

කැකිරාව ප්‍රාදේශීය සභාව

සතිපොළ ගාස්තු අයකිරීම - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 සහ 126 (XII) වගන්ති යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2025 සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ දී තීරණ අංක 2025/208 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සිදත් වාමර බණ්ඩාර මුදියන්සේ,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 24 දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 සහ 126 (XII) වන වගන්ති යටතේ මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2026 වර්ෂය තුළ සතිපොළ සඳහා දිනකට පහත සඳහන් ගාස්තුවක් අයකළ යුතු බවට මා විසින් තීරණය කරමි.

අනු. අංකය	*විස්තරය*	*රු.ශත*
1.	එළවළු වෙළඳාම	250 0
2.	සිල්ලර වෙළඳාම	300 0
3.	නිමි ඇඳුම් අලෙවිය	400 0
4.	විසිතුරු බඩු, මනි බඩු අලෙවිය	300 0
5.	සාප්පු බඩු අලෙවිය	300 0
6.	පළතුරු අලෙවිය	300 0

අනු. අංකය	*විස්තරය*	*රු.ශත*
7.	ප්ලාස්ටික් භාණ්ඩ අලෙවිය	400 0
8.	බුලත් පුවක් අලෙවිය	200 0
9.	මුහුදු මාළු විකිණීම	2,000 0
10.	වැව් මාළු විකිණීම	500 0
11.	ඌරු මස් අලෙවිය	1,000 0
12.	රැස්වීමක් සඳහා සතිපොල භූමිය	4,000 0
13.	වෙනත් උත්සව සඳහා දිනකට	5,000 0

12 - 31/13

කැකිරාව ප්‍රාදේශීය සභාව

කසල ගාස්තු අයකිරීම - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව, 1988.08.23 දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ගැසට් පත්‍රය හා IV (ආ) පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ගරු පළාත් පාලන නිවාස ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 9 අතුරු ව්‍යවස්ථාවට අනුව කැකිරාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2025 සැප්තැම්බර් මස 24 දින පවත්වන ලද කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක 2025/211 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සිදත් වාමර බණ්ඩාර මුදියන්සේ,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 24 දින,
කැකිරාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව, 1988.08.23 දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ගැසට් පත්‍රය හා 4(ආ) පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ගරු පළාත් පාලන නිවාස ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 9 අතුරු ව්‍යවස්ථාවට අනුව, 2026 වර්ෂයට පහත පරිදි කසල ගාස්තු අයකළ යුතු බවට මා විසින් තීරණය කරමි.

අනු. අංකය	*විස්තරය*	*රු.ශත*
1.	කැකිරාව සහ හබරණ නගර සීමාවන් ඇතුළත පිහිටි වෙළඳසල්වලින් මසකට	500 0
2.	මරදන්කඩවල, මඩාටුගම, ගනේවැල්පොල, පලුගස්වැව, කිතුල්හිටියාව යන අනෙකුත් උප නගරවල පිහිටි වෙළඳසල්වලින් මසකට	300 0
3.	කර්මාන්තශාලා, අනෙකුත් උපකාරක පන්ති නගර සීමාවන් තුළ (මසකට - වාර 04ක් සඳහා) කැකිරාව නගර සීමාවෙන් පරිභාහිරව	14,000 0 20,000 0
4.	**හෝටල්** කැකිරාව නගර සීමාවේ මසකට හබරණ නගර සීමාවේ සංචාරක හෝටල් සඳහා	 2,000 0 2,000 0 10,000 0

12 - 31/14

මාතර ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම - 2026 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 05 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මුති අංක 05:29 යටතේ වරිපනම් බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුගත් වෙංගප්පුලි,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 05 දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ පිහිටි සියලුම නිවෙස්වල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2023 වර්ෂයේ සිදු කරන ලද නව වාර්ෂික වටිනාකම හා ඉන්පසුව පිළිගෙන කරන ලද සංශෝධනද සමග එකී තක්සේරු වටිනාකම 2026 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්, එම නව වාර්ෂික වටිනාකම 2026.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමටත්,

(ආ) එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) හා (2) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සමස්ථ දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකම්න් සියයට නවයක (9%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අයකිරීමටත්,

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (6) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යටෝක්ත වරිපනම් බද්ද 2026 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු 04 තුළ දී සමාන වාරික ඉතරකින් ප්‍රාදේශීය සභාව වෙත ගෙවන ලෙසට බද්දට යටත්වන සෑම තැනැත්තකුට ම නියම කිරීමටත්,

(ඉ) එකී පනතේ 134 (7) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම වාර්ෂිකව අයකරනු ලබන වරිපනම් බද්ද 2025 වර්ෂයේ ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම සම්පූර්ණයෙන් ගෙවන්නේ නම් බද්දේ ප්‍රමාණයෙන් 10% වට්ටම් මුදලක් ද, මුදල් කාර්තු වශයෙන් ගෙවන්නේ නම් කාර්තුවේ පළමු මාසය තුළ ගෙවන්නන් හට ගෙවන මුදලින් 5% ක වට්ටම් මුදලක් ද ලබා දීමටත්,

ඉහත සඳහන් පරිදි නියමිත දිනට පසුව ගෙවීම් කරන ගාස්තු මත හිස්බිම් හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 15%ක වරෙන්තු ගාස්තුවක් අය කිරීමටත්,

(ඊ) තව ද, නියමිත දිනට පෙර වරිපනම් මුදල් නොගෙවුවහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තියේ විධිවිධාන අනුව දේපළ තහනමට ගෙන විකිණීමෙන් එකී වරිපනම් බදු මුදල් අයකර ගැනීමට ද මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 30/1

මාතර ප්‍රාදේශීය සභාව

අක්කර බදු පැනවීම - 2026 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 05 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මුති අංක 05:30 යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුගත් වෙංගප්පුලි,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 05 දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 146 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම 2025 වර්ෂයේ දී බලාත්මක වූ සත්‍යාක්ෂණය 2026 වර්ෂයේ සත්‍යාක්ෂණය ලෙස පිළිගැනීමටත්,

(ආ) 134 වගන්තියේ (3) උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව එහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1989-03-10 දිනැති *ගැසට් පත්‍රයේ* iv (ආ) කොටස යටතේ අක්කර බද්ද නියම කිරීම හා අය කිරීමේ කාර්ය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශයේ හෙක්ටයාර් 05 ට අඩු නමුත් හෙක්ටයාර් 01 ට නොඅඩු ඉඩමක් සඳහා 2026 වර්ෂය සඳහා රු. 50.00 බැගින් ද, හෙක්ටයාර් 05 ක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත 2026 වර්ෂය සඳහා රු. 10.00 බැගින් වන අනුප්‍රමාණ වාර්ෂික බද්දක් අය කළ යුතු බවත්,

(ඇ) 134 වගන්තියේ (6) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත බද්ද 2026 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු 04 තුළ දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස ද බද්දට යටත් වන සෑම තැනැත්තකුට ම විධානය කිරීමටත්,

(ඈ) එකී පනතේ 134(7) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2025 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයෙන් අවසන් දිනයට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ලබා දීමටත්,

ඉහත සඳහන් පරිදි නියමිත දිනට පසුව ගෙවීම් කරන ගාස්තු මත 15% ක වරෙන්තු ගාස්තුවක් නියම කිරීමටත්,

(ඊ) තව ද, නියමිත දිනට පෙර අක්කර බදු මුදල් නොගෙවුවහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තියේ විධිවිධාන අනුව දේපළ තහනමට ගෙන විකිණීමෙන් එකී අක්කර බදු මුදල් අයකර ගැනීමටත් මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 30/2

මාතර ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බදු පැනවීම - 2026 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 05 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මුති අංක 05:31 යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුගත් වෙංගප්පුලි,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 05 දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2026 වර්ෂය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (3) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බද්දට යටත්වන සෑම තැනැත්තකු විසින්ම යටෝක්ත බද්ද මාතර ප්‍රාදේශීය සභාව වෙත 20265.06.30 දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි ද,

(ඇ) නියමිත දිනට බදු මුදල් ගෙවීම පැහැර හරින අයට එරෙහිව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(4) වගන්තිය ප්‍රකාරව අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන අයකර ගැනීමට ද මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I තීරුව		*II තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තය හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත*
01.	සපත්තු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
02.	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
03.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
05.	තිර රෙදි, මදුරුදැල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
06.	පිහන් බඩු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
07.	හැලි වළං නිෂ්පාදනය	500 0	750 0	1,000 0
08.	ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09.	සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0

I තීරුව		*II තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තය හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු.750.00 ඉක්මවන එහෙත් රු.1,500.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත*
10.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ඩිජිටල් තාක්ෂණයේ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	බීරළු කැටයම් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14.	ඉදල්, පාපිසි, කොසු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම	500 0	750 0	1,000 0
15.	මැණික් කැපීම හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	පොල්කටු අඟුරු නිෂ්පාදනය හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
17.	සත්ත්ව ආහාර නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
19.	විනාකිරි නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ කල් තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	උම්බලකඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
22.	රබර් නිෂ්පාදනය හෝ රබර් රොටි තබා ගැනීම	500 0	750 0	1,000 0
23.	කරවල ලුණු මාළු හෝ ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
24.	දුම්කොළ වියලීම	500 0	750 0	1,000 0
25.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
26.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
27.	වඩු කර්මාන්ත වැඩපලක් පවත්වා ගෙන යාම	500 0	750 0	1,000 0
28.	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
29.	පොල් ලෙලි පෙහවීම (පල් කිරීම)	500 0	750 0	1,000 0
30.	පින්තාරු තීන්ත වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
31.	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
32.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
33.	ටයර් හා ටියුබ් වොල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
34.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
35.	උළු නිපදවීම	500 0	750 0	1,000 0
36.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0

I කිරුව		*II කිරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තය හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු.750.00 ඉක්මවන එහෙත් රු.1,500.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත*
37.	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
38.	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
39.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
40.	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
41.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
42.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
43.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
44.	මිරිස් තුනපහ ධාන්‍ය වර්ග ඇඹරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	නූඩ්ල්ස් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	පළතුරු බීම වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	යන්ත්‍රානුසාරයෙන් ගල් කැඩීම	500 0	750 0	1,000 0
49.	කිසියම් වර්ගයක යන්ත්‍ර පාවිච්චියට ගනු ලබන ලී ඉරන මෝලක් තිබීම	500 0	750 0	1,000 0
50.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	විදුලි කර්මාන්ත වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	සුරුට්ටු, බීඩි සෑදීම	500 0	750 0	1,000 0
53.	රෙදි ඩයි දැමීම හෝ ඩ්‍රයික්ලීන් හෝ රෙදි මැදීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	රබර් නිෂ්පාදනය හා රබර් රොටි සෑදීම	500 0	750 0	1,000 0
55.	ලෝහ ආශ්‍රිත නිෂ්පාදන වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	යකඩ හා වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
57.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
58.	එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
59.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
60.	මෙතිලේටඩ් ස්පිරිත්තු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
61.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0

I තීරුව		*II තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තය හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු.750.00 ඉක්මවන එහෙත් රු.1,500.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත*
62.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවත්වීම	500 0	750 0	1,000 0
63.	විසිරි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
64.	යන්ත්‍ර මාර්ගයෙන් කෙඳි වර්ග හෝ කොහු ලණු නිපදවීම	500 0	750 0	1,000 0
65.	ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	රෙදි මුද්‍රණය හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
67.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
68.	තෙල් හා සත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
69.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
70.	කෘමිනාශක, දිලීර නාශක, පැළැටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
71.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
72.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
73.	මෝර තෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
74.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
75.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
76.	මදුරු දහර නිපදවීම	500 0	750 0	1,000 0
77.	හඳුන්කූරු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
78.	එළවළු, පළතුරු වියලීම හා ඇසිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	ගීත පටිගත කිරීමේ හා වීඩියෝ කැසට් විකිණීම හෝ බදු දීම	500 0	750 0	1,000 0
80.	බිම්මල් (හතු) නිෂ්පාදනය	500 0	750 0	1,000 0
81.	පූජා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	පැකට් කළ බීම වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
83.	ඇන්ටනා නිෂ්පාදනය	500 0	750 0	1,000 0
84.	බතික් කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85	කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

මාතර ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2026 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 05 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මුති අංක 05:32 යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුගත් වෙංගප්පුලි,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 05 දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු 147 වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද 1988.08.23 වැනි දින අංක 520/7 දරන අති විශෙෂ *ගැසට් පත්‍රය* මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2008.12.05 දිනැති අංක 1579 දරන *ගැසට් පත්‍රය* මගින් මාතර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා නියමයන් අනුව මෙහි පහත උපලේඛනයෙහි I තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2025 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂයට පනවා අය කිරීමටත්,

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත අනුව සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයක්. ආපනශාලාවක්, නවාතැන්පොළක් සඳහා ඊට අදාළ බලපත්‍ර ලබා දීමේ දී අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුවක් ලෙස 2026 වර්ෂයට පනවා අය කිරීමටත්,

ඉහත සඳහන් සියලුම බලපත්‍ර 2026.03.31 දිනට පෙර අදාළ ස්ථානයන් පවත්වාගෙන යනු ලබන තැනැත්තන් විසින් මාතර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවා අදාළ බලපත්‍රය ලබා ගත යුතු බවත්,

තව ද, නියමිත දිනට ඉහත කී බලපත්‍රය ලබා නොගත් සෑම ව්‍යාපාරයක් හෝ ස්ථානයක්ම 1988.08.23 දින අංක 520/ 7 දරන සම්මත අතුරු ව්‍යවස්ථාව මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන ව්‍යාපාරය වසා දැමීම දක්වා කටයුතු කිරීමටත් තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු

උපලේඛනය

I තීරුව		*II තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තය හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු.750.00 ඉක්මවන එහෙත් රු.1,500.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත*
01.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I තීරුව		*II තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තය හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත*
03.	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	කොණ්ඩ කැපීමේ ස්ථාන/ සැලුන් හල් හා බාබර් සාප්පු, රූපලාවන්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම (කිරි ආහාර වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම)	500 0	750 0	1,000 0
07.	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	බත්කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	නවාතැන් පළවල්, ලැගුම්හල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
13.	ආහාර විකිණීම	500 0	750 0	1,000 0
14.	රසකැවිලි නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
15.	පළතුරු මාළු හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
16.	පළතුරු බීම වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	කෑම පාර්සල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	සකස් කළ කෙටි ආහාර හා සිසිල් බීම (ස්නැක් බාර්) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	පැකට් කළ බීම වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
20.	කිරි පැණි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

මාතර ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බදු පැනවීම - 2026 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 05 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මුති අංක 05:33 යටතේ ව්‍යාපාර බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුගත් වෙංගප්පුලි,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 05 දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 147 වගන්තිය හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ හෝ එම පනතේ 150 (1) වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I තීරුවේ නිරූපිත යම් විෂය අංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයක වාර්ෂික බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (3) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බද්දට යටත් සෑම තැනැත්තකු විසින් යටෝක්ත බද්ද 2026 ජුනි මස 30 වැනි දිනට ප්‍රථම මාතර ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට ද,

(ඇ) නියමිත දිනට බදු මුදල් ගෙවීම පැහැර හරින අයට එරෙහිව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (4) වගන්තිය ප්‍රකාරව අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන අයකර ගැනීමට ද තීරණය කරමි.

උපලේඛනය (I කොටස)

I තීරුව *2025 වර්ෂයේ දී ආදායම*	*II තීරුව* *රු. ශ.*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නොමැත
රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 150,000 ඉක්මවන විට	3,000 0

උපලේඛනය (II කොටස)

01. ඡායාරූප ශාලාවක් පැවැත්වීම
02. බැංකුවක් පවත්වාගෙන යාම
03. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් (හාඩ්වෙයාර් එකක්) පවත්වාගෙන යාම
04. සන්නිවේදන මධ්‍යස්ථානයක් (කොමියුනිකේෂන්) පවත්වාගෙන යාම

05. දුරකථන සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
06. ඉංග්‍රීසී/සිංහල බෙහෙත් වර්ග විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
07. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
08. දේශීය වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
09. පෞද්ගලික දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
10. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
11. පශු වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
12. ඇස් කණ්නාඩි සාප්පුවක් පවත්වාගෙන යාම
13. සපත්තු සාප්පුවක් පවත්වාගෙන යාම
14. පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
15. ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම
16. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
17. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
18. උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
19. මිනින්දෝරු සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
20. නීතිඥ, නොතාරිස් සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
21. රක්ෂණ සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
22. ගෘහ නිර්මාණ හා වාස්තු විද්‍යා සේවා සැපයීම
23. දේපළ තක්සේරුකරණය හා ව්‍යාපාර උපදේශන සේවා සැපයීම
24. උපදේශන සහ විදේශීය සංචාරක සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
25. විගණනයෙන් විගණකාධිකාරි සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
26. ජ්‍යෝතිෂ සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
27. සිල්ලර වෙළඳ සැලක් පවත්වාගෙන යාම
28. නිමි ඇඳුම් වෙළඳ සැලක් පවත්වාගෙන යාම
29. ගෘහ භාණ්ඩ වෙළඳ සැලක් පවත්වාගෙන යාම
30. යකඩ බඩු වෙළඳ සැලක් පවත්වාගෙන යාම
31. පිහන් බඩු වෙළඳ සැලක් පවත්වාගෙන යාම
32. විදුලි උපකරණ වෙළඳ සැලක් පවත්වාගෙන යාම
33. එළවළු/ පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34. උත්සව භාණ්ඩ කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම
35. උත්සව සඳහා ආහාර පාන සැකසීම හා උත්සව සඳහා ස්ථාන බදු දීම
36. මල් පෝච්චි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37. කැසට් හා ගුවන් විදුලි යන්ත්‍ර, ඔරලෝසු, රූපවාහිනී යන්ත්‍ර විකිණීමේ ස්ථානයක්
38. සාප්පු බඩු (කිරිපිටි, ප්ලාස්ටික්, ලිපිද්‍රව්‍ය පාසල් උපකරණ)
39. ප්ලාස්ටික් බඩු / ඇලුමිනියම් බඩු ගබඩා කිරීම හා විකිණීම
40. කළුගල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41. කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම
42. පැරණි ලෝහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක්
43. ප්ලාස්ටික් (ෆයිබර් ග්ලාස්/ලෝහ ආශ්‍රයෙන් පුවරු නිෂ්පාදනය)
44. කෑමට ගන්නා ලුණු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45. මිනී පෙට්ටි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
46. බ්‍රේක් ලයිනර් නිෂ්පාදනය කිරීමේ, පාවිච්චි කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. ගුවන් ටිකට් පත් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක්

48. පෙර පාසලක්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
49. ලයිට් සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
50. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
51. අලුත් ලෝහ හෝ පරණ ලෝහ එකරැස් කිරීම හා විකිණීම
52. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
53. කෘෂි රසායන ද්‍රව්‍ය හා කෘෂි උපකරණ විකිණීම
54. තීන්ත අලෙවි කිරීමේ ස්ථානයක්
55. ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක්
56. රේස් බුකියක් පවත්වාගෙන යාම
57. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
58. රබර්, කුරුඳු මිලට ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
59. රැකියා නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
60. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. වැහිපිලි, අමානෝ තහඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
63. අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම
64. සූර්ය පැනල සවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. ලිහිසිතෙල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. අවමංගල සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම
67. ඉඩම් හා දේපළ විකිණීමේ බ්‍රෝකර්වරයෙකු වශයෙන් කටයුතු කිරීම
68. රියැදුරු පුහුණු පාසැලක් පවත්වාගෙන යාම
69. මෝටර් රථ, ත්‍රී රෝද රථ, යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70. වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71. වාහන ප්‍රින්ටඩ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
72. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
73. ටයර් හා ටියුබ් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
74. රථ වාහන අමතර කොටස් වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
75. රථ වාහන ඵලයිමන්ට් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
76. රථවාහන ආදියේ විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක්
77. පාපැදි විකුණන ස්ථානයක්
78. අලුත්වැඩියා කර සකසන ලද වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක්
79. මෝටර් වාහන බොඩි තැනීම
80. බැටරි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
81. පාපැදි අලුත්වැඩියා කිරීම
82. කුලී පදනම මත වාහන ලබාදීමේ ස්ථානයක්
83. ඉදිකිරීමේ යන්ත්‍ර උපකරණ බදුදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
84. නෙස්කැෆේ මැෂින් බදු දීම
85. ශබ්ද විකාශන යන්ත්‍ර බදු දෙන ස්ථානයක්
86. ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87. බෝට්ටු එන්ජින් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89. වායු සමකරණ, ශීතකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
90. ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

91. පරිගණක උපාංග විකිණීම හා අලුත්වැඩියා කිරීම
92. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
93. ඉලෙක්ට්‍රොනික් ජේන්ට් වැඩපලක් පවත්වාගෙන යාම
94. ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
95. ළදරු උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
96. පානීය ජලය බෝතල්කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
97. රෙදි සාප්පුවක් පවත්වාගෙන යාම
98. කොප්පරා මැස්සක් පවත්වාගෙන යාම
99. මිරිස් තුනපහ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
100. තේ කොළ පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
101. ගිනිකෙළි භාණ්ඩ (රතිඤඤා) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
102. සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම
103. වී මෝල්ක් පවත්වාගෙන යාම
104. යන්ත්‍ර මගින් පොල් තෙල් සෑදීම
105. ලෝහ වර්ග පැස්සීම (වැල්ඩින් වැඩපල)
106. පොලිතීන් ආශ්‍රිත නිෂ්පාදන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
107. පැකට් කරන ලද ආහාර (බිස්කට්/ ටොපි) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
108. සත්ව ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
109. භෝග පැළ සකස් කිරීම සහ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110. පින්තූර රාමු කිරීම හා වීදුරු රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
111. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම
112. විකිණීම සඳහා විසිතුරු මසුන් ඇති කිරීම
113. දේශීය කෑඳ වර්ග හා ඔසුපැන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
114. පිරිසිදුකාරක ද්‍රව්‍ය ඒජන්සියක් පවත්වාගෙන යාම
115. ගීත පටිගත කිරීමේ හා වීඩියෝ කැසට් විකිණීම හෝ බදු දීම
116. නරක්වන සුළු ආහාර වර්ග විකිණීම (එළවළු හා හොටෙල් බලපත්‍ර යටතට ගැනෙන ආහාර ද්‍රව්‍ය සිල්ලර වශයෙන් විකිණීම)
117. නාන කාමර උපාංග හා ටයිල් අලෙවිසැලක් පවත්වාගෙන යාම
118. විසිතුරු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් (ලවර්ස්) පවත්වාගෙන යාම
119. ග්‍රැෆික් ඩිසයින් හා අන්තර්ජාල පහසුකම් සැපයීම

12 - 30/5

මාතර ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම - 2026 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 05 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මුති අංක 05:34 යටතේ සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුගත් වෙංගප්පුලි,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 05 දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) උපවගන්තිය යටතේ මාතර ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ නිත්‍ය හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ඒ ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති නම්; හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට වෙන්කර නොමැති විටක; හෝ

(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය හෝ වගා කිරීමට යටත් බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 60% ට වඩා අඩු වන්නේ නම් එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2026 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2026 වර්ෂයේ ජුනි මස 30 දිනට පෙර මාතර ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට තීරණය කරමි.

12 -30/6

මාතර ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු පැනවීම - 2026 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 05 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මුති අංක 05:35 යටතේ ඉඩම් විකිණීම මත බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුගත් වෙංගප්පුලි,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තියේ (1) උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම් විකිණීමෙන් ලත් ආදායමින් 1% ට සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ මාතර ප්‍රාදේශීය සභාවට 2026 වර්ෂයට ගෙවිය යුතු බවට තීරණය කරමි.

12 -30/7

මාතර ප්‍රාදේශීය සභාව

විනෝද බදු අය කිරීම - 2026 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 05 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මුති අංක 05:36 යටතේ විනෝද බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුගත් වෙංගප්පුලි,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 05 දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

තීරණය

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තක් නැරඹීම සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර වටිනාකමින් 10% (සියයට දහයකට) සමාන මුදලක් බද්දක් වශයෙන් පනවා අයකල යුතු බවත්, එසේම ඉහත පනවන ලද විනෝද බද්ද එකී කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරු විසින් නිසි ලෙස මාතර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

12 -30/8

මාතර ප්‍රාදේශීය සභාව

ආදාහනාගාර ගාස්තු අයකිරීම - 2026 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 05 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මුති අංක 05:36 යටතේ ආදාහනාගාර බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුගත් වෙංගප්පුලි,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

2025 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි ආදාහනාගාර ගාස්තු අයකළ යුතු යැයි මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

		රු. ශත
01.	මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආදාහනයක් සඳහා	8,000 0
02.	බල ප්‍රදේශයෙන් පිටත ආදාහනයක් සඳහා	10,000 0
03.	අළු තැන්පත් කිරීම සඳහා (2'x 2')	5,000 0
04.	සාමාන්‍ය මිහිදන් කිරීම සඳහා	1,000 0
05.	වල නොබැඳ අළු බැහැර කිරීම සඳහා	1,000 0

12 - 30/9

මාතර ප්‍රාදේශීය සභාව

සැළසුම් හා සංවර්ධන කටයුතු සඳහා ගාස්තු අය කිරීම - 2026 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 05 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මුති අංක 05:38 යටතේ සැලසුම් හා සංවර්ධන කටයුතු සඳහා ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුගත් වෙංගප්පුලි,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 05 දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

තීරණය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 21 වගන්තිය ප්‍රකාර විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද 2021.07.08 දින අංක 2235/54 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2 උපලේඛනයේ සඳහන් පරිදි සැලසුම් හා සංවර්ධන කටයුතු සඳහාවන ගාස්තු 2026 වර්ෂය සඳහා අය කිරීමට තීරණය කරමි.

12 - 30/10

මාතර ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසර පිළිබඳ බදු පැනවීම - 2026 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 05 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මුති අංක 05:39 යටතේ සැලසුම් හා ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසර හා වෙනත් බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

තව ද, නියමිත දිනට ඉහත කී දැන්වීම් පුවරු ගාස්තු නොගෙවන පුද්ගලයන් හට 1988.08.23 දින අංක 520/7 දරන සම්මත අතුරු ව්‍යවස්ථාව මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව ද තවදුරටත් දැනුම් දෙනු ලැබේ.

සුගත් වෙංගප්පුලි,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 05 දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 (xxx) වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයා විසින් 1988.08.23 හා අංක 520/7 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද 2008.12.05 වැනි දින අංක 1579 ගැසට් නිවේදනය මගින් මාතර ප්‍රාදේශීය සභාව විසින් වැළඳ ගනු ලැබූ 39 ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසර අතුරු ව්‍යවස්ථාවේ 3 (උ) වගන්තිය ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු 2026.01.01 දින සිට අයකළ යුතු බවට මාතර ප්‍රාදේශීය සභාව තීරණය කරමි.

	රු.ශත
01. වෙළඳ ප්‍රචාරක දැන්වීමක් සඳහා වසර තුළ වර්ග අඩියකට	75.00 ක් ද
20.	බේකරි කෑම පමණක් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
21.	බත් කඩයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
22.	තේ, කෝපි සමග බත් කඩයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
23.	සංචාරක මාළු වෙළඳාම (ජංගම රථයක තබා)	500.00	750.00	1,000.00
24.	ජංගම රථයක තබා කඩල, වඩේ, මික්ෂර් කෑම වර්ග විකිණීම	500.00	750.00	1,000.00
25.	මාළු වෙළඳසලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
26.	විලිපේස්ට්, සෝස් වර්ග, අච්චාරු, ලුණුදෙහි නිෂ්පාදනය කිරීම හා විකිණීම	500.00	750.00	1,000.00
27.	මික්ෂර් වර්ග නිෂ්පාදනය, පැකට් කිරීම හා විකිණීම	500.00	750.00	1,000.00
28.	කඩල පැකට් කර විකිණීම	500.00	750.00	1,000.00
29.	සිසිල් බීම නිෂ්පාදනය විකිණීම	500.00	750.00	1,000.00
30.	සංචාරක හෝටලයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
31.	ශීතකළ කුකුලු මස්, මාළු ශීතකරණයක තබා විකිණීම	500.00	750.00	1,000.00
32.	කිරිහලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
33.	රස කැවිලි ගබඩා කිරීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම, (බේකරි කෑම විකුණන ස්ථානයේම)	500.00	750.00	1,000.00
34.	ශීතකරණයක තබා ඌරු මස් විකිණීම	500.00	750.00	1,000.00
35.	ජංගම රථයක තබා කෑම වර්ග වෙළඳාම	500.00	750.00	1,000.00

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 වන වගන්තිය යටතේ පැනවෙන වෙළඳ බදු අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාමට අයත් නොවන ව්‍යාපාර

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1501 අවස්ථාවක*
01.	ඇලුමිනියම් භාණ්ඩ ගබඩා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
02.	ආයුර්වේද බෙහෙත් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
03.	ආයුර්වේද බෙහෙත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
04.	පිත්තල බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
05.	අලුත් හෝ පරණ ටයර් 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
06.	පොල්තෙල් ගබඩා කර තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
07.	ඇස් කණ්නාඩි සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
08.	රසයනාගාර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
09.	අපතේ යන ද්‍රව්‍ය ගබඩාවක් පවත්වාගෙන යාම (යකඩ හැර)	500.00	750.00	1,000.00
10.	අලුත් හෝ පරණ පත්තර ගබඩා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
11.	එළවළු සිල්ලර මිලට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
12.	උක් මෝලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
13.	උක් පැණි හෝ හකුරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
14.	උළු ගඩොල් නිපදවීමේ, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
15.	උළු හෝ ගඩොල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
16.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
17.	ඔරලෝසු විකිණීම සඳහා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
18.	කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
19.	කෝපි, ධාන්‍ය වර්ග, මාංශ භෝග කෙටීම, පැකට් කිරීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
20.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම, ගබඩා කිරීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
21.	ක්ෂණික ඡායා පිටපත් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
22.	කුෂන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
23.	ඇඳුම් මැසීමේ ස්ථානයක් (තිදෙනෙකුට වැඩි) පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
24.	කම්මලක් පවත්වාගෙන යාම (යන්ත්‍රෝපකරණ භාවිතා නොකර)	500.00	750.00	1,000.00
25.	කුකුලු පොහොර ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
26.	කරවල විකිණීමේ, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
27.	කොහු හෝ කොහුවලින් භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
28.	ක්ලච් ප්ලේට්, බ්‍රේක් ලයිනර් ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
29.	කිරුම් මිණුම් උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1501 අවස්ථාවක*
30.	කළුගල් මෝලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
31.	ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
32.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
33.	ගෘහ භාණ්ඩ නිපදවීම, ගබඩා කිරීම, අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
34.	ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
35.	ගිණිකෙළි භාණ්ඩ, රතිඤ්ඤා විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
36	ගීත පටිගත කිරීමේ හෝ සී. ඩී. පටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
37.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
38.	ගෑස් සිලින්ඩර විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
39.	ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කිරීමේ, විකිණීමේ ස්ථානයක්	500.00	750.00	1,000.00
	පවත්වාගෙන යාම (උළු, ගඩොල්, දැව වර්ග හැර)			
40.	ටයර් ට්‍යුබ්, වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
41.	ටයර් ට්‍යුබ්, ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ටයර් 50ට වැඩි)	500.00	750.00	1,000.00
42.	ටින්කර් වැඩපලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
43.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
44.	දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
45.	දේශීය විදේශීය දුරකථන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
46.	දර මඩුවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
47.	දැව ගබඩාවක් පවත්වාගෙන යාම (ඉරාපු ලී)	500.00	750.00	1,000.00
48.	දුම්වැටි විකිණීමේ ගබඩා කිරීමේ (සුරුට්ටු, බීඩි) ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
49.	දේශීය විදේශීය මත්පැන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
50.	පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
51.	පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩාවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
52.	පාවිච්චි කරන ලද පත්තර, කඩදාසි හෝ පුවත්පත් ගබඩා කිරීමේ, ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
53.	පුන්නක්කු හොන්ඩර් 10ට වැඩියෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
54.	පින්තාරු තින්ත, වාර්නිස්, ඩිස්ටැම්පර් තින්ත ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
55.	පෞද්ගලික වෛද්‍යවරයකු ලෙස සත්ත්ව සායන පැවැත්වීම (පශු වෛද්‍ය)	500.00	750.00	1,000.00
56.	පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
57.	පොත් සාප්පුවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
58.	පාවහන් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1501 අවස්ථාවක*
59.	පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
60.	පිහන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
61.	පෞද්ගලික ළදරු පාසලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
62.	පුවත්පත්, සඟරා අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
63.	පොල්තෙල් ගබඩාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
64.	පරණ යකඩ බඩු ගබඩා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
65.	ෂේපකර්ම ස්ථානයක් පවත්වාගෙන යාම (අත්යන්ත්‍ර හෝ බලවේග)	500.00	750.00	1,000.00
66.	හරිතාගාරයක් පවත්වාගෙන යාම (වර්ග අඩි 5000ට අඩු)	500.00	750.00	1,000.00
67.	පරිගණක පාඨමාලා පන්ති පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
68.	ප්ලාස්ටික් භාණ්ඩ, පොලිතීන්, රෙක්සීන් රබර්වලින් තැනූ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
69.	බැටරි චාජ් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
70.	බුලත්, පුවක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
71.	බයිසිකල් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම (පා පැදි)	500.00	750.00	1,000.00
72.	මෝටර් බයිසිකල්, ත්‍රීවිල් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
73.	බයිසිකල් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම (යතුරු පැදි)	500.00	750.00	1,000.00
74.	බෙලෙක් වැඩ පලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
75.	බයිසිකල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (පා පැදි)	500.00	750.00	1,000.00
76.	බිත්තර ගබඩා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
77.	බටහිර බෙහෙත් ද්‍රව්‍ය ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ෆාමසි)	500.00	750.00	1,000.00
78.	මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
79.	මෝටර් කැබලි කොටස් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
80.	මෝටර් රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
81.	මෝටර් රථ, ට්‍රැක්ටර් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
82.	මැණික් ගල් කැපීමේ, ඔප දැමීමේ, මිල දී ගැනීමේ හා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
83.	මහන මැෂින් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
84.	මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
85.	යතුරු පැදි අලෙවි කිරීම හා ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
86.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම (අත් යන්ත්‍ර)	500.00	750.00	1,000.00
87.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම (විදුලි බලයෙන්)	500.00	750.00	1,000.00
88.	යකඩ බඩු සාප්පුවක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම (ගොඩනැගිලි ද්‍රව්‍ය සමඟ)	500.00	750.00	1,000.00
89.	රසායනික පොහොර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
90.	රෙදිපිළි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1501 අවස්ථාවක*
91.	යතුරු පැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන ගෙන යාම	500.00	750.00	1,000.00
92.	එක්ස්රේ කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
93.	සුරතල් මසුන්, පක්ෂීන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
94.	රබර් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
95.	රබර් මුද්‍රා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
96.	රේස් බුකියක් පවත්වාගෙන යාම (ඔට්ටු පොලක්)	500.00	750.00	1,000.00
97.	ලිපි ද්‍රව්‍ය හා පාසල් උපකරණ වෙළඳසැලක් පවත්වා ගෙන යාම	500.00	750.00	1,000.00
98.	ලියවන පට්ටලයක් උපයෝගී කරගෙන නිෂ්පාදනය කිරීමේ සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
99.	විදුලි උපකරණ වැඩපලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
100.	විදුලි උපකරණ විකිණීම, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
101.	වීදුරු තහඩු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
102.	වතුර පොම්ප, මෝටර්, ඇඹරුම් යන්ත්‍ර, විදුලි ජනන යන්ත්‍ර ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
103.	වාත්තු වැඩපලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
104.	වඩු වැඩපලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
105.	විදුලි ජෙනරේටර් කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
106.	වේවැල් භාණ්ඩ, පැදුරු විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500.00	750.00	1,000.00
107.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
108.	වීඩියෝ යන්ත්‍ර කුළියට දීම, වීඩියෝ ගත කිරීම සඳහා උපකරණ භාවිතා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
109.	සී. ඩී. තැටි විකිණීම	500.00	750.00	1,000.00
110.	විසිතුරු අත්කම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
111.	ලේ, මුත්‍රා පරීක්ෂා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
112.	සාප්පු බඩු අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
113.	කුකුළන් 100ට වැඩි ගණනක් සඳහා කුකුළු පට්ටියක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
114.	ඌරන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
115.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 01 සිට 08 දක්වා)	500.00	750.00	1,000.00
116.	ලොන්ඩරියක්, ඩ්‍රයික්ලීන් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
117.	අවමංගල්‍ය භාණ්ඩ නිපදවීම, විකිණීම හා මල් ශාලාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
118.	වී, හාල් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
119.	මිරිස්, තුනපහ ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
120.	සත්ත්ව ආහාර ගබඩා කිරීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
121.	සංචාරක වෙළඳාම (වෙනත්)	500.00	750.00	1,000.00
122.	ලුණු ගබඩා කිරීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
123.	කිතුල් හකුරු, කිතුල් පැණි, කිතුල් පිටි නිෂ්පාදනය හා විකිණීම	500.00	750.00	1,000.00

I වැනි තීරුව		II වැනි තීරුව		
අනු. අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750ට වැඩි එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක	රු. 1501 අවස්ථාවක
124.	සිල්ලර බඩු කුළු බඩු වෙළඳ සැලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
125.	ස්වර්ණාභරණ විකිණීම ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
126.	සිමෙන්ති ගබඩා කර සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
127.	කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
128.	සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
129.	ශබ්ද විකාශන යන්ත්‍රය කුළියට දීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
130.	ශීතකරණයක තබා අයිස්ක්‍රීම්, යෝගට්, කිරි ආශ්‍රිත නිෂ්පාදන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
131.	හඳුන්කූරු, සුවඳ ධූප නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
132.	හිස් බෝතල්, පරණ පත්තර, අනෙකුත් අපතේ යන ද්‍රව්‍ය එකතු කිරීම, ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
133.	හාල් ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
134.	හාල් පිටි, සීනි තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
135.	අලුහුණු ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
136.	සුවඳ විලවුන් නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
137.	හිස් ගෝනි, යූරියා මළු ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
138.	මැටිවලින් තැනූ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
139.	මනිබඩු, ෆැන්සි බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
140.	ලොතරැයි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
141.	වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
142.	පෞද්ගලික බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
143.	පෞද්ගලික වෛද්‍යවරුන් රෝගීන් පරීක්ෂා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
144.	අත් බෑග්, පාසල් බෑග්, ගමන් මළු ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
145.	ඉරාපු ලී ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
146.	ලී බීරළු නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
147.	යන්ත්‍රානුසාරයෙන් වඩු මඩුවක් පවත්වා ගෙන යාම	500.00	750.00	1,000.00
148.	ලොරි බෝඩ් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
149.	සූර්යකෝෂ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
150.	යකඩ, ග්‍රිල්, ගේට්ටු, පුටු, වානේ භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
151.	ලැමිනේටින්, පරිගණක අකුරු සැකසුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1501 අවස්ථාවක*
152.	කැබලි රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
153.	පෞද්ගලික අධ්‍යාපන පන්ති පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
154.	ස්ට්‍රෝබෙරි වගා කිරීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
155.	ටින්කරින්, ස්ප්‍රේපේන්ට් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
156.	පරිගණක හා කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
157.	ශීතකරණ, අධි ශීතකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
158.	ගුවන් විදුලි, රූපවාහිනී හා අනෙකුත් විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
159.	දුරකථන උපකරණ, ජංගම දුරකතන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
160.	සෙල්ලම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
161.	ආහාර ද්‍රව්‍ය, බෙහෙත් ඖෂධ වර්ග, පොලිතීන් බෑග් මගින් අසුරා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
162.	එළවළු තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
163.	එළවළු බීජ වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
164.	පූජා භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
165.	දැන්වීම් පුවරු සකස් කිරීමේ හා අකුරු පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
166.	කෘෂි උපකරණ නිෂ්පාදනය හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
167.	ත්‍රීවිලර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
168.	ත්‍රීවිලර් රථ සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
169.	සංගීත භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
170.	කෞතුක භාණ්ඩ ලබා ගැනීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (කෞතුක)	500.00	750.00	1,000.00
171.	උත්සව සඳහා ආහාර සැපයීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම (කේටරින්)	500.00	750.00	1,000.00
172.	නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
173.	කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
174.	සම්භාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
175.	පා පැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500.00	750.00	1,000.00
176.	කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500.00	750.00	1,000.00
177.	ඇලුමිනියම්, වීදුරු භාවිතයෙන් ගෘහ භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
178.	ලිහිසි තෙල් ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
179.	ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම	500.00	750.00	1,000.00
180.	ගබඩාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1501 අවස්ථාවක*
181.	පහන් තිර, නිෂ්පාදනය, පැකට් කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
182.	ඉටිපන්දම් නිෂ්පාදනය, පැකට් කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
183.	ප්ලාස්ටික්වලින් තැනූ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
184.	මල්පැළ හෝ වෙනත් පැළ වර්ග විකිණීමේ හා පැළ තවානක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
185.	කාබනික පොහොර වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
186.	පරිගණක භාවිතයෙන් විවධ ලිපි, දැන්වීම් සකස් කිරීමේ ස්ථනයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
187.	පොල් කටු හා ඒ ආශ්‍රිත නිර්මාණ කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

12 - 76/1

උඟවපරණගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත ගාස්තු අය කිරීම

උඟවපරණගම ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 30 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 1 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. දිනදාස රත්නායක රත්නායක,
සභාපති,
උඟවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

2025 නොවැම්බර් මස 03 දින,
උඟවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව, උඟවපරණගම ප්‍රාදේශීය සභා පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක (1%) සමාන බදු මුදලක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා, අනුයෝජිතයකු විසින් උඟවපරණගම ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට යෝජනා කරන්නීය.

12 - 76/2

ඌවපරණගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු අය කිරීම

ඌවපරණගම ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 30 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 1 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. දිනදාස රත්නායක,
සභාපති,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

2025 නොවැම්බර් මස 03 දින,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21, 49, 79 වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර, 1988.01.01 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව (260 වැනි අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර, 2026.01.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඌවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු නැවත සංශෝධනය කරන තෙක් අයකිරීමට ඌවපරණගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛන අංක 01

ගෙබිම විශාලත්වය වර්ග අඩි	පදිංචිය සඳහා (රු.)	වාණිජ හෝ වෙනත් භාවිතය සඳහා (රු.)
500 ට අඩු	20.00	50.00
501 සිට 1,000 දක්වා	50.00	100.00
1,001 සිට 2,000 දක්වා	200.00	500.00
2,001 සිට 3,000 දක්වා	400.00	750.00
3,001 සිට 4,000 දක්වා	700.00	1,000.00
4,001සිට 5,000 දක්වා	1,000.00	1,250.00
5,000 සිට වැඩි වන සෑම වර්ග අඩි 1,000 කට	300.00	500.00

12 - 76/3

ඌවපරණගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ප්‍රචාරක/දැන්වීම් දෘෂ්‍ය පරිසරය ගාස්තු අයකිරීම

ඌවපරණගම ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 30 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 1 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. දිනදාස රත්නායක,
සභාපති,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

2025 නොවැම්බර් මස 03 දින,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වගන්තියේ හා 1988.06.23 දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදි කිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳව අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, උඟවපරණගම ප්‍රාදේශීය සභා සීමාව තුළ කිනම් ආකාරයක හෝ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2026.01.01 දින සිට අයකළ යුතුයැයි උඟවපරණගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

අනු. අංකය	උපලේඛනය	ගාස්තුව රු. ශත
01.	බිත්තියක හෝ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම එක් අවුරුද්දක් සඳහා	90.00
02.	ලෑල්ලක් හෝ ආධාරකයක් හෝ බැනරයක් හෝ කටවුට් මගින් ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්වීමක් වෙනුවෙන් මාස තුනකට අඩු කාලයක් සඳහා වර්ග අඩියක් වෙනුවෙන් (චිත්‍රපටි දැන්වීම් ද ඇතුළුව)	60.00
03.	ලෑල්ලක් හෝ ආධාරකයක් හෝ බැනරයක් හෝ කටවුට් මගින් ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්වීමක් වෙනුවෙන් මාස තුනකට වැඩි එහෙත් මාස හයකට අඩු කාලයක් සඳහා වර්ග අඩියක් වෙනුවෙන් (චිත්‍රපටි දැන්වීම් ද ඇතුළුව)	70.00
04.	ලෑල්ලක් හෝ ආධාරකයක් හෝ බැනරයක් හෝ කටවුට් මගින් ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්වීමක් වෙනුවෙන් මාස හයකට වැඩි එහෙත් මාස 12කට අඩු කාලයක් සඳහා වර්ග අඩියක් වෙනුවෙන් (චිත්‍රපටි දැන්වීම් ද ඇතුළුව)	80.00

අංක 1 සිට 4 දක්වා කරුණුවලට අදාළව 10% ක මුද්දර ගාස්තුවක් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

12 - 76/4

උඟවපරණගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අයකිරීම

උඟවපරණගම ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 30 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 1 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. දිනදාස රත්නායක,
සභාපති,
උඟවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

2025 නොවැම්බර් මස 03 දින,
උඟවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

යෝජනාව

උඟවපරණගම ප්‍රාදේශීය සභාව මගින් ලබාදෙනු ලබන විවිධ සේවාවන් සඳහා වන සේවා ගාස්තු හා අයදුම්පත්‍ර ගාස්තුවක් ද, ක්ෂේත්‍ර පරීක්ෂණවලට අදාළ වන කටයුතු සඳහා පරීක්ෂණ ගාස්තුවක් ද, පහත උපලේඛනයේ දැක්වෙන අනුප්‍රමාණ මත 2026 වර්ෂය තුළ පනවා අයකිරීමට උඟවපරණගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

අඹගස්දෝව ක්‍රීඩාපිටියට සහ ක්‍රීඩාගාරය සඳහා ගාස්තු අය කිරීම

1.	පාසල් ළමුන්ගේ ක්‍රීඩා කටයුතු සඳහා	කොට්ඨාසය තුළ (රු.)	කොට්ඨාසයෙන් පිටත (රු.)
	ක්‍රීඩා උත්සව සඳහා ක්‍රීඩාපිටිය පමණක් දිනකට	600.00	800.00
	ක්‍රීඩාපිටිය හා සම්පූර්ණ ක්‍රීඩාගාරය දිනකට	2,600.00	2,700.00
	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරයේ ඉහළ මාලය පමණක් දිනකට	2,100.00	2,200.00
	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරයේ පහළ මාලය පමණක් දිනකට	1,600.00	1,900.00
	ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පතුව	3,000.00	3,000.00
2.	**රාජ්‍ය නොවන ආයතන හා පුද්ගලයින් සංවිධානය කරනු ලබන ක්‍රීඩා උත්සව**		
	ක්‍රීඩාපිටිය පමණක් දිනකට	3,000.00	3,500.00
	ක්‍රීඩාපිටිය හා සම්පූර්ණ ක්‍රීඩාගාරය දිනකට	7,500.00	8,500.00
	ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩාගාරයේ ඉහළ මාලය පමණක් දිනකට	6,500.00	7,000.00
	ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩාගාරයේ පහළ මාලය පමණක් දිනකට	5,500.00	6,000.00
	ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පතුව	10,000.00	10,000.00
3.	**ක්‍රීඩා අමාත්‍යාංශය හැර වෙනත් රාජ්‍ය ආයතන සංවිධානය කරනු ලබන ක්‍රීඩා උත්සව**		
	ක්‍රීඩාපිටිය පමණක් දිනකට	2,200.00	
	ක්‍රීඩාපිටිය හා සම්පූර්ණ ක්‍රීඩාගාරය දිනකට	5,200.00	
	ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩාගාරයේ ඉහළ මාලය පමණක් දිනකට	4,700.00	
	ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩාගාරයේ පහළ මාලය පමණක් දිනකට	4,200.00	
	ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පතුව	10,000.00	
4.	වෙනත් රැස්වීම් සඳහා ක්‍රීඩාගාරයේ ඉහළ මාලය පමණක් දිනකට	3,500.00	
5.	**දේශපාලන රැස්වීම්**		
	ක්‍රීඩාපිටිය පමණක් දිනකට	12,000.00	
	ක්‍රීඩාපිටිය හා සම්පූර්ණ ක්‍රීඩාගාරය දිනකට	17,500.00	
	ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩාගාරයේ ඉහළ මාලය පමණක් දිනකට	15,000.00	
	ක්‍රීඩාගාරයේ ඉහළ මාලය පමණක් දිනකට	10,000.00	
	ආපසු ගෙවන ආරක්ෂිත ඇප තන්පතුව	10,000.00	
6.	**වෙනත් වෙළඳ ව්‍යාපාර කටයුතු සඳහා**		
	ක්‍රීඩාපිටිය පමණක් දිනකට	7,000.00	
	ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩාගාරයේ ඉහළ මාලය පමණක් දිනකට	8,000.00	
	ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පතුව	10,000.00	
7.	**සංගීත සංදර්ශන හෝ වෙනත් විනෝදාංශ පැවැත්වීම සඳහා**		
	ක්‍රීඩාපිටිය පමණක් දිනකට	13,000.00	

	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරය දිනකට	රු. 20,000.00
	සංගීත සංදර්ශන හෝ වෙනත් විනෝදාංශ පැවැත්වීම සඳහා වැඩිවන එක් දිනකට	රු. 5,000
	ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පතුව දිනකට සැණකෙළි සඳහා	රු. 15,000.00
	ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පතුව දිනකට සංගීත සංදර්ශන සඳහා	රු. 20,000.00
8.	**දන්සල් හා සල්පිල්, විශේෂ වැඩසටහන් සඳහා දිනකට අය කිරීම්**	
	ක්‍රීඩාපිටිය පමණක් දිනකට	රු. 3,500.00
	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරය ඉහල මාලය පමණක් දිනකට	රු. 5,000.00
	ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පතුව දිනකට	රු. 10,000.00
9.	**ලුණුවත්ත පොළ භූමිය මහජන රැස්වීම්, වෙළඳ ප්‍රදර්ශන, ආගමික උත්සව සඳහා**	
	ලුණුවත්ත පොළ භූමිය මහජන රැස්වීම් හා වෙළඳ ප්‍රදර්ශන සඳහා ලබා දීම දිනකට	රු. 13,000.00
	ලුණුවත්ත පොළ භූමිය වෙළඳ ප්‍රදර්ශන සඳහා වැඩිවන එක් දිනකට	රු. 2,000.00
	ලුණුවත්ත පොළ භූමිය ආගමික උත්සව සඳහා දිනකට	රු. 5,000.00
	ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පතුව දිනකට	රු. 10,000.00
2026 වෙනත් ගාස්තු අය කිරීම් යටතේ 1 සිට 9 දක්වා වගන්තිවලට අදාල කරුණු සම්බන්ධයෙන් පහත තීරණ ගෙන ඇත. විදුලිය හා ජල මීටර් ඡායාරූප ගත කර එදින පවතින මිල ගණන් සහ මනු කියවීම්වලට අදාළ මුදල් අයකර ගැනීමෙන් පසු ආරක්ෂිත ඇප තැන්පතු නිදහස් කෙරේ.		
10.	**පුස්තකාල සේවා ගාස්තු**	
	පුස්තකාල සාමාජික ගාස්තු වැඩිහිටි	රු. 200.00
	පුස්තකාල සාමාජික ගාස්තු පාසල් ළමුන්	රු. 100.00
	පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තු	රු. 50.00
	පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු දිනකට	රු. 5.00
11.	**රථ ගාල් සඳහා ගාස්තු**	
	ත්‍රිරෝද රථයක් ගාල් කිරීම සඳහා වාර්ෂික අය කිරීම	රු. 600.00
	නව ත්‍රිරෝද රථයක් ගාල් කිරීමට ලියාපදිංචි ගාස්තුව	රු. 5,000.00
	සියළුම වර්ගයේ ලොරි, ට්‍රැක්ටර්, ටිපර්, වෑන්, බස් රථ ගාල් කිරීම සඳහා ලියාපදිංචි ගාස්තු අය කිරීම්	රු. 5,000.00
	සියළුම වර්ගයේ ලොරි, ට්‍රැක්ටර්, ටිපර්, වෑන්, බස් රථ ගාල් කිරීම සඳහා වාර්ෂිකව අය කිරීම	රු. 2,500.00
(2026 වර්ෂය සඳහා වාර්ෂික බලපත්‍ර 2026.12.31 දිනට ලබා ගත යුත අතර එසේ ලබා නොගත් ත්‍රිරෝද රථ සඳහා ඉදිරි මාස 06 කින් පසුව ලියාපදිංචියෙන් ඉවත් කරනු ලබන්නීය.		

12.	වීථි රේඛා ගාස්තු	රු. 2,500.00
13.	ජල පෝරම ගාස්තු	රු. 250.00
14.	ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	රු. 1,000.00
15.	අනතුරුදායක ගස් ඉවත් කිරීමේ පෝරම ගාස්තු	රු. 500.00
16.	කර්මාන්ත ගිවිසුම්පත් ගාස්තු (ආපසු නොගෙවන)	රු. 1,000.00
17.	කොඩි කණු 01ක් දිනකට කුළියට දීම	රු. 75.00
18.	අඩි 10 ×10 සමර්හට් (කැනපි).001ක් දිනකට කුළියට දීම	රු. 2,000.00
19.	කොම්පෝස්ට් 1kg ක් අලෙවි කිරීමේ ගාස්තුව	රු. 10.00

		රු. ශත
20.	ට්‍රැක්ටර් රථය බදු දීම දිනකට උපරිම පැය 08ක් සඳහා (ඉන්ධන රහිතව)	4,000.00
21.	ජේසීබී යන්ත්‍රය කුලියට ලබාදීම පැය 01ක් සඳහා (ඉන්ධන සහිතව) ඉන්දන මිළ උච්ඡාවචනය අනුව තෙල් මිල වෙනස් විය හැකිය.	6,000.00
22.	ස්කීඩ් ස්ටීරියල් ලෝඩර්ස් යන්ත්‍රය කුළියට ලබාදීම පැය 1ක් සඳහා (ඉන්ධන සහිතව)	3000.00
23.	මාර්ග තලනය කුළියට ලබාදීම දිනකට (උපරිම පැය 08ක් සඳහා ඉන්ධන සහිතව)	34000.00
24	එක් ජල බවුසරයක් සඳහා යන පැය 1ක් සඳහා ප්‍රවාහන ගාස්තුව (බල ප්‍රදේශය තුළ හා පිටත)	30,000.00
25.	මාර්ග තලන යන්ත්‍රය ප්‍රවාහනය කිරීම සඳහා ඇප තැන්පත් ගාස්තුව	1,200.00
26.	යාන්ත්‍රික පැය.001ක් සඳහා ට්‍රැක්ටර් රථ ගාස්තුව (ඉන්ධන සහිතව)	2,300.00
27.	එක් ජල බවුසරයක් සඳහා (බලප්‍රදේශය තුළ)	3000.00
28.	එක් ජල බවුසරයක් සඳහා (බලප්‍රදේශයෙන් පිටත)	300.00
29.	ඩ්‍රම්ප්ට්‍රක් රථය කුළියට ලබාදීම දිනකට (උපරිම පැය.008ක් සඳහා ඉන්ධන රහිතව)	11500.00
30.	ශබ්ද විකාශන යන්ත්‍රය කුළියට ලබා දීම (දිනකට)	1,500.00
31.	පරිසර බලපත්‍ර ගාස්තු	4,500.00
32.	පරිසර බලපත්‍ර නව ඉල්ලුම්පත් ගාස්තුව	100.00
33.	පරිසර බලපත්‍ර අලුත්කිරීමේ ඉල්ලුම්පත් ගාස්තුව	50.00
34.	අනුකූලතා සහතිකයක් සඳහා	1,500.00
35.	ඉඩම් අනුබෙදුම් අනුමත කිරීමේ ගාස්තු (එක් කට්ටියක් සඳහා)	1,500.00
36.	නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ප්‍රකාශිත ප්‍රදේශ හැර සෙසු ප්‍රදේශවල ඉදිකරනු ලබන ගොඩනැගිලි සඳහා පෙරසැරි ගාස්තුව අයකිරීම (වර්ග අඩියකට)	5.00
37.	අයාලේ යන ගවයින් අල්ලා ගාල් කිරීමේ ගාස්තුව දිනකට	500.00
38.	සභාවට අයත් පොදු ස්ථාන මහජන රැස්වීම් පැවැත්වීම සඳහා දිනකට	4,000.00
39.	විදුලි ජනන යන්ත්‍රය ඉන්ධන රහිතව ලබාදීම දිනකට (ක්‍රියාකරු සමඟ)	6,000.00
40.	ආදාහනාගාර ගාස්තුව	13,000.00
41.	ප්ලාස්ටික් එක් පුටුවක් දිනකට කුලියට ලබා දීම (අලාභයක් සිදු වූ අවස්ථාවල දී එම වර්ගයේම පුටුවක් ලබා දිය යුතුය)	15.00
42.	බල ප්‍රදේශය තුළ අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් සඳහා අය කිරීම දිනකට	3,000.00
43.	ලුණු වත්ත යෝජිත බස් නැවතුම් පල වෙන් කිරීම දිනකට	6,000.00
44.	මාර්ග පළුදු කිරීමේ ගාස්තු	5,000.00

45	මාර්ග පළුදු කිරීමේ ගාස්තු		රු. 5000.00
	ආපසු නොගෙවන ඇප තැන්පතු	ගෙවන ඇප තැන්පතු	
	(රු)	(රු.)	
	3000.00	2000.00	

46	බෝඹුරු ඇල්ල ප්‍රවේශ පත්‍ර ගාස්තුව	(දේශීය) රු.	(විදේශීය)
	ළමා	05-12 පාසල්නිල ඇඳුමෙන් පැමිණෙන - මුදල්අයකරනු නොලැබේ. 05-12 අතර (වෙනස්)-30 12-18 අතර (වෙනස්)-50 12-18 අතර පාසල් නිල ඇඳුමෙන් පැමිණෙන ළමුන්ගෙන්-මුදලින් 50% ක් අය කරනු ලැබේ.	
	වැඩිහිටි	රු. 100.00	රු. 700.00

47	**බෝඹුරු ඇල්ල රථ වාහන නතර කර තැබීමේ ගාස්තු - පැය 4 කට**	(රු.)
	මෝටර් බයිසිකල්	50.00
	ත්‍රී රෝද රථ	150.00
	වෑන් රථ/කාර් රථ/ ජීප් රථ/ කැබ් රථ	200.00
	බස් රථ/ ලොරි රථ/ ට්‍රැක්ටර් රථ	300.00
වැඩිවන සෑම පැය 1කට අය කිරීම		
	මෝටර් බයිසිකල්	20.00
	ත්‍රී රෝද රථ	50.00
	වෑන් රථ/කාර් රථ/ ජීප් රථ/ කැබ් රථ	80.00
	බස් රථ/ ලොරි රථ/ ට්‍රැක්ටර් රථ	100.00

48	අඹගස්දෝව සම්මන්ත්‍රණ ශාලාව දිනකට ලබාදීම	20,000.00
	ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පතුව දිනකට	10,000.00

49	**පෙර පාසල සඳහා ගාස්තු අය කිරීම**	රු.
	ඇතුළත් වීමේ ගාස්තු	1,000 0
	පෙර පාසල් ළමයකු සඳහා මාසික ගාස්තු	2,000 0
	දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ පමණක් රඳවන ළමයකු සඳහා මාසික ගාස්තු	2,000 0
	දිවා සුරැකුම් මධ්‍යස්ථානය සහ පෙර පාසල යන දෙකටම සහභාගි වන ළමයකු සඳහා මාසික ගාස්තු	3,000 0

50.	මස්පන්න පුස්තකාලය ඡයා පිටපත් නිකුත් කිරීම සඳහා ගාස්තු අය කිරීම	(රු.)
	A 4 තනි පැත්ත	8.00
	A 4 දෙපැත්ත	10.00
	A 3 තනි පැත්ත	12.00
	A 3 දෙපැත්ත	20.00
	B 5 තනි පැත්ත	8.00
	B 5 දෙපැත්ත	10.00
	Legal තනි පැත්ත	10.00
	Legal දෙපැත්ත	15.00

51.	දුරකථන විදුලි සංදේශන කුලුණු මූලික දිග 20m සඳහා අය කිරීම	රු. 40,000 0
	වැඩිවන සෑම මීටරයක් සඳහාම අය කිරීම	රු. 1,000 0

12-76/5

ඌවපරණගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ගාස්තු අයකිරීම

ඌවපරණගම ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 30 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 1 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. දිනදාස රත්නායක,
සභාපති,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

2025 නොවැම්බර් මස 03 දින,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

යෝජනාව

පාරිසරික පනතේ 23 අ වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පරිසර අධිකාරිය මගින් 2022 ජනවාරි මස 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන අමුණා ඇති උපලේඛනයේ (11) හි දැක්වෙන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ සහ එකී සංශෝධන සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව එකී ක්‍රියාකාරකම් පවත්වාගෙන යනු ලබන්නන් විසින් 2026 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉදිරි අවුරුදු තුනකට (03) හෝ ඊට අඩු කාලයක් සඳහා බලපත්‍ර ගාස්තුව ලෙස රු. 4,500.00 මුදලක් සහ රු. 100.00 ක අයදුම්පත්‍ර/ලිපිද්‍රව්‍ය ගාස්තුව හා එකී ක්‍රියාකාරකම්වලට අදාළ වන මූලික ආයෝජනය මත පදනම් වූ උපලේඛන (1) හි සඳහන් පරීක්ෂණ ගාස්තුව යන මුදල් මෙම ප්‍රාදේශීය සභාව වෙත ගෙවා පාරිසරික ආරක්ෂක බලපත්‍රයක් ලබා ගත යුතු බවට ඌවපරණගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය 1

පරීක්ෂණ ගාස්තු අය කිරීම

මූලික ආයෝජනය (රුපියල්)	ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව (පවතින වටිනාකම)
250,000/- ට අඩු	රු. 3,000/- + රජයේ අනුමත බදු
250,001/- - 500,000/- දක්වා	රු. 3,750/- +රජයේ අනුමත බදු
500,001/- සිට - 1,000,000/- දක්වා	රු. 5,000/- + රජයේ අනුමත බදු
1,000,001/- ට වැඩි	රු. 10,000/- රජයේ අනුමත බදු

උපලේඛනය II

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ වගන්තිය යටතේ පවරා දී ඇති බලතල ප්‍රකාරව පරිසරය දූෂණය කරමින් පරිසරයට අපද්‍රව්‍ය බැහැර කිරීම, තැන්පත් කිරීම හෝ මෝචනය කිරීම කෙරෙන කටයුතු වන්නා වූ මෙහි උපලේඛනයේ දක්වා ඇති කටයුතු, ඉහත කී වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට නියමිත කටයුතු ලෙස නිශ්චය කරමි.

(ඇ) කොටස

1. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4. රෙදි වියන යන්ත්‍ර/ මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර් 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
6. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
7. දිනකට ලීටර් 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මද්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත

8. දිනකට කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්
9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250ක් හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ කිරීමේ හෝ සැකසුම් කිරීමේ කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්"
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්
    • මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව ඉටුකිරීම + (50 × (ඌරන් සංඛ්‍යාව + ගවයන් සංඛ්‍යාව)+ 10 ×(එළුවන් සංඛ්‍යාව)
20. ගබඩා ධාරිතාව ඝන මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාව මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24. සේවක සංඛ්‍යාව 5කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින "ප්ලාස්ටර් ඔෆ් පැරිස්" අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
28. කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු
30. දිනකට ඝන මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිත කරන කර්මාන්ත
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත
33. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම් හල්
35. විසිරි පින්තාරු කිරීමේ හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ
36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත
37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
38. මෘත ශරීර කල්තබා ගැනීමට සකස් කිරීම සහිත මල්ශාලා
39. මෙම උපලේඛනයේ ඈ කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/කර්මාන්තයක්

2008.01.25 දිනැති අංක 1533/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබුවා වූ ද පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතු වූ ද නියම කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ *ගැසට්* නිවේදන පරිවිඡින්න කරනු ලැබේ.

ඌවපරණගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

ඌවපරණගම ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 30 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 1 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. දිනදාස රත්නායක,
සභාපති,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

2025 නොවැම්බර් මස 03 දින,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ, යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් ඌවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක, එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2026 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ඌවපරණගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, ඌවපරණගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

උපලේඛනය I

අනු. අංකය	I තීරුව	II තීරුව
	බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය රු.	ගෙවිය යුතු බද්ද
1	රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90.00
2	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180.00
3	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360.00
4	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200.00
5	රු. 1,50,000 ඉක්මවන විට	3,000.00

උපලේඛනය II

1. අමු තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
2. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
3. පෙර පාසල්, දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
4. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
5. පරිගණක පුහුණු පාඨමාලා ආයතනයක් හා වෙනත් පුහුණු පවත්වාගෙන යාම
6. ජ්‍යොතිෂ්‍ය සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
7. රියැදුරු පුහුණුව සපයන ආයතනයක් පවත්වාගෙන යාම
8. සත්ත්ව සායනයක් පවත්වාගෙන යාම
9. නීතිඥ, නොතාරිස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
10. බැංකුවක් පවත්වාගෙන යාම

11. රක්ෂණ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
12. ලීසිං සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
13. මිනින්දෝරු සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
14. ගෘහ නිර්මාණ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
15. වාස්තු විද්‍යා සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
16. ඉංජිනේරු සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
17. උත්සව භාණ්ඩ කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
18. ලොතරැයි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
19. රැකියා නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
20. උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
21. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ බෙදාහැරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
22. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (යන්ත්‍රෝපකරණ)
23. යතුරු පැදි, ත්‍රිරෝද රථ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
25. අරක්කු, බියර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
26. දේශීය හා විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
27. තේ කම්හලක් පවත්වාගෙන යාම
28. ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
29. කළු ගල් කඩන ස්ථානයක් පවත්වාගෙන යාම '
30. විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම
31. වාහන දුම් පරීක්ෂා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
32. ඩිජිටල් ව්‍යාපෘති සැලසුම් කිරීම හා සංවර්ධනය කර අන්තර්ජාලය හරහා භාණ්ඩ හා සේවා අලෙවිය
33. ලැගුම් හලක්/ උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
34. දුරකථන සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යාම
35. මනාළියන් හැඩ ගැන්වීම හා රූපලාවන්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම
36. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරුම්හලක් හා ලී මෝලක් පවත්වාගෙන යාම
37. කොම්පෝස්ට් පොහොර හා වෙනත් පොහොර වර්ග නිෂ්පාදනය හා අලෙවිය
38. වෙන්දේසිකරුවකු හා තැරැව්කරුවකු වශයෙන් කටයුතු කිරීම
39. නැවුම් කුකුල් මස් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
40. ත්‍රිරෝද රථ, මෝටර් රථ, කාර්, වෑන් රථ, අනෙකුත් වාහන හා යන්ත්‍රෝපකරණ විකිණීම
41. හරිතාගාරයක් පවත්වාගෙන යාම (වර්ග අඩි 5000ට වැඩි)
42. අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම
43. වෙළෙඳ දැන්වීම් ප්‍රචාරණය සඳහා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
44. උත්සව අවස්ථා සඳහා ශබ්දවාහිනී උපකරණ සැපයීම හා සංගීත භාණ්ඩ කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
45. වාහන කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම
46. මුදල් ණයට දෙන්නකු ලෙස කටයුතු කිරීම
47. කොමිස් ඒජන්තවරයකු ලෙස කටයුතු කිරීම
48. පෞද්ගලික ඉංජිනේරුවකු ලෙස කටයුතු කිරීම
49. කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
50. බීජ අල එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
52. ස්පොටින් ස්ටාර් රේස් බයි රේස් ස්ථානයක් පවත්වාගෙන යාම
53. මහා පරිමානව බේකරි කෑම වර්ග වාහන මගින් අලෙවි කිරීම

54. කොන්ත්‍රාත්කරුවෙකු ලෙස කටයුතු කිරීම (හරිතාගාර, ගොඩනැගිලි, මාර්ග, සිවිලිම්)
55. ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෙකු ලෙස කටයුතු කිරීම (ගල්, වැලි, මැටල්)
56. අන්තර්ජාල සම්බන්ධතා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
57. කාබනික පොහොර භාවිතයෙන් එළවළු වගා කිරීමේ ගොවිපලක් පවත්වාගෙන යාම
58. බාත්රූම් කට්ටල විකිණීම
59. එළවළු, පළතුරු වර්ග සැපයීම (ස්ට්‍රෝබරි. බෙල්පෙපර් ඇතුළුව)
60. කිරි පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 08ට වැඩි එළදෙනුන්/එළුවන්)
61. භාණ්ඩ වර්ග රැගෙන ගොස් අලෙවි කිරීම (වානේ, ලී ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ)
62. විශේෂඥ වෛද්‍ය සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
63. එළවළු බීජ හා මල්පැල බීජ ආනයනය කර බෙදාහැරීම
64. මල් අතු රිකිළි නිෂ්පාදනය හා මල් බඳුන් සකස් කිරීම
65. තෙල චූර්ණ හා ආයුර්වේද ඖෂධ වර්ගයන් යන්ත්‍රානුසාරයෙන් ඇඹරීම
66. පිරිසිදු කිරීමේ දියර නිෂ්පාදනය හා විකිණීම
67. කොහු, ඉදල්, පැදුරු, පාපිසි වර්ග ඇතුළු නිෂ්පාදන අලෙවිය
68. තරාදි වර්ග රැගෙන ගොස් අලෙවි කිරීම
69. පෞද්ගලික විගණන ආයතනයක් පවත්වාගෙන යාම
70. ඇඳුම් වර්ග නිෂ්පාදනය කිරීම
71. සැපයුම්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම
72. ආයුර්වේද බෙහෙත් වර්ග නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
73. සැණකෙලි සඳහා විනෝද ක්‍රීඩා උපකරණ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
74. මිනිස්බල සැපයීමේ නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
75. සාත්තු සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

12 - 76/7

උඩපරණගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ජල ගාස්තු අය කිරීම

උඩපරණගම ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 30 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 1 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. දිනදාස රත්නායක,
සභාපති,
උඩපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

2025 නොවැම්බර් මස 03 දින,
උඩපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

උඩපරණගම ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක ජල යෝජනා ක්‍රම මගින් ජලය සැපයීම වෙනුවෙන් පහත සඳහන් පරිදි 2026 වර්ෂය සඳහා ජල ගාස්තු අය කිරීමට උඩපරණගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

	ගුරුත්ව බලයෙන් ක්‍රියාත්මක වන රු. ශත		ජල පොම්ප මගින් ක්‍රියාත්මක වන (උණුපාන) රු. ශත		ජල පොම්ප මගින් ක්‍රියාත්මක වන රු. ශත		ජල පොම්ප හා ජලය මිල දී ගෙන ක්‍රියාත්මක වන රු. ශත	
	ගෘහස්ථ	වාණිජ	ගෘහස්ථ	වාණිජ	ගෘහස්ථ	වාණිජ	ගෘහස්ථ	වාණිජ
1-5	15	23	40	60	40	60	63	88
6-10	23	30	50	70	50	70	75	113
11-15	30	38	70	100	70	100	113	138
16-20	53	68	90	130	90	130	138	175
21-25	75	98	120	150	120	150	175	213
26-30	113	120	160	200	160	200	213	250
31-40	135	150	190	220	190	220	250	288
41-50	158	180	230	250	230	250	300	338
51-75	188	210	270	280	270	280	350	388
75 ට වැඩි	218	225	290	320	290	320	400	438
ස්ථාවර ගාස්තු	275	375	575	675	425	525	525	675

නව ජල සම්බන්ධතා ලබා දීමේ දී හා/ හෝ නමක් මාරු කිරීමේ දී ආරක්ෂිත ඇප තැන්පත් මුදල ලෙස	සාමාජිකයාගේ පවුල් ඒකකය තුළ (දරුවන් සහ ඔවුන්ගෙ කලත්‍රයන්ට)- රු. 2,000.0 පවුල් ඒකකයෙන් පිටත - රු. 5,000.0	
ජල ගාස්තු නොගෙවීම හා ජලය අවභාවිතය පදනම් කරගෙන විසන්ධි කරන ලද ජල සැපයුමක් නැවත සන්ධි කිරීමේ ගාස්තුව ලෙස	රු. 2,000.0	
නමක් මාරු කිරීමේ දී හා/ හෝ පාරිභෝගික ඉල්ලීම් මත තාවකාලිකව විසන්ධි කරන ලද ජල සැපයුමක් නැවත ලබා දීමේ දී සේවා ගාස්තුව ලෙ	රු. 15,000.0	
ජල නල එළීම සඳහා මාර්ග පළුදු කිරීමේ ගාස්තු ලෙස	රු 5,000.0	
	ආපසු නොගෙවන තැන්පතු	ගෙවන තැන්පතු
	රු. 3,000.0	රු. 2,000.0
නව ජල සම්බන්ධතා ගාස්තුව ලෙස	රු. 20,000.0	

ජලය අවභාවිතය පදනම් කරගෙන විසන්ධි කරන ලද ජල සැපයුම නැවත සන්ධි කිරීම සඳහා අදාළ දඩ මුදල් හා ගාස්තු ගෙවා අවම වශයෙන් එක් මාසයක්වත් ඉක්ම විය යුතුය.
එහි දඩ මුදල් සකස් කිරීම සඳහා පහත සඳහන් නිර්ණායක අනුගමනය කළ යුතු වේ.

I. ජලය ලබා ගත් දින සිට විසන්ධි කළ දිනය දක්වා පාරිභෝජනයට ගෙන ඇති මාසික ජල ඒකක ගණනේ අවමය සහ උපරිමය සලකා බලා එහි මධ්‍යඅගය, එකී පාරිභෝගිකයා විසින් අයථා අයුරින් මාසිකව ලබාගෙන ඇති ජල ප්‍රමාණය ලෙස ගණනය කිරීම,

II. අනතුරුව එක් ජල ඒකකයක් සඳහා අය කරනු ලබන අවම ගාස්තුව පදනම් කර ගනිමින් එසේ මාසිකව අයථා ලෙස ලබාගෙන ඇති ජලය සඳහා අයකර ගත යුතු ගාස්තුව ගණනය කිරීම,

III. එසේ මාසිකව ගණනය කරන ලද මුදල අයථා ලෙස පාරිභෝජනය කර ඇති මාස ගණනින් වැඩිකර දඩ මුදල ගණනය කිරීම.

12-76/8

ඌවපරණගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා අක්කර බද්ද පැනවීම

ඌවපරණගම ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 30 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක 1 යටතේ ප්‍රාදේශීය සභාවට අදාළව පහත තීරණ ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. දිනදාස රත්නායක,
සභාපති,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

2025 නොවැම්බර් මස 03 දින,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134 (3) වගන්තිය ප්‍රකාරව, ඌවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ ස්ථිර හෝ නීතිපතා ගොවිතැන් කරන්නාවූ ද ඉඩම්වලින් පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන්ගෙන් යුත් අක්කර බද්දක් 2026වර්ෂය සඳහා අය කිරීම සුදුසු බවට ඌවපරණගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් එකට වැඩිමුත් ,

01. හෙක්ටයාර් 05 ට අඩුවන අවස්ථාවක	රු. 50.0 බැගින්
02. හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩිවන අවස්ථාවක එක් හෙක්ටයාරයකට	රු. 10.0 බැගින්

12 - 76/9

ඌවපරණගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

(267 අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වන ලද (තත් ආඥාපනතේ විස්තර කර ඇති) විනෝද කටයුත්තකට ඇතුලුවීම සඳහා කරන ලද ගෙවීම්වලින් මෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව බද්දක්, මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට පනවා අයකළ යුතු යැයි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) උපවගන්තියෙන් පැවරී ඇති බලතල පරිදි ගාස්තු අයකිරීම සුදුසු බවට ඌවපරණගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

01. ප්‍රේක්ෂකයින්ගෙන් මුදල් අයකර ප්‍රදර්ශනය කරනු ලබන චිත්‍රපට, සර්කස් සංදර්ශන, මැජික් සංදර්ශන, සංගීත සංදර්ශන හෝ ඕනෑම විනෝද සංදර්ශනයක් සඳහා නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% ක විනෝද බද්දක් එම සංදර්ශනය සිදුකරන අයගෙන් පනවා අය කිරීම.

12 - 76/10

ඌවපරණගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්ති ප්‍රකාරව මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව 2025.11.30 දිනැති තිරණ පොතේ 1 අංක යටතේ ඌව පරණගම ප්‍රාදේශීය සභාවට අදාළව පහත යෝජනා ගන්නා ලද් බව. මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. දිනදාස රත්නායක,
සභාපති,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

2025 නොවැම්බර් මස 03 දින,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව,
අඹගස්දෝව.

උපලේඛනය

		රු. ශත
•	මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින්රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25.0
•	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා	
	(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18.00
	(ආ) වෙළෙඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම්	4.00
	• සෑම කරත්තයක් සඳහා	20.00
	• සෑම අත්කරත්තයක් සඳහා	10.00
	• සෑම රික්ෂෝවක් සඳහා	7.50
	• සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15.00
	• සෑම අලියෙකු හෝ ඇතෙකු සඳහා	50.00

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මෙම උපලේඛනයේ ‘‘වෙළෙඳ කාර්යය’’ යන්නට විකිණීම සඳහා හෝ අන් ආකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 76/11

උහන ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2025 නොවැම්බර් මස 04 දින පවත්වන ලද විශේෂ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක UPS/11-SPECIAL/01-i යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. බී. විමලරත්න,
සභාපති,
උහන ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 19 දින,
උහන ප්‍රාදේශීය සභාව.

ඉහත කී තීරණය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) උප වගන්තියෙන් උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2026 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට සහ,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (3) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත්වන තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2026 මාර්තු මස 31 දිනට ප්‍රථම උහන ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි නියම කිරීමට උහන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි තීරණය කරමි.

උපලේඛනය

I තීරය	*II තීරය*
2025 වර්ෂයේදී ආදායම	*රු. ශත.*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	රු. 90.00
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	රු. 180.00
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	රු. 360.00
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	රු. 1200.00
රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	රු. 3000.00

12-27/1

උහන ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වැනි වගන්තියෙන් උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2025 නොවැම්බර් මස 04 දින පවත්වන ලද විශේෂ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක UPS/11-SPECIAL/01- ii යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. බී. විමලරත්න,
සභාපති,
උහන ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 19 දින,
උහන ප්‍රාදේශීය සභාව.

ඉහත කී තීරණය

(*අ*) 1987අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උප වගන්තියෙන් උහන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණුකල ප්‍රදේශයක් / ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයේ/ ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපලක 2024 වර්ෂයේදී බලපැවැත්වූ වාර්ෂික වටිනාකම 2026 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්,

(*ආ*) එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර උහන ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ දියුණුකල ප්‍රදේශයේ/ ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපලක වාර්ෂික වටිනාකමින් සියයට 10% ක වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත්,

(*ඇ*) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (6) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත වරිපනම් බද්ද 2026 වර්ෂයේ මාර්තු මස 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුල දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙසද, බද්දට යටත් වන සෑම පුද්ගලයෙකුටම විධාන කිරීමට උහන ප්‍රාදේශීය සභාව තීරණය කරමි.

12-27/2

උහන ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමඟ කියවිය යුතු 147 වගන්තිය යටතේ උහන ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2025 වර්ෂයෙහි නොවැම්බර් මස 04 දින පවත්වන ලද විශේෂ ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණ අංක UPS/11-SPECIAL/01- iii යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. බී. විමලරත්න,
සභාපති,
උහන ප්‍රාදේශීය සභාව.

කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 14 දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 06 - 87 යටතේ ඒකමතිකව අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල වන කුරුවිට මහජන පුස්තකාලය, කිරිඇල්ල ශාඛා පුස්තකාලය, එල්ලාවල ශාඛා පුස්තකාලය සහ දොඩම්පේ ශාඛා පුස්තකාලය වලට සම්බන්ධ පහත උප ලේඛනයේ සඳහන් සියළු ගාස්තු කුරුවිට ප්‍රාදේශීය සභාව වෙත හෝ අදාල උප කාර්යාලයන් වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. විකසිත පුෂ්පසූරිය,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

2025 නොවැම්බර් මස 18 දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු අංකය	විස්තරය	පාසල් ළමුන් සඳහා රු. ශත.	වැඩිහිටියන් සඳහා රු. ශත.
01	පුස්තකාල අයදුම් පත්‍ර ගාස්තු	25 0	25 0
02	සාමාජික ගාස්තු	50 0	200 0
03	සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු	50 0	50 0
04	ප්‍රමාද ගාස්තු (දිනකට)	2 0	5 0

12 - 28/16

කුරුවිට ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ජල බවුසරය ලබා දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

2025 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී අංක 06 - 86 දරන මහ සභා යෝජනාව පරිදි පහත සඳහන් ගාස්තු අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

		රු. ශත.
1.	කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජලය රහිත බවුසරය (ලීටර් 3000) සඳහා	14,000.00
2.	ප්‍රවාහනය කි.මී. 01ක් සඳහා	38.00
3.	කම්කරු (පුහුණු) කුලිය (රියදුරු හා සහයක) දිනකට (පැය 8ක් සඳහා)	3,500.00
4.	රඳවා ගැනීමේ ගාස්තු දිනකට	1,000.00

එම්. විකසිත පුෂ්පසූරිය,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

2025 නොවැම්බර් මස 18 දින,
කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 28/17

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වගන්තියේ (1) උපවගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද 1988.08.23 දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2006.06.16 දිනැති අංක 1450 දරන *ගැසට් පත්‍රය* මගින් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති I තීරයේ යම් පරිශ්‍රයක්, ස්ථානයක් සම්බන්ධයෙන් II තීරයේ සඳහන් අනුප්‍රමාණයෙන් යුත් බලපත්‍ර ගාස්තුවක් සෑම ව්‍යාපාරයක් මතම 2026 වර්ෂයට පනවා අය කිරීමටත්, අංක 1991 හා 2016.10.28 දිනැති ගැසට් පත්‍රයේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය අනුව හා අංක 520/7, 1988 අගෝස්තු මස 23 අහඹරුවාදා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 21 වගන්තියට අනුව අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම සඳහා බලපත්‍රයක් ලබා ගත යුතු යම් පරිශ්‍රයක්, ස්ථානයක් සම්බන්ධයෙන් II තීරයේ සඳහන් අනුප්‍රමාණයෙන් යුත් බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂයට පනවා අය කිරීමටත්,

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත අනුව සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පොළක් සඳහා ඊට අදාළ බලපත්‍ර ලබා දීමේදී අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2026 වර්ෂයට පනවා අය කිරීමටත්, ඉහත සඳහන් සියලුම බලපත්‍ර 2026.03.31 දිනට පෙර අදාළ ස්ථානයන්ට ලබා ගත යුතු බවත් කිරින්ද ප්‍රාදේශීය සභාව විසින් 2025 ජූලි 01 දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ සභා සම්මත වී ඇති බව මහජනතාව වෙත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා මෙයින් නිවේදනය කරමි.

2025 වර්ෂය සඳහා පනවන ලද එම බලපත්‍ර ගාස්තුව 2026 මාර්තු මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවා බලපත්‍ර ලබා ගත යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල.

2025 ජූලි මස 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය. ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වගන්තියේ (1) උප වගන්තියේ (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද 1988.08.23 දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව 2006.06.16 දිනැති අංක 1450 දරන ගැසට් පත්‍රය මගින් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා නියමයන් අනුව බලපත්‍රයක් ලබා ගත යුතු පහත උපලේඛන අංක 01 හි I තීරයේ යම් පරිශ්‍රයක්, ස්ථානයක් සම්බන්ධයෙන් II තීරයේ සඳහන් අනුප්‍රමාණයෙන් යුත් බලපත්‍ර ගාස්තුවක් සෑම ව්‍යාපාරයක් මතම 2026 වර්ෂයට පනවා අය කිරීමටත්,

අංක 1991 හා 2016.10.28 දිනැති ගැසට් පත්‍රයේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය අනුව හා අංක 520/7, 1988 අගෝස්තු මස 23 අහඹරුවාදා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 21 වගන්තියට අනුව අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම සඳහා බලපත්‍රයක් ලබා ගත යුතු යම් පරිශ්‍රයක්, ස්ථානයක් සම්බන්ධයෙන් II තීරයේ සඳහන් අනුප්‍රමාණයෙන් යුත් බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂයට පනවා අය කිරීමටත්,

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත අනුව සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පොළක් සඳහා ඊට අදාළ බලපත්‍ර ලබා දීමේ දී අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2026 වර්ෂයට පනවා අය කිරීමටත්, ඉහත සඳහන් සියලුම බලපත්‍ර 2026.03.31 දිනට පෙර අදාළ ස්ථානයන් විසින් ලබා ගත යුතු බවත් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය 01

I කිරුව		*II කිරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*ව්‍යාපාරය*	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු.750.00 ඉක්මවන එහෙත් රු.1,500.00 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
01	බේකරියක් පවත්වාගෙන යාම	500.00	750.00	1000.00
02	බත්කඩයක් හෝ භෝජනාගාරයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
03	තේ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
04	ලැහුම්හලක්/නවාතැන් ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
05	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
06	මස් වෙළෙඳසැලක් පවත්වගෙන යාම	500.00	750.00	1,000.00
07	මාළු වෙළඳසැලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
08	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
09	සංචාරක වෙළෙඳාම (එදිනෙදා පරිභෝජනය සඳහා ගනු ලබන ආහාර වර්ග වාහන මගින් ගෙන ගොස් මහා මාර්ගයේ වෙළෙඳාම් කිරීම	500.00	750.00	1,000.00
10	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
11	කිරි වෙළඳාම	500.00	750.00	1,000.00
12	හොටෙල්	500.00	750.00	1,000.00
13	ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
14	ගවගාලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම

උපලේඛනය - 02

01	ගල් මෝල්/ගල් වලක් (කබොක්, බොරළු හෝ කළු ගල් හෑරීමේ ස්ථානයක්) පවත්වාගෙන යාම/කළු ගල් පිපිරවීමේ ස්ථානයක්/යන්ත්‍රානුසාරයෙන් කළු ගල් කැඩීමේ (ක්‍රෂර්) ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
02	ගෑස් අලෙවිය	500.00	750.00	1,000.00
03	ගිනිකෙළි නිෂ්පාදනය/අලෙවිය/ගබඩා කිරීම	500.00	750.00	1,000.00

උපලේඛනය - 03

අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර

01	අවමංගල්‍ය ශාලා	500.00	750.00	1,000.00
02	රබර් එකතු කිරීමේ/රබර් ෂීට් එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
03	කෘෂි රසායන හා රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම/අලෙවි කිරීම	500.00	750.00	1,000.00
04	වාහන සර්විස් සෙන්ටර්	500.00	750.00	1,000.00

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බද්ද පැනවීම - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම එකී පනතේ 150 වගන්තියේ (1) (2) උපවගන්ති අනුව දක්වා ඇති පහත උපලේඛනයෙහි I තීරුවේ සඳහන් කර්මාන්තයේ වාර්ෂික වටිනාකමට අනුරූපීව II තීරුවේ සඳහන් බදු මුදලක් පනවා අය කිරීමට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2025 ජූලි 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එසේම, මෙකී බදු මුදල 2026.04.30 දිනට පෙර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල.

2025 ජූලි 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම එකී පනතේ 150 වගන්තියේ (1) (2) උපවගන්ති අනුව දක්වා ඇති පහත උපලේඛනයෙහි I තීරුවේ සඳහන් කර්මාන්තයේ වාර්ෂික වටිනාකමට අනුරූපීව II තීරුවේ සඳහන් බදු මුදලක් පනවා අය කළ යුතු බවටත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2026 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I තීරුව		*II තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තය*	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* රු. ශත	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* රු. ශත	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක* රු. ශත
01	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
02	ඇඟලුම් කම්හලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
03	තේ කුඩු, කුළු බඩු පැකට් විකිණීම	500.00	750.00	1,000.00
04	පාපැදි අලුත්වැඩියා කිරීම	500.00	750.00	1,000.00
05	වී මෝල්ක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

I තීරුව		*II තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තය*	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
06	යතුරු පැදි, ත්‍රී රෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
07	සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය කිරීම	500.00	750.00	1,000.00
08	ටයර් ටියුබ් අලුත්වැඩියා කිරීම	500.00	750.00	1,000.00
09	විදුලි උපකරණ හෝ රේඩියෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
10	පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
11	ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
12	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
13	අත් යන්ත්‍ර මගින් හෝ විදුලි බලයෙන් හෝ ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
14	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
15	කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
16	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
17	බීරළු කැටයම් වැඩපළක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
18	හුණු පිළිස්සීමේ හෝ විකිණීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
19	කොප්පරා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
20	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
21	වායු සමීකරණ හා ශීතකරණ, අධි ශීතකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
22	ඉදල්, පාපිසි, කොහු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
23	මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
24	රන් රිදී ලෝහ ආලේපන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*කර්මාන්තය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750.00 නොඉක්මවන අවස්ථාවක	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
25	මැණික් කැපීම හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
26	ප්ලාස්ටික් ෆයිබර් ග්ලාස් නිපදවන කර්මාන්තයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
27	ලී මෝල්ක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
28	කම්මලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
29	කුකුළු කොටුවක් හෝ ගොවිපළක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
30	කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
31	පරණ ලෝහ ගබඩා කිරීම හෝ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
32	විසිරි පින්තාරු (ස්ප්‍රේ පේන්ටින්) ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1.000.00
33	පෑස්සුම් (වෙල්ඩින්) (අයන් වර්ක්ස්) ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
34	පෞද්ගලික ජලවිදුලි බලාගාරයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
35	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1.000.00
36	අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
37	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
38	පාවහන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
39	සුරුට්ටු හෝ බීඩි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
40	රබර් දුම් ගැසීමේ හා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
41	මෝටර් වාහන සඳහා බොඩි සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
42	පැණිරි තෙල් හෝ කුරුඳු තෙල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
43	ස්වර්ණාභරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
44	බිම් මල් වගා කිරීමේ හා පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

I තීරුව		*II තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තය*	*රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
45	පැකට් බඩු නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
46	සීනි බෝල හා ග්ලූකෝස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
47	යන්ත්‍රානුසාරයෙන් හෝ යන්ත්‍ර නොමැතිව මෙවට නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
48	වේවැල් භාණ්ඩ නිපදවීම, ගබඩා කර තබා ගැනීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
49	පිත්තල බඩු නිපදවීමේ හෝ ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
50	විනාකිරි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
51	සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
52	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
53	රබර් මුද්‍රා සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
54	හකුරු හෝ පැණි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
55	කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
56	ප්‍රතිමා නෙළීමේ හා ගල් ස්මාරක නෙළීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
57	කාබනික පොහොර නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
58	විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
59	ජලය බෝතල්ගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
60	රට උළු කම්හලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
61	පෞද්ගලික ජල ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
62	ආයුර්වේද ඖෂධ හා තෙල් වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බද්ද පැනවීම - 2025 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ 147 වගන්තිය හෝ එකී පනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ හා එකී පනතේ 150 (1) වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් වෙළඳ ව්‍යාපාරයක් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මත මෙහි පහත උපලේඛන I හි I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2026 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2025 ජූලි 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා පනවන ලද එම ව්‍යාපාර බද්ද එම වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල

2025 ජූලි මස 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ 147 වගන්තිය හෝ එකී පනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ හා එකී පනතේ 150 (1) වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් වෙළඳ ව්‍යාපාරයක් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මත මෙහි පහත උපලේඛන I හි I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණය අනුව වූ උපලේඛන II හි සඳහන් පරිදි ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2026 වර්ෂයේ අප්‍රේල් මස 30 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය I

I තීරුව *ව්‍යාපාරයේ ආදායම*		*II තීරුව* *ගෙවිය යුතු බදු ප්‍රමාණය* *රු. ශත*
01.	රු. 6,000 ක් නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නැත
02.	රු. 6,000 ක් ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03.	රු. 12,000 ක් ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
04.	රු. 18,750 ක් ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
05.	රු. 75,000 ක් ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
06.	රු. 1,50,000 ක් ඉක්මවන අවස්ථාවක	3,000 0

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයේ පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2026 වර්ෂයේ නව තක්සේරුව අනුව ප්‍රමාණවත් වාර්ෂික වටිනාකම 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හතක (7%) වරිපනම් බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට සහ ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) උපවගන්තියේ විධිවිධාන යටතේ 2026 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් කාර්තු 04 තුළ දී සමාන වාරික 04කින් ගෙවීමට විධාන කිරීමටත් එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2026 වර්ෂයෙහි ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවේ පළමු මාසය තුළ දී අදාළ වරිපනම් බදු ගෙවන්නේ නම් එම කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) ක වට්ටමක් ද ලබා දෙනු ලැබේ.

ඉහත සඳහන් පරිදි නියමිත දිනට පසුව ගෙවීම් කරන ගාස්තු මත 15%ක වරෙන්තු වියදම් අය කිරීමට ද කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2025 ජූලි 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල

2025 ජූලි මස 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයේ පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2025 වර්ෂයේ නව තක්සේරුව අනුව පනවන වාර්ෂික වටිනාකම 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හතක (7%) වරිපනම් බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට, සහ ඒ වරිපනම් බද්ද, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) උපවගන්තියේ විධිවිධාන යටතේ 2026 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් කාර්තු 04 තුළ දී සමාන වාරික 04 කින් ගෙවීමට විධාන කිරීමටත් එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2026 වර්ෂයෙහි ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවේ පළමු මාසය තුළ දී අදාළ වරිපනම් බදු ගෙවන්නේ නම් එම කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද ලබා දෙනු ලැබේ. ඉහත සඳහන් පරිදි නියමිත දිනට පසුව ගෙවීම් කරන ගාස්තු මත 15%ක වරෙන්තු වියදම් අය කළ යුතු බව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 37/4

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

අක්කර බදු අය කිරීම - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ, 134 වගන්තියේ (3) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම, 2024 වර්ෂයේ දී බලාත්මක වූ වාර්ෂික වටිනාකම 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල පිහිටි හෙක්ටයාර් එකකට නොඅඩු

එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (50.00) අනු ප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි සෑම ඉඩමක සෑම හෙක්ටයාරක් මත රුපියල් දහය (10.00) බැගින් වූ වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ, 134 වගන්තියේ (6) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථෝක්ත බද්ද 2026 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු හතර තුළ දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්දට යටත් සෑම තැනැත්තෙකුට විධාන කළ යුතු යැයි ද කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2025 ජූලි මස 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා සම්පූර්ණ අක්කර බද්ද 2026 ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත්, එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයෙන් අවසන් දිනයට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල

2025 ජූලි මස 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 134 වගන්තියේ (3) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමක ම 2025 වර්ෂයේ දී බලාත්මක වූ වාර්ෂික වටිනාකම 2026 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්,

(ආ) කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල පිහිටි හෙක්ටයාර් එකකට නොඅඩු එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (50.00) අනු ප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි සෑම ඉඩමක සෑම හෙක්ටයාරයක් මත රුපියල් දහය (10.00) බැගින් වූ වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ,

(ඇ) 134 වගන්තියේ (6) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථොක්ත බද්ද 2026 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් කාර්තු හතර තුළ දී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්දට යටත් සෑම තැනැත්තෙකුට විධාන කිරීමටත්, 2026 වර්ෂය සඳහාවන සම්පූර්ණ අක්කර බද්ද 2025 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයෙන් අවසන් දිනයට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක් ද ගෙවනු ලබන බවත් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 37/5

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු හා පරීක්ෂණ ගාස්තු පැනවීම - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු හා පරීක්ෂණ ගාස්තු පනවා අය කිරීමට 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 2264/18 දරන 2022 ක් වූ ජනවාරි මස 27 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ''ඇ'' කොටසේ නියමිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත පහත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මෙහි සඳහන් උපලේඛනයේ සඳහන් ක්‍රියා පටිපාටියට අනුව 2026 වර්ෂය සඳහා කර්මාන්ත හිමිකරුවන් විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු හා පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු බවටත්, ඒ අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, අවලංගු කිරීම, ප්‍රතික්ශේප කිරීම හා අත්හිටුවීම සම්බන්ධව

සලකා බලන බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2025 ජූලි මස 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල.

2025 ජූලි 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු හා පරීක්ෂණ ගාස්තු පනවා අය කිරීමට 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 2264/18 දරන 2022 ක් වූ ජනවාරි මස 27 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* "ඈ" කොටසේ නියමිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත පහත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මෙහි සඳහන් උපලේඛනයේ සඳහන් ක්‍රියා පටිපාටියට අනුව 2026 වර්ෂය සඳහා කර්මාන්ත හිමිකරුවන් විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු හා පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු බවටත්, ඒ අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, අවලංගු කිරීම, ප්‍රතික්ශේප කිරීම හා අත්හිටුවීම සම්බන්ධව සලකා බැලිය යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

කර්මාන්තයේ ස්වභාවය අනුව :

01.	පරීක්ෂණ ගාස්තු මුදල	-	රු. 3,000 0 සිට රු. 10,000 0 ක් දක්වා වූ උපරිමයකට යටත්ව අය කිරීම
02.	පරිසර බලපත්‍ර ගාස්තු මුදල	-	රු. 4,500 0
	පරිසර බලපත්‍රය සඳහා මුද්දර ගාස්තු	-	රු. 450 0

උපලේඛනය

"ඈ" කොටස

1.	සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
2.	සේවක සංඛ්‍යාව 5 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත.
3.	සේවක සංඛ්‍යාව 5 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4.	රෙදි වියන යන්ත්‍ර මැෂින් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත.
5.	දිනකට ලීටර 200 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල් තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.
6.	පොල් තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර 10 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.
7.	දිනකට ලීටර 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මද්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත.
8.	දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවයක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල.
9.	මසකට කිලෝග්‍රෑම් 1,000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්.

10.	සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිශ්පාදන කර්මාන්ත.
11.	එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
12.	සේවක සංඛ්‍යාව 5 ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසීම් කිරීමේ කර්මාන්ත
13.	සේවක සංඛ්‍යාව 5 ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත.
14.	සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත.
15.	දිනකට පිටි කිලෝග්‍රෑම් 250 ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත.
16.	ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500 ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂී ගොවිපලවල්.
17.	ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 5 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්.
18.	ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25 ක් හෝ ඊට වැඩි සහ 50 ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්.
19.	වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල් =
	= මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය + [පක්ෂීන් සංඛ්‍යාව] 50 x [ඌරන් සංඛ්‍යාව + ගවයන් සංඛ්‍යාව = 10]
20.	ගබඩා ධාරිතාවය සන මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21.	කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත.
22.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
23.	දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්ට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24.	සේවක සංඛ්‍යාව 5කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින ප්ලාස්ටර් ඔෆ් පැරිස් අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්
25.	බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත
26.	උළු සහ ගඩොල් පෝරණු
27.	වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
28.	කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29.	පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු
30.	දිනකට සන මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවයක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31.	දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත

32.	බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත
33.	සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙළ කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා
34.	පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැහුම් හල්
35.	විසිරි පින්තාරු කිරීම් හෝ වාහන වායු සම්කරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ
36.	වාහන සේවා සිදුනොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත
37.	ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
38.	මෘත ශරීර කල්තබා ගැනීමට සකස් කිරීම සහිත මල්ශාලා
39.	මෙම උපලේඛනයේ ඈ කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්ත ව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/කර්මාන්තයක්

12 - 37/6

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

නිවාස හා දේපළ සංවර්ධන හා කැබලි කරන ලද ඉඩම්වල සැලසුම් අනුමත කිරීම,
ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු හා පෙරසැරි ගාස්තු අය කිරීම - 2026 වර්ෂය

I. නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නිවාස දේපළ සංවර්ධන හා කැබලිකරන ලද ඉඩම් වල සැලසුම් අනුමත කිරීම, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු හා පෙරසැරි ගාස්තු අය කිරීමේ ගාස්තු පනවා අය කිරීමට 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221 (අ) වගන්තිය සමග කියවිය යුතු 122 හා 126 යන වගන්තිවලින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති විධිවිධාන මත හා ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත 2021.07.08 දිනැති අංක 2235/54 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* නියෝග රෙගුලාසිවලට අනුකූලව හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධානවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ නිවාස දේපළ සංවර්ධනය හා කැබලි කරන ලද ඉඩම්වල සැලසුම් අනුමත කිරීමේ ගාස්තු හා පෙරසැරි ගාස්තු, ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් සඳහා ගාස්තු 2026 වර්ෂයේ ජනවාරි මස 01 දා සිට බලපැවැත්වෙන පරිදි පනවා අය කළ යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2025 ජූලි 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල.

2025 ජූලි මස 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නිවාස දේපළ සංවර්ධන හා කැබලිකරන ලද ඉඩම් වල සැලසුම් අනුමත කිරීම, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු හා පෙරසැරි ගාස්තු අය කිරීමේ ගාස්තු පනවා අය කිරීමට 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221 (අ) වගන්තිය සමග කියවිය යුතු 122 හා 126 යන වගන්තිවලින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති විධිවිධාන මත හා ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත 2021.07.08 දිනැති අංක 2235/54 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* නියෝග රෙගුලාසිවලට අනුකූලව හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධානවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ නිවාස දේපළ සංවර්ධනය හා කැබලි කරන ලද ඉඩම්වල සැලසුම් අනුමත ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් සඳහා ගාස්තු 2026 ජනවාරි මස 01 දා සිට බලපැවැත්වෙන පරිදි පනවා අය කළ යුතු බව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 37/7/1

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

නිවාස හා දේපළ සංවර්ධන හා කැබලි කරන ලද ඉඩම්වල සැලසුම් අනුමත කිරීම,
ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු හා පෙරසැරි ගාස්තු අය කිරීම - 2026 වර්ෂය

ii. නාගරික සංවර්ධන බල ප්‍රදේශයෙන් පිටත

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නිවාස දේපළ සංවර්ධන හා කැබලිකරන ලද ඉඩම් වල සැලසුම් අනුමත කිරීම, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු හා පෙරසැරි ගාස්තු අය කිරීමේ ගාස්තු පනවා අය කිරීමට 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221 (අ) වගන්තිය සමග කියවිය යුතු 122 හා 126 යන වගන්තිවලින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති විධිවිධාන මත පහත උපලේඛනය අනුව නාගරික සංවර්ධන බල ප්‍රදේශයෙන් පිටත නිවාස දේපළ සංවර්ධනය හා කැබලි කරන ලද ඉඩම්වල සැලසුම් අනුමත කිරීම හා ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් සඳහා ගාස්තු 2026 වර්ෂයේ ජනවාරි මස 01 දා සිට බලපැවැත්වෙන පරිදි ගාස්තු පනවා අය කළ යුතු බව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව 2025 ජූලි 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල

2025 ජූලි මස 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නිවාස දේපළ සංවර්ධන හා කැබලිකරන ලද ඉඩම් වල සැලසුම් අනුමත කිරීම, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු හා පෙරසැරි ගාස්තු අය කිරීමේ ගාස්තු පනවා අය කිරීමට 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221 (අ) වගන්තිය සමග කියවිය යුතු 122 හා 126 වගන්තිවලින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති විධිවිධාන මත පහත උපලේඛනය අනුව නාගරික සංවර්ධන බල ප්‍රදේශයෙන් පිටත නිවාස දේපළ සංවර්ධනය හා කැබලි කරන ලද ඉඩම්වල සැලසුම් අනුමත කිරීම හා ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් සඳහා 2026 වර්ෂයේ ජනවාරි මස 01 දා සිට බලපැවැත්වෙන පරිදි ගාස්තු පනවා අය කළ යුතු බව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

<table>
<tr><td colspan="5">සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම හා කාලය දීර්ඝ කිරීම සඳහා පෙරසැරි ගාස්තු</td></tr>
<tr><td>සංවර්ධන කාර්යයේ ස්වභාවය</td><td colspan="4">අයකළ යුතු ගාස්තු</td></tr>
<tr><td>1. ඉඩමේ අනුබෙදුම් සඳහා</td><td colspan="2">ඉඩමේ ප්‍රමාණය (ව.මී)</td><td colspan="2">පෙරසැරි ගාස්තු</td></tr>
<tr><td></td><td colspan="2">ව. මී. 150 - ව. මී 300</td><td colspan="2">කැබලි 1ක් සඳහා රු. 750.00</td></tr>
<tr><td></td><td colspan="2">ව. මී. 301 - ව. මී 600</td><td colspan="2">කැබලි 1ක් සඳහා රු. 600.00</td></tr>
<tr><td></td><td colspan="2">ව. මී. 601 - ව. මී 900</td><td colspan="2">කැබලි 1ක් සඳහා රු. 500.00</td></tr>
<tr><td></td><td colspan="2">ව. මී. 900ට වැඩි</td><td colspan="2">කැබලි 1ක් සඳහා රු. 400.00</td></tr>
<tr><td>2. මායිම් තාප්ප/රැඳවුම් බැම් ඉදිකිරීම</td><td colspan="2">දික් මීටර් 1ක් සඳහා</td><td colspan="2">රු. 80.00</td></tr>
<tr><td>3. සන්නිවේදන කුළුණු/ඇන්ටනා කුළුණු/සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම</td><td colspan="4">රු. 40,000.00</td></tr>
<tr><td>4. ඉන්ධන පිරවුම්හල්/ වාහන සේවා ස්ථාන / දුම් පරීක්ෂා කරන ස්ථාන</td><td colspan="2">ව. මී. 1 කට</td><td colspan="2">රු. 100.00</td></tr>
<tr><td rowspan="6">5. නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි</td><td rowspan="2">ගෙබිම් ප්‍රමාණය (ව. මී)</td><td>නේවාසික (ව. මීටර් 1කට)</td><td>(ව.මීටර් 1 කට)</td><td rowspan="2">නේවාසික නොවන (ව. මීටර් 1කට)</td></tr>
<tr><td>තනි පුද්ගල</td><td>මහල් නිවාස</td></tr>
<tr><td>ව මී. 400 දක්වා</td><td>රු. 20</td><td>රු. 25</td><td>රු. 25</td></tr>
<tr><td>ව. මී, 401-1,000</td><td>රු. 22</td><td>රු. 27</td><td>රු. 27</td></tr>
<tr><td>ව. මී. 1,001 - 1,500</td><td>රු. 25</td><td>රු. 30</td><td>රු. 30</td></tr>
<tr><td>ව. මී. 1,501 - 2,000</td><td>රු. 25</td><td>රු. 32</td><td>රු. 32</td></tr>
<tr><td>ව. මී 2,000ට වැඩි</td><td>වැඩිවන සෑම ව. මී. 90ක් සඳහාම රු. 2,000.00 බැගින්</td><td>වැඩිවන සෑම ව. මී. 90ක් සඳහාම රු. 2,000.00 බැගින්</td><td>වැඩිවන සෑම ව. මී 90ක් සඳහාම රු. 2000.00 බැගින්</td></tr>
<tr><td rowspan="5">6. වාණිජ පරමාර්ථයෙන් සිදු කරනු ලබන
i. පිහිනුම් තටාක
(තටාකයේ ඩෙක් සමඟ)

ii. සූර්ය පැනල සඳහා</td><td colspan="2">ගාස්තු</td><td colspan="2">ගාස්තුව (රු.)</td></tr>
<tr><td colspan="2">ව. මී. 300 දක්වා</td><td colspan="2">රු. 6,000/-</td></tr>
<tr><td colspan="2">ව. මී. 301-500</td><td colspan="2">රු. 15,000/-</td></tr>
<tr><td colspan="2">ව. මී. 501-1000</td><td colspan="2">රු. 30,000/-</td></tr>
<tr><td colspan="2">ව. මී. 1000ට වැඩි</td><td colspan="2">රු. 30,000/- + වැඩිවන සෑම ව. මී. 100 හෝ ඉන් කොටසක් සඳහා රු. 1,000/- බැගින්</td></tr>
<tr><td>7.
i. අනුමත සැලසුමට අමතරව ගෙබිම් ප්‍රමාණය වැඩි සේ සිදු කරන වෙනස් කිරීම් හා එකතු කිරීම</td><td colspan="4">මුළු පෙරසැරි ගාස්තුවෙන් 25% + වැඩි අමතර වර්ග ප්‍රමාණය සඳහා පෙරසැරි ගාස්තුව</td></tr>
</table>

ii. ගෙබිම් ප්‍රමාණය වෙනස් කිරීමක් නොමැතිව අනුමත සැලැස්ම තුළ සිදු කරනු ලබන වෙනස් කිරීම්	මුල් අනුමැතියේ දී ගෙවන ලද පෙරසැරි ගාස්තුවෙන් 25%	
8. සංවර්ධන බලපත්‍රයක් වෙනත් පාර්ශ්වයකට පැවරීම	රු. 25,000/-	
9. සංවර්ධන බලපත්‍රයේ වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම	i. ව. මී. 1000 දක්වා	රු. 5,000/-
	ii. ව. මී. 1000ට වැඩි	රු. 10,000/-
හරිත ගොඩනැගිලි සහතිකය සඳහා ගාස්තු		
සංවර්ධන කාර්යයේ ස්වභාවය	පෙරසැරි ගාස්තුව (බදු රහිත) රුපියල්	
01. සියලුම භාණ්ඩ සඳහා හරිත ගොඩනැගිලි (සහතිකය සඳහා ලියාපදිංචි වීම)	රුපියල් 5,000/-	
02. අවසාන හරිත ගොඩනැගිලි සහතිකය ලබා ගැනීම (උපරිම පෙරසැරි ගාස්තුව මිලියන 1)	වර්ග මීටරයකට ගාස්තුව	
i. සහතික මට්ටම	රු. 600/-	
ii. රිදී මට්ටම	රු. 500/-	
iii. රන් මට්ටම	රු. 400/-	
iv. ප්ලැටිනම් මට්ටම	රු. 300/-	
අවසාන හරිත ගොඩනැගිලි සහතිකය සඳහා අයදුම්පත භාරදෙනු ලබන අවස්ථාවේ දී 75% ක මූලික ගෙවීමක් සිදු කළ යුතු ය.		
03. රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතන, ආගමික ස්ථාන, රජයේ සෞඛ්‍ය ආයතන සහ වැඩිහිටි සහ ළමා නිවාස	ව. මී. ට රු. 50/-	
බලපත්‍රය නිකුත් කරන අවස්ථාවේ දී ඉල්ලුම් කර ඇති හරිත මට්ටම හා අනුකූලතා සහතිකය නිකුත් කරන අවස්ථාවේ දී ළඟා කරගෙන ඇති හරිත මට්ටමෙහි යම් වෙක්පත් පවතී නම් ලබාන කාර්යය ඇති මට්ටම අනුව ගෙවිය යුතු පෙරසැරි ගාස්තුවෙහි වෙනස ප්‍රතිපූර්ණය කොට අනුකූලතා සහතිකය ලබා ගත යුතු ය.		
ආවරණ අනුමැතිය ලබාදීම සඳහා සේවා ගාස්තු (පෙරසැරි ගාස්තු වලට අමතරව)		
සංවර්ධනයේ ස්වභාවය	අයකළයුතු ගාස්තු (බදු රහිත)	
01. අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සිදුකරන ලද ඉඩම් බෙදීමක් සඳහා	ඉඩම් කැබලි 1 ක් සඳහා රු. 3,000/- බැගින්	
02. අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම / එකතු කිරීම් / නැවත ඉදිකිරීම	නේවාසික (ව. මී. 1කට)	නේවාසික නොවන (ව. මී. 1කට)
i. අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම දක්වා)	රු. 150/-	රු. 375/-
ii. වහල මට්ටම දක්වා ඉදිකිරීම් ටැම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට (වහලය හැර)	රු. 225/-	රු. 750/-
iii. වහලය සහිත බිත්ති ඉදිකිරීම	රු. 300/-	රු. 1,100/-
iv. පදිංචි වීම සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කිරීම	රු. 375/-	රු. 1,500/-
v. මායිම් තාප්ප/ රැඳවුම් බිත්ති ඉදිකිරීම	රු. 150/- (දික් මීටරයක් සඳහා)	රු. 375/- (දික් මීටරයක් සඳහා)

vi. විදුලි සංදේශ, සම්ප්‍රේෂණ සහ ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම	බිම් පාදම ඉදිකිරීම රු. 150,000/- වහල මුදුන ඉදිකිරීම රු. 250,000/-		
03. අනුකූලතා සහතිකය (CoC) ලබා නොගෙන පදිංචි වීම	දිනකට රු. 50/-		
04. වාහන නැවැත්වීමේ ස්ථන (පරිශ්‍රය තුළ ලබා දී නොමැති විට එක් එක් වාහන නැවැත්වීමේ ඉඩ සඳහා සේවා ගාස්තු)	සියලුම වාහන සඳහා රු. 150,000.00		
5. රථ වාහන නැවැත්වීමේ ඉඩ වෙනත් භාවිතයන් සඳහා භාවිතා කිරීම	එක ඉඩකඩක් සඳහා රු. 10,000.00ක් සහ අනුමත සැලැස්ම පරිදි වාහන නැවැත්වීමට පරිවර්තනය තෙක් වසරකට 10%ක වර්ධනයක් සහිතව		
අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම සඳහා ගාස්තු			
සංවර්ධන කාර්යයේ ස්වභාවය	අයකළ යුතු ගාස්තු (බදු රහිත)		
1. ඉඩම් අනුබෙදුම් කිරීම	එක් කැබැල්ලකට රු. 1,000/-		
2. ගොඩනැගිලි ඉදිකිරීම	ගෙබිම් ප්‍රමාණය (ව.මී.)	නේවාසික	නේ වා සි ක නොවන
		තනි පුද්ගල	මහල් නිවාස
	ව.මී. 400 දක්වා	රු. 4,000/-	රු. 5,000/-	රු. 5,000/-
	ව.මී. 400 ට වැඩි	රු. 4,000/- + ව.මී. 400ට වැඩි සෑම ව.මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 15 බැගින්	රු. 5,000/- + ව.මී. 400ට වැඩි සෑම ව.මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 20 බැගින්	රු. 5,000/- + ව.මී. 400ට වැඩි සෑම ව.මී. 1 ට හෝ ඉන් කො ට ස ක් සඳහා රු. 25 බැගින්
3. සංනිවේදන කුළුණු, ඇන්ටෙනා කුළුණු/ සම්ප්‍රේෂණ කුළුණු සඳහා	රු. 5,000/-		
4. මායිම් තාප්ප හා රැඳවුම් බැම්	දික් මීටර් 1කට රු. 25/- බැගින්		
5. පොදු ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතිකය අලුත් කිරීම	රු. 10,000/-		
පෙරසැරි ගාස්තු	ගෙබිම ප්‍රමාණය (ව.මී)	ගාස්තුව (රුපියල්) (බදු රහිත)	
	45 දක්වා	1,000/-	
	41-90	1,500/-	
	91-180	1,750/-	
	181-270	2,000/-	
	271-450	2,500/-	
	451-675	2,750/-	
	676-900	3,000/-	

	900ට වැඩි	වර්ග මීටර් 900ට වැඩිවන සෑම වර්ග මීටර් 90ක් සඳහාම රු. 500/- බැගින්
අවසර පත්‍රය සඳහා ගාස්තු : i. නේවාසික භාවිතයක් වෙනත් භාවිතයක් සඳහා යොදා ගැනීම	වර්ග මීටරයක් සඳහා රු. 500/-	
ii. නේවාසික නොවන අනිකුත් භාවිතයක් වෙනත් භාවිතයක් සඳහා යොදා ගැනීම	වර්ග මීටරයක් සඳහා රු. 300/-	

සටහන :

ඉහත සඳහන් ගාස්තුවලට අමතරව ස්ථානීය පරීක්ෂාව සඳහා ප්‍රවාහන ගාස්තු වශයෙන් කිලෝ මීටරයට රු. 175.00 ක අතිරේක ගාස්තුවක් අය කෙරේ. කෙසේ වෙතත් පළාත් පාලන ආයතන විසින් වෙළඳ පොළෙහි ඉන්ධන මිලෙහි වෙනස්කම් අනුව මූලික ගාස්තුව වෙනස් කරනු ලැබිය හැක. (ගණනය කිරීම 2022/06/27)

නාගරික බල ප්‍රදේශයෙන් පිටත ඉහත සඳහන් කර ඇති ගාස්තු අයකිරීම්වලට අමතරව යම් අවශ්‍යතාවයක් ඇති වුවහොත් 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැළසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසිවලට අදාළ අංක 2235/54 හා 2021 ජූලි මස 08 බ්‍රහස්පතින්දා 2021.07.08 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* අනුව ක්‍රියාකරන බව දැනුම් දෙමි.

12 - 37/7/(ii)

කිරින්ද - පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්, ආපන ශාලා හා ලැඟුම්හල් සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නවාතැන් පොළ ගාස්තු පනවා අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන් පොළක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන අවස්ථාවක, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පළ අනුමත කර හෝ පිළිගන්නා ලැබූ අවුරුද්දට පෙර වර්ෂයේ ලද ආදායමින් 1%ක බද්දක් නවාතැන්පළ පළමු අවුරුද්ද අවස්ථාවක ඒ ගාස්තුව එම ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුව තීරණය කර අය කිරීමට කටයුතු කර ඇති බැවින්, එම බදු මුදල් 2026 වර්ෂයේ මාර්තු මස 31 දිනට ප්‍රථම ගෙවීමට කටයුතු කළ යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව 2025 ජූලි මස 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා පනවන ලද නවාතැන් පොළ ගාස්තුව 2026 මාර්තු මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල

2025 ජූලි මස 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,නවාතැන් පොළ ගාස්තු පනවා අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන් පොළක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන අවස්ථාවක, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පළ

අනුමත කර හෝ පිළිගන්නා ලැබූ අවුරුද්දට පෙර වර්ෂයේ ලද ආදායමින් 1%ක බද්දක් ද නවාතැන්පළ පළමු අවුරුද්ද අවස්ථාවක ඒ ගාස්තුව එම ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුව තීරණය කර අය කිරීමට කටයුතු කර ඇති බැවින් එම බදු මුදල් 2026 වර්ෂයේ මාර්තු මස 31 දිනට ප්‍රථම ගෙවීමට කටයුතු කළ යුතු බව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 37/8

කිරින්ද - පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකිරීම - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 1988.08.23 දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළාත් පාලන ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථාවේ ඡේදය යටතේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි එක් එක් දැන්වීමකට මුදලක් 2026 වර්ෂයට අය කිරීම කළ යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව 2025 ජූලි 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල

2025 ජූලි 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය..

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළාත් පාලන ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථාවේ 39 ඡේදය යටතේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි එක් එක් දැන්වීමකට මුදලක් 2026 වර්ෂයට අය කිරීම කළ යුතු බව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය 01

ප්‍රචාරක දැන්වීම්	*දැන්වීම් පුවරු වර්ෂයක් සඳහා (වර්ග අඩියකට)*	*බැනර් හා කටවුට් සඳහා*	
		මාසයක් සඳහා (වර්ග අඩියකට)	*මාසයකට වැඩි (වර්ග අඩියකට)*
01. පෞද්ගලික පරිශ්‍රයේ ඉදිකරනු ලබන හෝ ප්‍රදර්ශනය කරන දැන්වීම්	රු. 100 0	රු. 40 0	රු. 50 0
02. මහා මාර්ගයට පෙනෙන පරිදි අවකාශීය ඉඩකට භාවිත කරමින් මහා මාර්ගයට යාබද ඉදිකරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම්	රු. 100 0	රු. 40 0	රු. 50 0
03. පළාත් පාලන ආයතන පරිශ්‍රයන් ප්‍රයෝජනයට ගනිමින් ඉදිකරනු ලබන දැන්වීම්	රු. 100 0	රු. 40 0	රු. 50 0
04. අන්තර් ජාතික සමාගම් මගින් ප්‍රදර්ශනය කරන දැන්වීම් පුවරු සඳහා	රු. 200 0	-	-

කිරින්ද - පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

රථ වාහන බදු පැනවීම - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වගන්තිය සහ (4) උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයේ දී පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් කිසියම් වාහනයක් තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි II තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට ද, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් කිසියම් වාහනයක් තබාගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2026 වර්ෂය සඳහා මෙම බද්ද, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව 2025 සැප්තැම්බර් 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල.

2025 සැප්තැම්බර් 08 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය..

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වගන්තිය සහ (4) උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයේ දී පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් කිසියම් වාහනයක් තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි II තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට ද, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් කිසියම් වාහනයක් තබාගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2026 වර්ෂය සඳහා මෙම බද්ද, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I තීරුව		*II තීරුව*	*රු. ශත*
01.	(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීප් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
	(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
		(අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
		(ආ) වෙළෙඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0

02. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12 - 37/10

කිරින්ද - පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම් විකිණීමෙන් ලත් ආදායමින් 1% ට සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවට 2026 වර්ෂයට ගෙවිය යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව 2025 ජූලි මස 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල

2025 ජූලි මස 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය..

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම් විකිණීමෙන් ලත් ආදායමින් 1% ට සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා හෝ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවට 2026 වර්ෂයට ගෙවිය යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 37/11

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු අය කිරීම - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත්කර ඇති සීමාව ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ

(ආ) එම ඉඩමෙහි ගොඩනැගිලිවලට සත්‍ය වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය හා එම ඉඩමෙහි සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය නියමිත ප්‍රමාණයට වඩා අඩු නම් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නා වූ හෝ

(ඇ) ඒ ඉඩමේ ස්ථාවර නැතහොත් නිතිපතා කරන ගොවිතැනට යොදවා නොමැති අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් (2%) වූ බද්දක් සංවර්ධනය නොකළ ඉඩම්වලින් බදු වශයෙන් ඉඩම් අයිතිකරුවන්ගෙන් 2026 වර්ෂය සඳහා අයකළ යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව 2025 ජූලි 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල

2025 ජූලි මස 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය..

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත්කර ඇති සීමාව ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ

(ආ) එම ඉඩමෙහි ගොඩනැගිලිවලට සත්‍ය වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය හා එම ඉඩමෙහි සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය නියමිත ප්‍රමාණයට වඩා අඩු නම් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නා වූ හෝ

(ඇ) ඒ ඉඩමේ ස්ථාවර නැතහොත් නිතිපතා කරන ගොවිතැනට යොදවා නොමැති අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් (2%) වූ බද්දක් සංවර්ධනය නොකළ ඉඩම්වලින් බදු වශයෙන් ඉඩම් අයිතිකරුවන්ගෙන් 2026 වර්ෂය සඳහා අයකළ යුතු බවට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යොජනා කරන්නීය.

12 - 37/12

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

විනෝද බදු ආඥාපනත යටතේ බදු අය කිරීම - 2026 වර්ෂය

විනෝද බදු ආඥාපනතේ 2 වගන්තියේ (1) උපවගන්තිය ප්‍රකාර චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% ක විනෝද බද්දක් 2026 වර්ෂය සඳහා කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, මීට අමතරව පහත සංදර්ශන වෙනුවෙන් 2026 වර්ෂය සඳහා පහත සඳහන් අයුරින් බලපත්‍ර ගාස්තුවක් ද ගෙවිය යුතු බවත් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව 2025 ජූලි 01 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බැද්දෙ කංකානම්ගේ සුදත් නන්දන සමරසිංහ,
සභාපති,
ප්‍රාදේශීය සභාව - කිරින්ද පුහුල්වැල්ල

2025 ජූලි මස 15 දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

විනෝද බදු ආඥාපනතේ 2 වගන්තියේ (1) උපවගන්තිය ප්‍රකාර චිත්‍රපට දර්ශනයක්, මැජික් දර්ශනයක්, සර්කස් දර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 10% ක විනෝද බද්දක් 2026 වර්ෂය සඳහා කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, මීට අමතරව පහත සංදර්ශනය වෙනුවෙන් 2026 වර්ෂය සඳහා පහත සඳහන් අයුරු බලපත්‍ර ගාස්තුවක් ද ගෙවිය යුතු බව කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

i.	මුදල් අය කරන සංගීත සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	රු. 1,000 0
ii.	මුදල් අය නොකරන සංගීත සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	රු. 1,000 0
iii.	මුදල් අය කරන සර්කස් සංදර්ශනයක් සඳහා බලපත්‍ර ගාස්තුව	රු. 1,000 0
v. මායිම් තාප්ප/ රැඳවුම් බිත්ති ඉදිකිරීම	රු. 200/- (දික් මීටරයක් සඳහා)	රු. 500/- (දික් මීටරයක් සඳහා)	
vi. විදුලි සංදේශ, සම්ප්‍රේෂණ සහ ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම	බිම් පාදම ඉදිකිරීම රු. 150,000/- වහල මුදුන ඉදිකිරීම රු. 100,000/-		
03. අනුකූලතා සහතිකය (ක්දක්) ලබා නොගෙන පදිංචි වීම	දිනකට රු. 100/-		
04. වාහන නැවැත්වීමේ ස්ථන (පරිශ්‍රය තුළ ලබා දී නොමැති විට එක් එක් වාහන නැවැත්වීමේ ඉඩ සඳහා සේවා ගාස්තු	සම්මත වාහන නැවැත්වීම - රු. 500,000/- ලොරි රථ - 1.000,000/- කන්ටේනර් ඇතුළු බහු ඇක්සල් වාහනය - රු. 2,500,000/-		
සියලුම මහ නගර සභා			
i. නගර සභා	රු. 500,000/-		
ii. ප්‍රාදේශීය සභා	රු. 250,000/-		

අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම සඳහා ගාස්තු				
සංවර්ධන කාර්යයේ ස්වභාවය	අයකළ යුතු ගාස්තු (බදු රහිත)			
1. ඉඩම් අනුබෙදුම් කිරීම	එක් කැබැල්ලකට රු. 1,000/-			
2. ගොඩනැගිලි ඉදිකිරීම	ගෙබිම් ප්‍රමාණය (ව.මී.)	නේවාසික		නේ වා සි ක නොවන
		තනි පුද්ගල	මහල් නිවාස	
	ව.මී. 400 දක්වා	රු. 4,000/-	රු. 5,000/-	රු. 5,000/-
	ව.මී. 400 ට වැඩි	රු. 4,000/- + ව.මී. 400ට වැඩි සෑම ව.මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 15 බැගින්	රු. 5,000/- + ව.මී. 400ට වැඩි සෑම ව.මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 20 බැගින්	රු. 5,000/- + ව.මී. 400ට වැඩි සෑම ව.මී. 1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 25 බැගින්

3. සංනිවේදන කුළුණු, ඇන්ටෙනා කුළුණු/ සම්ප්‍රේෂණ කුළුණු සඳහා	රු. 5,000/-	
4. මායිම් තාප්ප හා රැඳවුම් බැම්	දික් මීටර් 1කට රු. 25/- බැගින්	
5. පොදු ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතිකය අලුත් කිරීම	රු. 10,000/-	
භාවිතය වෙනස් කිරීම සඳහා සේවා ගාස්තු		
පෙරසැරි ගාස්තු	ගෙබිම ප්‍රමාණය (ව.මී)	ගාස්තුව (රුපියල්) (බදු රහිත)
	45 දක්වා	1,000/-
	45-90	1,500/-
	91-180	1,750/-
	181-270	2,000/-
	271-450	2,500/-
	451-675	2,750/-
	676-900	3,000/-
	900ට වැඩි	වර්ග මීටර් 900ට සෑම වර්ග මීටර් සඳහාම රු. 500/- බැගින්
අවසර පත්‍රය සඳහා ගාස්තු : i. නේවාසික භාවිතයක් වෙනත් භාවිතයක් සඳහා යොදා ගැනීම ii. නේවාසික නොවන අනිකුත් භාවිතයක් වෙනත් භාවිතයක් සඳහා යොදා ගැනීම	වර්ග මීටරයක් සඳහා රු. 750/- වර්ග මීටරයක් සඳහා රු. 500/-	
සටහන :- ඉහත සඳහන් ගාස්තුවලට අමතරව ස්ථානීය පරීක්ෂාව සඳහා ප්‍රවාහන ගාස්තු වශයෙන් කිලෝ මීටරයකට රුපියල් 50/- ක අතිරේක ගාස්තුවක් අය කෙරේ. කෙසේ වෙතත් නාගරික සංවර්ධන අධිකාරිය/ පළාත් පාලන ආයතනය විසින් වෙළඳපොළේ ඉන්ධන මිලෙහි වෙනස්කම් අනුව ගාස්තුව වෙනස් කරනු ලැබිය හැක.		
නිවාස හා නගර සංවර්ධන ආඥාපනත ක්‍රියාත්මක ප්‍රදේශවල		
ඉඩම් අනුබෙදුම් සැලැස්මක් සම්බන්ධයෙන් අනුමැතියට අදාළ එක් බිම් කොටසක් සඳහා		
පර්චස් 6 සිට 10 දක්වා	රු. 500 0	
පර්චස් 10 සිට 20 දක්වා	රු. 100 0	
පර්චස් 20ට වැඩි	රු. 1,500 0	
ඉඩම් සැලැස්මක් සම්බන්ධයෙන් අනුමැතියට අදාළ එක් බිම් කොටසක් සඳහා		
පර්චස් 40 දක්වා	රු. 1,000 0	
පර්චස් 41-80 දක්වා	රු. 1,500 0	
පර්චස් 81 ට වැඩි	රු. 2,000 0	

ඉඩම් සැලැස්මක් අනු බෙදුම් කර ඇති අවස්ථාවක නියමානුකූල කිරීම සඳහා අදාල අනුබෙදුම් සැලැස්ම අනුමත කිරීම සඳහා අය කළ යුතු නියමිත ගාස්තුවට අමතරව එම ගාස්තුවෙන් :-			
පර්චස් 6 සිට 10 දක්වා	30%		
පර්චස් 10 සිට 20 දක්වා	40%		
පර්චස් 20 ට වැඩි	50%		
ගොඩනැගිලි ඉදිකිරීම් නැවත ඉදිකිරීම් හා වෙනස් කිරීම් සඳහා (එක් වර්ග මීටරයක් සඳහා)			
ගෙබිම් විශාලත්වය වර්ග මීටර්	නේවාසික		නේවාසික නොවන
	තනි නිවාස	මහල් නිවාස	
400 දක්වා	රු. 20 0	රු. 25 0	රු. 25 0
401 - 1,000 දක්වා	රු. 22 0	රු. 27 0	රු. 27 0
1001 - 1,500 දක්වා	රු. 25 0	රු. 30 0	රු. 30 0
1501 - 2,000 දක්වා	රු. 25 0	රු. 32 0	රු. 32 0
ව.මී. 2000ට වැඩි සෑම වර්ග මීටර් 90 ක් සඳහා ම	රු. 2,000 0	රු. 2,000 0	රු. 2,000 0
නියමානුකූල ඉදිකිරීම් ගාස්තුව - අත්තිවාරම දක්වා නිමකර ඇති අවස්ථාවක			
සංවර්ධනයේ ස්වභාවය	අදාළ ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම සඳහා අයකළ යුතු නියමිත ගාස්තුවට අමතරව එම ගාස්තුවෙන්		
	නේවාසික		නේවාසික නොවන
අත්තිවාරම මට්ටම දක්වා	25%		30%
වහල මට්ටම දක්වා ඉදිකිරීම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට (වහළය හැර)	35%		40%
වහළය සහ බිත්ති ඉදිකිරීම	50%		60%
තාප්ප/ පැති බැම් ආදිය සඳහා (දික් මීටරයක් සඳහා)			
	උස මීටර් 2ට අඩු		උස මීටර් 2ට වැඩි
දිග මීටර් 50 ට අඩු	රු. 25 0		රු. 50 0
දිග මීටර් 50ට වැඩි	රු. 35 0		රු. 60 0
වෙනත් ඉදිකිරීම්			
	ඉදිකිරීම් සඳහා		නියමාණුකූල කිරීම්
සන්නිවේදන ඇන්ටනා කුළුණු සම්ප්‍රේෂණ කුළුණු	රු. 40,000 0		රු. 75,000 0
අනුකූලතා සහතික නිකුත් කිරීම			
ගොඩනැගිලි (නේවාසික)	රු. 2,000 0		
ගොඩනැගිලි (නේවාසික නොවන)	රු. 3,000 0		
ඉඩම් අනුබෙදුම් සැලසුම්	රු. 3,000 0		

12-58/11

කොටගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 3.3 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද 2026 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා පනවන සම්පූර්ණ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනකට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක් (5%) වට්ටමක් ගෙවනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 146 වගන්තියේ (1) උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය කිරීම 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී පනතේ 134 වගන්තියේ (3) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වගන්තියේ නියම යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ,

(*අ*) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත 2026 වර්ෂය සඳහා රුපියල් 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(*ආ*) ඉහත කී පනතේ 134 වගන්තියේ (3) උපවගන්තියේ අතුරු විධාන යටතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (21) කොටසේ 1989.02.03 දිනැති *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කර ඇති හෙයින් හෙක්ටයාර එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2026 වර්ෂය සඳහා රුපියල් 50 බැගින් වාර්ෂික අක්කර බද්ද පනවා අය කිරීමට සහ,

(*ඇ*) ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ 2026 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධානය කළයුතු යැයි කොටගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 23/1

කොටගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 3.3 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බදු 2026 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා සම්පූර්ණ වරිපනම් බද්ද 2026 ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%)ක වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 146 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙවල්වල ද 2025 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව ඉහත කී වාර්ෂික වටිනාකමින්,

අංක	*දියුණු ගම් ප්‍රදේශය*	*වරිපනම් ප්‍රතිශතය*
1.	රොසිටා නගරය	15%
2.	වුටන් නගරය	15%
3.	පතන නගරය	15%
4.	දෙවිසිරිපුර	15%
5.	වටගොඩ නගරය	10%
6.	බෝගහවත්ත නගරය	10%

2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ;

ඒ වරිපනම් බද්ද, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) උප වගන්තියේ විධිවිධාන යටතේ 2026 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් කොටගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 23/2

කොටගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 3.3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද මාර්තු 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) උපවගන්තියේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ යටතේ සාදන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් කොටගල ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශයේ ඇතුළත 2026 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්ද 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2026 මාර්තු මස 31 දිනට පෙර කොටගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි කොටගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

උපලේඛනය

I තීරුව *2025 වර්ෂයේ ව්‍යාපාරයේ ආදායම*		*II තීරුව* *අයකිරීමට තීරණය කළ බද්ද* *රු. ශත*
1.	රු. 6,000.00 නොඉක්මවන අවස්ථාවක	නැත
2.	රු. 6,001.00 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90.00
3.	රු. 12,001.00 ඉක්මවන එහෙත් රු. 18,000 නොඉක්මවන අවස්ථාවක	180.00
4.	රු. 18,001.00 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360.00
5.	රු. 75,001.00 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200.00
6.	රු. 1,50,001 ඉක්මවන අවස්ථාවක	3,000.00

12 -23/3

කොටගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීම මත බදු

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 3.3 යටතේ සභා සම්මත කරන ලද යෝජනා අනුව 2026 වර්ෂයට ඇතැම් ඉඩම් විකිණීම මත බදු අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මෙයින් දන්වමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්ති යටතේ කොටගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති තැරැව්කරුවෙකු හෝ ඔහුගේ අනු නියෝජිතයකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන් ආකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක් (1%) සමාන බද්දක් 2026 වර්ෂය සඳහා වහා අය කළ යුතු බවටත් එකී බද්ද විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයාගේ අනු නියෝජිතයා විසින් කොටගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 23/4

කොටගල ප්‍රාදේශීය සභාව

සුනඛයින් ලියාපදිංචි කිරීම - 2026 වර්ෂය

සුනඛයන් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 අධිකාරය) 4 ඡේදයේ සඳහන් ප්‍රකාරව 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 3.3 යටතේ සභා සම්මත වූ යෝජනාව අනුව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තබාගෙන සිටින සෑම බල්ලෙකු වෙනුවෙන් රුපියල් 10.00 බැගින් ද, බැල්ලියක් සඳහා රුපියල් 7.50 ක් බැගින් ද ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් එකී, ගාස්තුව 2026 වර්ෂයට ගෙවිය යුතු බවත්, මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 23/5

කොටගල ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2026 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 3.3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2026 වර්ෂයේ දී කොටගල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මතම ගාස්තුව 2026 මාර්තු 31 දිනට ප්‍රථම අදාළ ගාස්තු කොටගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවද තවදුරටත් දන්වමි.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ කොටගල ප්‍රාදේශීය සභා විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවක් යටතේ කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනය II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචිකර ඇති හෝ එය විසින් අනුමතකර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපනශාලාවක් හෝ නවාතැන්පොලක්වන විට, එකී හෝටලයෙන් හෝ ආපනශාලාවෙන් හෝ නවාතැන්පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එකක (1%)කට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් කොටගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

උපලේඛනය

අනු. අංකය	බලපත්‍රයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම		
		රු. 750 දක්වා	රු. 750 සිට රු. 1,500 දක්වා	රු. 1,500ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
01.	හෝටලයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
02.	බත්කඩ, ආපනශාලා, තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
03.	ලැහුම්හලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
04.	බේකරියක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
05.	සත්ත්ව ගොවිපලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
06.	කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හෝ බාබර් සාප්පුවක් හෝ බියුටි සෙන්ටර් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
07.	කිරිපිටි හෝ කිරි වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
08.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
09.	ජලය බෝතල් කිරීමේ ස්ථානයක් හෝ සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
10.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
11.	ආහාර ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
12.	මස් කඩයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
13.	ඌරන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :				
01.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝ ග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම	500.00	750.00	1,000.00
02.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම්	500.00	750.00	1,000.00
03.	මුද්‍රණාලයක් පැවැත්වීම	500.00	750.00	1,000.00
04.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් කොටුවක් පැවැත්වීම	500.00	750.00	1,000.00
05.	ගඩොල් හෝ උළු ගබඩා කොට තැබීම	500.00	750.00	1,000.00
06.	දර ගබඩාවක් පැවැත්වීම	500.00	750.00	1,000.00
07.	කළුගල් ගැනීම හෝ කැඩීම යන්ත්‍රාණුසාරයෙන් හෝ අතින්	500.00	750.00	1,000.00
08.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500.00	750.00	1,000.00
09.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500.00	750.00	1,000.00
10.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500.00	750.00	1,000.00
11.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසින් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500.00	750.00	1,000.00

අනු. අංකය	බලපත්‍රයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම		
		රු. 750 දක්වා	රු. 750 සිට රු. 1,500 දක්වා	රු. 1,500ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
12.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500.00	750.00	1,000.00
13.	ස්වර්ණාභරණ නිෂ්පාදන හෝ අලුත්වැඩියා කිරීම	500.00	750.00	1,000.00
14.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500.00	750.00	1,000.00
15.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500.00	750.00	1,000.00
16.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500.00	750.00	1,000.00
17.	පාපැදි හෝ යතුරු පැදි අලුත් වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
18.	පාවිච්චි කරන ලද පත්තර හෝ කඩදාසි ගබඩාකර තබා ගැනීම	500.00	750.00	1,000.00
19.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1,000.00
20.	ගිණිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම	500.00	750.00	1,000.00
21.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500.00	750.00	1,000.00
22.	ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම	500.00	750.00	1,000.00
23.	දැව ගබඩා කිරීම	500.00	750.00	1,000.00
24.	රසායනික ද්‍රව්‍ය පාවිච්චිකර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500.00	750.00	1,000.00
25.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500.00	750.00	1,000.00
26.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500.00	750.00	1,000.00
27.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1,000.00
28.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම්, සකස් කිරීම් හෝ අලුහුණු ගබඩා කිරීම	500.00	750.00	1,000.00
29.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1,000.00
30.	මෝටර් වාහන සේවා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
31.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
32.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
33.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
34.	ආයුර්වේද ඖෂධ දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500.00	750.00	1,000.00
35.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන	500.00	750.00	1,000.00
36.	කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500.00	750.00	1,000.00

අනු. අංකය	බලපත්‍රයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම		
		රු. 750 දක්වා	රු. 750 සිට රු. 1,500 දක්වා	රු. 1,500ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
37.	කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500.00	750.00	1,000.00
38.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1,000.00
39.	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
40.	තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
41.	කෘෂි රසායනික, රසායනික පොහොර ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500.00	750.00	1,000.00
42.	වායු සමනය යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සේවා කරන හෝ අලුත්වැඩියා කිරීම	500.00	750.00	1,000.00
43.	විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500.00	750.00	1,000.00
44.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1,000.00
45.	සම් පදම් කිරීම	500.00	750.00	1,000.00
46.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර)	500.00	750.00	1,000.00
47.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500.00	750.00	1,000.00
48.	පශු වෛද්‍ය ශාලාවක් පැවැත්වීම	500.00	750.00	1,000.00
49.	විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හා ආහාර ද්‍රව්‍ය ගබඩාකර තැබීම	500.00	750.00	1,000.00
50.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500.00	750.00	1,000.00
51.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම් හෝ අඟුරු ගබඩාකර තැබීම	500.00	750.00	1,000.00
52.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1,000.00
53.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500.00	750.00	1,000.00
54.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝ ග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500.00	750.00	1,000.00
55.	සබන් නිෂ්පාදනය කිරීම	500.00	750.00	1,000.00
56.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500.00	750.00	1,000.00
57.	අලුත් හෝ පරණ ලෝහ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1,000.00
58.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500.00	750.00	1,000.00
59.	රසකැවිලි වර්ග නිපදවීම	500.00	750.00	1,000.00
60.	පොල්ලෙලි පෙහවීම (පල් කිරීම)	500.00	750.00	1,000.00

අනු. අංකය	බලපත්‍රයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම		
		රු. 750 දක්වා	රු. 750 සිට රු. 1,500 දක්වා	රු. 1,500ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
61.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500.00	750.00	1,000.00
62.	දත් බුරුසු නිපදවීම	500.00	750.00	1,000.00
63.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1,000.00
64.	රා එකතු කිරීම	500.00	750.00	1,000.00
65.	විනාකිරි නිපදවීම හා ගබඩා කිරීම	500.00	750.00	1,000.00
66.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1,000.00
67.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ නිෂ්පාදනය හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500.00	750.00	1,000.00
68.	සෝඩා නිපදවීම	500.00	750.00	1,000.00
69.	සම් භාණ්ඩ නිපදවීම	500.00	750.00	1,000.00
70.	පළතුරු මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින් කිරීම	500.00	750.00	1,000.00
71.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශ බෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක්	500.00	750.00	1,000.00
72.	ඉටිපන්දම් නිපදවීම	500.00	750.00	1,000.00
73.	කපුරු නිපදවීම	500.00	750.00	1,000.00
74.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500.00	750.00	1,000.00
75.	රෙදි සෝදන නිල් නිපදවීම	500.00	750.00	1,000.00
76.	ලාකඩ නිපදවීම	500.00	750.00	1,000.00
77.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීම	500.00	750.00	1,000.00
78.	පාසල් රට හුණු නිපදවීම	500.00	750.00	1,000.00
79.	ටයර් ටියුබ් හෝ 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500.00	750.00	1,000.00
80.	ටයර් නැවත පිරවීම	500.00	750.00	1,000.00
81.	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500.00	750.00	1,000.00
82.	සිමෙන්ති කිලෝග්‍රෑම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500.00	750.00	1,000.00
83.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500.00	750.00	1,000.00
84.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500.00	750.00	1,000.00
85.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500.00	750.00	1,000.00
86.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍ය දමා තිබූ ගෝනි පිරිසිදුකර අලෙවිය	500.00	750.00	1,000.00

අනු. අංකය	බලපත්‍රයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම		
		රු. 750 දක්වා	රු. 750 සිට රු. 1,500 දක්වා	රු. 1,500ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
87.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500.00	750.00	1,000.00
88.	ධාන්‍ය හෝ මාංශභෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500.00	750.00	1,000.00
89.	පැල තවාන්	500.00	750.00	1,000.00
90.	මැණික් ව්‍යාපාරය	500.00	750.00	1,000.00
91.	සත්ව අභිජනනය	500.00	750.00	1,000.00
92.	සිදුවීම් කළමනාකරණය	500.00	750.00	1,000.00
93.	ලොතරැයි නියෝජිත කාර්යාලය	500.00	750.00	1,000.00

12 - 23/6

කොටගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සහතික, ලබාදෙනු ලබන සේවාවන් සහ වෙනත් ගාස්තු පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 3.3 යටතේ යෝජනාව සභා සම්මත වී ඇත. ඒ අනුව සභාව විසින් ලබාදෙනු ලබන සහතිකයක් හෝ සේවාවන් වෙනුවෙන් ගාස්තු නියමකර පහත සඳහන් ආකාරයට අය විය යුතු බවට සභාව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් සහතිකයක් හෝ සේවාවක් ලබා දීම සඳහා එම උපලේඛනය II තීරුවේ ඒ ඒ සහතිකය හෝ සේවාව සැපයීම වෙනුවෙන් සඳහන් කර ඇති ගාස්තුව 2026 වර්ෂය සඳහා පනවා අය කළයුතු බවත් එකී සේවාව හෝ සහතිකය ලබා ගන්නා තැනැත්තෙක් විසින් ඒ සේවාව හෝ සහතිකය ලබා ගැනීමට පෙර එම ගාස්තුව කොටගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට සභාව තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම

1. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දවස් හතකට කලින් අවසර පත්‍ර ලබාගැනීම සඳහා ඉල්ලුම්පතක් සභාවට ඉදිරිපත් කළ යුතුය. එම ඉල්ලුම් පත්‍රය පහත දේවල්වලින් සමන්විත විය යුතුය.

- ලේකම්වරයා වෙත යොමු කළ ලිඛිත ඉල්ලුම් පත්‍රය,
- දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන පරිමිතියේ පිහිටීමට සාපේක්ෂව 1:1000 පරිමාවට නොඅඩු පරිමාවකින් අඳින ලද භූමි සැලැස්ම,

- 1:1000 පරිමාවට නොඅඩු පරිමාවකට අඳින ලද එම නිර්මිතයේ රූප සටහනක්,
- එම සැලැස්මේ රූප සටහනේ හෝ නිර්මිතියෙහි අනුකූලව සංශෝධන,
- ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් යොදා ගන්නා වර්ණ සියල්ල යොදා කුඩා පරිමාණයකට අඳින ලද එම දැන්වීමේ පිටපතක්,
- යාබද වීදිවලට සහ ප්‍රධාන සලකුණුවලට සාපේක්ෂව ප්‍රචාරක දැන්වීමේ පිහිටීමේ දැක්වෙන සැලැස්මක්,
- ප්‍රචාරක දැන්වීමට අදළ සවිස්තරය හා අනන්‍යතාවය,
- අනවසර බැනර් දැන්වීම් ඉවත් කිරීමේ බලය සහාව සතුවේ.

අංකය	*ගාස්තු විස්තර*	*මුදල රු. ශත*	*මුදල රු. ශත*
01	**දැන්වීම් පුවරු සඳහා ගාස්තු**		
	දැන්වීම් පුවරු සඳහා ගාස්තු	01 වර්ග අඩි	200.00
	තාවකාලික දැන්වීම් පුවරු ගාස්තු	01 වර්ග අඩි	350.00
02.	පරිසර බලපත්‍ර ගාස්තු	-	4,500.00
03.	පරිසර පරීක්ෂණ ගාස්තුව (උපරිම)	-	23,009.26
04.	**වීථිරේඛා, නොපවරා ගැනීමේ සහ අයිතිය පිළිබඳ සහතික**		
	සංවර්ධිත ප්‍රදේශ	*නේවාසික*	*ව්‍යාපාර*
	වීථිරේඛා සහතික - නේවාසික	2,500.00	2,500.00
	නොපවරා ගැනීමේ සහතික - නේවාසික	2,500.00	2,500.00
	අයිතිය පිළිබඳ සහතික - නේවාසික	2,500.00	2,500.00
	වරිපනම් ගෙවීම්/ නොගෙවීම් තහවුරු ලිපියක් නිකුත් කිරීම	2,500.00	2,500.00
	සංවර්ධිත නොවූ ප්‍රදේශ :		
	වීථිරේඛා සහතික - නේවාසික	2,500.00	2,500.00
	නොපවරා ගැනීමේ සහතික - නේවාසික	2,500.00	2,500.00
	අයිතිය පිළිබඳ සහතික - නේවාසික	2,500.00	2,500.00
	වරිපනම් ගෙවීම්/ නොගෙවීම් තහවුරු කිරීමේ ගාස්තුව	2,500.00	2,500.00
05.	***ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු :***	2,500.00	6,500.00
06.	***නම මාරු කිරීම්***		
	ලියාපදිංචිය	3,000.00	6,000.00
	A.T.D. පෝරම	2,500.00	4,000.00
07.	J.C.B. (ඉදිරිපස පැටවුම් යන්ත්‍රය කුළියට දීම ඉන්ධන සහිත)	01 පැයකට	5,500.00
08.	***ක්‍රීඩාංගනය ලබාදීම :***	*බල ප්‍රදේශය*	*බාහිර*
	පාසල් සඳහා	නිදහස්	1,000.00
	ක්‍රීඩා සමාජවලට	3,500.00	6,500.00
	අන්තර් සමාජ ක්‍රීඩා තරග සඳහා	5,000.00	10,000.00
	සංගීත සංදර්ශන	10,000.00	20,000.00
	විනෝද වැඩ සටහන් (කාර්නිවල්)	5,000.00	10,000.00

අංකය	*ගාස්තු විස්තර*	*මුදල රු. ශත*		*මුදල රු. ශත*	
09.	***ආදාහනාගාර ගාස්තු :***				
	ආදාහනය (වෙළඳපොළේ ගෑස් සිලින්ඩරයේ මිලගණන් වෙනස් වීම අනුව මුදල වෙනස් වේ)	22,000.00		23,000.00	
10.	සුසාන භූමිය වෙන්කිරීම ගාස්තුව			3,500.00	
11.	පාපැදි බලපත්‍ර ගාස්තුව			50.00	
12.	කසල බදු 1 kg			50.00	
13	**ත්‍රී රෝද රථ ගාස්තු අයකිරීම**				
	පෙර ලියාපදිංචිය			4,000.00	
	දිනකට			10.00	
14.	විකුණුම් - කොම්පෝස්ට් පොහොර (1 kg x 20.00)			20.00	
15.	***එළවන් ප්‍රවාහනය කිරීමේ ගාස්තු :***	*බල ප්‍රදේශය*		*බාහිර*	
		4,000.00		5,000.00	
16.	කුකුලු ව්‍යාපාරය වෙනුවෙන් කසළ ගාස්තු අයකිරීම			18,000.00	
17.	එළමස් ප්‍රවාහන ගාස්තු			10,000.00	
18.	ගවමස් ප්‍රවාහන ගාස්තු			40,000.00	
19.	නව විදුලි සහ නව ජල සම්බන්ධතාවයක් සඳහා ලිපියක් නිකුත් කිරීම ගාස්තු	විදුලි		2,000.00	
		ජල		1,500.00	
20.	විදුලි බිල සහ ජල බිල නම වෙනස් කිරීම සඳහා ලිපියක් නිකුත් කිරීම ගාස්තු			1,000.00	
				1,500.00	
21.	කොටගල ප්‍රාදේශීය සභා සේවා ලාභීන්ට නව ජල සම්බන්ධතා ලබා දීමේ ගාස්තු			20,000.00	
22.	*කොටගල ප්‍රාදේශීය සභා සේවා ලාභීන්ගේ ජල බිල නම වෙනස් කිරීම සඳහා ලිපියක් නිකුත් කිරීම ගාස්තු :*	*නේවාසික*		*ව්‍යාපාර*	
		පවුල්	*පවුල් නොවන*	*පවුල්*	*පවුල් නොවන*
		2,500.00	*5,000.00*	*5,000 0*	*10,000 0*
23.	විසන්ධි කිරීමෙන් පසු ජල නැවත සම්බන්ධ කිරීමේ ගාස්තු			10,000.00	
24.	පුස්තකාල සාමාජික ගාස්තු/ සාමාජිකත්වය අලුත් කිරීම			50.00	
25.	පුටු කුලියට ලබා දීම (1 පුටුවක් සඳහා)			10.00	
26.	ආහාර පිණිස/ උත්සව අවස්ථාවක් සඳහා සතුන් ඝාතනය කිරීම සඳහා අනුමත කිරීමේ ගාස්තු			1,000.00	
27.	ප්‍රවර්ධනය ගාස්තු (එක් දිනකට)			5,000.00	
28.	කොටගල ප්‍රාදේශීය සභාවේ නිවාස කුළී හෝ ඉඩම් බදු අයිතිය බිරිඳ/ සැමියා හෝ දරුවන්ට වෙනස් කිරීමේ ගාස්තු			10,000.00	
29.	කොටගල ප්‍රාදේශීය සභාවේ කඩ කුළී අයිතිය බිරිඳ/ සැමියා හෝ දරුවන්ට වෙනස් කිරීම ගාස්තු			20,000.00	

අංකය	*ගාස්තු විස්තර*	*මුදල රු. ශත*	*මුදල රු. ශත*
30.	කොටගල ප්‍රාදේශීය සභාවේ නිවාස කුළී හෝ ඉඩම් බදු අයිතිය පුද්ගලික පුද්ගලයෙකුට වෙනස් කිරීම ගාස්තු		20,000.00
31.	කොටගල ප්‍රාදේශීය සභාවේ කඩ කුළී අයිතිය පුද්ගලික පුද්ගලයෙකුට වෙනස් කිරීම ගාස්තු		30,000.00
32.	වීථි රේඛා සහතික/ නොපවරා ගැනීමේ සහතික/ අයිතිය පිළිබඳ සහතික/ පිඹුරුපත් සහතිකකර ගැනීම අයදුම්පත/ ආදාහනාගාර වෙන්කර ගැනීමේ ඉල්ලුම්පත/ JCB රථය වෙන්කර ගැනීමේ ඉල්ලුම්පත/ ක්‍රීඩාපිටිය වෙන්කර ගැනීමේ ඉල්ලුම්පත/ වෙළඳ බලපත්‍ර ඉල්ලුම්පත		100.00
33.	**දඩ මුදල් පුස්තකාල :** ප්‍රමාද කරන දිනකටම එක් පොතකට රු. 1.00 බැගින් අස්ථාන ගත කරනු ලබන පොතක් සඳහා වර්තමාන මිල හා දෙපාර්තමේන්තු ගාස්තු 25% ක්		
34.	පුවත්පත් විකිණීමේ ගාස්තු මිල ගණන් කැඳවීමෙන් පසු ඉහළ මිල ගණන් යටතේ		

12 - 23/7

කොටගල ප්‍රාදේශීය සභාව

ජලය සැපයීමේ ගාස්තු - 2026 වර්ෂය

1987 අංක 16 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය හා 126 වගන්තිය යටතේ සම්පාදනය කරන ලද්දා වූ 1988 අගෝස්තු මස 23 දින අංක 520/7 (පළාත් පාලන) අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ ප්‍රකාශ කරන ලද්දා වූ අතුරු ව්‍යවස්ථාවන්හි 34 වැඩාණ්ඩයේ 40(1) අතුරු ව්‍යවස්ථාව යටතේ කොටගල ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන ජල සේවාවන් පහත සඳහන් පරිදි ජල ගාස්තුවක් 2026 වර්ෂය සඳහා පනවා අයකර ගැනීමට 2025 ඔක්තෝබර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 3.3 ප්‍රකාරව තීරණයකර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. ජල මීටර සවිකර ඇති ප්‍රදේශයන්හි (වටගොඩ/ පතන/ රත්නගිරිය) උපලේඛනය පරිදි.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ගෘහස්ථ :

මාසික පාරිභෝගික ඒකක	*ඒකකයක් සඳහා පරිහරණ ගාස්තුව*	*සේවා ගාස්තුව*
00 - 05	රු. 08.00	රු. 100.00
06 - 10	රු. 16.00	
11 - 15	රු. 30.00	
16 - 20	රු. 50.00	
21 - 25	රු. 110.00	
26 - 30	රු. 160.00	
31 - 40	රු. 200.00	
41 - 50	රු. 240.00	
51 - 75	රු. 260.00	
75 <	රු. 300.00	

රාජ්‍ය ආයතන / ව්‍යාපාරික / හෝටල් :

මාසික පාරිභෝගික ඒකක	*ඒකකයක් සඳහා පරිහරණ ගාස්තුව*	*රාජ්‍ය/ ව්‍යාපාරික සේවා ගාස්තුව*	*හෝටල් සඳහා සේවා ගාස්තුව*
00 - 10	රු. 35.00	රු. 150.00	රු. 250.00
11 - 20	රු. 45.00		
21 - 30	රු. 55.00		
31 - 40	රු. 65.00		
41 - 50	රු. 75.00		
51 - 60	රු. 85.00		
61 - 70	රු. 95.00		
71 - 80	රු. 105.00		
81 - 90	රු. 115.00		
91 - 100	රු. 125.00		

12 - 23/8

කොටගල ප්‍රාදේශීය සභාව

කොටගල ප්‍රාදේශීය සභාවේ සංවර්ධන උපදේශක සභාව පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වගන්තියෙන් සාදන ලද 2025 වර්ෂයේ ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 3.3 යටතේ සභා සම්මත විය. ඒ අනුව 2026 වර්ෂය සඳහා කොටගල ප්‍රාදේශීය සභාවේ සංවර්ධන උපදේශක කාරක සභා පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථා නිවේදනය මෙයින් පළ කරමි. එම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට එකී අතුරු ව්‍යස්ථාව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට බලපාන බව මෙයින් දැනුම් දෙමි.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

01. මෙම කොටසේ අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන හා මහජන සුභ සාධක සේවා විධිමත් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට සහාය දක්වන සංවර්ධන උපදේශක කාරක සභා අතුරු ව්‍යවස්ථාව යැයි හඳුන්වනු ලැබේ.

02. මහා සභා තීරණයක් මත පත්කරනු ලබන මෙම උපදේශක කමිටුවේ සාමාජිකයින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් විය යුතු අතර, සිවිල් අයිතිවාසිකම්වල අනර්ථයක් සිදු නොකරන ලද පුද්ගලයන් විය යුතු ය.

03. මෙම අතුරු ව්‍යවස්ථාව මගින් පත්කරනු ලැබූ සාමාජිකයන්ගේ ධුර කාලය වර්ෂයක් දක්වා බල පැවැත්වේ.

04. සංවර්ධන උපදේශක කාරක සභාවේ සාමාජිකයන් පත් කිරීමේ දී ඔවුන්ගේ කුමන හෝ කාර්යයක් සම්බන්ධයෙන් වුව ද විශේෂ හැකියාවක් ඇත්නම් වඩාත් සුදුසු ය.

05. සුවිශේෂ හැකියාවන් ඇති පුද්ගලයන් සොයා ගැනීමට අපහසු අවස්ථාවල විවිධ කාර්යයන් සඳහා නිපුණත්වයක් දක්වන්නේ නම් මේ සඳහා පත් කළ හැකි ය.

06. එසේ නොවන අවස්ථාවක දී සමාජ සත්කාර සේවයේ නියැලී සිටින පුද්ගලයින් ඒ සඳහා පත් කළ හැකි ය.

07. මෙම සාමාජිකත්වය ස්වේච්ඡාවෙන් සිදු කරනු ලබන උපදේශන සේවාවකි.

සංවර්ධන උපදේශක කාරක සභාවේ කාර්යයන් :

- සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම.
- වාර්ෂික අයවැය ඇස්තමේන්තුව කෙටුම්පත් කිරීම.
- ඉටු කළ යුතු සංවර්ධන කාර්යයන් ප්‍රමුඛතාගත කිරීම.
- හදිසි ආපදා සහන සැලසීම් හා ආපදා වළක්වා ගැනීම.
- ආදායම් උත්පාදන මාර්ග හා විශේෂ ව්‍යාපෘති හඳුනා ගැනීම.

08. වර්ෂයක් සඳහා ක්‍රියාත්මකවන සංවර්ධන උපදේශක කාරක සභාවේ නිල කාලය වසරකි.

09. කිසියම් සාමාජිකයකු උපදේශක කාරක සභාවෙන් ඉවත් වන්නේ නම් දැනුම්දීමක් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමාට මාසයකට කලින් දැනුම් දිය යුතු ය.

10. උපදේශක කාරක සභා රැස්වීම්වල දී ගණපූර්ණය පවත්වාගෙන යාම පිළිබඳව කමිටු සභාපතිවරයා විසින් සැහීමකට පත්විය යුතු ය.

අර්ථ කථනය

උපදේශක කාරක සභාව :

සංවර්ධන කාර්යයන් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලතල ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රදේශයේ සුවිශේෂ හැකියාවන් සහිත තැනැත්තෙකුගෙන් සමන්විත කමිටුව.

ධුරවල කාලය :

කමිටු සාමාජිකයන්ගේ රාජකාරීමය කාලය මෙයින් අදහස් වේ.

සුවිශේෂී හැකියාවන් :

සමාජගත කාර්යයන්වල දී ඒවා හොඳින් කිරීමේ හැකියාව ඇති පුද්ගලයින් මෙයින් අදහස් වේ.

නිපුණතාව :

යම්කිසි කාර්යයක් මනාව කිරීමේ හැකියාව.

සිවිල් අයිතිවාසිකම් සඳහා අන්තර්ගතය :

ජීවත්වීමේදී වටපිටාව සමග සුහදශීලීව ජීවත්වන කිසිම සමාජ විරෝධී ක්‍රියාවකට සම්බන්ධ නොවූවන් මින් අදහස් වේ.

12 - 23/9

කොටගල ප්‍රාදේශීය සභාව

බලප්‍රදේශය තුළ භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය

කොටපොල ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 3.3 යටතේ සභා සම්මත කරන ලද යෝජනාව අනුව 2026 වර්ෂය සඳහා කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ භෞතික සැලසුම්කරණයේ මාර්ග, ගොඩනැගිලි, මිහිදන් උයන්, ළිං වීදි ලාම්පු ප්‍රතිපත්තිය මහජනතාවට දැන ගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

භෞතික සැලසුම්කරන ප්‍රතිපත්තිය

අරමුණු :

සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් ම නියෝජනය වන පරිදි සංවර්ධන කාර්යයන් ව්‍යාප්ත කිරීමට ජනතා සහභාගිත්වය ලබා ගැනීම තුළින් භෞතික සැලසුම්කරණය සඳහා ප්‍රමිතියානුකූල නිමාවක් ඇති කිරීම.

නිර්ණායකයන් :

- ❖ ජන ඝනත්වය
- ❖ දුෂ්කරතාවයන්
- ❖ ජන ඉල්ලුම්
- ❖ ජනතා සහභාගීත්වය
- ❖ කාර්යය අවශ්‍යතාවයන්ගේ වැදගත්කම

ක්‍රමවේදය :

01. *මාර්ග* :

01. සියලුම මාර්ගවල වර්ෂයකට වතාවක් හෝ කාණු කැපීම, කාණුවල පස් ගොඩ දැමීම, කාණු උරහිස පිරිසිදු කිරීම.
02. පළුදු සහිත මාර්ගවලින් 40%ක් පළුදු මැකීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අයවැය ලේඛනය මගින් ලබා දීම.
03. මාර්ගවල පාලම්, බෝක්කු අත්වැල් වර්ෂයකට වර්ණ ගැන්වීම.
04. ජනතා සහභාගීත්වයෙන් නව මාර්ග කැපීම, මාර්ග කැපීම, මාර්ග පුළුල් කිරීම, ඒවා *ගැසට්* පත්‍රයට ඇතුළත් කිරීම.
05. සෑම මාර්ගයක්ම නියෝජනය වන ආකාරයට ගොඩනැගිලි සීමා, වීථි සීමා *ගැසට්* කිරීම, මායිම් සළකුණු කිරීම.
06. මාර්ගවලට හානි කරන අයට අවශ්‍ය දඩුවම් ලබාදීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.
07. මාර්ග සීමාවලට මුහුණලා ඇති ගොඩනැගිලිවල පිරිසිදු භාවය පිළිබඳව ප්‍රාදේශීය සභා පනතේ නිසි ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කිරීම.
08. මාර්ග අලුතින් කොන්ක්‍රීට් කිරීම, තාර දැමීම, කාණු සෑදීම, ජල බස්නා ඇති කිරීම.
09. නාගරික කොටස්වල පදික වේදිකාව ඉදිකිරීම.
10. සභාව සතු මාර්ගවල හඳුනාගැනීමේ පුවරු සවි කිරීම.
11. අඩි පාරවල් වාහන ගමන් කළ හැකි මාර්ග බවට පත්කිරීම හා එම තත්ත්වයට ගෙන ඒමට සැලසුම් කිරීම.
12. වීදි ආලෝකකරණය.

02. *මිහිදන් උයන්*:

01. සියලුම සුසාන භූමිවල අයිතිය ප්‍රාදේශීය සභාවට ලබාගැනීම.
02. මායිම් නිරවුල්කර වැටවල් ඉදිකිරීම.
03. ජනතා සහභාගිත්වයෙන් සුසාන භූමියේ දේහ මිහිදන් කරන ප්‍රදේශ හඳුනා ගැනීම.
04. විශාලත්වය සහ මහජන කැමැත්ත මත සුසාන භූමිවල කොටසක් වාණිජ කටයුතු සඳහා ශාඛා වගා කිරීම.
05. මරණාධාර සංගම්වල සහභාගීත්වයෙන් සුසාන භූමිවල මිහිදන් කරන දේහ පිළිබඳ තොරතුරු දින වකවානු සහිතව ලබාගෙන පුද්ගලයන්ගේ පුද්ගලික විස්තර සහිත ලේඛනයක් පවත්වාගෙන යාම.
06. සිහිවටන ස්මාරක ඉදිකරන අය සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා දුන් අංකය එම සිහිවටන හා ස්මාරකවල සටහන් කිරීම.
07. සුසාන භූමිය භාවිතා කරන්නන්ගේ සහභාගීත්වයෙන් වැටවල් සඳහා ශාඛා සිටුවීමට සැලැස්වීම.
08. සුසාන භූමි නඩත්තු කාර්යයන්, මරණාධාර හා සුභසාධක සමිතිවලට පැවරීම.

03. *ළිං සහ පිහිලි*:

01. අලුතෙන් ඉදිකරන ළිං සහ පිහිලිවල පිහිටීමේ අයිතිය පවරා ගැනීම.
02. ළිං හා පිහිලි ඉදිකිරීමේ දී ඒ සඳහා මහජන සහභාගිත්වය ලබාගැනීම.
03. ඉදිකර ඇති ළිං පිහිලි සඳහා වාර්ෂිකව නඩත්තු වැඩසටහනක් සකස් කිරීම.
04. අභාවයට යන ළිං හඳුනාගෙන ඒවා මහජන අවශ්‍යතාවයන් මත පුනර්ජීවනය කිරීම.
05. බෝවන රෝග පවතින කාලවල දී ජලයේ ගුණාත්මක භාවය රැක ගැනීමට අවශ්‍ය ප්‍රතිකාර සැළසීම.
06. අනාරක්ෂිත ගැඹුරු ළිං ආරක්ෂිත තත්ත්වයට පත්කිරීම.
07. ළිං, පිහිළිවල ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සහ නඩත්තුව.
08. නව ජල යෝජනා ක්‍රම ඇතිවීම හේතුකොටගෙන භාවිතයට නොගන්නා ළිං වසා දැමීම.

04. *වීදි ලාම්පු ප්‍රතිපත්තිය*:

01. ට්‍රාන්ස්ෆෝමරයේ ධාරිතාවයෙන් 3%ක් පුරවැසියාගේ පොදු අවශ්‍යතාවය, නගර අලංකරණය සඳහා වැඩි දියණු කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
02. දියුණු ප්‍රදේශ ලෙස නම් කර ඇති ප්‍රදේශ සඳහා ප්‍රධාන මාර්ග, අතුරු මාර්ග, මංසන්ධි සඳහා වීදි ලාම්පු සවිකිරීම.
03. අනෙකුත් තදාසන්න ප්‍රදේශවල මහජනයාගේ ඉල්ලීම මත වීදි ලාම්පු සවිකිරීම.
04. ප්‍රාදේශීය සභාවේ හඳුනාගත් ප්‍රදේශ සඳහා මංසන්ධි, ආගමික ස්ථාන, රාජ්‍ය ගොඩනැගිලි පිහිටි ස්ථානවල වීදි ලාම්පු සවිකිරීම.
05. වීදි ලාම්පු දැල්වීම සහ නිවීම සඳහා මහජන දායකත්වය ලබාගත හැකි ස්ථාන සඳහා ප්‍රමුඛත්වය ලබාදීම.
06. මහජන ඉල්ලීම පරිදි සවි කරන වීදි ලාම්පුවල දිගුකාලීන පැවැත්ම, ආරක්ෂාකාරීත්වය සම්බන්ධ ගැටලු ඇති නොවුනොත්, වෙනත් වීදි ලාම්පුවල ආරක්ෂාව තහවුරු කිරීම හා නඩත්තු කිරීම සඳහා නිලධාරියෙකු පත් කිරීම.
07. වීදි ලාම්පු ලේඛනයක් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
08. ක්‍රියා විරහිත වීදි ලාම්පු නඩත්තු කිරීම.
09. දියුණු ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල වීදි ලාම්පු සවිකළ පසු දියුණු කළ ප්‍රදේශ ලෙස *ගැසට්* කිරීම.
10. ඉඩම් කට්ටි කිරීමේ දී එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන හරහාම අවශ්‍ය වීදි ලාම්පු සවි කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
11. ඉඩම් කට්ටි කිරීමේ දී එම ඉඩම් කට්ටි ප්‍රමාණය අනුව ඒ සඳහා අවශ්‍ය උපරිම ධාරිතාවයක ට්‍රාන්ස්ෆෝමර් සවි කිරීමට උපදෙස් දීම එම ට්‍රාන්ස්ෆෝමර් ධාරිතාවය හරහා උචිත ප්‍රමාණයට වීදි ලාම්පු සවිකිරීම.
12. වීදි ලාම්පුවලට හානිකරන්නන් සඳහා දඬුවම් ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
13. වීදි ලාම්පු සවි කිරීමට සමගාමීව ප්‍රාදේශීය සභා ඒකක බලගැන්වීම.

කොටගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 3.3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2026 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද, 2026 අප්‍රේල් මස 30 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) උපවගන්තියේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ පළමුවන තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම මත එම උපලේඛනයේ දෙවන තීරුවේ අනුරූපිත සටහනේ අනුරූපිත ප්‍රමාණය අනුව කර්මාන්ත බද්දක් 2026 වර්ෂය වෙනුවෙන් පනවා අය කිරීමටත් එම කර්මාන්ත බදු 2026 මාර්තු මස 31 දිනට පෙර කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

I තීරුව	*II තීරුව* *රු. ශත*
වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක	500.00
වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	750.00
වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක	1,000.00

12 - 23/11

කොටගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වාහන හා සතුන් මත බදු පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 3.3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත්වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2026 වර්ෂය සඳහා වන මෙම බද්ද කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වගන්තිය සහ 4 උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයේ දී පහත උපලේඛනයේ පළමුවන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම එහි II තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට කොටගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I තීරුව	*II තීරුව* *රු. ශත*
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකල් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක්ම සඳහා	25.00
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා :	
(*අ*) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18.00
(*ආ*) වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4.00
සෑම කරත්තයක් සඳහා	20.00
සෑම අත් කරත්තයක් සඳහා	10.00
සෑම රික්ෂෝවක් සඳහා	7.50
සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවෙකු සඳහා	15.00
සෑම ඇතෙකු සඳහා	50.00

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්යයන් සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීම්වලින් නිදහස් කෙරේ.

මෙහි උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන් ආකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ යම් ලිඛිත *නැතහොත්* ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 23/12

කොටගල ප්‍රාදේශීය සභාව

පරිසර ආරක්ෂණ ගාස්තු - 2026 වර්ෂය

2000 අංක 53 සහ 1998 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය වර්ෂ 2022 පෙබරවාරි මස 24 වැනි දින සිට මෙහි පළමුවැනි සභාව වෙත පවරා ඇති බලතල මත කොටගල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත ආරම්භකර පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ සඳහන්වන කර්මාන්ත සම්බන්ධයෙන් ඉහත කී පනතේ අදාළ සංශෝධිත යටතේ පවරා ඇති රෙගුලාසිවලට අදාළව එකී ව්‍යාපෘති පවත්වාගෙන යනු ලබන්නන් විසින් 2026 වර්ෂයට බලපත්‍රයක් ලබාගත යුතු බවට 2025 ඔක්තෝබර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේදී කමිටු රැස්වීමේ දී යෝජනා අංක 3.3 යටතේ තීරණයකර ඇති බැවින්, ඒ සඳහා පහත දක්වා ඇති ගාස්තු ගෙවිය යුතු බව මෙයින් නිවේදනය කරමි. අදාළ රෙගුලාසිවලට අනුකූලව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම කොටගල ප්‍රාදේශීය සභාව සතුයි.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

පරිසර බලපත්‍ර සඳහා පරීක්ෂණ ගාස්තු

අංක	*ආයෝජන*	*පරීක්ෂණ ගාස්තු*
1	රු. 250,000.00 හෝ ඊට වැඩි	රු. 3,472.22 + රජයේ විසින් අනුමත කරන ලද බදු
2	රු. 250,001.00 - රු. 500,000.00	රු. 4,305.56 + රජයේ විසින් අනුමත කරන ලද බදු
3	රු. 500,001.00 - රු. 1,000,000.00	රු. 5,740.74 + රජයේ විසින් අනුමත කරන ලද බදු
4	රු. 1,000,000.00 - වැඩි	රු. 11,527.78 + රජයේ විසින් අනුමත කරන ලද බදු
5	රු. 10,000,001.00 හෝ ඊට වැඩි ප්‍රමාණය	රු. 23,009.26 + රජයේ විසින් අනුමත කරන ලද බදු

පරිසර බලපත්‍ර ගාස්තු ගෙවීම්

ඈ. කාණ්ඩය (වසර තුනක් සඳහා රුපියල් 4,500.00)

සභාව විසින් අයදුම්පත්‍ර නිකුත් කිරීමේදී - රු. 250.00 (මාර්ග ගත ක්‍රමයට නොමිලේ අයදුම්පත් ලබාගැනීමට - https://www.cea.lk)

ඈ කොටස

01. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත.
02. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත.
03. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි).
04. රෙදි වියන යන්ත්‍ර මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත.
05. දිනකට ලීටර් 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල් තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.
06. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.
07. දිනකට ලීටර් 100කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත.
08. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදනය ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලිය සහිත වී මෝල්.
09. මසකට කිලෝග්‍රෑම් 1000කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්.
10. සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 25ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම් වැටි හෝ දුම්කොල ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත.
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම්ගැසීමේ කර්මාන්ත.
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැළසුම් කිරීමේ කර්මාන්ත.
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/ මුහුවම් කිරීමේ කර්මාන්ත.
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත.
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත.
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂී ගොවිපලවල්.
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක හෝ ඊට වැඩි සහ 10ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්.
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්.
19. වැඩුණු සතුන් මුළු එකතුව 100ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්. *මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + [50 x (ඌරන් සංඛ්‍යාව + ගවයින් සංඛ්‍යාව) + 10 x (එළුවන් සංඛ්‍යාව)]
20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100ක් හෝ ඊට වැඩි පළතුරු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන.

21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත.
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු.
24. සේවක සංඛ්‍යාව 5 කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින ප්ලාස්ටර් ඔෆ් පැරිස් අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්.
25. බෙලිකටු කැබලි කිරීමේ/ පතුරු කිරීමේ කර්මාන්ත.
26. උළු සහ ගඩොල් පෝරණු.
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
28. කළු ගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත.
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු
30. දිනකට ඝන මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10 කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත.
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත.
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත.
33. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා.
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100 ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැඟුම්හල්.
35. විසිරි පින්තාරු කිරීම් හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත් වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත් වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ්.
36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත.
37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර.
38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම සහිත මල් ශාලා.
39. මෙම උපලේඛනයේ "ඈ" කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/ කර්මාන්තයක්.

12 - 23/13

කොටගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 153 අධිකාරය යටතේ කොටගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංවර්ධන නොවූ ඉඩම් සඳහා ඒ වනවිට පවත්නා වාණිජ වටිනාකමින් 2% බද්දක් අය කර ගැනීමට කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2025 ඔක්තෝබර් මස 28 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 3.3 යටතේ තීරණය කර ඇත. අදාළ ඉඩම් හිමිකරුවන් විසින් එම බද්ද කොටගල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව නිවේදනය කරමි.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 28 දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 23/14

රත්නපුර ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියෙහි (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන කර්මාන්ත සඳහා 2026 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පහත පරිදි අය කිරීම සඳහා 2025.11.06 දිනැති මහ සභා රැස්වීමේ දී තීරණ අංක 06.1.11 යටතේ සම්මත කර ගන්නා ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එල්. එන්. මුණසිංහ,
සභාපති,
රත්නපුර ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 24 දින,
රත්නපුර ප්‍රාදේශීය සභාව,
විද්‍යාල මාවත,
නවනගරය,
රත්නපුර.

කර්මාන්ත බදු යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව,

(අ) රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවටත්,

(ආ) 2025 දෙසැම්බර් මස 31 දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධ වූ විට යටෝක්ත බද්ද 2026 අප්‍රේල් මස පළමු දිනයට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ගෙවිය යුතු බවටත්,

(ඇ) 2026 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යටෝක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස තුනක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධානය කිරීමට රත්නපුර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I තීරුව		*II තීරුව*		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු. 750 දක්වා	*රු. 750 ට වැඩි රු. 1,500 ට නොවැඩි*	*රු.1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ඇලුමිනියම් භාණ්ඩ, විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ඇඳුම් මැසීමේ/තිරරෙදි මැසීමේ රෙදිපිළි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	වානේ භාණ්ඩ/ගෘහ භාණ්ඩ/ක්‍රීඩා භාණ්ඩ අලෙවි කිරීම සඳහා	500 0	750 0	1,000 0
04.	වාහන අමතර කොටස්, ටයර් අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
05.	රබර්/තේ/පොල් ඇතුළු කෘෂි බෝග හෝ අපනයන ද්‍රව්‍ය මිලදී ගැනීමේ, හා අලෙවි කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
06.	ප්ලාස්ටික් භාණ්ඩ/පිඟන්/විසිතුරු භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0

I තීරුව		*II තීරුව*		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
		රු. 750 දක්වා	*රු. 750 ට වැඩි රු. 1,500 ට නොවැඩි*	*රු.1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
07.	වේවැල් භාණ්ඩ/පූජා භාණ්ඩ/ අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
08.	ඡායා පිටපත් කිරීමේ/බයින්ඩින් කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
09.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
10.	ඡායාරූපාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
12.	ලොතරැයි අලෙවි කිරීමේ සංචාරක රථ/කූඩු සඳහා	500 0	750 0	1,000 0
13.	කැසට් පට/ සංයුක්ත තැටි විකිණීමේ හෝ පටිගත කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
14.	වාහන ෂීට් මැසීමේ හා කුෂන් කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
15.	පොත්පත් ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
16.	පැණි/ කිතුල් හකුරු/ කිතුල් පිටි විකිණීම	500 0	750 0	1,000 0
17.	විසිතුරු මසුන් අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
18.	ඉලෙක්ට්‍රොනික් තරාදි අලෙවිය සඳහා ස්ථානයක්	500 0	750 0	1,000 0
19.	සුරතල් සතුන් අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
20.	පැළ තවාන් ස්ථාන සඳහා (මල්/එළවළු/පලතුරු/තේ/රබර්)	500 0	750 0	1,000 0
21.	කොමියුනිකේෂන් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	වැලි, සිමෙන්ති, කළු ගල් අලෙවි කිරීම	500 0	750 0	1,000 0
23.	මැණික්, ස්වර්ණාභරණ අලෙවි කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
24.	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීම හා ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	ඉංග්‍රීසි බෙහෙත්, සිංහල බෙහෙත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	පොල්තෙල් හැර වෙනත් තෙල් වර්ග අලෙවිය	500 0	750 0	1,000 0
27.	කෘතිම දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	ජ්‍යොතිෂය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	තැඹිලි, කුරුම්බා, බුලත් විට විකිණීම	500 0	750 0	1,000 0
30.	චිත්‍ර මූර්ති කැටයම් නිර්මාණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	නිෂ්පාදිත රසකැවිලි, කුළු බඩු, බයිට් වර්ග ආදිය පැකට් බඩු අලෙවිය	500 0	750 0	1,000 0
32.	ජංගම දුරකථන අලෙවිය	500 0	750 0	1,000 0
33.	අමු රබර් එකතු කිරීමේ, තේ දළු එකතු කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
34.	පොල්තෙල් හා පොල් අලෙවිය	500 0	750 0	1,000 0

රත්නපුර ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වාහන සහ සතුන් පිළිබඳව බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වගන්තිය යටතේ රත්නපුර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව රත්නපුර රත්නපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් නියම කර පහත පරිදි අය කිරීම සඳහා 2025.11.06 දිනැති මහ සභා රැස්වීමේ දී තීරණ අංක 06.1.12 යටතේ සම්මත කර ගන්නා ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. එල්. එන්. මුණසිංහ,
සභාපති,
රත්නපුර ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 24 දින,
රත්නපුර ප්‍රාදේශීය සභාව,
විද්‍යාල මාවත,
නවනගරය,
රත්නපුර.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වගන්තිය යටතේ රත්නපුර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත සෑම වාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ දැක්වෙන ආකාරයට වාහන හා සත්ව බද්දක් පනවා පහත පරිදි අය කිරීම සඳහා යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*I තීරුව*	*II තීරුව රු. ශත*
01	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් බයිසිකලයක්, මෝටර් ලොරියක්, කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා ගාස්තුව	25 0
02	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ කරත්තයක් සඳහා - *(අ)* වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් *(ආ)* වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	 18 0 4 0
03	සෑම අත් කරත්තයක් සඳහා	10 0
04	සෑම කරත්තයක් සඳහා	20 0
05	සෑම රික්ෂෝවක් සඳහා	7 50
06	සෑම අශ්වයෙකු පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15 0
07	සෑම ඇතෙකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන වීල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

12 - 74/2

රත්නපුර ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියෙන් බේරුවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 ඔක්තෝබර් මස 14 දින පවත්වන ලද බේරුවල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී අංක ඊ. 1.9 තීරණය යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. එන්. එම්. ෆයිසාන්,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 24 දින,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

යෝජනාව

(01) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ පළමු උප වගන්තියේ බේරුවල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බේරුවල ප්‍රාදේශීය සභාවේ,

(I) අළුත්ගම උප කාර්යාල බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල, 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා පිළිගන්නා ලද 2017 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරුව 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව මත වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත්,

(II) දර්ගා නගරය උපකාර්යාල බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල, 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා පිළිගන්නා ලද 2016 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව මත වාර්ෂික වටිනාකමින් සියයට හතක (7%) වරිපනම් බද්දක් පනවා අය කළ යුතු බවටත්,

(III) පයාගල උප කාර්යාලයීය බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශ ලෙස නම්කර ඇති ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල, 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා පිළිගන්නා ලද 2016 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරුව 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත්,

(IV) (අ) මාලේවන්බද්ද උප කාර්යාලයීය බල ප්‍රදේශයේ මොරගල්ල, කළුවාමෝදර, දියුණු ප්‍රදේශ ලෙස නම්කර ඇති ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල, 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා 2018 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරුව 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

(ආ) කාලවිල, කන්දවිහාරය දියුණු ප්‍රදේශය ලෙස නම්කර ඇති ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල, 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා පිළිගන්නා ලද 2024 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරුව සඳහා 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත්,

තවද, 2026 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියමිත කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2026 ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එම කාර්තුවට අදාළ මුදලින් (5%) ක වට්ටමක් ද, සභාව ලබා දිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

I තීරුව	*II තීරුව*	*III තීරුව*
කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*5% ක වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2026 මාර්තු මස 31	2026 ජනවාරි මස 31
දෙවන කාර්තුව	2026 ජුනි මස 30	2026 අප්‍රේල් මස 30
තුන්වන කාර්තුව	2026 සැප්තැම්බර් මස 30	2026 ජූලි මස 31
හතරවන කාර්තුව	2026 දෙසැම්බර් මස 31	2026 ඔක්තෝබර් මස 31

12 - 219/1

බේරුවල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියෙන් බේරුවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂයෙහි ඔක්තෝබර් මස 14 දින පවත්වන ලද බේරුවල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී අංක ඊ. 1.10 තීරණය යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. එන්. එම්. ෆයිසාන්,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 24 දින,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමඟ කියවිය යුතු 147 වගන්තිය යටතේ බේරුවල ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අනුරූ ව්‍යවස්ථාවක විස්තරකර ඇති මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2026 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ අනුරූප ඝටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළයුතු යැයි යෝජනා කරමි.

තව ද, එම ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමතකර ඇති, පිළිගෙන ඇති යම් හෝටලයක් ආපනශාලාවක් හෝ නවාතැන් පොලක් වන විට ඊට අදාළ බලපත්‍ර ලබා දීමේ දී ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2025 වර්ෂයේ ලැබීම් වලින් 0.25% ක මුදලක් බලපත්‍ර ගාස්තුව ලෙස 2026 වර්ෂය සඳහා අයකළ යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

අනු අංකය	*I තීරුව* *බලය දෙනු ලබන කාර්යය*	*II තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන රු. 1,500ට නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
01.	බේකරියක් පවත්වාගෙන යාම/බේකරි නිෂ්පාදන අලෙවිය	300 0	500 0	1,000 0
02.	ආපන ශාලාවක් හෝ හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	තේ, කෝපි කඩයක් පවත්වාගෙන යාම	200 0	500 0	750 0
04.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	300 0	500 0	1,000 0
05.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	300 0	750 0	1,000 0
06.	නවාතැන්පොළක් හෝ රෙස්ටුරන්ට් එකක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	තානායමක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	විකිණීම සඳහා ශීත කරන ලද ආහාර ද්‍රව්‍ය ගබඩාකර තැබීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	200 0	750 0	1,000 0
09.	එළ හරක් මස් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	කුකුළු මස් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	250 0	750 0	1,000 0
11.	ඌරු මස් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	750 0	1,000 0
12.	එළු මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	750 0	1,000 0
13.	පළතුරු බීම පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	100 0	750 0	1,000 0
14.	යෝගට් නිෂ්පාදනය හා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	750 0	750 0
15.	පිසින ලද ආහාර ද්‍රව්‍ය විකිණීම හා බෙදාහැරීම සඳහා ස්ථානයක්	350 0	750 0	1,000 0
	පවත්වාගෙන යාම			
16.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
20.	සම් විකිණීම	500 0	750 0	1,000 0
21.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
22.	ඖෂධාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
23.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
24.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තැබීම	500 0	750 0	1,000 0
25.	කරවල, ලුණු, මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
26.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0

අනු අංකය	I තීරුව බලය දෙනු ලබන කාර්යය	II තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන රු. 1,500ට නොඉක්මවන අවස්ථාවක	රු.1,500 ඉක්මවන අවස්ථාවක
27.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	සත්ත්ව ආහාර නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	පුන්නක්කු නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
31.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
32.	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
33.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
34.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
35.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
36.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
37.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
38.	රස කැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
39.	පොල් ලෙලි පෙහවීම (පල් කිරීම)	500 0	750 0	1,000 0
40.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
41.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
42.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
43.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
44.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
45.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
46.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
47.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
48.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
49.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංෂ භෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
51.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
52.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
53.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
54.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
55.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
56.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
57.	ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
58.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0

අනු අංකය	I තීරුව බලය දෙනු ලබන කාර්යය	II තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන රු. 1,500ට නොඉක්මවන අවස්ථාවක	රු.1,500 ඉක්මවන අවස්ථාවක
59.	ටයර්, ට්‍යුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
60.	සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1,000ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
61.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
62.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
63.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
64.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදුකර විකිණීම	500 0	750 0	1,000 0
65.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
66.	ධාන්‍ය හෝ මාංෂ භෝග කිලෝ ග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
67.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
68.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
69.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
70.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
71.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
72.	ගඩොල් හා උළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
73.	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
74.	කළු ගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
75.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක්	500 0	750 0	1,000 0
	ගබඩා කිරීම			
76.	අයිස් ක්‍රීම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
77.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
78.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම	500 0	750 0	1,000 0
79.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
80.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
81.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
82.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
83.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්මල් පැවැත්වීම	500 0	750 0	1,000 0
84.	හිස්ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
85.	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපොළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
86.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
87.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
88.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0

අනු අංකය	I තීරුව බලය දෙනු ලබන කාර්යය	II තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන රු. 1,500ට නොඉක්මවන අවස්ථාවක	රු.1,500 ඉක්මවන අවස්ථාවක
89.	පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක්	500 0	750 0	1,000 0
	ගබඩා කිරීම			
90.	ශීතකළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
91.	දැව ගබඩා කිරීම	500 0	750 0	1,000 0
92.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු හා එනසාල් සකස් කිරීම	500 0	750 0	1,000 0
93.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
94.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
95.	විද්‍යුත් ලෝහ ආලේපණය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
96.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
97.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
98.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
100.	වාත්තු මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
101.	බෙලෙක් වැඩපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
102.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
103.	ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
104.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
105.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
106.	කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
107.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
108.	ලියවන පට්ටලයක් භාවිතා කර වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
109.	පෙට්‍රල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
110.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
111.	වායු සමන යන්ත්‍ර ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
112.	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා	500 0	750 0	1,000 0
	කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම			
113.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

බෙරුවල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියෙන් බෙරුවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂයෙහි ඔක්තෝබර් මස 14 දින පවත්වන ලද බෙරුවල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී අංක ඊ. 1.11 තීරණය යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. එන්. එම්. ෆයිසාන්,
සභාපති,
බෙරුවල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 24 දින,
බෙරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පනතේ 150 වගන්තියේ (1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බෙරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II තීරුවේ, අනුරූප ඝටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*I තීරය* *කර්මාන්තයේ ස්වභාවය*	*II තීරය* *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* රු. ශත	*වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක* රු. ශත
01.	බෑග් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	පාවහන් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	තේකොළ හා ධාන්‍ය වර්ග පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	බිම්මල් වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	200 0	300 0	500 0

12 - 219/3

බෙරුවල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියෙන් බෙරුවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 ඔක්තෝබර් මස 14 දින පවත්වන ලද බෙරුවල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී අංක ඊ. 1.12 තීරණය යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. එන්. එම්. ෆයිසාන්,
සභාපති,
බෙරුවල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 24 දින,
බෙරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එම පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් බෙරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2026 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

	I තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර 2025 වර්ෂයේ ව්‍යාපාරයෙන් ලන් ලැබීම් ප්‍රමාණය*	*II තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නැත
02.	රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03.	රු.12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
04.	රු.18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
05.	රු.75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
06.	රු.1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12- 219/4

බෙරුවල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වගන්තියෙන් බෙරුවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂයෙහි ඔක්තෝබර් මස 14 දින පවත්වන ලද බෙරුවල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී අංක ඊ. 1.13 තීරණය යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. එන්. එම්. ෆයිසාන්,
සභාපති,
බෙරුවල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 24 දින,
බෙරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වගන්තියෙන් බේරුවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2026 වර්ෂයේ දී පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතුයැයි යෝජනා කරමි.

උපලේඛනය

	I තීරුව	*II තීරුව* *රු. ශත*
(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක්, බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
	(*අ*) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(*ආ*) වෙළෙඳ කාර්යයක් නොවන කාර්ය සඳහා යොදවන්නේ නම්	4 0
(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iv)	සෑම අත් කරත්තයක් සඳහා	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15 0
(vii)	සෑම ඇතෙකු සඳහා	50 0

12 - 219/5

බේරුවල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

2025 වර්ෂයෙහි ඔක්තෝබර් මස 14 දින පවත්වන ලද බේරුවල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී අංක ඊ. 1.14 තීරණය යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. එන්. එම්. ෆයිසාන්,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 24 දින,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා පනතේ (අනුශාංගික විධිවිධාන) 2 වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015.12.28 දිනැති අංක 1947/6 දරන පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ ගරු අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව බේරුවල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල ප්‍රවාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව බේරුවල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ප්‍රවාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන පරිදි 2026 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*මාස 03 ට අඩු*	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රවාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250/-	350/-	500/-
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250/-	350/-	500/-
		3 ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රවාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500/-	750/-	1,000/-
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රවාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250/-	750/-	1,000/-
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
05	ඉටිරෙදි හෝ ෆයිබර් මගින් කරනු ලබන ප්‍රවාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250/-	350/-	500/-
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රවාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250/-	350/-	500/-
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රවාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750/-	850/-	1,000/-
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 5000 බැගින්		

12 - 219/6

බේරුවල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අදාළව අයාලේ යන ගවයින් හා සතුන් ඇල්ලීම පිළිබඳ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 (1, 2, 3) වගන්තිවලින් බේරුවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 වර්ෂයෙහි ඔක්තෝබර් මස 14 දින පවත්වන ලද බේරුවල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී අංක ඊ. 1.15 තීරණය යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. එන්. එම්. ෆයිසාන්,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 24 දින,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

යෝජනාව

බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් මංමාවතක හෝ ඒ අවට බැද දිගේලිකර හෝ අයාලේ යන ගවයන් මී ගවයින් එළුවන් ආදි සතුන්ගෙන් ප්‍රදේශයේ ජනතාවට සහ දේපළවලට විශාල වශයෙන් හානි පැමිණෙන බැවින් එම ආපදාවලින් වැලැක්වීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66(1), (2) හා (3) වගන්තිය අනුව 2026 වර්ෂයට ද කටයුතු කිරිමටත්,

මෙම විධිවිධාන පරිදි ක්‍රියාකිරීමේ දී අල්ලා ගනු ලබන සතුන් නිදහස් කර ගැනීම සඳහා පහත දැක්වෙන ගාස්තු අයකර ගැනීමට යෝජනා කරමි. :

	රු. ශත
1. ගවයෙකු, මී ගවයෙකු, එළුවෙකු හෝ ඌරෙකු ඇල්ලීමේ ගාස්තුව	5,000 0
2. එම සතුන් නඩත්තු කිරීමේ ගාස්තුව (එක් දිනයකට)	3,000 0

12 - 219/7

බේරුවල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අදාළව ආකෘති පත්‍ර, සේවා සහ ක්‍රීඩාපිටි ආදිය සඳහා අයකරනු ලබන ගාස්තු පැනවීම

2025 වර්ෂයෙහි ඔක්තෝබර් මස 14 දින පවත්වන ලද බේරුවල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී අංක ඊ. 1.16 තීරණය යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. එන්. එම්. ෆයිසාන්,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 24 දින,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

යෝජනාව

2026 වර්ෂයට සේවා සඳහා ගාස්තු පැනවීම හා ක්‍රීඩාපිටි සඳහා බදු පැනවීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ දෙවන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් සාදන ලදුව අංක 1988/47 හා 2014 නොවැම්බර් මස 14 දා තමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කල කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව හා 1989 අංක 12 දරන ප්‍රාදේශීය සභා (අනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ තුන්වන වගන්තිය විධිවිධාන අනුව 1947/06 හා 2015.12.28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* නිවේදනයට අනුව අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද බේරුවල ප්‍රාදේශීය සභාව විසින් අංක 1987 හා 2026. 09.30 දිනැති *ගැසට්* පත්‍රය මගින් ප්‍රසිද්ධ කර පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව සහ ක්‍රීඩා භූමි

පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව අයකර ගත යුතු ගාස්තුව මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට 2026 වර්ෂයට බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

			රු. ශත
01.	**වීථි රේඛා සහ නොපවරාගැනීමේ සහතික නිකුත් කිරීම**	-	2,000 0
02.	**වරිපනම් ඔප්පු උද්ධෘත ලබාදීම**		
	මුල් වර්ෂ 05ට	-	2,000 0
	වැඩි වන වර්ෂයකට	-	200 0 බැගින්
03.	පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තුව	-	100 0
	පුස්තකාල සාමාජිකත්වය අලුත්කිරීමේ අයදුම්පත්‍ර ගාස්තුව	-	100 0
04.	පෙර පාසල් සඳහා වාර්ෂික ඇතුළත් වීමේ ගාස්තුව	-	3,000 0
05.	**ක්‍රීඩා පිටි වෙන් කිරීම සඳහා (දිනකට)**		
	ක්‍රීඩා තරඟ සඳහා	-	2,000 0
	නොමිලේ පවත්වන සංගීත සංදර්ශන සඳහා	-	15,000 0
	මුදල් අය කරන සංගීත සංදර්ශන සඳහා	-	25,000 0
	පෞද්ගලික පාසල් උත්සව සඳහා	-	5,000 0
	පාසල් සහ පෙරපාසල් සඳහා	-	2,000 0
06.	**වෙනත්**		
	(සර්කස්, සැනකෙළි, වෙළඳ ප්‍රචාරක කටයුතු)	-	15,000 0
	සැණකෙළි හා සංගීත සංදර්ශන සඳහා තැන්පත් මුදල	-	100000 0
	රාත්‍රී 10න් පසුව විදුලිය ලබාදීම සඳහා (පැය 1 කට) රුපියල් 1000 0 බැගින් පයාගල, අළුත්ගම, ක්‍රීඩා පිටි සඳහා		
	ප්‍රදේශයේ ක්‍රීඩා සමාජවල ක්‍රීඩා සඳහා තැන්පත් මුදල	-	5,000 0
	බල ප්‍රදේශයෙන් පිටත ක්‍රීඩා සමාජ (එක් දිනකට)	-	5,000 0
	ආපසු ගෙවන තැන්පත් මුදල	-	10,000 0
	ක්‍රීඩා සමාජවල ක්‍රීඩා තරගාවලි සඳහා එක් දිනකට	-	10,000 0
	ක්‍රීඩා සමාජවල ක්‍රීඩා තරගාවලි සඳහා තැන්පත් මුදල	-	10,000 0

12-219/8

බේරුවල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අදාළව ආකෘති පත්‍ර, සේවා සහ ගෝ සාතනය සඳහා අයකරනු ලබන ගාස්තු පැනවීම

2025 වර්ෂයෙහි ඔක්තෝබර් මස 14 දින පවත්වන ලද බේරුවල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී අංක ඊ. 1.16 තීරණය යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. එන්. එම්. ෆයිසාන්,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 24 දින,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

යෝජනාව

ආකෘති පත්‍ර, සේවා සහ ගෝ සාතනය ආදිය සඳහා 2026 වර්ෂයට පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

			රු. ශත
01.	ගොඩනැගිලි අයදුම්පත් 01	-	1,500 0
02.	අනුබෙදුම් අයදුම්පත් 01	-	1,500 0
03.	අනුමත ගොඩනැගිලි සැලසුම්වල අතිරේක පිටපත් නිකුත් කිරීම එක් පිටපතකට	-	2,000 0
04.	අනතුරුදායක ගස් පිළිබඳ දැනුම් දීමේ අයදුම්පත් ගස් 02 ක් සඳහා	-	5,000 0
	වැඩිවන සෑම ගසක් සඳහා		200 0 බැගින්
05.	ඒ.ටී. පෝරම් (ඔප්පු ලුහුඬු සාරාංශ) එක් පිටපතක්	-	2,000 0
06.	වරිපනම් බදු ගෙවීම්/නොගෙවීම් පිළිබඳ සහතික නිකුත් කිරීම	-	2,000 0
07.	සුසාන භූමිවල දේහයක් භූමදානය කිරීම	-	1,000 0
08.	**නගර ශාලා වෙන් කිරීම් දිනකට**		
	පෞද්ගලික අධ්‍යාපන වැඩසටහනක් සඳහා	-	2,0000 0
	පෞද්ගලික උත්සව කටයුතු සහ වෙනත් සංදර්ශන	-	25,000 0
	රැස්වීම් හා වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු ආපසු ගෙවන තැන්පත් මුදල් පුටු ලබා දෙන්නේ නම් එක් පුටුවකට රුපියල් 30 බැගින් (විදුලි බිල් හා ජල බිල් වැඩි වෙන ඒකක ගණන අනුව වෙනම් අයකළ යුතුයි.)	-	10,000 0
09.	කසළ බැහැර කිරීම, එක් ට්‍රැක්ටරයකට	-	5,000 0
10.	මස්කඩ ටෙන්ඩර් පෝරම් ගාස්තුව	-	25,000 0
11.	**දේහයක් ආදාහනය කිරීමේ ආදාහනාගාර ගාස්තු**		
	සභා බල ප්‍රදේශය තුළ	-	8,500 0
	බල ප්‍රදේශයෙන් පිටත	-	15,000 0
12.	**මාර්ග තලනය කුළියට දීම (පැය 06 කට)**		
	බල ප්‍රදේශය තුළ - ටොන් 08	-	52,000 0
	- ටොන් 04	-	18,000 0
	බල ප්‍රදේශයෙන් පිටත - ටොන් 08 - (ප්‍රවාහනය සඳහා රු. 10,000.00)	-	58,320 0
	- ටොන් 04 - (ප්‍රවාහනය සඳහා රු. 10,000.00)	-	22,912 80
13.	බොබ්කැට් යන්ත්‍රය කුළියට දීම පැය 1ට	-	5,000 0
14.	**ගව සාතන ගාස්තුව**		
	උත්සවයක් සඳහා - එක් පිරිමි ගවයෙකුට	-	1,000 0
	සාතකාගාර ගාස්තුව - එක් පිරිමි ගවයෙකුට	-	1,000 0
	- එක් එළුවෙකුට	-	500 0
	- එක් ඌරෙකුට	-	500 0
	උත්සවය කටයුතුවල දී තාවකාලික ගව සාතන බලපත්‍ර ගාස්තුව	-	1,000 0
	බලපත්‍ර ගාස්තුව/ හජ්ජී උත්සවය වෙනුවෙන් තාවකාලික ගවසාතන බලපත්‍ර ගාස්තුව		
15.	වතුර බවුසරය කුළියට දීම (ලීටර් 3000 බවුසරය)	-	1,500 0
	සුභසාධන කටයුතු සඳහා (ළමා උත්සව සහ පාසල් උත්සව ඇතුළත්ව) (ලීටර 1000 කට)		
	මංගල උත්සව සඳහා (ලීටර් 3000 බවුසරය)	-	5,000 0
	ව්‍යාපාරික හා කොන්ත්‍රාත් කටයුතු සඳහා (ලීටර් 3000 බවුසරය)	-	6,000 0
	ආගමික ස්ථාන හා අවමංගල්‍ය උත්සවයන් හා සත්දින දානමය පිංකම් සඳහා නොමිලේ		

			රු. ශත
16.	සංචාරක වෙළෙඳාම සඳහා අවසර පත්‍ර ගාස්තුව	-	1,000 0
17.	සැරසිලි කිරීම සඳහා අවසර පත්‍ර ගාස්තුව	-	2,500 0
18.	**කායවර්ධන මධ්‍යස්ථාන ගාස්තු**		
*	**පයාගල/මග්ගොන**		
	ඇතුළත්වීමේ ගාස්තුව (බල ප්‍රදේශය තුළ)	-	500 0
	ඇතුළත්වීමේ ගාස්තුව (බල ප්‍රදේශයෙන් පිටත)	-	1,000 0
	මාසික අයකිරීම - පිරිමි	-	750 0
	මාසික අයකිරීම - කාන්තා	-	500 0
*	**අළුත්ගම**		
	ඇතුළත්වීමේ ගාස්තුව (බල ප්‍රදේශය තුළ)	-	1000 0
	ඇතුළත්වීමේ ගාස්තුව (බල ප්‍රදේශයෙන් පිටත)	-	2,000 0
	මාසික අයකිරීම - පිරිමි	-	1,500 0
	මාසික අයකිරීම - කාන්තා	-	1,500 0
19.	කාබනික පොහොර (කිලෝ 25 පැකට් එකක්)	-	475 0
20.	නව ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරය කුළියට දීම		
i.	ශ්‍රවණාගාරය ලබා දීම දිනකට	-	25,000 0
ii.	ශබ්ද වාහිනි යන්ත්‍ර ලබා ගැනීම සඳහා දිනකට කුඩා බෆල් සමග	-	7,500 0
iii.	ශබ්ද විකාශන යන්ත්‍ර විශාල බෆල් සමඟ	-	10,000 0
iv.	තැන්පත් මුදල	-	10,000 0

12 - 219/9

බේරුවල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙන් බේරුවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2025 ඔක්තෝබර් මස 14 දින පවත්වන ලද බේරුවල ප්‍රාදේශීය සභා රැස්වීමේ දී අංක ඊ. 1.17 තීරණය යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එම්. එන්. එම්. ෆයිසාන්,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 24 දින,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙන් බේරුවල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ වගා කිරීමේ කාර්ය සඳහා යෝග්‍ය වන හෝ සාධාරණ වියදමකින් එවැනි කාර්ය සඳහා එම ඉඩම සංවර්ධනය කළ හැකි අවස්ථාවක, එම ඉඩමෙහි ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති විට සහ විධිමත් ලෙස වගාවක් සිදු නොකර ඇති විට එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 1% බද්දක් 2026 වර්ෂයට පැනවිය විය යුතු බවටත් එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1)ආ ඡේදය යටතේ වන සමානුපාතය වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1:10 ක් විය යුතු බවටත් යෝජනා කරමි.

12 - 219/10

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව

සත්ව හිංසා ආඥාපනත (පරිච්ඡේදය 272) 7 (2) කොටස යටතේ දැන්වීම - 2026

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ප්‍රාදේශීය සභාවෙන් සමත් වූ බදුකරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් යම්කිසි මස් කඩවල්, සත්ව හිංසා පනතේ (පරිච්ඡේදය 272) කොටස යටතේ මා හට ලබා දී ඇති බලතල අනුව පහත උප ලේඛනය අනුව පහත දක්වා ඇති දිනවල, රජයේ සම්මත වූ දිනවලත් මා විසින් වරින්වර දැනුවත් කරනු ලබන දිනවලත් සතුන් විකිණීම ද, විකුණනු පිණිස එල්ලීම ද, මස් කඩ විවෘත කර තබා ගැනීම ද මුළුමනින්ම තහනම් බව 2025.10.16 දින සභා තීරණ අංක VSSPS/2025/10/05/47 හි පරිදි දන්වා සිටිමි.

එස්. සී. වීරකෝන්,
සභාපති,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 20 දින,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව,
ඊරට්ටිපෙරියකුලම,
වවුනියාව.

උපලේඛනය

1. ශ්‍රී ලංකා නිදහස් දිනය
2. මහා ශිව රාත්‍රිය
3. වෙසක් පුර පසළොස්වක පොහොය දිනය (රජයේ සම්මත වූ දිනවල්)
4. ලෝක සත්ව දිනය
5. සෑම මාසයකම පුර පසළොස්වක දින

12 - 26/1

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් ගාස්තු - 2026

1987 ප්‍රාදේශීය සභා පනතේ 126-7ඌ කොටස යටතේ භාර කළ උපමා අනුව 1988.08.23 දින 520/7 දරන අති විශෙෂ වක්‍රලේඛනයේ පළාත් පාලන නිවස හා නිර්මාන ඇමතිතුමා විසින් ප්‍රසිද්ධ කළ (62ඒ, 63ඒ, 64ඒ) පිටුවල 1998.04.17 දින අංක 1024 වක්‍රලේඛනයේ මා විසින් පිළිගත් ප්‍රචාරක දැන්වීම් සම්බන්ධව අතුරු ව්‍යවස්ථා සැලැස්ම අනුව වවුනියාව දකුණු සිංහල ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයක කවුරු හෝ වේවා යම්කිසි පාරක් හෝ පාරට දිග් ගැස්සුන ප්‍රචාරක පුවරු නැතහොත්, තාවකාලික සංවිධානාත්මක නැතහොත්, විවිධ අලංකාර ස්ථාපිත කිරීමට සැලසුම් කිරීමට වවුනියාව දකුණු සිංහල ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා මෙවැනි ස්ථිර ස්ථාපිත ප්‍රචාරවලට අවුරුදු පතා නියමිත ගාස්තු ගෙවා අලුත් කිරීම කරන ලෙස 2025.10.16 දින සභා තීරණ අංක VSSPS/2025/10/05/48 හි පරිදි දැනුවත් කරමි.

උපලේඛනය

01. බිත්තියක හෝ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනයට තබන ස්ථිර ප්‍රචාරක දැන්වීම් වලට සෑම වර්ග අඩියකට එක් වර්ෂයකට හෝ එක් කොටසකට (නාම පුවරුවේ දෙපස දැන්වීම් ප්‍රදර්ශනයට තබා ඇත්නම් දෙපසට ගාස්තු අය කළ යුතු ය.) රු. 200.00
02. බැනරයක් ප්‍රදර්ශනයට තබා ගන්නා තාවකාලික දැන්වීම් වසරකට සෑම වර්ග අඩියකටම - රු. 100 0
03. එක් ලෑල්ලක හෝ එක් උපකාරයක් සමග ප්‍රදර්ශනය කරනු ලබන විදුලි බුබුළු එළියක් සමග ඇති දැන්වීම්වලට සෑම වර්ග අඩියකටම එක් වර්ෂයකට හෝ එයින් කොටසකට රු. 250.00

එස්. සී. වීරකෝන්,
සභාපති,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 20 දින,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව,
ඊර්ට්ටපෙරියකුලම,
වවුනියාව.

12 - 26/2

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව

ගොඩනැගිලි අනුමැතිය - 2026

ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව තුළ 1987 වර්ෂයේ අංක 15 පරිපාලන සභා පනතේ කොටස් 47 සිට 59 දක්වා එක්ව නිවාස සංවර්ධන ආඥාපනත (පරිච්ඡේදය 600) යටතේ 1998.01.01 දින සිට සභාවේ බල ප්‍රදේශය තුළ ගෙවල් සෑදීම හෝ වෙනත් ආයතන ඉදිකිරීමට ගොඩනැගිලි ඉදිකිරීම ඉල්ලුම්පත් ඉදිරිපත් කරන විට එම පරීක්ෂණ වෙනුවෙන් අනෙකුත් දේවල් සම්බන්ධවත් පහත දක්වා ඇති උපලේඛන අනුව 2026.01.01 දින සිට ගාස්තු අය කිරීමට 2025.10.16 දින සභා තීරණ අංක VSSPS/2025/10/05/49 හි පරිදි මෙයින් තීරණය කර ප්‍රකාශ කරමි.

එස්. සී. වීරකෝන්,
සභාපති,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 20 දින,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව,
ඊර්ට්ටපෙරියකුලම,
වවුනියාව.

උපලේඛනය

අනු. අංකය	*විස්තරය*	*2026 වර්ෂය සඳහා අයකිරීම් රු. ශත*
01.	පදිංචිව සිටින ස්ථානයට තාප්පයක් සෑදීම (වර්ග අඩි 3,000 ට අඩු)	800 0
02.	ව්‍යාපාරික ස්ථානයට තාප්පයක් සෑදීම (වර්ග අඩි 3,000 ට අඩු)	1,000 0
03.	ව්‍යාපාරික අවශ්‍යතාවයකට තාප්ප බැඳීම	1,500 0
04.	වර්ග අඩි 500 ට වැඩි නොවන බිම් ප්‍රමාණ ගොඩනැගිලිවලට	1,000 0
05.	වර්ග අඩි 500 ට වැඩි නොවන බිම් ප්‍රමාණ ව්‍යාපාරික ගොඩනැගිලිවලට	1,200 0
06.	වර්ග අඩි 500 ක් 1,500 ත් අතර බිම් ප්‍රමාණ ගොඩනැගිලිවලට	1,300 0
07.	වර්ග අඩි 500 ක් 1,500 ත් අතර බිම් ප්‍රමාණ ව්‍යාපාරික ගොඩනැගිලිවලට	1,800 0
08.	වර්ග අඩි 1,500 ක් 2,500 ක් අතර බිම් ප්‍රමාණ ගොඩනැගිලිවලට	2,000 0
09.	වර්ග අඩි 1,500 ක් 2,500 ක් අතර බිම් ප්‍රමාණ ව්‍යාපාරික ගොඩනැගිලිවලට	2,500 0
10.	වර්ග අඩි 2,500 ට වැඩි බිම් ප්‍රමාණ ගොඩනැගිලිවලට වැඩිවන සෑම වර්ග අඩි 1,000 ක කොටසකට	1,000 0
11.	වර්ග අඩි 2,500 ට වැඩි බිම් ප්‍රමාණ ව්‍යාපාරික ගොඩනැගිලිවලට වැඩිවන සෑම වර්ග අඩි 1,000 ක කොටසකට	2,000 0
12.	ගොඩනැගිලි වෙනසක් සිදු කිරීමට ඇති බිම් ප්‍රමාණය වැඩි නොවන ගොඩනැගිලිවලට	1,000 0
13.	ගොඩනැගිල්ලේ වෙනසක් සිදු කිරීමට ඇති බිම් ප්‍රමාණය වැඩි නොවන ව්‍යාපාරික ගොඩනැගිලිවලට	2,000 0
14.	ගොඩනැගිලි අනුමැතිය ලබා ඇති නමුත් නිසි කාල සීමාවේ අවසන් නොකර නැවත අලුත්වැඩියා කිරීමට ගාස්තු	1,000 0
15.	ව්‍යාපාරික ගොඩනැගිලි අනුමැතිය ලබා ඇති නමුත් නිසි කාල සීමාවේ අවසන් නොකර අලුත්වැඩියා කිරීමට ගාස්තු	1,000 0
16.	ගොඩනැගිල අනුකූලතා සහතික ගාස්තුව	1,000 0
17.	ගොඩනැගිලි ඉල්ලුම්පත්‍ර ගාස්තුව	1,000 0
18.	වීදිරේඛා ඉල්ලුම්පත්‍ර ගාස්තුව	500 0
19.	වීදිරේඛා සහතික ගාස්තුව	1,500 0
20.	වීදිරේඛා පරීක්ෂණ ගාස්තුව	1,000 0
21.	මිනින්දෝරු සහතික අනුමත කිරීම	1,000 0

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව

සුනඛයින් ලියාපදිංචි කිරීමේ පනත (පරිච්ඡේදය 272) - 2026

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාවේ පාලන ප්‍රදේශයේ ඇති කරනු ලබන සුනඛයින්ට, සුනඛයින් ලියාපදිංචි කිරීමේ පනතේ (පරිච්ඡේදය 477) හි 4 කොටස් අනුව 2026 වර්ෂයට ලියාපදිංචි ගාස්තු එක් සතෙකුට රු. 500.00 බැගින් අය කළ යුතු බව 2025.10.16 දින සභා තීරණ අංක VSSPS/2025/10/05/50 හි පරිදි දන්වා සිටිමි.

එස්. සී. වීරකෝන්,
සභාපති,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 20 දින,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව,
ඊර්ට්ටපෙරියකුලම,
වවුනියාව.

12-26/4

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව

ජාතික පරිසර පනත යටතේ දැන්වීම - 2026

1980 වර්ෂයේ 47 අංකයේ ජාතික පරිසර අධිකාර සභාවේ 1980 අංක 47 ජාතික පරිසර පනත, 1988 වර්ෂයේ අංක 56 සංශෝධන පනත් සැලැස්ම අනුව මධ්‍යම පරිසර උක්ත පනතේ 26 කොටසට අයත් 2001 සැප්තැම්බර් මස 01 දින පටන් පහත දැක්වෙන උපලේඛනයෙන් දක්වන පරිදි උපමාව ද, රාජකාරිය ද, සේවය ද ප්‍රාදේශීය සභාවේ ලේකම්ට හාරදුන් පනතේ දක්වන වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ මෙම පනත ක්‍රියාත්මකවන පරිදි පහත දැක්වෙන ලේඛනයේ පෙන්වා සිටින කර්මාන්තයද වෙත මධ්‍යම පරිසර අධිකාරිය මගින් දක්වා ඇති අන්දමට ලැයිස්තු ද, ගාස්තු ද, පරීක්ෂා ගාස්තු ද බලපත් ගාස්තු ද, ආදිය අනුමත කළ අයකිරීම් කරන බව මෙයින් තීරණය කර ප්‍රකාශ කරමි. මෙම ප්‍රකාශ මගින් අය කරන ලද ගාස්තු 1987 වර්ෂයේ අංක 15 ප්‍රාදේශීය සභා පනත යටතේ අනුමත කර අය කරන බලපත්‍ර ගාස්තුවට වඩා ඉහළින් හෝ කොයි ආකාරයෙනුත් බදු නොවන ආකාරය 2025.10.16 දින සභා තීරණ අංක VSSPS/2025/10/05/51 හි පරිදි වේ.

එස්. සී. වීරකෝන්,
සභාපති,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 20 දින,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව,
ඊර්ට්ටපෙරියකුලම,
වවුනියාව.

උපලේඛනය (ඈ කොටස)

1. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත.
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වානිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4. රෙදි වියන යන්ත්‍ර මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර් 200 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
6. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත

7. දිනකට ලීටර් 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත
8. දිනකට කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලී සහිත වී මෝල්
9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම් සිහින කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවයක් සහිත වානිජ මට්ටමේ බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්
    * මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව+ [50 x (ඌරන් සංඛ්‍යාව + ගවයන් සංඛ්‍යාව) + 10 x (එළුවන් සංඛ්‍යාව)]
20. ගබඩා ධාරිතාව සන මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20 ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24. සේවක සංඛ්‍යාව 5 කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින ප්ලාස්ටර් ඔෆ් පැරිස්" අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
28. කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීමේ කටයුතු
30. දිනකට සන මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවයක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05 ක් හෝ ඊට වැඩි සහ 10 කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිත කරන කර්මාන්ත
32. බහුකාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත
33. සේවක සංඛ්‍යාව 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම් හල්
35. විසිරි පින්තාරු කිරීමේ හෝ වාහන වායුසම්කරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ගරාජ
36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත
37. ර්යම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම් සහිත මල් ශාලා
39. මෙම උපලේඛනයේ 'ඈ' කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/කර්මාන්තයක්.

උපලේඛනය

පරීක්ෂා කිරීම සඳහා අයකරනු ලබන ගාස්තු

2025.10.16 දින සභා තීරණ අංක VSSPS/2025/10/05/52 හි පරිදි පරීක්ෂා කිරීම සඳහා අයකරන ගාස්තු පහත පරිදි අය කරනු ලැබේ.

අංකය	*ස්වභාවය*	*2026 වර්ෂයට අදාළ අය කිරීම් (රුපියල්)*
01.	රු. 2,50,000 ට අඩු ආයෝජනය	3,000 0
02.	රු. 250,000 සිට රු. 500,000 අතර වූ ආයෝජනය	3,750 0
03.	රු. 500,000 සිට 1,000,000 අතර වූ ආයෝජනය	5,000 0
04.	රු. 1, 000,000 සිට 2,000,000 අතර වූ ආයෝජනය	11,730 0
05.	රු. 2,000,000 ට වැඩි ආයෝජනය	17,595 0

පරිසර බලපත්‍ර ගාස්තුව

2025.10.16 දින සභා තීරණ අංක VSSPS/2025/10/05/53 හි පරිදි පරීක්ෂා කිරීම සඳහා අයකරන ගාස්තු පහත පරිදි අය කරනු ලැබේ:-

01.	කර්මාන්ත, නිෂ්පාදන ආයතන හා වෙනත්	4,500.00

එස්. සී. වීරකෝන්,
සභාපති,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 20 දින,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව,
ඊර්ට්ටපෙරියකුලම,
වවුනියාව.

12-26/5

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව

ගාස්තු අයකිරීම් - 2026 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147, 148, 149, 150 (1), (2), 151, 152 (1), (2), 153 (1), 154 (2) කොටස්වලට ඇතුළත් 2026 ජනවාරි මස 01 සිට දෙසැම්බර් මස 31 දින දක්වා පහත ඇති උපලේඛන අනුව ව්‍යාපාර වෙනුවෙන් ව්‍යාපාර බදු ගාස්තු අය කිරීම 2025.10.16 දින සභා තීරණ අංක VSSPS/2025/10/05/54 හි යටතේ තීරණයක් ගෙන සම්මත වී ඇත, වෙළඳ බලපත් ගාස්තු උපලේඛනය අනුව 2026.03.31 දිනට පෙර ගෙවිය යුතු බව මෙයින් දැනුම් දී ඇත.

එස්. සී. වීරකෝන්,
සභාපති,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 20 දින,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව,
ඊර්ට්ටපෙරියකුලම,
වවුනියාව.

උපලේඛනය

අංකය	*විස්තරය*	2026 වර්ෂයට අයකිරීම් (රුපියල්)
01	තේ කඩයක් පවත්වාගෙන යාම "A"	1,200 0
02	තේ කඩයක් පවත්වාගෙන යාම "B"	1,000 0
03	භෝජනාගාරයක් පවත්වාගෙන යාම	3,000 0
04	තේ කඩයක් සහ භෝජනාගාරයක් පවත්වාගෙන යාම	3,000 0
05	බේකරියක් පවත්වාගෙන යාම	3,000 0
06	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	3,000 0
07	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	3,000 0
08	හරක් මස්, ඌරු මස් කඩයක් පවත්වාගෙන යාම	3,000 0
09	මාළු කඩයක් පවත්වාගෙන යාම	3,000 0
10	සමුපකාර වෙළෙඳ සලක් පවත්වාගෙන යාම	3,000 0
11	එළුමස් කඩයක් පවත්වාගෙන යාම	3,000 0
12	සිල්ලර කඩයක් පවත්වාගෙන යාම A	3,000 0
13	සිල්ලර කඩයක් පවත්වාගෙන යාම B	3,000 0
14	සීතල බීම වර්ග කඩයක් පවත්වාගෙන යාම	3,000 0
15	යකඩ අලෙවි භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
16	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
17	සිමෙන්ති පැකට් 20 ට වැඩි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
18	ලී මෝලක් පවත්වාගෙන යාම	3,000 0
19	වඩු මඩුවක් පවත්වාගෙන යාම	3,000 0
20	ගෘහ භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
21	දර මඩුවක් පවත්වාගෙන යාම	1,000 0
22	එළවළු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
23	පොල් 1000ට වැඩි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
24	ස්වර්ණාභරණ නිෂ්පාදන හා අලුත්වැඩියා ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
25	පිදුරු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
26	කඩල අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	1,000 0
27	පාපැදි අලුත්වැඩියා ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
28	මත්පැන් අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
29	පාපැදි අමතර කොටස් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
30	රූපවාහිනී යන්ත්‍ර, ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ හා අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3.000 0
31	කම්මල් වැඩපලක් පවත්වාගෙන යාම A	1,500 0
32	කම්මල් වැඩපළක් පවත්වාගෙන යාම B	1,000 0
33	ලණු සහ කොහු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
34	රා එකතු කිරීමේ සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
35	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	3,000 0
36	පට්ටල් වැඩපලක් පවත්වාගෙන යාම	3,000 0
37	බැටරි ආරෝපණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
38	කුෂන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
39	ඔරලෝසු අලුත්වැඩියා ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
40	අලුත් පාපැදි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
41	පෙට්ට්‍රල්, භූමිතෙල් ගබඩා කිරීමේ හා අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
42	රෙදිපිළි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0

අංකය	*විස්තරය*	2026 වර්ෂයට අයකිරීම් (රුපියල්)
43	කෘෂි රසායනික පොහොර අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
44	කෘෂි රසායනික බෙහෙත් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
45	පාවහන් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
46	නිත්ත වර්ග හා වාර්නිෂ්, ඩිස්ටෙම්පර් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
47	පින්තූර රාමු කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
48	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාකරන මිරිස් හා ධාන්‍ය හලක් මෝලක් පවත්වාගෙන යාම	3,000 0
49	වී මෝලක් පවත්වාගෙන යාම A (ගල්, වැලි ඉවත් කරන)	3,000 0
50	වී මෝලක් පවත්වාගෙන යාම B	3,000 0
51	100 ට වැඩි කුකුළු කොටුවක් පවත්වාගෙන යාම	3,000 0
52	ගීත කැසට්පට අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
53	පුවත්පත්, ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
54	රූපවාහිනී යන්ත්‍ර, වීඩියෝ කැසට් යන්ත්‍ර කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
55	පදික වෙළෙඳාම් කිරීම (දිනකට)	500 0
56	මනි මඩු සාප්පුවක් පවත්වාගෙන යාම	3,000 0
57	කුකුළු කෑම අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
58	ධාන්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
59	සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
60	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	3,000 0
61	තල තෙල් නිෂ්පාදනය හා පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
62	ගෑස් ගබඩාකර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
63	මෝටර් රථ අලුත්වැඩියා හා පිරිසිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
64	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
65	ටයර්, ටියුබ් වෝල්කනයිස් ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
66	යතුරුපැදි අලුත්වැඩියා ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
67	හුණු පැකට් කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
68	ස්වර්ණාභරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
69	ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
70	කළුගල් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
71	ඡායා පිටපත් ලබා ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
72	පෞද්ගලික වෛද්‍ය ශාලාවක් පවත්වාගෙන යාම	3,000 0
73	රෙදිපිළි කර්මාන්තයක් පවත්වාගෙන යාම	3,000 0
74	බ්ලොක් ගල් වැඩපොළක් පවත්වාගෙන යාම	3,000 0
75	ගඩොල් වැඩපොළක් පවත්වාගෙන යාම	3,000 0
76	කොන්ක්‍රීට් වැඩපොළක් පවත්වාගෙන යාම	3,000 0
77	ගල් වලක් පවත්වාගෙන යාම	3,000 0
78	ගල් ඇඹරුම් ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
79	දුරකථන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
80	අයිස්ක්‍රීම් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
81	පැණි රස කෑම හා මුරුක්කු වැනි ආහාර නිෂ්පාදනය කර විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	3,000 0
82	කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
83	අවමංගල භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
84	ඇඳුම් බතික් කිරීම	3,000 0
85	දුම්කොළ නිෂ්පාදනය කර විකිණීම	3,000 0

අංකය	*විස්තරය*	2026 වර්ෂයට අයකිරීම් (රුපියල්)
86	අභ්‍යාස පොත් ආනයනය කිරීම	3,000 0
87	අභ්‍යාස පොත් බැඳුම් ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
88	කුකුළු මස් කඩයක් පවත්වාගෙන යාම	3,000 0
89	තැරැව්කාර ආයතනයක් පවත්වාගෙන යාම	3,000 0
90	ගොඩනැගිලි වයරින් කර්මාන්තය	3,000 0
91	වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
92	කිරි පට්ටියක් පවත්වාගෙන යාම (ගවයින් 10ට වැඩි)	3,000 0
93	ඉලෙක්ට්‍රොනික් මෝටර් කොයිල් එතීම	3,000 0
94	අන්තර්ජාල පරිගණක පන්ති පවත්වාගෙන යාම	3,000 0
95	සංයුක්ත තැටි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
96	බුලත් කඩයක් පවත්වාගෙන යාම	3,000 0
97	වාහන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
98	ටයර්, ටියුබ් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
99	පොල් අතු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
100	කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
101	වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
102	නෙස් කැෆේ බීම අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
103	සුරතල් සතුන් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
104	ගවයින් 10 ට අඩු ගව ගාල් පවත්වාගෙන යාම	3,000 0
105	වාහනවල රේඩියේටර් අලුත්වැඩියාව	3,000 0
106	වාහන කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
107	කුළු බඩු අපනයනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
108	සැරහුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
109	නවාතැන්පොළක් පවත්වාගෙන යාම	3,000 0
110	සබන් නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
111	පෞද්ගලික පන්ති පවත්වාගෙන යාම	3,000 0
112	රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම	3,000 0
113	අන්තර්ජාල පහසුකම් ලබාදෙන ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
114	ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරුවන්ගේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
115	මහ පරිමාණයේ රෙදි කම්හලක් පවත්වාගෙන යාම	3,000 0
116	මහ පරිමාණ රෙදි කම්හලක ගබඩාවක් පවත්වාගෙන යාම	3,000 0
117	ලොතරැයි අලෙවිකරණ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
118	ලේ, මූත්‍රා පරීක්ෂා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
119	සූර්ය බලශක්ති විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම	3,000 0
120	ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම	3,000 0
121	ඡායාරූප මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
122	වැලි සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
123	සමුපකාරයක් පවත්වාගෙන යාම	3,000 0
124	මුල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම	3,000 0
125	සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම	3,000 0
126	ජංගම වෙළඳ රථයක් සඳහා	3,000 0
127	ලිහිසි තෙල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
128	ආරක්ෂක සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
129	පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0

අංකය	*විස්තරය*	2026 වර්ෂයට අයකිරීම් (රුපියල්)
130	පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම	3,000 0
131	ටැටූ (පච්ච ගැසීමේ) ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
132	හඳුන්කුරු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
133	ලුණු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
134	ගෘහ නිර්මාණ සැලසුම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
135	ලී බඩු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
136	වෛද්‍ය සේවා ලබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
137	උත්සව භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
138	උත්සව සඳහා ආහාර ලබාදෙන ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
139	ජල පිරිපහදු ස්ථානයක් පවත්වාගෙන යාම (පෞද්ගලික)	3,000 0
140	කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම	3,000 0
141	කුලී පදනම් මත වාහන නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
142	වාහන අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
143	ධාන්‍ය ඇඹරුම් ස්ථානයක් පවත්වාගෙන යාම	3,000 0
144	පොල් කැබලි අඹරා තෙල් නිෂ්පාදනය කරන මෝල් පවත්වාගෙන යාම	3,000 0
145	වෘත්තීය මත බදු අය කිරීම් (වෛද්‍ය, සැළසුම් ශිල්පී, නීතිඥ)	3,000 0
146	කාන්තා මූලික ව්‍යාපාර සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තුවෙන් අඩු කිරීම	10%
147	ආබාධිත පුද්ගලයින් සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තුවෙන් අඩු කිරීම	10%
148	ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තුවෙන් අඩු කිරීම	10%
149	අවතැන් වූවන් සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තුවෙන් අඩුකිරීම	10%

12-26/6

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව

කසළ ඉවත් කිරීමේ නීති (126 වැනි වගන්තිය) යටතේ දැනුම් දීමයි - 2026 වර්ෂය

1987 අංක 15 ප්‍රාදේශීය සභා නීති 126 කොටස යටතේ ඉදිරිපත් කළ අංක 1024, 1998.04.17 දින පිළිගත් 520/7 අංක 1998.08.23 දින 9 කොටස කසළ ඉවත් කිරීම් සේවාව ප්‍රාදේශීය සභාව මාර්ගයෙන් කිරීමට අදහස් කර ඇත. එබැවින් 2025.10.16 දින සභා තීරණ අංක VSSPS/2025/10/05/55 හි පරිදි ඉඩම් හිමියන් විසින් රු. 300.00 මුදලක් සෑම මසකම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය.

එස්. සී. වීරකෝන්,
සභාපති,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 20 දින,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව,
ඊර්ට්ටපෙරියකුලම,
වවුනියාව.

12-41/7

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව

1987 වර්ෂයේ අංක 15 වැනි ප්‍රාදේශීය සභා පනතේ, 109 (ඊ) වගන්තිය අනුව කරනු ලබන නිවේදනය - 2026

නළ ළිං සඳහා සේවා ගාස්තු අය කිරීම වවුනියාව දකුණු සිංහල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සියලුම නළ ළිං වෙනුවෙන් නළ ළිඳක් භාවිතා කරන පවුලකින් වාර්ෂිකව රුපියල් 100.00 ට නොඅඩු, එසේම නළ ළිඳකට වාර්ෂිකව ලබා ගන්නා මුළු මුදල රුපියල් 1,500.00 ට නොඅඩු වාර්ෂික සේවා ගාස්තුවක් 2026.01.01 දින සිට අය කරන බව 1987 වර්ෂයේ අංක 15 ආඥාපනතේ 109 (ඊ) වගන්තිය අනුව හා 2025.10.16 දින සභා තීරණ අංක VSSPS/2025/10/05/56 හි පරිදි මෙයින් ප්‍රකාශ කරමි.

එස්. සී. වීරකෝන්,
සභාපති,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 20 දින,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව,
ඊර්ට්ටපෙරියකුලම,
වවුනියාව.

12-26/8

වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 148 (4) දරන උපලේඛන ප්‍රකාරව වාහනය වෙනුවෙන් අය කරනු ලබන කුළී බදු පිළිබඳ නිවේදනය - 2026

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 (4) උපලේඛනය ප්‍රකාරව හා 2025.10.16 දින සභා තීරණ අංක VSSPS/2025/10/05/57 හි සභා තීරණය අනුව 2026 වර්ෂයේ ජනවාරි මස 01 දින සිට 2026 වර්ෂයේ දෙසැම්බර් මස 31 දින දක්වා පහත සඳහන් පරිදි ගාස්තු අයකරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. සී. වීරකෝන්,
සභාපති,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 20 දින,
වවුනියා දකුණු සිංහල ප්‍රාදේශීය සභාව,
ඊර්ට්ටපෙරියකුලම,
වවුනියාව.

අනු. අංකය	*විස්තරය*	*අය කිරීම් (රුපියල්)*
01.	ට්‍රැක්ටරය ට්‍රේලරය සමඟ පැයකට (ඉන්ධන නොමැතිව)	1,000 0
02.	ට්‍රැක්ටරය චතුර බවුසරය සමඟ පැයකට (ඉන්ධන නොමැතිව)	1,000 0
03.	ට්‍රේලරය පමණක් දිනකට	2,000 0
04.	ට්‍රැක්ටරය භාණ්ඩ ප්‍රවාහනය සඳහා පැයකට	2,700 0
05.	ට්‍රැක්ටරය පමණක් පැය 08 කට (ඉන්ධන හා රියදුරන් නොමැතිව)	5,000 0

අනු. අංකය	*විස්තරය*	*අය කිරීම් (රුපියල්)*
06.	ගොඩ ඉඩම් - ට්‍රැක්ටරය රොටරියෙන් සී සෑමට එක් අක්කරයකට (කුලීකරු විසින් ඉන්ධන ලීටර 08 ක් යෙදිය යුතුය)	6,000 0
07.	මඩ ඉඩම් - ට්‍රැක්ටරය රොටරියෙන් සී සෑමට එක් අක්කරයකට (කුලීකරු විසින් ඉන්ධන ලීටර 20 ක් යෙදිය යුතුය)	12,000 0
08.	ගොඩ ඉඩම් - ට්‍රක්ටරය කොකු නඟුලෙන් සී සෑමට හා පෝරු ගෑමට - එක් අක්කරයකට (කුලීකරු විසින් ඉන්ධන ලීටර 08 ක් යෙදිය යුතුය)	7,000 0
09.	මඩ ඉඩම් - ට්‍රැක්ටරය කොකු නඟුලෙන් සී සෑමට හා පෝරු ගෑමට - එක් අක්කරයකට (කුලීකරු විසින් ඉන්ධන ලීටර 20 ක් යෙදිය යුතුය)	12,000 0
10.	බොබ්කැට් යන්ත්‍රය පැයකට (ප්‍රවාහනය හා ඉන්ධන නොමැතිව)	3,000 0
11.	බැකෝ ලෝඩර් යන්ත්‍රය පැයකට (ඉන්ධන නොමැතිව)	3,500 0
12.	ගලි බවුසරය ලීටර් 4,000 එක් පැටවුමක් සඳහා	6,500 0
13.	ගලි බවුසරය කිලෝ මීටර 5ට වැඩි වන කිලෝ මීටරයකට	100 0
14.	ගලි බවුසරය ප්‍රාදේශීය බල ප්‍රදේශයෙන් පිට (එක් පැටවුමක් සඳහා)	9,000 0
15	ගලි බවුසරය සඳහා පරීක්ෂණ ගාස්තු	250 0
16	ටිපර් රථය කිලෝ මීටරයකට	100 0
ඊ.දේශපාලන රැස්වීම් සඳහා	15,000 0	20,000 0	100,000 0
උ.ශබ්ද විකාශන යන්ත්‍ර	20,000 0		
ඌ. රාජ්‍ය ආයතන සඳහා	5,000 0	20,000 0	
II. ශ්‍රවණාගාර මිදුල (වර්ග අඩියක ප්‍රමාණය දිනකට)	10 0		

III. පාසල් ළමුන් ප්‍රවාහනය කරනු ලබන වාහන නවතා තැබීමේ ගාස්තු :

(i)	පාසල් බස් රථ සඳහා (මසකට)	1,000 0
(ii)	පාසල් වෑන් රථ සඳහා (මසකට)	750 0
(iii)	වෙනත්/ත්‍රීවීල් (දිනකට)	100 0
(iv)	බයිසිකල් (දිනකට)	50 0

		රු. ශත.	රු. ශත.
4	සුසාන භූමි සඳහා ගාස්තු (භූමිදානයක් සඳහා)		250 0
5	බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසිකරුවන් ලියාපදිංචි කිරීම සඳහා එක් වර්ෂයක් සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුව	1,000 0	
6	ගල්මත්ත පොළ භූමිය දේශපාලන රැස්වීම් දිනකට	7,500 0	තැන්පතු 5,000 0
7	සතිපොළ ගාස්තු :		
	මතුගම (දිනකට එක් මඩුවකට)	250 0	
	ගල්මත්ත (දිනකට එක් මඩුවකට)	120 0	
8	මාර්ග පළුදු කිරීමේ තැන්පත් ගාස්තු (ආපසු නොගෙවන)	1,000 0	
9.	කසළ ගාස්තු අයකිරීම		
	1. මතුගම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (මාසික)	20,000 0	
	2. මතුගම මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (මාසික)	15,000 0	

12 - 70/10

මතුගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බදු පැනවීම පිළිබඳ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උප වගන්තිය යටතේ මතුගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වාහන හා සත්ත්ව බදු පනවා අයකිරීම පිළිබඳව 2025 ඔක්තෝබර් 14 දින පවත්වන ලද මතුගම ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේදී යෝජනා අංක ඊ - 1.7 (11) යටතේ පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කසුන් මුණසිංහ,
සභාපති,
මතුගම ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 15 දින,
මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2024 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තකුම එහි II තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ත්ව බද්දක් 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් එකී වාහන සත්ත්ව බද්දට යටත් තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින තිහක් සම්පූර්ණ වූ වහාම 2026 වර්ෂය සඳහා මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කරමි.

උපලේඛනය

I තීරුව		*II තීරුව*
(i)	මෝටර් රථයක්, මෝටර් ලොරියක්, මෝටර් ට්‍රයිසිකලයක්, කරත්තයක්, බයිසිකලයක් හෝ ජීන් රික්ෂෝවක්, නොවන සෑම වාහනයක් සඳහා	රු. 25 0
(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
	(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	රු. 18 0
	(ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	රු. 04 0

I වැනි තීරුව	*II වැනි තීරුව*
(iii) සෑම කරත්තයක් සඳහා	රු. 20 0
(iv) සෑම අත් කරත්තයක් සඳහා	රු. 10 0
(v) සෑම රික්ෂෝවක් සඳහා	රු. 7 50
(vi) සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	රු. 15 0
(vii) සෑම ඇතෙකු සඳහා	රු. 50 0

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

(3) ඉහත සඳහන් වන "වෙළඳ කාර්ය" යන්නට විකිණීම සඳහා හෝ අන් ආකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැත හොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 70/11

මතුගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා සංචාරක වෙළෙඳාම් කිරීම සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උප වගන්තිය යටතේ මතුගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සංචාරක වෙළඳාම් කිරීම සඳහා ගාස්තු පනවා අයකිරීම පිළිබඳව 2025 ඔක්තෝබර් 14 දින පවත්වන ලද මතුගම ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේදී යෝජනා අංක අංක ඊ - 1.7 (12) යටතේ පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කසුන් මුණසිංහ,
සභාපති,
මතුගම ප්‍රාදේශීය සභාව.

2025 ඔක්තෝබර් මස 15 දින,
මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 149 වන වගන්තිය යටතේ මාවෙත පැවරී ඇති, බලතල ප්‍රකාරව 2016 වර්ෂයේ සැප්තැම්බර් මස 20 දින බලතල දැරීමද, කාර්ය, කර්තව්‍ය ඉටුකරන ලේකම්ගේ තීරණ පොතේ අංක 2469 යටතේ ගන්නා ලද තීරණය අනුව, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික) විධිවිධාන පනතේ වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ දෙවන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1888/47 හා 2014.11.14 දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා අනුශාංගික විධිවිධාන පනතේ දෙවන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලදුව, ඒ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක1947/6 හා 2015.12.28 දිනැති ගැසට් පත්‍රය යටතේ නිවේදනය කර ඇත.

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 3 වගන්තිය යටතේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව එකී සම්මත අතුරු ව්‍යවස්ථා, මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017.01.01 දින සිට අදාළ කරගනිමින් බලාත්මක වන සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ සංචාරක වෙළඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සංචාරක වෙළඳාම කිරීම සඳහා අවසර පත්‍ර ගාස්තුව 2026 වර්ෂයට රු. 1,500.00 ක් විය යුතු බවත් මම තීරණය කරමි.

12 - 70/12

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වරිපනම් බදු අය කර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය යටතේ මීරිගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2026 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

2026 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ 1 උපවගන්තියෙන් යටතේ මීරිගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කළ ප්‍රදේශවල පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල ගෙපත්වල, වාර්ෂික වටිනාකම සඳහා 2023 සිදු කරන ලද තක්සේරුව 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උප වගන්තියෙන් ම පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට 5%ක වාර්ෂික වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවටත්,

එකී පනතේ 134(7) වගන්ති ප්‍රකාර 2026 වර්ෂයට අදාළ වරිපනම් බදු එකී වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර ගෙවනු ලැබුවහොත් 10% වට්ටමක්ද,

පහත උපලේඛනයේ සඳහන් කාර්තු වශයෙන් ගෙවන විට කාර්තුවේ මුල් මාසය අවසන් වීමට පෙර ගෙවනු ලැබුවහොත් එකී ගෙවන මුදලින් 5% ක වට්ටමක් ලබාදීම සුදුසු වට සභාව යෝජනා කරන ලදි.

උපලේඛනය

කාර්තුව	*ගෙවිය යුතු දිනය*	*වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2026.03.31	2026.01.31
දෙවන කාර්තුව	2026.06.30	2026.04.30
තුන්වන කාර්තුව	2026.09.30	2026.07.31
හතරවන කාර්තුව	2026.12.31	2026.10.31

කාර්තුවකට අදාළ බදු මුදල කාර්තුව තුළ නොගෙවන්නේ නම් එම බදු මුදල අයකර ගැනීම පිණිස 158 වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබුයේ නම් 161 වගන්තිය ප්‍රකාරව එකී මුදලට අතිරේකව පහත සඳහන් පරිදි බලපත්‍රය නිකුත් කිරීමේ ගාස්තුවක් අයකිරීම සුදුසු බවටත්, යෝජනා කරන ලදී.

i. අයවිය යුතු බද්දේ හෝ කුළියේ ප්‍රමාණයෙන් 10%ක් අයකිරීමටත්,
ii. හිස් බිම් හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 15%ක් සහ,
iii. හිස් බිම් හා නිවාස ස්ථාන නොවන දේපළ සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දෙන් 20%ක් අයකිරීමටත් සභාව යෝජනා ලදී.

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු 147 වගන්තියෙන් මීරිගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2026 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීම සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

2026 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීමේ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමග කියවිය යුතු 147 වගන්තිය යටතේ මීරිගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා මීරිගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින්, 2026 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප ඝටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් අය කිරීම සුදුසු බවටත් 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපනශාලාව හෝ නවාතැන්පොළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූද අනුමත කර හෝ පිළිගත්තාවූද අවස්ථාවක එසේ කරනු ලැබූ ගාස්තුව අය කරනු ලැබූ අවුරුද්දට පෙරාතුවම වූ අවුරුද්දේ ඒ හෝටලයේ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළේ ආදායම අනුව විය යුතු අතර එම ආදායමින් සියයට එකක් නොඉක්මවිය යුතුය. ඒ හෝටලය ආපන ශාලාව හෝ නවාතැන්පොළ ක්‍රියාත්මක වන පළමුවන අවුරුද්ද වන අවස්ථාවක ඒ ගාස්තුව ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව තීරණය කොට අය කරනු ලැබිය යුතු බවට සභාව යෝජනා කරන ලදී.

පළමු උපලේඛනය

	I තීරුව	*II තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
	පීඩාකාරී ව්‍යාපාර :			
1.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
2.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
3.	සම් විකිණීම	500 0	750 0	1,000 0
4.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
5.	ඖෂධාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0

	I තීරුව	*II තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
8.	කරවල ලූණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
9.	පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබාගැනීම	500 0	750 0	1,000 0
15.	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
16.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
18.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
19.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	සිරප් හෝ පලතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
21.	රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
22.	පොල් ලෙලි පෙහවීම හෝ පල් කිරීම	500 0	750 0	1,000 0
23.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
24.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
25.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
26.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
27.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
28.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබාගැනීම	500 0	750 0	1,000 0
29.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
30.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
31.	පලතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
32.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂභෝග, කුළුබඩු හෝ කිරිපිටි ඇඹරුම් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0

	I තීරුව	*II තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
34.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
35.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
36.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
37.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
38.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
39.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
40.	ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
41.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
42.	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
43.	සිමෙන්ති කි. ග්‍රෑම් 1000 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
44.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
45.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
46.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
47.	පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
48.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
49.	ධාන්‍ය හෝ මාෂභෝග කිලෝග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0

දෙවන උපලේඛනය

	අන්තරාදායක ව්‍යාපාර			
1.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි/ ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
2.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0

	I තීරුව	*II තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
3.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4.	කුකුළන් 100 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු ගාලක් හෝ කුකුළු කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	එළුවන්, ඌරන් 10 ට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
6.	ගඩොල් හෝ උළු ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
7.	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8.	කළු ගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
9.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100 ට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
10.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
12.	ගිණිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
17.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
18.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	විසිරී පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
22.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0
23.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
24.	ශීත කළ මස් හෝ මාළු ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
25.	දැව ගබඩා කිරීම	500 0	750 0	1,000 0

	I තීරුව	*II තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
	පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර			
1.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු එනසාල් හෝ කෙඳි කිරීම	500 0	750 0	1,000 0
2.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
3.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
4.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අළුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
6.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
9.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
13.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
15.	කිලෝග්‍රෑම් 150 ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	ලියවන පට්ටලයක් භාවිත කරමින් වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
18.	පෙට්‍රල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛණිජතෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
20.	වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
21.	විදුලි කර්මාන්ත වැඩපළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

	I තීරුව	*II තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
	අනෙකුත් වෙළඳ බලපත්‍ර			
1.	ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	ආපනශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	කිරි විකිණීම	500 0	750 0	1,000 0
10.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
11.	මස් විකිණීම	500 0	750 0	1,000 0
12.	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ගවගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	පෞද්ගලික වෙළඳපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	කොන්ඩය කැපීමේ සැලුන්හලක් පවත්වාගෙන යාම (රූපලාවන්‍යාගාරයක්)	500 0	750 0	1,000 0
18.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	පපඩම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	හකුරු නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	වී තම්බා කොටන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	නූඩ්ල්ස් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	ඉංග්‍රීසි බෙහෙත් වර්ග නිෂ්පාදනය/ගබඩා කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
24.	බිම් මල් නිෂ්පාදන සහ අලෙවිය	500 0	750 0	1,000 0
25.	වියලි ආහාර ද්‍රව්‍ය ඇසුරුම් කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
26.	විජලනය ආහාර ද්‍රව්‍ය ඇසුරුම් කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
27.	වැලි නිස්සාරනය හා වැලි ගබඩාකිරීම	500 0	750 0	1,000 0
28.	කළු ගල් කුඩු කිරීම	500 0	750 0	1,000 0
29.	ඇසිඩ් හා විවිධ රසායනික වර්ග නිෂ්පාදනය කිරීම සහ අලෙවිය	500 0	750 0	1,000 0

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ මීරිගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2026 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

2026 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (I) උපවගන්තිය යටතේ මීරිගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනත හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරයේ 2025 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමට සුදුසු බවට සභාව යෝජනා කරන ලදී.

උපලේඛනය

I තීරුව	***II තීරුව***
2025 වර්ෂයේ දී ව්‍යාපාරයේ වාර්ෂික ආදායම	***රු. ශත***
රු. 6,000 0 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 0 ඉක්මවන එහෙත් රු. 12,000 0 නොඉක්මවන විට	90 0
රු. 12,000 0 ඉක්මවන එහෙත් රු. 18,750 0 නොඉක්මවන විට	180 0
රු. 18,750 0 ඉක්මවන එහෙත් රු. 75,000 0 නොඉක්මවන විට	360 0
රු. 75,000 0 ඉක්මවන එහෙත් රු. 1,50,000 0 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,000 0 ඉක්මවන විට	3,000 0

12 - 77/3

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ගාස්තු පනවා අයකර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව 2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ගාස්තු පනවා අයකර ගැනීමට මීරිගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ගාස්තු පනවා අයකර ගැනීම සඳහා වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කර බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික සංවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් 2015.12.28 දින අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(අ) කොටසේ පළාත් සභා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සහ 2016.07.20 දිනැති 1976/21 දරන සංශෝධිත ගැසට් පත්‍රයේ පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් ප්‍රචාරක දැන්වීම් අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ දැන්වීම ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන පරිදි ප්‍රදර්ශන ගාස්තුවක් 2026 වර්ෂයට ගෙවිය යුතු බවට සභාවට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග ප්‍රමාණය (වර්ග මීටර්)*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක් හෝ තාප්පයක කරනු ලබන ප්‍රචාරක දැන්වීමක්	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 200ක් බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් සඳහා	1 ට අඩු	250 0	750 0	1,000 0
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500 0	750 0	1,000 0
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1 ට අඩු	250 0	350 0	500 0
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750	850	1,000
		1 ට වැඩි	1 ට වැඩිවන සෑම වර්ග අඩියක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්		

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා කර්මාන්ත බදු පනවා අයකර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම මීරිගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

2026 වර්ෂය සඳහා කර්මාන්ත බදු පනවා අයකර ගැනීම වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා සම්මත කිරීම සුදුසු බවටය යෝජනා කරමි.

කර්මාන්ත උපලේඛනය

	I තීරුව	*II වැනි තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
1.	හකුරු නිපදවීම	500 0	750 0	1,000 0
2.	සීනි බෝල හෝ ග්ලූකෝස් නිපදවීම	500 0	750 0	1,000 0
3.	අයිස්ක්‍රීම් හෝ ශීතකළ බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
4.	කිරි ආහාර හෝ යෝගට් නිපදවීම	500 0	750 0	1,000 0
5.	කුළු බඩු පැකට් කිරීම	500 0	750 0	1,000 0
6.	කරත්ත අලුත්වැඩියා කිරීම හෝ සාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	වතුර පොම්ප හා වෙනත් උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	නල ලිං තැනීම	500 0	750 0	1,000 0
10.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	විදුලි උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ගොඩනැගිලි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
13.	වායු සමීකරණ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	විදුලි කාර්මික ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I තීරුව	*II වැනි තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
15.	ගුවන් විදුලි හා රූපවාහිනී අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	රෙදිපිලි මෝස්තර මුද්‍රණය කිරීම, පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
17.	අත් යන්ත්‍ර රෙදි විවීම (යන්ත්‍ර 2ට වැඩි)	500 0	750 0	1,000 0
18.	මදුරු දැල් නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
19.	කොප්පරා නිපදවීම	500 0	750 0	1,000 0
20.	කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
21.	කොසු මිටවල් සකස් කිරීම	500 0	750 0	1,000 0
22.	ගල් ස්මාරක නිපදවීම හෝ ගලින් කරන ලද භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
23.	මැටි පහන් නිෂ්පාදනය හෝ විකිණීම	500 0	750 0	1,000 0
24.	හඳුන්කූරු නිපදවීම	500 0	750 0	1,000 0
25.	දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ඇස් කණ්ණාඩි රාමු නිපදවීම	500 0	750 0	1,000 0
27.	ඇසිඩ් වර්ග නිපදවීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
28.	විවිධ රසායනික ද්‍රව්‍ය නිපදවීම	500 0	750 0	1,000 0
29.	ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	පරිගණක අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	බීඩි නිපදවීම	500 0	750 0	1,000 0
32.	ගම් වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
33.	දැන්වීම් පුවරු බැනර් පෝස්ටර් සැකසීම	500 0	750 0	1,000 0
34.	ආරක්ෂක කැමරා පද්ධති සැකසීම	500 0	750 0	1,000 0
35.	දැහැටි කූරු නිපදවීම	500 0	750 0	1,000 0
36.	තේ පෙට්ටි සෑදීම හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
37.	මිනී පෙට්ටි සෑදීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
38.	අඩු වියදම් සිවිලින් සකස් කිරීම	500 0	750 0	1,000 0
39.	රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	ගීත පටිගත කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	වාර්තාමය චිත්‍රපට නිපදවීම	500 0	750 0	1,000 0
42.	අත් යන්ත්‍ර මාර්ගයෙන් මෙට්ට නිපදවීම	500 0	750 0	1,000 0
43.	අශ්වබල 10ත් 20ත් අතර වී මොලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	අශ්වබල 20ට වැඩි වීමෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	කුෂන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	අත් යන්ත්‍ර මගින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	රබර් සීල් සෑදීමේ හෝ ප්ලාස්ටික් නාම පුවරු සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I තීරුව	*II වැනි තීරය පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
48.	වෙස් මුහුණු හෝ කලාත්මක භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	මනි බඩු නිපදවීම	500 0	750 0	1,000 0
50.	ෆයිබර් මගින් බුදු පිළිම දේව රූප නිර්මාණය කිරීම	500 0	750 0	1,000 0
51.	බෑග් නිපදවීම	500 0	750 0	1,000 0
52.	ලී කැටයම් කිරීම	500 0	750 0	1,000 0

12 - 77/5

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ආදාහනාගාර සේවා ගාස්තු පනවා අයකර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව ආදාහනාගාර සේවා ගාස්තු පැනවීම සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

2026 වර්ෂය සඳහා ආදාහනාගාර සේවා ගාස්තු පනවා අයකර ගැනීම සඳහා වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තියෙන් මීරිගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2015.12.28 වැනි දින අංක 1989 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 2015.12.28 දිනැති හා අංක 1947/6 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ගරු විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ආදාහනාගාර ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභාවට අයත් විල්වත්ත ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනය කිරීම සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි වූ ගාස්තු 2026 වර්ෂය සඳහා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

උපලේඛනය

	රු. ශත
1. මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ	10,000 0
2. මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත	12,000 0

12-77/6

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පනවා අයකර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පනවා අයකර ගැනීම සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

2026 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පනවා අයකර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක (2%) බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) (ආ) ඡේදය යටතේ වන සමානුපාතය වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1:4 විය යුතු බවට සම්මත කිරීම සුදුසු බව යෝජනා කරමි.

12 - 77/7

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා පොදු උපයෝගීතා සේවා සඳහා ගාස්තු පනවා අයකර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109(ඇ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට පොදු උපයෝගීතා සේවා සඳහා ගාස්තු පැනවීම සම්බන්ධයෙන් අයකර ගැනීම සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

2026 වර්ෂය සඳහා පොදු උපයෝගීතා සේවා සඳහා ගාස්තු පනවා අයකර ගැනීම සඳහා වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109 (ඇ) වගන්තියේ මීරිගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පොදු උපයෝගීතා සේවා සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි වූ ගාස්තු 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109 (ඇ) ප්‍රකාරව පොදු උපයෝගීතා සේවා සඳහා ගාස්තු පැනවීම.

	රු. ශත
01. ජල බවුසරය (ලොකු) - 7,000L – VAT - 01/4602)	
බවුසරය ගාස්තු	4,000 0
ජලය	700 0
රියැදුරු	1,600 0
සහායක	1,000 0
	7,300 0

දුර අනුව 1Km කට 200 0 (යන +එන)

* හදිසි විපත්, ස්වභාවික ආපදා වැනි අවස්ථාවල දී, නියං, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි විසින් සනාථ කර ඇත්තේ නම් පමණක්) පානීය ජලය ගාස්තු අය කිරීමකින් තොරව ප්‍රවාහන ගාස්තු අය කර ජලය ලබා දිය යුතුය.

* එමෙන්ම පාසල් රෝහල් සායන වැනි පොදු පහසුකම් සපයන ස්ථානවල සිදු ආගමික ස්ථාන, කරන සුබ සාධන කටයුතු සඳහා පමණක් මුදල් අය නොකර ගාස්තු අය කිරීමකින් තොරව ජලය ලබා දීම.

* අනිකුත් මහජන ඉල්ලීම්වලදී පොදු කටයුතු සඳහා හෝ පුද්ගලික කටයුතු සඳහා සිදු කරන ජලය සඳහාත්, ප්‍රවාහන ගාස්තුවත් යන දෙකම අයකර ජලය ලබාදිය යුතුය.
ජල ටැංකි - stand සමග - (රු. 1000) දිනකට - ප්‍රවාහන පහසුකම් සපයා ගත යුතුය.

* ජල ටැංකි කුළියට ලබා දීමේ දී පාසල් ආගමික ස්ථාන රෝහල් වැනි ආයතන සඳහා නොමිලේ ලබාදිය යුතු අතර ඔවුන් විසින් ප්‍රවාහනය කළ යුතුය.

* අනෙකුත් මහජන ඉල්ලීම්වලදී ගැසට් පත්‍රයේ සඳහන් පරිදි අදාළ ගාස්තු අයකර ජලය ලබා දිය යුතුය.

	රු. ශත
02. ජල බවුසරය (පොඩි) - 3,000L – VAT - 01/4602)	
බවුසරය ගාස්තු	2,150 0
ජලය	350 0
රියැදුරු	1,600 0
සහායක	1,000 0
	5,100 0

* දුර අනුව 1Km කට රු. 150 0 (යන +එන)

03. ගල් රෝල (පොඩි) රු. 6,000.00 (දිනකට) – VAT - 04/4299) (ප්‍රවාහන ගාස්තු රහිතව)

04. බැකෝ රථය රු. 5,500.00 (පැයකට) – VAT 04/4299) (පැය 04 කට වඩා වැඩි)
*දුර අනුව 1Km කට රු. 200.00 (යන + එන)

05. මෝටර් ග්‍රේඩරය රු. 6,000.0 – VAT - 04/4299) (පැය 03 කට වඩා වැඩි)
දුර අනුව 1Km කට රු. 200.0 (යන + එන)

06. ගල් රෝල (ලොකු) රු. 21,500.0 (දිනකට) – VAT - 04/4299) (පැය 08)
රු. 10,750.0 (වරුවකට)

07. ට්‍රැක්ටරය ඉන්ධන හා රියැදුරු සමග (පැය 08 - තණකොල කැපීම සඳහා) රු. 16,000.0

* ප්‍රාදේශීය සභාවේ වාහන යොදවා ලබාදිය යුතු සේවාවන් ලබා දීමේදී රජයේ ආයතන හෝ මහජන ඉල්ලීම් හෝ පුද්ගලික ආයතන වලින් සිදුකරන ඉල්ලීම් සඳහා *ගැසට් පත්‍රයේ* සඳහන් පරිදි අදාළ ගාස්තු අයකර ලබා දිය යුතුයි.

08. කොඩි කණු සඳහා ගාස්තු රු. 50.0 (දිනකට එක් කණුවක් සඳහා) ප්‍රවාහනය සපයා ගත යුතු ය.

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බද්දක් පනවා අයකර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය හා 148 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව වාහන හා සත්ව බද්දක් පනවා අයකර ගැනීම සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

2026 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බද්දක් පනවා අයකර ගැනීම සඳහා වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය හා 148 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයේ දැක්වෙන II තීරුවේ ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂය වෙනුවෙන් සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

උපලේඛනය

I තීරුව	*II තීරුව* *රු. ශත*
මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බසියිකලයක්, කරත්තයක්, ජීප් රික්ෂෝවක් (බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා)	25.0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකලයක් හෝ අත් කරත්තයක් සඳහා	
(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18.0
(ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4.0
සෑම කරත්තයක් සඳහා	20.0
සෑම අත්කරත්තයක් සඳහා	10.0
සෑම රික්ෂෝවක් සඳහා	7.50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15.0
සෑම ඇතෙකු සඳහා	50.0

12 - 77/9

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වෙනත් සේවා සඳහා ගාස්තු පනවා අයකර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109(1) වගන්තිය හා 148 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව වෙනත් සේවා ගාස්තු පනවා අයකර ගැනීම සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

2026 වර්ෂය සඳහා වෙනත් සේවා සඳහා ගාස්තු අයකර ගැනීම සඳහා වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109(7) වගන්තිය හා 148 වගන්තියෙන් මීරිගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.10.14 වැනි දින අංක 1989 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ගරු විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ගරු විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ සේවා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව, මීරිගම ප්‍රාදේශීය සභාව මගින් සපයන සේවා සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි වූ ගාස්තු 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

උපලේඛනය

					රු. ශත
1.	නිවාස හා නගර සංවර්ධන ආඥාපනත යටතේ ගොඩනැගිලි අයදුම්පත්/සංවර්ධන අයදුම්පත්				700 0
2.	වීථි රේඛා නිකුත් කිරීම ගොඩනැගිලි සීමා සහතික ද නිකුත් කිරීම, අයිතිය/ නොපවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීම				1,500 0
3.	අයදුම්පත් ගාස්තු				100 0
4.	ජල සැපයුම් සහතික නිකුත් කිරීම				500 0
5.	දේපල අයිතිය හැරවීමේ අයදුම්පත් ගාස්තු				50 0
6.	ප්‍රසම්පාදන පෝර්ම ගාස්තු				1,500 0
7.	සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම				2,000 0
8.	පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තු				100 0
9.	පුස්තකාල සාමාජික ගාස්තුව (නව සාමාජිකයින්)				100 0
10.	පුස්තකාල සාමාජික අලුත් කිරීමේ ගාස්තුව (වසර 02කට වරක්)				50 0
11.	වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමට				1,000 0
12.	සභාව මගින් පොළ ගාස්තු අයකිරීමේදී :				
	දෛනික පොළ වර්ග අඩියකට				5 0
	සති පොළ වර්ග අඩියකට				8 0
13.	ජංගම ප්‍රචාරක ප්‍රවර්ධන වැඩසටහන් සඳහා දිනකට				5,000 0
14.	කොම්පෝස්ට් පොහොර විකිණීම	කිලෝග්‍රෑම් 1ක සිල්ලර මිල			40 0
		කිලෝග්‍රෑම් 5 පැකට් 01			200 0
		කිලෝග්‍රෑම් 15 පැකට් 01			500 0
		කිලෝග්‍රෑම් 20 පැකට් 01			600 0
15.	ඉඩම් අනු බෙදුම් සඳහා	ව.මී. 150-ව.මී. 300	කැබලි 1ක් සඳහා	රු.	1,000 0
		ව.මී. 301-ව.මී. 600	කැබලි 1ක් සඳහා	රු.	800 0
		ව.මී. 601-ව.මී. 900	කැබලි 1ක් සඳහා	රු.	600 0
		ව.මී. 900 ට වැඩි	කැබලි 1ක් සඳහා	රු.	500 0
16.	මායිම් තාප්ප/රැඳවුම් බැම් ඉදිකිරීම		දික් මීටර් 1ක් සඳහා	රු.	100 0
17.	සන්නිවේදන කුළුණු/ඇන්ටනා කුළුණු සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම			රු.	40,000 0

18. නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි

ගෙබිම් ප්‍රමාණය	*(ව.මී.1) තනි පුද්ගල*	*නේවාසික ව.මීටර් 1කට මහල් නිවාස*	*නේවාසික නොවන (ව.මී.1)*
ව.මී. 400 දක්වා	20 0	25 0	25 0
ව.මී. 401-1000	22 0	27 0	27 0
ව.මී. 1001-1500	25 0	30 0	30 0
ව.මී. 1501-2000	25 0	32 0	32 0
ව.මී. 2000ට වැඩි	වැඩිවන සෑම ව.මී. 90ක් සඳහාම රු. 20 00 බැගින්	වැඩිවන සෑම ව.මී. 90ක් සඳහාම රු. 20 00 බැගින්	වැඩිවන සෑම ව.මී. 90ක් සඳහාම රු. 20 00 බැගින්

19. සංවර්ධන බලපත්‍රයේ වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම

ව.මී. 1000 දක්වා	රු. 5,000.0
ව.මී. 1000 වැඩි	රු. 10,000.0

20. ඉඩම් අනු බෙදුම් සඳහා — එක් කැබැල්ලකට — රු. 1,000.0

21. ගොඩනැගිලි ඉදිකිරීම

ගෙබිම් ප්‍රමාණය	නේවාසික (ව.මී.1) තනි පුද්ගල	නේවාසික (ව.මී.1) මහල් නිවාස	නේවාසික නොවන ව.මීටර් 1කට
ව.මී. 400 දක්වා	රු. 4,000 0	රු. 5,000 0	රු. 5,000 0
ව.මී. 400 වැඩි	400.0 ව.මී. 400ට වැඩිවන සෑම ව.මී. 1ට හෝ ඉන් කොටසක් සඳහා රු. 15.0 බැගින්	5,000.0 ව.මී. 400ට වැඩිවන සෑම ව.මී. 1ට හෝ ඉන් කොටසක් සඳහා රු. 20.0 බැගින්	5,000.0 ව.මී. 400ට වැඩිවන සෑම ව.මී. 1ට හෝ ඉන් කොටසක් සඳහා රු. 25.0 බැගින්

* අංක 2235/54-2021 ජූලි මස 8 දින ගැසට් පත්‍රය අනුව අයකරනු ලැබේ.

22. ජල ව්‍යාපෘතිය - වාණිජ්‍යය :

ඒකක පරාසය	*ඒකකයක මිල රු.*	*ඒකකයක මිල වෙනස් වීමේ පරාසය රු.*	*ස්ථාවර ගාස්තුව රු.*
1 - 10	240.0	-	350.0
11 -20		300.0	350.0
21 - 30		360.0	350.0
31 - 40		450.0	350.0
41 - 55		600.0	350.0
56 - 60		750.0	350.0
61 - 70		900.0	350.0
80 ට වැඩි		1,000.0	350.0

ජල ව්‍යාපෘතිය - නේවාසික :

ඒකක පරාසය	*ඒකකයක මිල* *රු.*	*ඒකකයක මිල වෙනස් වීමේ පරාසය* *රු.*	*ස්ථාවර ගාස්තුව* *රු.*
1-5	60.0	-	300.0
6-10		180.0	300.0
11 - 15		180.0	300.0
16 - 20		240.0	300.0
21 - 25		300.0	300.0
26 - 30		360.0	300.0
31 - 35		420.0	300.0
36 - 40		480.0	300.0
41 - 45		540.0	300.0
46 - 50		600.0	300.0
51 - 55		660.0	300.0

		රු. ශත
23.	සංචාරක වෙළෙඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තුව	1,000 0
24.	සභාව විසින් පවත්වාගෙන යන පෙර පාසල් සඳහා ඇතුළත්වීමේ අයදුම්පත සඳහා ගාස්තුව	1,000 0
25.	වරිපනම් ලේඛනයේ උධෘත ලබාගැනීමේ ඉල්ලුම්පත් සඳහා	500 0
26.	වරිපනම් සීමාවේ බවට තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම සඳහා	500 0
27.	අනතුරුදායක ගස් ඉවත් කිරීම පිළිබඳ ඉල්ලුම් පත් ගාස්තුව	1,000 0
28.	තක්සේරු ලේඛනයේ පිටපතක් සඳහා	1,000 0
29.	මීරිගම ලීලෑන්ඩ්වත්තේ පිහිටි මීරිගම ප්‍රාදේශීය සභාවට අයත් "මිහිරි බොජුන්හලේ" එක් ව්‍යවසායිකාවකගේ දෛනික සේවා ගාස්තුව (එක් වරුවකට)	400 0

12-77/10

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ක්‍රීඩා භූමි පරිහරණය සඳහා ගාස්තු පනවා අයකර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109(අ) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව ක්‍රීඩා භූමි පරිහරණය සඳහා ගාස්තු පැනවීම සම්බන්ධයෙන් සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

2026 වර්ෂය සඳහා ක්‍රීඩා භූමි පරිහරණය සඳහා ගාස්තු පනවා අයකර ගැනීම සඳහා වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 109 (1) වගන්තියෙන් මීරිගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.10.14 දින අංක 1989 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති 2015.12.28 දිනැති හා අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ගරු විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ක්‍රීඩා භූමි ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා භූමි සඳහා එකී අතුරු ව්‍යවස්ථාවේ 3.2 වගන්තිය අනුව පහත උපලේඛනයේ සඳහන් පරිදි වූ ගාස්තු 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි තීරණය කරමි. (සියලුම ගාස්තු සඳහා රජයේ බදු මුදල් ද අය කරනු ලැබේ.)

උපලේඛනය

ක්‍රීඩා භූමියේ නම	ගාස්තුව දිනකට	තැන්පත් මුදල (ආපසු ගෙවන)	අතිරේක ගාස්තුව දිනයකට
	රු. ශත	රු. ශත	රු. ශත
01. ලීලෑන්ඩ්වත්ත ක්‍රීඩාංගනය (සංගීත ප්‍රසංගයක් සඳහා)	20,000 0	20,000 0	10,000 0
02. මීරිගම මහජන ක්‍රීඩාංගනය	25,000 0	20,000 0	10,000 0
03. සතිපොළ භූමිය	5,000 0	5,000 0	-
04. පොදු ඉඩම් සඳහා	2,500 0	-	-

* බස් නැවතුම්පළ අසල භූමිය අඩි 20x20 රු. 5,000 0
* වොලිබෝල් ක්‍රීඩා පිටිය පැයකට රු. 500 0
* ලීලෑන්ඩ්වත්ත ක්‍රීඩාංගනය රියදුරු පුහුණු ආයතන සඳහා පැයකට රු. 1,000 0

වෙනත් කාර්යයන් සඳහා 5,000.00 (පැය දෙකකට අඩුනම් පැයකට රු. 1,000.00)
භාවිතා කරන කාලය අනුව වෙන් කිරීම 6,000.00 (ප්‍රදර්ශන)

පාසැල්, පෙර පාසැල්, තරුණසේවා සභාවේ ලියාපදිංචි ආයතන, ක්‍රීඩා සමාජවල ක්‍රීඩා සඳහා ක්‍රීඩා නිලධාරි නිර්දේශ කල පසු මීරිගම මහජන ක්‍රීඩාංගනය නිදහස් කිරීමටත් යෝජනා කරන ලදී.

12-77/11

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂයට අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) උපවගන්තියෙන් මීරිගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) එම වගන්තියෙන් මීරිගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සහ බල ප්‍රදේශය තුල පිහිටියා වූ ද ස්ථීර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද,

එක් එක් ඉඩම් හෙක්ටයාරයක් මත පහත දක්වා ඇති අනුප්‍රමාණය බද්දක් පනවා අයකිරීමටද,

(අ) 2026.01.31 දිනට හෝ ඊට පෙර මුළු වර්ෂයටම ගෙවිය යුතු අක්කර බද්ද ගෙවනු ලැබුවහොත්, එම මුදලින් සියයට දහසක් (10%) වට්ටම් වශයෙන් ලබාදීම සුදුසු බවටත්,

(ආ) බදු මුදල් කොටස් වශයෙන් ගෙවන විට අක්කර බදු ගෙවිය යුතු පළමුවැනි මාසය තුළ ගෙවනු ලැබුවහොත්, එසේ ගෙවන මුදලින් සියයට පහක් (5%) වට්ටමක් ලබා දීම සුදුසු බවටත්, සභාව යෝජනා කරන ලදී.

ඉඩම් ප්‍රමාණය	*බදු අනු ප්‍රමාණය වර්ෂයකට රු. ශත*
ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක	50 0
ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩිවන අවස්ථාවක එක් හෙක්ටයාරයකට	10 0

12-77/12

මීරිගම ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා කසල බදු ගාස්තු පනවා අයකර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වගන්තිය සහ 109 වගන්තිය යටතේ ප්‍රතිපාදන සලසා ඇති පරිදි හා 2007 අංක 01 දරන බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තීන් හා 20 වගන්තිය සහ 01 උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මීරිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2026 වර්ෂයට අදාළව කසල බදු පැනවීම සම්බන්ධයෙන් සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

සුමිත් මහින්දලාල්,
සභාපති,
මීරිගම ප්‍රාදේශීය සභාව.

මීරිගම ප්‍රාදේශීය සභාව,
මීරිගම.

2026 වර්ෂය සඳහා කසල බදු ගාස්තු පනවා අයකර ගැනීම සඳහා වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 වගන්තිය යටතේ ප්‍රතිපාදන සලසා ඇති පරිදි හා 2007 අංක 01 දරන බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රඥප්තීන් හා 20 වගන්තිය හා 01 උපවගන්තියෙන් පැවරී ඇති බලතල පරිදි පහත 1 උපලේඛනයන්හි ඇති ආයතන ලැයිස්තුවට අනුව හා දිනකට අපද්‍රව්‍ය ජනනය වන ප්‍රමාණය අනුව 2 උපලේඛනයන්ගෙන් ඇති ආයතන ලැයිස්තුවට අනුව හා දිනකට අපද්‍රව්‍ය ජනනය වන ප්‍රමාණය අනුව 2 උපලේඛනය 3 උපලේඛනය හා 3 උප ලේඛනයේ සඳහන් ගාස්තු 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

1 උපලේඛනය

අපද්‍රව්‍ය වර්ග

අංකය	*අපද්‍රව්‍ය වර්ගය*	*අයිතම*
01	දෛනිකව ජනනය කරනු ලබන පහසුවෙන් ජෛවභායනය වන අපද්‍රව්‍ය	එළවළු හා පළතුරු කසල, මස් හා මාළු ඉතිරිවන අපද්‍රව්‍ය සැකසූ ආහාර හෝ ඒවායේ කසල, සත්ත්ව මළ, ගෙවතු කසළ, සත්ත්ව මළ කුණු, මිනිස් මළ, ඩයිපර් නැප්කින් සහ සැහැල්ලු කාබනික ද්‍රව්‍ය
02	ජෛවභායනය නොවන හෝ අඩුවෙන් ජෛවභායනය වන අපද්‍රව්‍ය	තුනී කඩදාසි, ඝණ කඩදාසි, හාඩ් බෝඩ්, ප්ලාස්ටික්, පොලිතීන්, ඉවතලන හා කැපූ රෙදි කැබලි, පොල් කුඩු ලෝහ, පිහන් ද්‍රව්‍ය, අළු, වැලි, සිල්ක් ද්‍රව්‍ය, බොරළු, සූත්‍රිකා බල්බ, වීදුරු භාණ්ඩ, අකාබනික, පෙණ සහිත භාණ්ඩ, ඇහුරුම් සඳහා ගන්නා ද්‍රව්‍ය, රබර් සහ රබර් ආශ්‍රිත ද්‍රව්‍ය, කොහු හා කොහු මුල් කොට සෑදූ ද්‍රව්‍ය කපා ඉවතලන කෙස් කැබලි සහ අනිකුත් අකාබනික සන ද්‍රව්‍ය
03	විද්‍යුත් අපද්‍රව්‍ය	ශීතකරණ ජංගම දුරකථන රේඩියෝ රූපවාහිනී යන්ත්‍ර පරිගණක සෙල්ලම් බඩු විද්‍යුත් පරිපථ
04	තොග ද්‍රව්‍ය	කිලෝග්‍රෑම් 10ට වැඩි ගෘහස්ථ අපද්‍රව්‍ය පාවිච්චි කළ ගෘහ භාණ්ඩ, ටයර්, කපන ලද ගස්වල කොටස්
05	බිඳ හෙළීම් හා ඉදිකිරීම් අපද්‍රව්‍ය	ෂීට් වර්ග සෙවිලි කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය, පස්/ පොලොවෙන් ඉවත් කරන ද්‍රව්‍ය, පයිප්ප වැහි පීලි, කඩා ඉවතලන කොන්ක්‍රීට් සහ සිමෙන්ති ආශ්‍රිත ද්‍රව්‍ය, යකඩ කූරු සහ පාවිච්චි කළ පලංචි ද්‍රව්‍ය
06	ගෘහස්තව ජනනය වන සායනික හෝ විෂ සහිත අපද්‍රව්‍ය	බැටරි, ටියුබ් ලයිට්, භාවිත කළ හෝ පිච්චුන තෙල් වර්ග එන්නත් කටු උෂ්ණත්වමාපක, කෘමී සහ වල් නාශක සහ අනිකුත් විෂ සහිත දියර වර්ග හා සනීපාරක්ෂක තුවා
07	අන්තරායකාරී අපද්‍රව්‍ය	1996 අංක 924/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති අපද්‍රව්‍ය

2 උපලේඛනය

භාවිත ගාස්තු :

පරිශ්‍රය	*මාසික ගාස්තු ප්‍රමාණය (රුපියල්)*	
	උපරිම	*අවම*
ගෘහස්ථ ;		
වර්ග ප්‍රමාණය අඩි 1,000 ට අඩු	200	30
වර්ග ප්‍රමාණය අඩි 1,000 සිට 3,000 දක්වා	300	50
වර්ග ප්‍රමාණය අඩි 3,000 ට වැඩි	500	100
වාණිජ ;		
වර්ග ප්‍රමාණය අඩි 1,000 ට අඩු	750	100
වර්ග ප්‍රමාණය අඩි 1,000 සිට 3,000 දක්වා	1,000	200
වර්ග ප්‍රමාණය අඩි 3,000 ට වැඩි	1,500	250
පරිශ්‍රය ;	මාසික ගාස්තු ප්‍රමාණය (රුපියල්)	
	උපරිම	අවම
කාර්මික ;		
වර්ග ප්‍රමාණය අඩි 1,000 ට අඩු	750	100
වර්ග ප්‍රමාණය අඩි 1,000 සිට 3,000 දක්වා	1,000	200
වර්ග ප්‍රමාණය අඩි 3,000 ට වැඩි	2,000	250
හෝටල්, ආපනශාලා, සාත්තු නිවාස		
වර්ග ප්‍රමාණය අඩි 1,000 ට අඩු	500	100
වර්ග ප්‍රමාණය අඩි 1,000 සිට 3,000 දක්වා	2,000	200
වර්ග ප්‍රමාණය අඩි 3,000 ට වැඩි	5,000	300
කාසල්, රජයේ රෝහල් සහ රජයේ ආයතන (ලාභ ලැබීම ඉලක්ක කොට නොගත්)	ගාස්තුව පළාත් පාලන ආයතනයට තීරණය කළ හැකි ය	

3 උපලේඛනය

භාවිත ගාස්තු (තොග අපද්‍රව්‍ය)

	අපද්‍රව්‍ය ප්‍රමාණය	භාවිත කරන්නා ගෙවිය යුතු ගාස්තුව (එක් වරකට) රුපියල්
(අ)	අත් කරත්තයකට අඩු ප්‍රමාණය (කියුබික් මීටර් 0.25)	ගාස්තු රහිත
(ආ)	ට්‍රැක්ටර් 1/2 ක ප්‍රමාණය සඳහා (කියුබික් මීටර් 0.5)	200 - 500
(ඇ)	පිරුණු ට්‍රැක්ටරයක ප්‍රමාණය සඳහා (කියුබික් මීටර් 1)	500 - 1000
(ඈ)	ට්‍රැක්ටරයක ප්‍රමාණය ඉක්මවූ විට	(ආ) සහ (ඇ) වල ගුණිතය

අපද්‍රව්‍යයේ ස්වභාවය සහ මාරු කිරීමේ හෝ අවසාන බැහැරලීමේ ස්ථානයට ඇති දුර ප්‍රමාණය මත සැබෑ ගාස්තුව පදනම් වේ.

4 උපලේඛනය

භාවිත ගාස්තු
(බිඳ හෙලීමේ හා ඉදිකිරීමේ දී ඇතිවන අපද්‍රව්‍ය)

	අපද්‍රව්‍ය ප්‍රමාණය	*පැය 24 ක් ඇතුළත එකතු කිරීම (රුපියල්)*	*සතියක් තුළ එකතු කිරීම (රුපියල්)*
(අ)	අත් කරත්තයකට අඩු ප්‍රමාණය (කියුබික් මීටර් 0.25)	300 - 1000	අමතර ගාස්තුවක් නැත
(ආ)	ට්‍රැක්ටර් 1/2 ක ප්‍රමාණය සඳහා (කියුබික් මීටර් 0.5)	500 - 1500	200 - 750
(ඇ)	ට්‍රැක්ටරයක ප්‍රමාණය (කියුබික් මීටර් 1)	1000 - 2000	300 - 700
(ඈ)	ට්‍රැක්ටරයක ප්‍රමාණය ඉක්මවූ විට	(ආ) හෝ (ඇ) වල ගුණිතය	(ආ) හෝ (ඇ) වල ගුණිතය

සැබෑ ගාස්තු ප්‍රමාණය මාරු කිරීමේ හෝ අවසාන බැහැරලීමේ ස්ථානයට ඇති දුර මත පදනම් වේ.

වැලිමඩ ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් 2025 අගෝස්තු මස 28 දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.(01).01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අජිත් කුමාර දිසානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වැලිමඩ.

2025 ඔක්තෝබර් මස 30 දින.
වැලිමඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් ගනු ලැබූ සභා සම්මුතියට බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලද අනුමැතිය අනුව සහ එකී පනතේ 146 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ ඇතුළත දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙවල්වල 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, එකී දේපළ මත වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සෑම නිශ්චල දේපළකම වාර්ෂික වටිනාකම්න් (3.5%)ක වරිපනම් බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, සහ

ඒ වරිපනම් බද්ද, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) උපවගන්තියේ විධිවිධාන යටතේ 2026 මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් විධාන කිරීමටත්, සුදුසු බවට යෝජනා කරමි.

තව ද, මෙම පනතේ 134 (7) වගන්තිය ප්‍රකාරව, එකී වාර්ෂික බදු මුදල සම්පූර්ණයෙන් ගෙවූ විට පහත දැක්වෙන වට්ටම් මුදල් ප්‍රදානය කරන බවද දැනුම් දෙනු ලැබේ.

(අ) 2026 ජනවාරි මාසයේ 31 දිනට හෝ ඊට පෙර මුළු වර්ෂයට ම ගෙවිය යුතු වරිපනම් බදු මුදල ගෙවනු ලැබුවහොත් එම මුදලින් 10%ක

(ආ) බදු මුදල කොටස් වශයෙන් ගෙවන විට වරිපනම් බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමුවන මාසය තුළ ගෙවනු ලැබුවහොත් එසේ ගෙවන මුදලින් (3.5%)

උපලේඛනය

වැලිමඩ ප්‍රධාන කාර්යාලය	*වරිපනම් ප්‍රදේශ*
දිවිතොටවෙල කන්ද පාර - වම	අංක 03 - 29/22 දක්වා ද
දිවිතොටවෙල කන්ද පාර - දකුණ	අංක 10 - 60 දක්වා ද
01 පටුමඟ - දිවිතොටවෙල කන්ද පාර - වම	අංක 05 - 29 දක්වා ද
01 පටුමඟ දිවිතොටවෙල කන්ද පාර - දකුණ	අංක 02 - 30 දක්වා ද
02-පටුමග දිවිතොටවෙල කන්ද පාර - වම	අංක 03-39 දක්වා ද
02-පටුමඟ දිවිතොටවෙල කන්ද පාර - දකුණ	අංක 02-28 දක්වා ද
රෝහල පාර - වම	අංක 15 - 35 දක්වා ද
රෝහල පාර - දකුණ	අංක 08 - 20/10 දක්වා ද
හේමපාල මුනිදාස මාවත - වම	අංක 111/8 - 327 දක්වා ද
හේමපාල මුනිදාස මාවත - දකුණ	අංක 2/C - 348 දක්වා ද

වැලිමඩ ප්‍රධාන කාර්යාලය	*වරිපනම් ප්‍රදේශ*
බොරලන්ද පාර - වම	අංක 07 - 77 දක්වා ද
බොරලන්ද පාර - දකුණ	අංක 04 - 94 B 1/1 දක්වා ද
බෞද්ධ මන්දිර පාර - වම	අංක 03-39 1/1 දක්වා ද
බෞද්ධ මන්දිර පාර - දකුණ	අංක 02-58 2/1 දක්වා ද
බණ්ඩාරවෙල පාර - වම	අංක 07 - 51/5 දක්වා ද
බණ්ඩාරවෙල පාර - දකුණ	අංක 10 - 10 b දක්වා ද
බදුල්ල පාර - වම	අංක 01-563 දක්වා ද
බදුල්ල පාර - දකුණ	අංක 02-270 දක්වා ද
මොරගොල්ල පාර - වම	අංක 01-33/1 දක්වා ද
මොරගොල්ල පාර දකුණ	අංක 02-12 දක්වා ද
නුවරඑළිය පාර - වම	අංක 01-311 දක්ව ද
නුවරඑළිය පාර - දකුණ	අංක 02-362 දක්වා ද
පට්ටිය මැදවත්ත පාර - වම	අංක 11-31 දක්වා ද
පට්ටියමැදවත්ත පාර - දකුණ	අංක 08-44/A දක්වා ද
රෑරාව පාර - වම	අංක 01-19 දක්වා ද
රෑරාව පාර දකුණ	අංක 04-8/3 දක්වා ද
වැලිමඩවත්ත පාර - දකුණ	අංක 02-20/24 දක්වා ද

කැප්පෙට්පොල උප කාර්යාලය	
බොරලන්ද පාර - වම	අංක 05 - 37/1 දක්වා ද
බොරලන්ද පාර - දකුණ	අංක 02 - 62 දක්වා ද
නුවරඑළිය පාර - වම	අංක 01 - 177 දක්වා ද
නුවරඑළිය පාර - දකුණ	අංක 02 - 202 දක්වා ද
වැලිමඩ පාර - වම	අංක 25 - 66/2 දක්වා ද
වැලිමඩ පාර - දකුණ	අංක 4 - 60 1/1 දක්වා ද

බෝගහකුඹුර උප කාර්යාලය	
1 වන පටුමග වැලිමඩ පාර වම	අංක 13 -31/1/1 දක්වා ද
1 වන පටුමග වැලිමඩ පාර දකුණ	අංක 06 - 46 දක්වා ද
අඹගස්දෝව පාර වම	අංක 05- 119 දක්වා ද
අඹගස්දෝව පාර දකුණ	අංක 06 -148/1 දක්වා ද
බෝගහකුඹුර ගම පාර වම	අංක11 - 33 දක්වා ද
බෝගහකුඹුර ගම පාර දකුණ	අංක 06 - 42 දක්වා ද
බොරලන්ද පාර වම	අංක 3 - 89 දක්වා ද
බොරලන්ද පාර දකුණ	අංක 6 - 102 දක්වා ද
වැලිමඩ පාර වම	අංක 5 - 109 දක්වා ද
වැලිමඩ පාර දකුණ	අංක 4 - 126 දක්වා ද

(අ) වැලිමඩ ප්‍රදේශය තුළ පිහිටි දේපළවල වාර්ෂික වටිනාකමින් 3.5% බැගින් ද,

(ආ) කැප්පෙට්පොල උපකාර්යාල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රකාශිත ප්‍රදේශවල ඇති දේපළ වෙනුවෙන් 3.5% බැගින් ද,

(ඇ) බෝගහකුඹුර උප කාර්යාල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රකාශිත ප්‍රදේශවල ඇති දේපළ වෙනුවෙන් 3.5% බැගින් ද,

(ඈ) වරිපනම් ලේඛනයේ නම් සංශෝධනය කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු රු. 1,700, හා එයට අදාළ පරීක්ෂණ ගාස්තු රු. 300 0ක් ලෙස ද,

(ඊ) නගරය හා නගර සීමාවෙන් පිට නිකුත් කරනු ලබන විටීරේඛා ගාස්තුව රු. 1,500 0, එයට අදාළ පරීක්ෂණ ගාස්තු රු. 200 0 ක් ලෙස ද, අයකර ගැනීම.

12 - 81/1

වැලිමඩ ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම

වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 28 දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.(01).01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අජිත් කුමාර දිසානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වැලිමඩ.

2025 ඔක්තෝබර් මස 30 දින.
වැලිමඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (1) වගන්තියේ හා 1988.06.23 දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳව අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව වැලිමඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ කිනම් ආකාරයකට හෝ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2026.01.01 දින සිට අයකිරීමට යෝජනා කරමි.

අනු. අංකය	*උපලේඛනය*	*ගාස්තු (වර්ග අඩියක් සඳහා) රු. ශත*
01	කිසියම් බිත්තියක හෝ පුවරුවක හෝ බැම්මක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා - වර්ග අඩි 100කට වැඩි (ලිත් වර්ෂයක් සඳහා)	150 0
02	කිසියම් බිත්තියක හෝ පුවරුවක හෝ බැම්මක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා - වර්ග අඩි 100කට අඩු (ලිත් වර්ෂයක් සඳහා)	200 0
03	බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්වීමක් වෙනුවෙන් මාස තුනකට අඩු කාලයක් සඳහා	175 0
04	බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්වීමක් වෙනුවෙන් මාස තුනකට වැඩි එහෙත් මාස 06කට අඩු කාලයක් සඳහා	200 0
05	බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්වීමක් වෙනුවෙන් මාස 06කට වැඩි එහෙත් මාස 12කට අඩු කාලයක් සඳහා	250 0
06	ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම (වර්ග අඩියකට)	300 0
07	සභාව තුළ ඩිජිටල් දැන්වීම් පුවරුවල දැන්වීම් ප්‍රචාරණය කිරීම - (වර්ග අඩියකට)	-

12 - 81/2

වැලිමඩ ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා මෝටර් වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීම

වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් 2025 අගෝස්තු මස 28 දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.(01).II යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අජිත් කුමාර දිසානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වැලිමඩ.

2025 ඔක්තෝබර් මස 30 දින.
වැලිමඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තිය යටතේ පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වාහන නවතා තැබීමේ ගාස්තුව 2026 වර්ෂය සඳහා වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පනවා අය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

I උපලේඛනය

4(1) අතුරු ව්‍යවස්ථාව:

අනු අංකය		*පළමුවැනි පැය* *රු. ශත*	*දෙවැනි පැය* *රු. ශත*	*තෙවැනි පැය හා වැඩිවන සෑම පැයකටම* *රු. ශත*
අ.	මෝටර් සයිකලයක් සඳහා	20 0	15 0	10 0
ආ.	මෝටර් කාර් රථයක් හෝ වෑන් රථයක්	80 0	50 0	30 0
ඇ.	ත්‍රිරෝද රථයක් සඳහා	40 0	30 0	20 0
ඈ.	බස් රථයක්, මෝටර් කෝච් රථයක්, ලොරියක් හෝ ට්‍රැක්ටරයක් සඳහා	100 0	80 0	60 0

II උපලේඛනය

4(2) අතුරු ව්‍යවස්ථාව:
රථ වාහන සඳහා වාර්ෂික අවසර පත්‍ර ගාස්තුව:

		රු. ශත
අ.	ලොරි රථ/ වෑන් රථ සඳහා	3,000 0
ආ.	ත්‍රිරෝද රථයක් සඳහා	2,000 0
ඇ.	මෝටර් බයිසිකලයක් සඳහා	1,000 0
ඈ.	ලියාපදිංචි විමේ මූලික ගාස්තුව	1,000 0
ඉ.	විශේෂිත අවශ්‍යතා මත මෝටර් රථ නවතා තැබීමේ ගාස්තුව (මාසික)	10,000 0
ඊ.	සභාව සතු රථගාල් තුළ වල වාහන නවතා තැබීමේ ගාස්තුව මෝටර් රථ හා ත්‍රිවීල් මෝටර් බයිසිකල්	 1,500 0 1,000 0

12 - 81/3

වැලිමඩ ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම

වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 28 දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.(01).III යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අජිත් කුමාර දිසානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වැලිමඩ.

2025 ඔක්තෝබර් මස 30 දින.
වැලිමඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

පාරිසරික පනතේ 26 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පරිසර අධිකාරිය මගින් 2008 පෙබරවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන අමුණා ඇති උපලේඛනයේ (II) හි දැක්වෙන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ සහ එකී සංශෝධන සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව එකී ක්‍රියාකාරකම් පවත්වාගෙන යනු ලබන්නන් විසින් 2023 ජනවාරි මස 01 ක්‍රියාත්මකවන පරිදි අවුරුදු 03කට හෝ ඊට අඩු කාලයක් සඳහා බලපත්‍ර ගාස්තුව හා ඊට අදාළ වැට බද්ද රු. 500.00 ක උපරිමයකට යටත්ව අයදුම්පත්‍ර/ ලිපි ද්‍රව්‍ය ගාස්තුවක් හා ඊට අදාළ වැට් බද්ද හා එකී බද්ද හා එකී ක්‍රියාකාරකම් වලට අදාළ වන මූලික ආයෝජනය මත පදනම් වූ උපලේඛන (1) හි සඳහන් පරීක්ෂණ ගාස්තුවක් හා ඊට අදාළ මුදල් මෙම ප්‍රාදේශීය සභාව වෙත ගෙවා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ වගන්තිය ප්‍රකාර ලැබී ඇති බලතල අනුව වැලිමඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය (1)

පරීක්ෂණ ගාස්තු අයකිරීම :

අනු. අංකය	*මූලික ආයෝජනය*	*ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු රු. ශත*
01	රු. 250,000 අඩු	3,000/=+ රජයේ අනුමත බදු
02	රු. 250,001 - රු. 500,000 දක්වා	3,750/=+ රජයේ අනුමත බදු
03	රු. 500,001- රු. 1,000,000 දක්වා	5,000/=+ රජයේ අනුමත බදු
04	රු. 1,000,000ට වැඩි	10,000/=+ රජයේ අනුමත බදු

උපලේඛනය (11)

(ඇ) - කොටස :

01. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත.
02. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත.
03. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි).
04. රෙදි වියන යන්ත්‍ර/ මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත.
05. දිනකට ලීටර් 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.
06. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.
07. දිනකට 100කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල්ගත කිරීමේ කර්මාන්ත.
08. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්.
09. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්.
10. සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 25ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත.
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250ක් හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත.
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත.
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/ මුහුවම් කිරීමේ කර්මාන්ත.
14. සේවක සංඛ්‍යාව 5ට හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත.
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත.
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්.
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්.
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්.
19. වැඩුණු සතුන් මුළු එකතුව 100ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්*

මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව = (උෂ්ට්‍රයන් සංඛ්‍යාව + ගවයින් සංඛ්‍යාව) +10 x එළුවන් සංඛ්‍යාව)

20. ගබඩා ධාරිතාවය සත මීටර් 100ක් හෝ ඊට වැඩි පලතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන.
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24. සේවක සංඛ්‍යාව 5කට වැඩි ප්‍රමාණයක සේවයේ නියුක්තව සිටින ප්ලාස්ටර් ඔෆ් පැරිස් අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
28. කළු ගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරණ ද්‍රව්‍ය භාවිත කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු
30. දිනකට සත මීටර් 25ට අඩු ඉතුරුම් ධාරිතාවක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිත කරන කර්මාන්ත
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිත කරන වඩු කර්මාන්ත
33. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සවශාලා හෝ සේවක 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙළ කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්
35. විසිරි පින්තාරු කිරීම හෝ වාහන වායු සම්කරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ්
36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත
37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම සහිත මල් ශාලා
39. මෙම උපලේඛනයේ "ඇ" කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/ කර්මාන්තයක්

12 - 81/4

වැලිමඩ ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා විනෝද බදු ගාස්තු අයකිරීම

වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් 2025 අගෝස්තු මස 28 දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.(01).IV යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අජිත් කුමාර දිසානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වැලිමඩ.

2025 ඔක්තෝබර් මස 30 දින.
වැලිමඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

ප්‍රසිද්ධ රහ දැක්වීමේ ආඥාපනත (176 අධිකාරය) 3 වගන්තිය යටතේ චිත්‍රපටි දර්ශනයක්, සැණකෙළියක්, මුදල් අයකරනු ලබන සෑම දර්ශනයක් සඳහාම මුද්‍රණය කරන ලද ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 15% ක් වූ විනෝද බද්දක් වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පනවා අයකිරීමටත්, 1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතේ 16 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

12 - 81/5

වැලිමඩ ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ ජල ගාස්තු අයකිරීම

වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් 2025 අගෝස්තු මස 28 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 05.(01).V යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අජිත් කුමාර දිසානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වැලිමඩ.

2025 ඔක්තෝබර් මස 30 දින.
වැලිමඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ වගන්තිය යටතේ පළාත් පාලන ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබූ 1988.08.23 දිනැති අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරන ලද්දා වූ පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 34 දරන කාණ්ඩයේ වන ජල සම්පාදනය යටතේ වූ අංක 40 සිට 43 දක්වා වූ අතුරු ව්‍යවස්ථාවල වූ පරිදි පහත උපලේඛනයේ සඳහන් අයුරු වැලිමඩ ප්‍රාදේශීය සභාව තුළ ඇති ජල සම්පාදන ක්‍රමවලින් 2026.01.01 සිට ජල ගාස්තු අය කිරීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 114 වගන්තිය ප්‍රකාර ලැබී ඇති බලතල අනුව වැලිමඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

උල්පත් ජල යෝජනා ක්‍රම වෙනුවෙන්

ඒකක ගණන	*ස්ථාවර ගාස්තුව* *රු. ශත*	*ඒකකයක මූදල* *රු. ශත*
01 - 05 දක්වා	300 0	30 0
06 - 10 දක්වා	300 0	50 0
11 - 15 දක්වා	300 0	70 0
16 - 20 දක්වා	300 0	80 0
21ට වැඩි වන සෑම ඒකකයක් සඳහා	300 0	100 0

පොම්ප ජල ක්‍රමය වෙනුවෙන්

ඒකක ගණන	*ස්ථාවර ගාස්තුව* *රු. ශත*	*විදුලි බිල්පත් ගාස්තුව* *රු. ශත*	*ඒකකයක මූදල* *රු. ශත*
01 - 05 දක්වා	300 0	200 0	30 0
06 - 10 දක්වා	300 0	200 0	50 0
11 - 15 දක්වා	300 0	200 0	70 0
16 - 20 දක්වා	300 0	200 0	80 0
21ට වැඩි වන සෑම ඒකකයක් සඳහා	300 0	200 0	100 0

1. 20ට වැඩිවන සෑම ඒකකයක් වෙනුවෙන් රු. 100 0ක් බැගින් විදුලි බිල්පත් ගාස්තුවක් අය කිරීම.
2. නව ජල සැපයුම් සඳහා සම්බන්ධතා ගාස්තුව රු. 19,500 0 අය කිරීම.
3. සභාව විසින් හිඟ ගාස්තු මත විසන්ධි කළ ජල සැපයුම් නැවත ලබාදීමේ ගාස්තුවක් රු. 5,000 0
4. විසන්ධි කර නැවත ලබා දෙන (පාරිභෝගික ඉල්ලීම මත) ජල සම්බන්ධතා ගාස්තුව රු. 2,000 0
5. අයථා ජල පරිභෝජනය වෙනුවෙන් අය කරනු ලබන දඩ මුදල රු. 10,000.00

වැලිමඩ ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් 2025 අගෝස්තු මස 28 දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.(01).VI යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අජිත් කුමාර දිසානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වැලිමඩ.

2025 ඔක්තෝබර් මස 30 දින.
වැලිමඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (3) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථීර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ,

2026 වර්ෂය සඳහා පනවන ලද අක්කර බද්ද මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ. 2026 සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2026 ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක්ද ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*විස්තරය*	*ගාස්තුව රු. ශත*
01.	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05ට අඩු නමුත් හෙක්ටයාර් 01ට නොඅඩුවන අවස්ථාවක	50 0
02.	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩිවන අවස්ථාවක	10 0

12 - 81/7

වැලිමඩ ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වෙනත් සේවාවන් සඳහා ගාස්තු පැනවීම

වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් 2025 අගෝස්තු මස 28 දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.(01).VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අජිත් කුමාර දිසානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වැලිමඩ.

2025 ඔක්තෝබර් මස 30 දින.
වැලිමඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් හා වෙනත් අනුශාංගික අනපනත්වලින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සපයනු ලබන පහත උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වෙනත් සේවාවන් සඳහා අය කරගත යුතු ගාස්තු 2026 වර්ෂය සඳහා වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

	රු. ශත	රු. ශත
01. ආදාහනයක් සඳහා අයකරනු ලබන ගාස්තු 01. එක් මෘත දේහයක් සඳහා අයකරන ලද ආදාහනාගාර ගාස්තුව (ඉන්ධන ගැලපුම් ගාස්තුව)	14,000 0	
02. ප්‍රාදේශීය සභාව සතු භූමි වෙන් කිරීම සඳහා (ක්‍රීඩා පිටි කැප්පෙටිපොළ/ පලතුරු වත්ත/ ගුරුතලාව) ගාස්තු I. පාසල් හා පෙර පාසල් ළමුන්ගේ ක්‍රීඩා කටයුතු හා උත්සව කටයුතු සඳහා ක්‍රීඩා උත්සව සඳහා ක්‍රීඩා පිටිය පමණක් (බල ප්‍රදේශය තුළ) ක්‍රීඩා උත්සව සඳහා ක්‍රීඩා පිටිය පමණක් (බල ප්‍රදේශයෙන් පිටත) ආපසු ගෙවන ආරක්ෂිත ඇපතැන්පත් මුදල (බල ප්‍රදේශය තුළ) ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පත් මුදල (බල ප්‍රදේශයෙන් පිටත)	 1,000 0 3,000 0 1,500 0 2,000 0	
II. රාජ්‍ය නොවන ආයතන හා පුද්ගලයින් සංවිධානය කරනු ලබන ක්‍රීඩා උත්සව ක්‍රීඩා පිටිය පමණක් දිනකට (බල ප්‍රදේශය තුළ) ක්‍රීඩා පිටිය පමණක් (බල ප්‍රදේශයෙන් පිට) ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පත් මුදල (බල ප්‍රදේශය තුළ) ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පත් මුදල (බල ප්‍රදේශයෙන් පිටත)	ක්‍රීඩාපිටි සඳහා 5,000 0 6,000 0 4,000 0 5,000 0	
III. රාජ්‍ය ආයතන සංවිධානය කරනු ලබන ක්‍රීඩා උත්සව ක්‍රීඩා පිටිය පමණක් ආපසු ගෙවන ඇප තැන්පතුව	 1,000 0 3,000 0	
IV. දේශපාලන රැස්වීම් කටයුතු සඳහා (කැප්පෙටිපොළ/ පළතුරු වත්ත/ ගුරුතලාව/ බොරලන්ද පොළ භූමිය/ කොඩිගහ වේදිකාව/ වැලිමඩ පොළ භූමිය/ ඔරලෝසු කණුව අසළ බස් නැවතුම/ බොරලන්ද වේදිකාව) වැලිමඩ පොළ භූමිය කැප්පෙටිපොළ ක්‍රීඩාංගනය බොරලන්ද පොළ භූමිය ඔරලෝසු කණුව අසළ පළතුරුවත්ත ක්‍රීඩාංගනය ගුරුතලාව ක්‍රීඩාංගනය කොඩිගහ වේදිකාව බොරලන්ද වේදිකාව ආපසු ගෙවන ඇප තැන්පත් මුදල (සියලුම භූමි සඳහා)	 10,000 0 8,000 0 5,000 0 8,000 0 8,000 0 5,000 0 8,000 0 5,000 0 5,000 0	
V. වෙනත් වෙළඳ ව්‍යාපාර කටයුතු සඳහා දිනකට (කැප්පෙටිපොළ/ පළතුරු වත්ත/ ගුරුතලාව/ බොරලන්ද පොළ භූමිය/ කොඩිගහ වේදිකාව/ වැලිමඩ පොළ භූමිය/ඔරලෝසු කණුව අසළ බස් නැවතුම/ බොරලන්ද වේදිකාව) ස්ථානය පමණක් (එක් දිනකට) ආපසු ගෙවන ඇප තැන්පතුව	 7,500 0 5,000 0	
VI. සංගීත සංදර්ශන හෝ වෙනත් විනෝදාංශ පැවැත්වීම සඳහා (කැප්පෙටිපොළ/ ගුරුතලාව/ දඹවින්න/ වැලිමඩ පොළ භූමිය/ ඔරලෝසු කණුව අසළ බස් නැවතුම/ බොරලන්ද පොළ භූමිය) මුල් දින සඳහා (ගාස්තු අය කරනු ලබන) ආපසු ගෙවන ඇප තැන්පතුව ගාස්තු අය නොකරන සංගීත සංදර්ශන හෝ වෙනත් විනෝදාංශ සඳහා වෙනත් - වෙළඳ කුටි (ප්‍රේක්ෂකාගාරය) දිනකට	 10,000 0 10,000 0 5,000 0 5,000 0	01 ට වැඩිවන සෑම දිනක් සඳහාම 8,000 0 4,000 0 4,000 0
03. ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ගාස්තු අය කිරීම 1. මෝටර් බයිසිකල් විකිණීමේ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා 2. මෝටර් වාහන ප්‍රවර්ධන වැඩසටහන් සඳහා දිනකට වෙනත් කුඩා ප්‍රමාණයේ වැඩසටහන් සඳහා දිනකට සිම්කාඩ්පත් සඳහා දිනකට	පළමු දින 5,000 0 10,000 0 5,000 0 2,000 0 500 0	1 - වැඩිවන සෑම දිනක් සඳහාම 1,500 0 3,000 0 2,000 0 1,000 0

	රු. ශත	රු. ශත
සංචාරක/ ජංගම වෙළෙඳාම් සඳහා අදාළ ගාස්තු අයකිරීම		
මාළු වෙළෙඳාම (දිනකට)	1,500 0	
පලතුරු වෙළෙඳාම (දිනකට)	1,500 0	
විදුලි උපකරණ (දිනකට)	1,500 0	
විසිතුරු භාණ්ඩ (දිනකට)	1,500 0	
මල් පැළ අලෙවිය (දිනකට)	1,000 0	
බේකරි නිෂ්පාදන ජංගම අලෙවිය	1,000 0	
04. වැසිකිළි ද්‍රව්‍ය ඉවත්කර ගැනීම සඳහා ගලි රථය ලබා දීම වෙනුවෙන් ගාස්තු		
එක් මූලික පැටවුමක් සඳහා සේවා ගාස්තු	6,000 0	
පරිපාලන වියදම්	1,700 0	
ප්‍රවාහන ගාස්තු (එක් කිලෝමීටරයකට)	400 0	
අමතර එක් පැටවුමක් සඳහා	5,500 0	
මළාපවහන පද්ධතියට එක් බැහැර කිරීමක් සඳහා	7,500 0	
06. මළාපවහන ගාස්තු අයකිරීම		
නව සම්බන්ධතා ගාස්තුව	40,000 0	
මාසික ගාස්තුව (පෞද්ගලික)	2,000 0	
මාසික ගාස්තුව (රාජ්‍ය)	1,000 0	
මෑන්හෝල් පිරිසිදු කිරීම සඳහා (එක් වරකට)	2,250 0	
අනවසර සම්බන්ධතා ලබා ගැනීම වෙනුවෙන්	50,000 0	
07. වැලිමඩ සතිපොළෙහි කූඩ නිකුත් කිරීමේ ගාස්තුව		
විශාල ප්‍රමාණයේ කූඩයක් සඳහා දිනකට	30 0	
මධ්‍යම ප්‍රමාණයේ කූඩයක් සඳහා දිනකට	25 0	
කුඩා ප්‍රමාණයේ කූඩයක් සඳහා දිනකට	20 0	
ප්‍රවාහනය සඳහා කූඩ ලබා දීමේ දී ඇප මුදල (කූඩ 5 කට වඩා අවුරුද්දක ඇප තැන්පත් මුදල)	5,000 0	
08. කොඩි කණු/ කැනපි පුටු කුළියට ලබා දීම		
එක් කොඩි කණුවක් සඳහා (දිනකට)	50 0	
එක් කැනපියක් සඳහා (දිනකට)	1,000 0	
එක් පුටුවක් සඳහා දිනකට	10 0	
09. තාවකාලික ගෝඝාතක බලපත්‍ර ගාස්තු		
ගෝඝාතක ගාස්තුව එක් සතෙකු ඝාතනය කිරීම සඳහා	7,500 0	
10. ජලය ලබා ගැනීම සඳහා මාර්ග පළුදු කිරීමේ ගාස්තු		
ගාස්තුව	2,500 0	
තැන්පතු මුදල	3,000 0	
11. I. මාළු විකිණීමේ කඩ කාමරයක් සඳහා දෛනික ගාස්තුව	1,500 0	
II. මාළු කඩකාමරවලින් නිකුත් කරන අපද්‍රව්‍ය ඉවත්කිරීමේ ගාස්තුව (එක් කඩකාමරයක් සඳහා දිනකට)	300 0	
12. පුස්තකාල ඝාමාජිකත්වය සඳහා ගාස්තු		
I. අයදුම්පත්‍ර ගාස්තුව	100 0	
II. තැන්පත් මුදල	200 0	
III. වර්ෂයක් පාසා ඝාමාජිකත්වය අලුත් කිරීම සඳහා	100 0	
IV. පොත් ප්‍රමාද කිරීමේ ගාස්තුව ප්‍රමාද දිනකට	5 0	
V. පුස්තකාලයේ ඝාමාජිකත්ව ගාස්තු පාසල් ළමුන් සඳහා	200 0	
VI. පුස්තකාලයේ ඝාමාජිකත්ව ගාස්තු වැඩිහිටියන් සඳහා	300 0	

	රු. ශත	රු. ශත
13. පෙර පාසල් ගාස්තු :-	1,000 0	
ඇතුළත් කිරීමේ ගාස්තුව	500 0	
මාසික ගාස්තුව	100 0	
අයදුම්පත්‍ර ගාස්තුව		
දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගාස්තු :		
දිවා සුරැකුම් මධ්‍යස්ථානයට බඳවා ගන්නා අවුරුදු එකහමාරේ (1 1/2) සිට අවුරුදු 02 දක්වා දරුවන් සඳහා මාසික ගාස්තුව	5,000 0	
අවුරුදු 02 සිට 04 දක්වා දරුවන් සඳහා	3,000 0	
අවුරුදු 04ට වැඩි දරුවන් සඳහා	2,500 0	
අයදුම්පත්‍ර ගාස්තු	100 0	
14. ජල බවුසරය සේවයේ යෙදවීම :-		
එක් ජල පැටවුමක් සඳහා	3,000 0	
ප්‍රවාහන ගාස්තු කි. මී. 01ක් සඳහා	400 0	
15. ප්‍රාදේශීය සභාවේ යන්ත්‍ර සේවයේ යෙදවීම හා සම්බන්ධ ගාස්තු :-		
1. Ex cavater යන්ත්‍ර පැයක් සඳහා	2,500 0	
2. බැකෝ ලෝඩර් යන්ත්‍රය සඳහා (යන්ත්‍ර පැය එකක් සඳහා)	6,000 0	
3. ලොරි රථ සඳහා (දිනකට/ ඉන්ධන සහිතව)	18,000 0	
16. පරිසර බලපත්‍ර අයදුම්පත් ගාස්තුව	500 0	
17. වරිපනම් ලේඛනයේ හා බලපත්‍ර ලේඛනයේ උධෘතයක් ලබා ගැනීම සඳහා (එක් වර්ෂයකට)	300 0	
18. වැලිමඩ ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය සභා උපකාර්යාලවලට අයත් කඩ සඳහා පැවරුම් ගාස්තු		
ඥාතීත්වය මත පැවරීමේ දී කඩ පැවරුම් ගාස්තු (කලත්‍රයා හා දරුවන්)	25,000 0	
වැලිමඩ ප්‍රධාන කාර්යාලයට අයත් කඩ සඳහා කඩ පැවරුම් ගාස්තු	600,000 0	
ප්‍රාදේශීය සභා උප කාර්යාලවලට අයත් කඩ සඳහා පැවරුම් ගාස්තු	500,000 0	
පදික කඩකාමර සඳහා කඩ පැවරුම් ගාස්තු	250,000 0	
පොළ කඩකාමර සඳහා කඩ පැවරුම් ගාස්තු	300,000 0	
19. කොම්පෝස්ට් විකිණීම :		
කිලෝග්‍රෑම් 01ක ඇසුරුම් කරන ලද මිල	15 0	
කිලෝග්‍රෑම් 01ක ඇසුරුම් නොකරන ලද මිල	12 0	
20. සුනඛ කරපටි ගාස්තුව (එක් කරපටියක් සඳහා)	100 0	
21. I. දැව ප්‍රවාහනය කිරීමේ ගාස්තු (එක් දැව කඳක් සඳහා)	200 0	
II. තැන්පතු ගාස්තුව (කඳන් 20ට වඩා වැඩිවන විට)	50,000 0	
22. ගොඩනැගිලි ඉදිකිරීම් හා ඉඩම් අනු බෙදුම් ගාස්තු		
ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව	1,000 0	
අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තුව	2,000 0	
ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තුව		
වර්ග අඩි 1000 තෙක් ගාස්තුව	1,000 0	
වර්ග අඩි 1001 - 1500 ගාස්තුව	2,000 0	
වර්ග අඩි 1501 - 2000 ගාස්තුව	3,000 0	
වර්ග අඩි 2001 සිට වැඩිවන සෑම වර්ග අඩි 1000කට හා ඉන් කොටසකට	1,000 0	
ඉඩම් කට්ටි කිරීමේ ගාස්තුව (එක් කට්ටියකට)	500 0	
ඉඩම් අනු බෙදුම් අයදුම්පත් ගාස්තුව	250 0	
NBRO අයදුම්පත් ගාස්තුව	250 0	
ගොඩනැගිලි අයදුම්පත්හි සංවර්ධන බලපත්‍ර කාලය දීර්ඝ කිරීමේ ගාස්තුව (වසරක කාලයක් සඳහා)	1,000 0	
දැනට ඉදිකර ඇති ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීම සඳහා දඩ මුදල	5,000 0	

	රු. ශත	*රු. ශත*
23. I. අනතුරුදායක ගස් සම්බන්ධ පෙරසැරි ගාස්තු II. අනතුරුදායක ගස් සම්බන්ධ පෝරම ගාස්තු	1,000.00 250.00	
24. I. කසල ලබා ගැනීමේ ගාස්තු වරිපනම් බදු අය නොකෙරෙන එක් පරිශ්‍රයක් සඳහා මාසිකව II. කසල ලබා ගැනීමේ ගාස්තු කියුබ් 01ක් සඳහා	300.00 2,000.00	
25. සන්නිවේදන කුළුණු/ ඇන්ටනා කුළුණු/ සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමේ ගාස්තුව	40,000.00	
26. සභාව සතු දේපළ සඳහා වන ගිවිසුම්පත් ගාස්තුව	250.00	

12 - 81/8

වැලිමඩ ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු අය කිරීම

වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් 2025 අගෝස්තු මස 28 දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.(01).VIII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අජිත් කුමාර දිසානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වැලිමඩ.

2025 ඔක්තෝබර් මස 30 දින.
වැලිමඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ 1 තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද වන අවස්ථාවක, ඉහත 2 කොටසේ කුමක් සඳහන්ව තිබුණද, ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොල හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළෙහි හෝ 2026 වර්ෂය තුළ ලැබීම් වලින් සියයට එකක් (1%) වියයුතු බවත් යෝජනා කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය යටතේ පැනවෙන වෙළෙඳ බලපත්‍ර ගාස්තු

අතුරු ව්‍යවස්ථාව යටතේ පළමුවන උපලේඛනය - පීඩාකාරී ව්‍යාපාර

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම් රුපියල්*		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක *රු. ශත*	*රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක* *රු. ශත*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක* *රු. ශත*
01.	මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
02.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
03.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
04.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කිලෝග්‍රෑම් 50ට වඩා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
06.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම	500 0	750 0	1,000 0
07.	පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
08.	තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500 0	750 0	1,000 0
09.	සම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 100 ට වඩා වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
11.	මාළු හෝ මස්, ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
12.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
13.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
17.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	ට්‍රන්ක් පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
20.	අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0
22.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
23.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
25.	සිරප් හෝ පලතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
26.	රස කැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
27.	පොල් ලෙලි නිපදවීම හෝ (පල් කිරීම)	500 0	750 0	1,000 0
28.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
29.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
30.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
31.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
32.	දැව ඉරීම	500 0	750 0	1,000 0
33.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
34.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0

I කිරුව		II කිරුව		
අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත
35.	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
36.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
38.	කෝපි, ධාන්‍ය වර්ග පිටිකිරීම	500 0	750 0	1,000 0
39.	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
40.	ගෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
41.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
42.	පොටි නිපදවීම	500 0	750 0	1,000 0
43.	ඉටි පන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
44.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
45.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
46.	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
47.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
48.	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
49.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
50.	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීම	500 0	750 0	1,000 0
51.	සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
52.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
53.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
54.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
55.	ගඩොල් පිලිස්සීම	500 0	750 0	1,000 0
56.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
57	අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
58.	උළු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
59.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයක් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
60.	යන්ත්‍රානුසාරයෙන් බ්ලොක්ගල් නිපදවීම	500 0	750 0	1,000 0
61.	නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
62.	කුකුළු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
64.	ටයර්/ටියුබ් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
65.	සපත්තු/බෑග්/සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
66.	දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම	500 0	750 0	1,000 0

I තීරුව		II තීරුව		
අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත
දෙවන උපලේඛනය - අන්තරායදායක ව්‍යාපාර				
67.	සිසිල් බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
68.	අයිස් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
69.	එළවළු තොග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
70.	පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
71.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
72.	මෙතිලේටි ස්පිරිතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
73.	තේ පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
74.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
75.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
76.	පිදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
77.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
78.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
79.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
80.	හිරිගල් හෝ හුණු ගල් කැණීම	500 0	750 0	1,000 0
81.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
83.	පා පැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
84.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
85.	විසිරි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
86.	ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ ආයුධ, උපකරණ නිපදවීම)	500 0	750 0	1,000 0
87.	වැල්ඩින් වැඩපලක් පවත්වානෙ යාම	500 0	750 0	1,000 0
තුන්වන උපලේඛනය - පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාරය				
88.	තලාතු මිනිරන් ශුද්ධ කිරීම	500 0	750 0	1,000 0
89.	රසායනික ද්‍රව්‍ය පාවිච්චිකර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
90.	ඩ්‍රයික්ලීන් කිරීම	500 0	750 0	1,000 0
91.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
92.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
93.	තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
94.	හුණුගල් හෝ හිරිගල් නිපදවීම	500 0	750 0	1,000 0
95.	මෝර තෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
96.	බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0
97.	ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0

I කිරුව		II කිරුව		
අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
98.	බැටරි විද්‍යුත් ආරෝපණ කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
99.	මෝටර් වාහන අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
100.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
101.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
102.	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
103.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
104.	කෘමි නාශක, දිලීර නාශක, පැලෑටි හෝ පළිබෝධ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
105.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
106.	මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0
107.	දැව ආරක්ෂණ නිපදවීම	500 0	750 0	1,000 0
108.	ගල්තාර හෝ බිටුමන්මය ද්‍රව්‍ය නිපදවීම	500 0	750 0	1,000 0
109.	වීදුරු භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
110.	වීදුරු කැඩපත් නිපදවීම	500 0	750 0	1,000 0
111.	යකඩ තහඩු ගැල්වනයිස් කිරීම	500 0	750 0	1,000 0
112.	පාස්සන ඊයම් නිපදවීම	500 0	750 0	1,000 0
113.	ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
114.	කටු කම්බි නිපදවීම	500 0	750 0	1,000 0
115.	කම්බි ඇණ නිපදවීම	500 0	750 0	1,000 0
116.	කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම	500 0	750 0	1,000 0
117.	බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබනික ටැංකි නිපදවීම	500 0	750 0	1,000 0
118.	ජී. අයි. බාල්දි නිපදවීම	500 0	750 0	1,000 0
119.	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවීම	500 0	750 0	1,000 0
120.	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
121.	බ්‍රෙක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම	500 0	750 0	1,000 0
122.	යන්ත්‍රෝපකරණ නිපදවීම	500 0	750 0	1,000 0
123.	විදුලි භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
124.	රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම	500 0	750 0	1,000 0
125.	සංචායන බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
126.	ට්‍රැක්ටර් රථ එකලස් කිරීම	500 0	750 0	1,000 0
127.	රේඩියේටර් නිපදවීම	500 0	750 0	1,000 0
128.	ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
129.	වියළි කෝෂ බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
130.	වී මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
131.	මිනීපෙට්ටි තැනීම	500 0	750 0	1,000 0
132.	දුරකතන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
133.	විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම	500 0	750 0	1,000 0
134.	පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
	ආහාර/ හෝටල්/ කුළුබඩු			
135.	අයිස්ක්‍රීම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
136.	ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
137.	බේකරි කෑම වර්ග රැගෙන ගොස් අලෙවි කිරීම	500 0	750 0	1,000 0
138.	කඩල වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
139.	කුළු බඩු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
140.	තේ කුඩු පැකට් කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
141.	තේ කුඩු හෝ 01ට වැඩියෙන් ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
142.	නේවාසිකාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
143.	පපඩම් තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
144.	බිම්මල් වගා කිරීමේ/ පැකට් කිරීමේ/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
145.	කරණෑවැම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
146.	මිනී එම්බාම් කිරීම/ මිනී පෙට්ටි විකිණීම/ ගබඩා කිරීම/ අවමංගල භාණ්ඩ කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
147.	රස කැවිලි විකිණීම/ ගබඩා කිරීම/ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
148.	ලොන්ඩරි ඩ්‍රයික්ලින් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
149.	ලුණු ගබඩා කිරීම/ පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
150.	හකුරු/ පැණි/ කිතුල් පිටි/ මුදවාපු කිරි ගබඩා කිරීම/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
151.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
152.	බේකරි කෑම පමණක් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
153.	කිරිපට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 5ට අඩු)	500 0	750 0	1,000 0
154.	කුකුළන් 100කට වැඩි ගණනක් සඳහා කුකුළු පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
155.	කිරිහලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
156.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
157.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
158.	භෝජන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
159.	භෝජන ශාලාවක් පවත්වාගෙන යාම (ලැගුම්හලක් සහිතව)	500 0	750 0	1,000 0
160.	සිසිල් බීම (විකිණීම) ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
161.	තේ, කෝපි සමග බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I තීරුව		II තීරුව		
අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත
162.	කඩල පැකට්කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
163.	මික්ස්චර් වර්ග නිෂ්පාදනය පැකට් කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
164.	ශීතකළ කුකුළු මස්, මාළු ශීතකරණයක තබා විකිණීම	500 0	750 0	1,000 0
165.	ජංගම රථයක තබා කෑම වර්ග වෙළෙඳාම කිරීම	500 0	750 0	1,000 0
166.	ශීතකරණයක තබා ඇසුරුම් කරන ලද ඌරුමස් හා එළුමස් විකිණීම	500 0	750 0	1,000 0
167.	පාවිච්චි කරන ලද පත්තර කඩදාසි හෝ පුවත්පත් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
168.	පුන්නක්කු හොන්ඩර් 10ට වැඩියෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
169.	පින්තාරු තීන්ත, වාර්නිෂ් ඩිස්ටැම්පර් තීන්ත වර්ග ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
170.	සත්වයන්ගේ ඇටකටු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
171.	පෙට්‍රල් ඩීසල් හෝ වෙනත් දැවෙන තෙල් වර්ග ගබඩා කිරීමේ නිකුත් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
172.	පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
173.	පොත් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
174.	පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
175.	පොල් 200 කට වැඩියෙන් ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
176.	පිඟන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
177.	පුවත්පත්, සඟරා අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
178.	පොල්තෙල් ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
179.	පරණ යකඩ බඩු ගබඩා කිරීමේ/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
180.	බැටරි චාජ් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
181.	බුලත් වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
182.	මෝටර් බයිසිකල්/ ත්‍රීවීලර් අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
183.	බයිසිකල් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම (යතුරු පැදි)	500 0	750 0	1,000 0
184.	බයිසිකල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (පා පැදි)	500 0	750 0	1,000 0
185.	බිත්තර ගබඩා කිරීමේ/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
186.	හිස් බෝතල් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
187.	බටහිර බෙහෙත් ද්‍රව්‍ය ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I තීරුව		II තීරුව		
අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත
188.	මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
189.	මෝටර් රථ කැබලි කොටස් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
190.	මෝටර් රථ/ ට්‍රැක්ටර් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
191.	මහන මැෂින් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
192.	මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
193.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම (විදුලි යන්ත්‍ර මැෂින් වලින් ක්‍රියාකරන)	500 0	750 0	1,000 0
194.	යකඩ බඩු සාප්පුවක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම (ගොඩනැගිලි ද්‍රව්‍ය සමග)	500 0	750 0	1,000 0
195.	රසායනික පොහොර වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
196.	යතුරුලියන යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
197.	රෙදිපිළි හා අනෙකුත් ඇඳුම් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
198.	යතුරුපැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
199.	වෙළෙඳාම සඳහා සුරතල් මසුන් හා කුරුල්ලන් (ලව් බර්ඩ්ස් හා සුරතල් සතුන්) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
200.	ත්‍රිරෝද රථ හා මෝටර් රථ ආසන කුෂන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
201.	ලිපි ද්‍රව්‍ය වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
202.	ලියවන පට්ටලයක් උපයෝගී කරගෙන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
203.	වී හාල් ඇඹරුම් සඳහා මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
204.	විදුලි උපකරණ විකිණීම සඳහා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
205.	වාත්තු වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
206.	වඩු වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
207.	විදුලි ජෙනරේටර කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
208.	වෑල්ඩින් වැඩ පළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
209.	වීඩියෝ යන්ත්‍ර කුළියට දීම, වීඩියෝගත කිරීම සඳහා උපකරණ භාවිතා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
210.	සී. ඩී. තැටි විකිණීම	500 0	750 0	1,000 0
211.	විසිතුරු අත්කම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
212.	සත්ව ආහාර විකිණීම, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
213.	සාප්පු බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම (විදුලි භාණ්ඩ හැර)	500 0	750 0	1,000 0
214.	සාප්පු බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම (ගුවන් විදුලි, ටේප් රෙකෝඩර්, රූපවාහිනී යන්ත්‍ර ඇතුළුව)	500 0	750 0	1,000 0
215.	සිල්ලර බඩු, කුළු බඩු වෙළෙඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
216.	සිමෙන්තිවලින් සෑදූ ශ්‍රිල්, බිරළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I කිරුව		II කිරුව		
අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත
217.	සිමෙන්ති බ්ලොක් ගල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
218.	ශීතකරණයක තබා අයිස්ක්‍රීම්, යෝගට්, ඇසුරුම් කරන ලද ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
219.	හඳුන්කුරු නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
220.	හිස් බෝතල්, පරණ පත්තර, අනෙකුත් අපතේ යන ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
221.	හාල් පිටි, සීනි, තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
222.	හාල් ගබඩා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
223.	අළුහුණු ගබඩා/ විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
224.	හිස් ගෝනි ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
225.	මැටි වලින් තැනූ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
226.	මනි බඩු, ෆැන්සි බඩු ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
227.	ලොතරැයි අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
228.	වාහන අමතර කොටස් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
229.	ප්ලාස්ටික්වලින් සෑදූ ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
230.	අත්බෑග්, පාසල් බෑග්, ගමන් මළු ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
231.	ඉරාපු ලී ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
232.	කැබලි රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
233.	ලොරි බොඩි සැදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
234.	සූර්යකෝෂ විකිණීමේ ස්ථානයක් පවත්වාගන යාම	600 0	750 0	1,000 0
235.	යන්ත්‍රානුසාරයෙන් වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
236.	ලැමිනේටින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
237.	ටින්කරින්, ස්ප්‍රේ පේන්ටින් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
238.	පරිගණක කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
239.	ශීතකරණ, අධිශීතකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
240.	ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර පමණක් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
241.	ජංගම දුරකථන හා වෙනත් දුරකථන උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
242.	සෙල්ලම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
243.	මල්පැල හෝ වෙනත් පැල වර්ග විකිණීමේ හා පැල තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
244.	ස්ට්‍රෝබෙරි වගා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
245.	ආහාර ද්‍රව්‍ය, බෙහෙත් ඖෂධ වර්ග, පොලිතීන් බෑග් මගින් අසුරා විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
246.	සංගීත භාණ්ඩ උපයෝගී කරගෙන පන්ති පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	500 0	750 0
247.	එළවළු තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
248.	එළවළු බීජ වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
249.	ජ්‍යෝතිෂ්‍ය කටයුතු කරගෙන යන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
250.	පූජා භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
251.	කාබනික පොහොර වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
252.	කෘෂි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
253.	ත්‍රීවිලර් රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
254.	ත්‍රීවිලර් රථ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
255.	සංගීත භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
256.	ජංගම දුරකතන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
257.	අකුරු පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
258.	කෞතුක භාණ්ඩ ලබා ගැනීම හා විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
259.	මෝටර් රථ වයරින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	500 0	750 0
260.	පා පැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
261.	ඇලුමිනියම් හා වීදුරු භාවිතයෙන් ගෘහ භාණ්ඩ වෙළෙඳසැල් උපකරණ නිෂ්පාදනය, ගෙන්වීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
262.	ලිහිසි තෙල් ගබඩා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
263.	ජංගම දුරකතන අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
264.	ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
265.	පරිගණක භාවිතයෙන් ලිපි සකස් කිරීම	500 0	750 0	1,000 0
266.	සබන් වර්ග නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
267.	පුවිචපු ගඩොල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
268.	ජංගම රථයක තබා බේකරි කෑම හා කෑම වර්ග විකිණීම (නගර සීමාවෙන් පිටත)	500 0	750 0	1,000 0
269.	කිරිහලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
270.	මාළු වෙළඳසලක් පවත්වාගෙන යාම (නගර සීමාවෙන් පිටත)	500 0	750 0	1,000 0
271.	ටින්කෑම, කිරිපිටි ඇතුළු පාරිභෝගික ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
272.	නිමි ඇඳුම් තොග වෙළෙඳාම	500 0	750 0	1,000 0
273.	දුරකතන කාඩ්පත් අලෙවිය හා රීලෝඩ් දැමීම	500 0	750 0	1,000 0

I කිරුව		II කිරුව		
අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත
274.	උම්බලකඩ පැකට් කර අලෙවිය	500 0	750 0	1,000 0
275.	පොලිතින් පැකට් විකිණීම	500 0	750 0	1,000 0
276.	ධාන්‍ය වර්ග පැකට් කර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
277.	මුඛ ආවරණ නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
278.	ඇලුමිනියම් භාණ්ඩ ගබඩා කිරීම/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
279.	ආයුර්වේද බෙහෙත් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
280.	පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
281.	ඇස් කණ්ණාඩි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
282.	අලුත් හෝ පරණ ටයර් 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම/ විකිණීම	500 0	750 0	1,000 0
283.	අලුත් හෝ පරණ ටයර් 25ට අඩු ප්‍රමාණයක් ගබඩා කිරීම/ විකිණීම	500 0	750 0	1,000 0
284.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (දෙදනෙකුට වැඩි)	500 0	750 0	1,000 0
285.	එළවළු සිල්ලරට විකිණීම	500 0	750 0	1,000 0
286.	උළු හෝ ගඩොල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
287.	ඔරලෝසු විකිණීම සඳහා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
288.	කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කිරීම/ විකිණීම	500 0	750 0	1,000 0
289.	කෝපි/ ධාන්‍ය වර්ග/ මාංශභෝග ඇඹරීම/ පැකට් කිරීම/ විකිණීම	500 0	750 0	1,000 0
290.	කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම/ විකිණීම	500 0	750 0	1,000 0
291.	ක්ෂණික ඡායා පිටපත් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
292.	කුකුල් පොහොර ගබඩා කිරීම/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
293.	කරවල ගබඩා කිරීම/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
294.	ක්‍රීඩා භාණ්ඩ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
295.	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය/ ගබඩා කිරීම/ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
296.	ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ ගබඩා කිරීම/ විකිණීම	500 0	750 0	1,000 0
297.	ටයර් ට්‍යුබ් වෝල්කනයිස් කිරීම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
298.	ටින්කර් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
299.	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
300.	මිරිස්, තුනපහ ඇඹරුම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
301.	විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් (වැඩ පළක්) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
302.	ජල පොම්ප, මෝටර්, ඇඹරුම් යන්ත්‍ර කොටස් ඇතුළු වෙනත් විදුලි ජනක යන්ත්‍ර ගබඩා කිරීම/ විකිණීම	500 0	750 0	1,000 0
303.	වීදුරු තහඩු ගබඩා කිරීම/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
304.	සුවඳ විලවුන් නිෂ්පාදන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
305.	වාහන ස්ටිකර් සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
306.	කෘෂිකාර්මික උපකරණ ගබඩා කිරීම/ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
307.	වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
308.	ජංගම රථයක තබා වෙළෙඳාම් කිරීම	500 0	750 0	1,000 0
309.	විෂබීජ නාශක දියර නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
310.	පරණ බැටරි එකතු කිරීම/ විකිණීම	500 0	750 0	1,000 0
311.	පිත්තල භාණ්ඩ ඔප දැමීම (පොලිෂ් කිරීම) ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
312.	කාබනික දියර පොහොර නිෂ්පාදනය හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
313.	කාබනික කෘමිනාශක වර්ග නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
314.	පරිගණක අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
315.	යතුරු කපන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
316.	පහන්තිර නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
317.	විදේශයෙන් ආනයනය කරන ලද (පාවිච්චි කරන ලද) රෙදි විකිණීම	500 0	750 0	1,000 0
318.	ආහාර ද්‍රව්‍ය උපයෝගී කරගෙන අතුරු ආහාර වර්ග නිෂ්පාදනය හා විකිණීම	500 0	750 0	1,000 0
319.	ජංගම රථයක තබා කොළකැඳ විකිණීම	500 0	750 0	1,000 0
320.	වෙනත් නව ව්‍යාපාර අවස්ථා	500 0	750 0	1,000 0
321.	පොල් ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
322.	රටඉඳි, ප්ලම්ස් වර්ග පැකට් කර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
323.	පොප් කෝන් නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
324.	ඉදිකිරීමේ යන්ත්‍ර උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
325.	අත්කම් නිර්මාණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
326.	මල් පෝච්චි නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
327.	විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
328.	පා පැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
329.	එළවළු වගා කිරීමේ ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
330.	මිරිස්, තුනපහ කුඩු ගබඩා කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
331.	පොලිතින් බෑග් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
332.	පාවහන්, පාසල් බෑග් හා ගමන් මලු, අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I කීරුව		II කීරුව		
අනු. අංකය	වෙළෙඳ ව්‍යාපාරයේ ස්වභාවය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 0 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත
333.	ස්වර්ණාභරණ ගෙන මාල, මුදු හා වෙනත් රත්නන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා අලුත්වැඩියා කිරීම හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
334.	ශීතකළ නැවුම් කුකුල් මස් ප්‍රදර්ශනය හා අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම (කොටස් ප්‍රමාණ වශයෙන්)	500 0	750 0	1,000 0
335.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම (දෙනුන් 10ට වැඩි)	500 0	750 0	1,000 0
336.	දුරකථන අලෙවිය, සේවා සැපයීම, බිල්පත් පියවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
337.	සෙරමික් භාණ්ඩ ගබඩා කිරීම විකිණීම	500 0	750 0	1,000 0
338.	ඉලෙක්ට්‍රොනික් උපාංග අලෙවිය	500 0	750 0	1,000 0
339.	නළ ළිං යන්ත්‍ර කුළියට ලබා දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
340.	තරාදි වර්ග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
341.	දේශීය ඖෂධ වර්ග තෙල චූර්ණ යන්ත්‍රානුසාරයෙන් ඇඹරීම/ පැකට් කර විකිණීම	500 0	750 0	1,000 0
342.	බල මෙවලම් කට්ටල ගබඩා කිරීම/ විකිණීම	500 0	750 0	1,000 0
343.	උත්සව අවස්ථා සඳහා ශබ්දවාහිනී උපකරණ සැපයීම හා සංගීත භාණ්ඩ කුළියට දීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
344.	වාහන යන්ත්‍රෝපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
345.	පොල්තෙල් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
346.	කෘෂිකාර්මික උපකරණ හා අත් ට්‍රැක්ටර් එකලස් කර විකිණීම	500 0	750 0	1,000 0
347.	මාර්ගගත ක්‍රමයට සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
348.	දැව කඳන් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
349.	වාහන බැටරි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
350.	බීජ වර්ග නිෂ්පාදනය හා අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
351.	ඇලුමිනියම් පිරිසැකසුම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
352.	මෝටර් රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම (සර්විසස්)	500 0	750 0	1,000 0
353.	එළවළු, පළතුරු විජලනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
354.	සෝපා පුටු කුෂන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
355.	මෝටර් රථ සඳහා ස්ටිකර් වර්ග අලෙවි කිරීම	500 0	750 0	1,000 0
356.	සිවිලිම් උපකරණ ගබඩා කිරීම හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0
357.	කිරුම් මිනුම් උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

වැලිමඩ ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ව්‍යාපාර හා වෘත්තීන් සඳහා බදු පැනවීම

වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ අගෝස්තු මස 28 දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 05.(01).XI යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. අජිත් කුමාර දිසානායක,
සභාපති,
ප්‍රාදේශීය සභාව - වැලිමඩ.

2025 ඔක්තෝබර් මස 30 දින,
වැලිමඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2026 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර වැලිමඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

I තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර 2025 වර්ෂයේ ව්‍යාපාරයෙන් ලන් ලැබීම් ප්‍රමාණය*	*II තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
1. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	අයකිරීමක් නැත
2. රු. 6,000 ඉක්මවන එහෙත් රු.12,000 නොඉක්මවන අවස්ථාවක	90.00
3. රු. 12,000 ඉක්මවන එහෙත් රු.18,750 නොඉක්මවන අවස්ථාවක	180.00
4. රු. 18,750 ඉක්මවන එහෙත් රු.75,000 නොඉක්මවන අවස්ථාවක	360.00
5. රු. 75,000 ඉක්මවන එහෙත් රු.1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200.00
6. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000.00

උපලේඛනය අංක 01 කොටස

(ව්‍යාපාර බදු)

01. ප්‍රසිද්ධ නොතාරිස්වරයකු වශයෙන් කටයුතු කිරීම
02. පෞද්ගලික ඉංජිනේරුවරයකු වශයෙන් කටයුතු කිරීම
03. බඩු උකස් ගන්නා අයකු වශයෙන් කටයුතු කිරීම
04. මුදල් ණයට දෙන්නකු වශයෙන් කටයුතු කිරීම
05. වෙන්දේසිකරුවකු වශයෙන් හෝ තැරැව්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම
06. ප්‍රසිද්ධ මිනින්දෝරුවකු වශයෙන් කටයුතු කිරීම
07. ප්‍රවාහන සේවා සැපයුම්කරු වශයෙන් කටයුතු කිරීම
08. ගෘහ නිර්මාණ ශිල්පියකු වශයෙන් කටයුතු කිරීම
09. කොමිස් ඒජන්තවරයකු වශයෙන් කටයුතු කිරීම
10. පෞද්ගලික විගණන ආයතනයක් වශයෙන් කටයුතු කිරීම
11. සැපයුම්කරුවකු වශයෙන් කටයුතු කිරීම
12. රක්ෂණ සමාගමක් හෝ නිලධාරියකු වශයෙන් කටයුතු කිරීම
13. බැංකුවක් පවත්වාගෙන යාම
14. ස්වයංක්‍රීය දුරකතන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
15. කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
16. බීජ ඇට එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
17. සංචාරක හෝටලයක් පවත්වාගෙන යාම

18. රැකියා එජන්සියක් පවත්වාගෙන යාම
19. කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
20. තුරඟ තරග ඔට්ටු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
21. කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ක්‍රියා කිරීම (හරිතාගාර, ගොඩනැගිලි) මාර්ග ඉදිකිරීම්, ජල නළ එළීම, සිවිලිම් බිත්ති ඉදිකර දීම
22. වෑන් රථ, කාර් ඇතුළු වෙනත් වාහන යන්ත්‍ර සූත්‍ර කුළියට ලබා දෙන්නකු වශයෙන්
23. පුහුණු/නුපුහුණු ශ්‍රමිකයන් සපයන්නකු ලෙස ක්‍රියා කිරීම සඳහා
24. අන්තර්ජාල සම්බන්ධතා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
25. ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නකු ලෙස කටයුතු කිරීම. (ගල්, වැලි, මැටල්)
26. දුරකතන විකාශන කුළුණක් පවත්වාගෙන යාම
27. රැහැන් රූපවාහිනී විකාශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28. විදේශ රැකියා නියෝජිත සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
2000 අංක 53 සහ 1988 අංක දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 2264/18 දරන වර්ෂ 2023 ක් වූ ජනවාරි මස 27 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* "ඇ" කොටසේ නියමිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත මෙහි පහත උපලේඛනයේ සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් 2026 වර්ෂය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම,ප්‍රතික්ෂේප කිරීම සහ අත්හිටුවීම සිදුකිරීම සුදුසු බව නාඋල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

1. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත.
2. සේවක සංඛ්‍යාව 5 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 5 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4. රෙදි වියන යන්ත්‍ර /මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර් 200 කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත වාණිජ මට්ටමේ පොල්තෙල් නිෂ්පාදනය කිරීමේ පොල්තෙල් කර්මාන්ත
6. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10 කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
7. දිනකට ලීටර් 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත.

8. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්.
9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත ඇඹරුම්හල්.
10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම් වැටි හෝ දුම් කොළ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත.
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවයක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම්ගැසීමේ කර්මාන්ත.
12. සේවක සංඛ්‍යාව 5 කට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත.
13. සේවක සංඛ්‍යාව 5 කට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/ මුහුවම් කිරීමේ කර්මාන්ත.
14. සේවක සංඛ්‍යාව 5 ක හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත.
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250 ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත.
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්.* මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + [50 × (ඌරන් සංඛ්‍යාව +ගවයින් සංඛ්‍යාව)+10 ×(එළුවන් සංඛ්‍යාව)]
20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100ක් හෝ ඊට වැඩි පලතුරු හෝ එළවලු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත.
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු.
24. සේවක සංඛ්‍යාව 5 කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින "ප්ලාස්ටර් ඔෆ් පැරිස් "අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා ඕනෑම කර්මාන්තයක්.
25. බෙලිකටු කැබලි කිරීමේ / පතුරු කිරීමේ කර්මාන්ත.
26. උළු සහ ගඩොල් පෝරණු.
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
28. කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත.
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැනීම් කටයුතු .
30. දිනකට ඝන මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවයක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10 කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත.
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත
32. බහුකාර්යය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන කර්මාන්ත.
33. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් සහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙළ කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා.
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්
35. විසිරි පින්තාරු කිරීම් හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම් නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ.
36. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලූ පර්යන්ත.
37. ඊයම් උණු කිරීම ඇතුලත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර.
38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම් සහිත මල් ශාලා
39. මෙම උපලේඛනයේ "ඇ " කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක් , කර්මාන්තයක්

මොනරාගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් 2025 සැප්තැම්බර් මස 26 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 5/2 (i) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. කේ. එම්. ජනක පුෂ්ප කුරුප්පු,
සභාපති,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 26 දින,
මොනරාගල ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තියේ (1) උපවගන්තියෙන් මොනරාගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2025 වර්ෂයට පිළිගෙන ක්‍රියාත්මක කරනු ලැබූ 2010 වර්ෂයේ දී සිදු කරන ලද තක්සේරුව 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (1) උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව ඉහත කී තක්සේරුව මත එකී වාර්ෂික වටිනාකමින් සියයට දහයක (10%) වරිපනම් බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

(ඇ) වර්ෂයේ සම්පූර්ණ වරිපනම් බදු මුදල් එම වර්ෂයේ ජනවාරි මස 31 දින හෝ එදිනට පෙර ගෙවන්නේ නම් 10% ක වට්ටමක් ද, කාර්තු වශයෙන් ගෙවන්නේ නම් කාර්තුවේ මුල් මාසය තුළ හෝ ඊට පෙර මුදල් ගෙවන විට 5% ක වට්ටමක් ද සභාව විසින් ලබා දීමටත්,

(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (6) උපවගන්තියේ බලතල යටතේ යථෝක්ත වරිපනම් බද්ද 2026 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් මොනරාගල ප්‍රාදේශීය සභාව වෙත ගෙවන ලෙසටත්,

මොනරාගල ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

12 - 68/1

මොනරාගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් 2025 සැප්තැම්බර් මස 26 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 5/2 (ii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. කේ. එම්. ජනක පුෂ්ප කුරුප්පු,
සභාපති,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් 26 මස දින,
මොනරාගල ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මොනරාගල ප්‍රාදේශීය සභාව 2026 වර්ෂයේ නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පහත

උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් වෙළඳ ව්‍යාපාරය වෙනුවෙන් එම උපලේඛනයේ II තීරුවේ ඒ එක් එක් වෙළඳ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක වෙළඳ බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇති හෝ අනුමතකර ඇති ආයතන හෝ පිළිගනු ලැබ ඇත්තාවූ අවස්ථාවක ඉහත දෙවන කොටසෙහි කුමක් සඳහන්ව තිබුණද ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන්පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන්පොළෙහි හෝ 2026 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් (සියයට එකක) විය යුතු බවට මොනරාගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750.00 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750.00ට වැඩි එහෙත් 1,5000 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	හෝටලයක් පවත්වාගෙන යාම			
02.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	අත් යන්ත්‍ර මගින් රබර් දුම් ගැසීමේ හා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ලී වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ශීතකරණ කරන ලද ආහාර ද්‍රව්‍ය සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	මස් වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	පළතුරු විකිණීම සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	හරක් මඩුවක්, ගාලක් හෝ නැවතුම්පොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	සෝගාතක මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	කුකුළන් ආදී සතුන් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	කලුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	මිරිස්, කෝපි, පිටි, ධාන්‍ය හෝ කුළු බඩු හෝ වෙනත් මෑ වර්ග ඇඹරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාකරන වී මෝල්ක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	අම්ලකර වායුව (ඔක්සිජන්) භාවිතා කරන යකඩ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	අශ්ව බල 10 හා 20 අතර වූ වී මෝල්ක්, ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	අශ්ව බල 20 ට අධික වූ වී මෝල්ක්, ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	වඩු වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ප්‍රමාණයෙන් ටොන් 01 ක් සත්ත්ව ආහාර ගබඩාකර තබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	මෝටර් ගරාජයක් පවත්වාගෙන යාම සඳහා (මෝටර් රථ අලුත්වැඩියාව)	500 0	750 0	1,000 0

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750.00 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750.00ට වැඩි එහෙත් 1,5000 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
21.	රස කැවිලි නිෂ්පාදනය කිරීමේ හෝ වෙළෙඳාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	පැස්සීමේ හෝ අම්ලකර පැස්සීමට ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	ලියවන පට්ටලයක් භාවිතා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීම හෝ එවැනි කාර්යයක් කිරීමට සුදුසු ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	මෝටර් වාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	යන්ත්‍ර නොමැතිව ගඩොල් හෝ උළු නිපදවීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
27.	අයිස් ක්‍රීම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	වේවැල් බඩු නිපදවීම හා ගබඩාකර තබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	යෝගට් හෝ අයිස් ක්‍රීම් නිපදවීම	500 0	750 0	1,000 0
31.	යන්ත්‍ර මගින් ක්‍රියාකරන ගල්මෝලක් සඳහා	500 0	750 0	1,000 0
32.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	බැටළුවන්, එළුවන් හෝ ඌරන් 10 ට වඩා ඇති මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	මස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	සිල්ලර බඩු වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	සිල්ලර බඩු වෙළෙඳාම (ගම්බඳ)	500 0	750 0	1,000 0
38.	ආයුර්වේද බෙහෙත් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	ඉංග්‍රීසි බෙහෙත් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	මල් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	ශීත කළ මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	කොන්ක්‍රීට් කණු හා ග්‍රිල් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	මිරිදිය මසුන් අලෙවිය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	කරදිය මසුන් අලෙවිය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	බැටරි චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන ටයර් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	ටයර් හෝ ට්‍යුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	පාපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	200 0	250 0	500 0
50.	බෙලෙක් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750.00 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750.00ට වැඩි එහෙත් 1,5000 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
51.	යන්ත්‍ර භාවිතයක් නොමැතිව ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	සංචාරක වෙළෙන්දෙකු වීම සඳහා	250 0	350 0	500 0
53.	රූපවාහිනී හෝ රේඩියෝ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	ගෝනි ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	500 0	1,000 0
55.	හිස් බෝතල් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	200 0	500 0	1,000 0
56.	යන්ත්‍ර නොමැතිව සපත්තු හෝ පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	200 0	500 0	1,000 0
57.	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබාගැනීමේ ස්ථානයක් සඳහා	300 0	500 0	1,000 0
58.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
59.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම සඳහා	300 0	500 0	1,000 0
60.	යතුරුපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	පරණ ලෝහ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	විසිතුරු පින්තාරු (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	මෝටර් වාහන සඳහා බොඩි සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
64.	ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	රේඩියෝ අමතර කොටස් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	ලිපිද්‍රව්‍ය වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	පොත් සාප්පුවක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
68.	මැටි භාණ්ඩ වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	බුලත් වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	250 0	300 0	500 0
70.	පින්තූර රාමු කරන හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	පුවත්පත් හා සඟරා ආදිය වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72.	සෙල්ලම් බඩු වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	ගී පටිගත කිරීමේ හා සීඩී තැටිගත කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
74.	ඉදල්, පාපිසි හා මුස්නා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
75.	ටින්කර් වැඩපලක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
76.	බීඩි නිෂ්පාදනය කිරීම සඳහා	500 0	750 0	1,000 0
77.	ලොතරැයි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	සුරතල් මසුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I තීරුව		II තීරුව		
අනු. අංකය	කර්මාන්තයේ ස්වභාවය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750.00 ට නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 750.00ට වැඩි එහෙත් 1,5000 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත
79.	කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	බීඩි ගබඩා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
81.	පිත්තල භාණ්ඩ වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	තාවකාලික එළවළු කඩ	500 0	750 0	1,000 0
83.	පිහන් හෝ වීදුරු භාණ්ඩ විකිණීම	500 0	750 0	1,000 0
84.	දුරකථන, ඡායා පිටපත්, පරිගණක කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85.	කලුගල් කැඩීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
86.	යන්ත්‍රානුසාරයෙන් කළුගල් වැඩපලක් පවත්වාගෙන යාමට අදාළ ස්ථාන	500 0	750 0	1,000 0
87.	ආගන්තුක නිවාස	500 0	750 0	1,000 0

12 - 68/2

මොනරාගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් 2025 සැප්තැම්බර් මස 26 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 5/2 (iii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. කේ. එම්. ජනක පුෂ්ප කුරුප්පු,
සභාපති,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 26 දින,
මොනරාගල ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) හා (2) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II තීරුවේ සඳහන් ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක්, 2026 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්,

(ආ) එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2026 වර්ෂයේ මාර්තු මස 31 දිනට පෙර මොනරාගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්,

මොනරාගල ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

උපලේඛනය

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750.00 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750.00ට වැඩි එහෙත් 1,5000 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	විදුලි බලයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා	500 0	750 0	1,000 0
02.	අත් යන්ත්‍ර මගින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	යතුරු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	බෝල මේස ක්‍රීඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ජුකී මැෂින් උපයෝගී කර ගනිමින් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ජුකී මැෂින්වලින් ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ඔරලෝසු වෙළෙඳාම් කරන, ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ප්‍රචාරක නාම පුවරු සැදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ජංගම දුරකථන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	මෙහි සඳහන් නොවන වෙනත් ව්‍යාපාර සඳහා	500 0	750 0	1,000 0

12 - 68/3

මොනරාගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් 2025 සැප්තැම්බර් මස 26 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 5/2 (iv) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. කේ. එම්. ජනක පුෂ්ප කුරුප්පු,
සභාපති,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 26 දින,
මොනරාගල ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

බද්දට යටත් යම් තැනැත්තකු එකී ව්‍යාපාර බද්ද 2026 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර මොනරාගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්,

මොනරාගල ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

උපලේඛනය

I තීරුව	*II තීරුව*
2025 වර්ෂයේ ව්‍යාපාරයෙන් ලන් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශත.*
1. රු. 6,000 0 නොඉක්මවන අවස්ථාවක	නැත
2. රු. 6,000 0 ඉක්මවන නමුත් රු. 12,000 0 නොඉක්මවන විට	90 0
3. රු. 12,000 0 ඉක්මවන නමුත් රු. 18,750 0 නොඉක්මවන විට	180 0
4. රු. 18,750 0 ඉක්මවන නමුත් රු. 75,000 0 නොඉක්මවන විට	360 0
5. රු. 75,000 0 ඉක්මවන නමුත් රු. 150,000 0 නොඉක්මවන විට	1,200 0
6. රු. 1,50,000 0 ඉක්මවන විට	3,000 0

මෙම ව්‍යාපාර බදු අදාළවන ව්‍යාපාර :

1. වෙන්දේසිකරුවන්
2. කොන්ත්‍රාත්කරුවන්
3. උකස් බඩු ගන්නවුන්
4. පෞද්ගලික අධ්‍යාපන පන්ති පවත්වන්නන්
5. ගෘහ නිර්මාණ ශිල්පීන්
6. සැපයුම්කරුවන්
7. ප්‍රවාහන සේවා
8. කුලී කාර් අයිතිකරුවන්
9. මෝටර් රථ හා යතුරු පැදි විකුණුම්කරුවන්
10. බැංකු හා රක්ෂණ ලීසිං සමාගම්
11. රියැදුරු පුහුණු පාසල්
12. මැණික් වෙළඳාම් ආයතන
13. වාරිකා සේවා ආයතන
14. ඇඟලුම් කර්මාන්තශාලා
15. බහුආංගික වෙළඳසැල් (සුඩ් සිටි)
16. මත්පැන් තොග හා සිල්ලර වශයෙන් පවත්වාගෙන යන ස්ථානයක් (රට බීමහල්)
17. සමාජශාලාවක්
18. මසා නිමකළ හා රෙදිපිළි සාප්පු සහ අලෙවිසැල්
19. ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළෙඳාම් කරන ස්ථානයක්
20. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්ප්‍රේෂණ කුළුණු
21. ගෘහ භාණ්ඩ සාප්පුවක් පවත්වාගෙන යාම
22. උළු, ගඩොල් හා කබොක් රැස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
23. හුණු හෝ හුණු ගල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24. ටයර්, ටියුබ්, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25. හොන්ඩර් 5කට වැඩි නොවූ තරම් තීන්ත හෝ වාර්නිස් ගබඩාකර තබා ගැනීම සඳහා
26. හොන්ඩර් 5කට වැඩි වූ තරම් තීන්ත හෝ වාර්නිස් ගබඩාකර තබා ගැනීම සඳහා
27. යකඩ බඩු ගබඩාවක් පවත්වාගෙන යාම
28. සිමෙන්ති ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29. දුම්කොල ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
30. පුවක් ගබඩා කිරීම සඳහා
31. මැණික් වෙළෙඳුන් විසින් මැණික් කැටයම් කපා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32. ග්‍රොස් එකකට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම බෝතල් ගබඩා කරතබා ගැනීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
33. ගැලුම් 50ට වැඩි ප්‍රමාණයක් පොල්තෙල් ගබඩාකර තබා ගැනීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34. කිලෝග්‍රෑම් 750ට වැඩි වන සේ ප්‍රමාණයක් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
35. තොග වශයෙන් විකිණීම සඳහා හාල්, පිටි, සීනි හෝ ලූණු කිලෝ 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.

36. ගෑස් නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37. ගුවන් විදුලි යන්ත්‍ර, ටෙප්රෙකෝඩර්, ටෙලිවිෂන් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
38. සාප්පු බඩු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
39. මෝටර් රථ, මෝටර් බයිසිකල් අමතර කොටස් වෙළඳාම් කරන ස්ථානයක් සඳහා
40. ඇලුමිනියම්, යකඩ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
41. පාවහන් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
42. මංගල උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
43. මහන මැෂින් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
44. බයිසිකල් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
45. ස්වර්ණාභරණ වෙළඳසැලක් පවත්වාගෙන යාම
46. ආයුර්වේද බෙහෙත් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
47. තොග වශයෙන් සිගරට් ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. විදුලි උපකරණ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
49. කාර් ෂීට් කුෂන් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
50. රේස් ඔට්ටු පොළවල් පවත්වාගෙන යාම
51. ඇස් කණ්ණාඩි වෙළඳාම් කිරීම සඳහා සාප්පුවක් පවත්වාගෙන යාම
52. මෝටර් සයිකල් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
53. ඡායා පිටපත් කර ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. කෘෂි කාර්මික හා ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම
55. නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම
56. සිමෙන්ති වලින් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය අලෙවි කිරීම
57. වැලිගොඩ දමා විකිණීමට රැස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
58. උළු ගබඩාවක් පවත්වාගෙන යාම
59. ඉන්ධන ගබඩා කිරීම හා විකිණීම සඳහා
60. මෙහි වර්ග නොකරන ලද වෙනත් ව්‍යාපාරික ස්ථාන

12 - 68/4

මොනරාගල ප්‍රාදේශීය සභාව

පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර සඳහා ගාස්තු පැනවීම

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් 2025 සැප්තැම්බර් මස 26 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 5/2 (v) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. කේ. එම්. ජනක පුෂ්ප කුරුප්පු,
සභාපති,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 26 දින,
මොනරාගල ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වගන්තියේ (1) උපවගන්තයෙන් උෟව පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදා 2013 ජුනි මස 28 අංක 1816/43 අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති පීඩාකාරී හා අන්තරාදායක වෙළඳාම පිළිබඳව අතුරු ව්‍යවස්ථා මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන 2013.11.29 වැනි දින අංක 2942 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකර ඇති දැන්වීම හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමඟ කියවිය යුතු පනතේ 147 වගන්තිය යටතේ මොනරාගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2026 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් පහත අංක 01 උපලේඛනය පීඩාකාරී ව්‍යාපාර අංක 02 උපලේඛනයේ අන්තරාදායක ව්‍යාපාර හා අංක 03 උපලේඛනයෙහි සඳහන් පීඩාකාරී ව්‍යාපාර හා අන්තරාදායක ව්‍යාපාර සඳහා එම උපලේඛනවල සඳහන් බලපත්‍ර ගාස්තුවක් අය කළයුතු බව මොනරාගල ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නිය.

01 උපලේඛනය

පීඩාකාරී ව්‍යාපාර

I කිරුව		*II කිරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750.00 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750.00ට වැඩි එහෙත් 1,5000 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
02.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
03.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
04.	සත්ත්ව පාලන (මස්/කිරි/හෝ බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කිලෝ ග්‍රෑම් 50ට වඩා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
06.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම	500 0	750 0	1,000 0
07.	පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
08.	තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500 0	750 0	1,000 0
09.	සම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, මාළු හෝ ඡාඩි කිලෝ ග්‍රෑම් 100ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
11.	මාළු හෝ මස් ඡාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
12.	පොල්කටු අඟුරු හා දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
13.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
14.	සත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
17.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18.	සත්ත්ව ඇට කටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	ට්‍රන්ක පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
20.	අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0
22.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
23.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
25.	සිරප් හෝ පලතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
26.	රස කැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
27.	පොල් ලෙලි නිපදවීම හෝ පල් කිරීම	500 0	750 0	1,000 0
28.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
29.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
30.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
31.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750.00 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750.00ට වැඩි එහෙත් 1,5000 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
32.	දැව ඉරීම	500 0	750 0	1,000 0
33.	පින්තාරු තීන්ත වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
34.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
35.	කෙඳි සායම් නිපදවීම	500 0	750 0	1,000 0
36.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින් වල ඇසිරීම	500 0	750 0	1,000 0
38.	කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
39.	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
40.	ගෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
41.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
42.	පොටි නිපදවීම	500 0	750 0	1,000 0
43.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
44.	ලියන තීන්ත අව්වු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
45.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
46.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
47.	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
48.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
49.	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
50.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
51.	ටයර් ටියුබ් වොල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
52.	සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
53.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
54.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
55.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
56.	ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
57.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
58.	අම්ල නිෂ්පාදනය කිරීම නැවත පිරවීම	500 0	750 0	1,000 0
59.	උළු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
60.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයක් දමා තිබූ ගෝනි පිරිසිදුකර විකිණීම	500 0	750 0	1,000 0
61.	යන්ත්‍රානුසාරයෙන් බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
62.	නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
63.	කුකුළු වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
65.	ටයර්, ටියුබ් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
66.	සපත්තු, බෑග්, සම් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
67.	දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම	500 0	750 0	1,000 0

02 උපලේඛනය

අන්තරාදායක ව්‍යාපාර :

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750.00 ට නොඉක්මවන අවස්ථාවක රු. ශත	*රු. 750.00ට වැඩි එහෙත් 1,5000 නොඉක්මවන අවස්ථාවක* රු. ශත	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක* රු. ශත
01.	කළු ගල් තැනීම හෝ කැඩීම			
02.	සිසිල් බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
03.	අයිස් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
04.	එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
05.	පොල් තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
06.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
07.	මෙතිලේටඩ් ස්පිරිත්තු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
08.	තේ පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	පිදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
12.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
14.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
15.	හිරිගල් හෝ හුණුගල් කැණීම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
19.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
20.	විසිතුරු පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
21.	ගිණිකෙළි භාණ්ඩ රතිඤ්ඤා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
22.	ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ යන්ත්‍රෝපකරණ ආයුධ උපකරණ නිපදවීම	500 0	750 0	1,000 0
23.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

03 උපලේඛනය

පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750.00 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750.00ට වැඩි එහෙත් 1,5000 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	තලාතු මිනිරන් ශුද්ධ කිරීම	500 0	750 0	1,000 0
02.	රසායන ද්‍රව්‍ය පාවිච්චිකර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
03.	ඩ්‍රයික්ලීන් කිරීම	500 0	750 0	1,000 0
04.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් කිරීම	500 0	750 0	1,000 0
05.	විද්‍යුත්ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
06.	තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
07.	හුණුගල් හෝ හිරිගල් නිපදවීම	500 0	750 0	1,000 0
08.	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම	500 0	750 0	1,000 0
09.	මොර තෙල් නිපදවීම	500 0	750 0	1,000 0
10.	බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0
11.	බැටරි විද්‍යුත් ආරෝපනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12.	ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0
13.	මෝටර් වාහන අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
14.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
15.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
16.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
19.	කෘමි නාශක, දිලීර නාශක පැලෑටි හෝ පළිබෝධ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
20.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
21.	මදුරු දහර නිපදවීම	500 0	750 0	1,000 0
22.	දැව ආරක්ෂණ නිපදවීම	500 0	750 0	1,000 0
23.	ගල් තාර හෝ බිටුන්මය ද්‍රව්‍ය නිපදවීම	500 0	750 0	1,000 0
24.	වීදුරු භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
25.	වීදුරු කැඩපත් නිපදවීම	500 0	750 0	1,000 0
26.	යකඩ තහඩු ගැල්වනයිස් කිරීම	500 0	750 0	1,000 0

I තීරුව		*II තීරුව*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750.00 ට නොඉක්මවන අවස්ථාවක	*රු. 750.00ට වැඩි එහෙත් 1,5000 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
27.	සාස්පාන ඊයම් නිපදවීම	500 0	750 0	1,000 0
28.	ඇළුමිනියම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
29.	කටු කම්බි නිපදවීම	500 0	750 0	1,000 0
30.	කම්බි ඇණ නිපදවීම	500 0	750 0	1,000 0
31.	කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන් නිපදවීම)	500 0	750 0	1,000 0
32.	බොලක් බදුන්, වානේ පීප්ප හෝ කාබනික ටැංකි නිපදවීම	500 0	750 0	1,000 0
33.	ජී. අයි. බාල්දි නිපදවීම	500 0	750 0	1,000 0
34.	වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ නිපදවීම	500 0	750 0	1,000 0
35.	වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
36.	බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම	500 0	750 0	1,000 0
37.	යන්ත්‍රෝපකරණ නිපදවීම	500 0	750 0	1,000 0
38.	විදුලි භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
39.	රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම	500 0	750 0	1,000 0
40.	සංචායන බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
41.	ට්‍රැක්ටර් රථ එකලස් කිරීම	500 0	750 0	1,000 0
42.	රේඩියේටර් නිපදවීම	500 0	750 0	1,000 0
43.	ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
44.	වියළිකෝෂ බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
45.	වී මෝල්	500 0	750 0	1,000 0
46.	මිනී පෙට්ටි තැනීම	500 0	750 0	1,000 0
47.	දුරකථන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
48.	විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම	500 0	750 0	1,000 0
49.	පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0

මොනරාගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා නිදැල්ලේ හැසිරෙන සතුන් අල්ලා ගාල්කර නිදහස් කිරීමේ ගාස්තු අය කිරීම

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් 2025 සැප්තැම්බර් මස 26 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 5/2 (vi) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. කේ. එම්. ජනක පුෂ්ප කුරුප්පු,
සභාපති,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 26 දින,
මොනරාගල ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

යෝජනාව

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් මාර්ගයක හෝ මාර්ගයකට යා හැකිවන පරිදි බැඳි දිගේලි කර හෝ නිදැල්ලේ යාමට සලස්වා ඇති ගවයකු, මී ගවයකු, එළුවකු හෝ වෙනත් සතෙකු නිසා මාර්ගයේ අනතුරු සිදුවීමට ඉඩ ඇත. එබැවින් ඉහත කී ස්ථාන වල බැඳි දිගේලි කර හෝ නිදැල්ලේ යාමට සලස්වා ඇති සතුන් 1987 අංක 18 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 66 (2) වගන්ති ප්‍රකාර අල්ලා ගාල් කිරීමටත් එවැනි අල්ලා ගත් සතුන් නිදහස් කිරීමේ දී පහත උපලේඛනයෙහි සඳහන් ගාස්තු 2026 වර්ෂයට අය කිරීමට මොනරාගල ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

අනු. අංක	*01 තීරුව* *විස්තරය*	*02 තීරුව* *ගෙවිය යුතු බද්ද*
01	ලොකු ගවයකු, මී ගවයකු අල්ලා නිදහස් කිරීමේ දී අයකරන ගාස්තු	5,000 0
02	කුඩා ගවයකු, කුඩා මී ගවයකු අල්ලා නිදහස් කිරීමේ දී අයකරන ගාස්තු	3,000 0
03	එළුවකු අල්ලා නිදහස් කිරීමේ දී අයකරන ගාස්තු	2,000 0
04	ලොකු ගවයකු, කුඩා ගවයකු, මී ගවයකු, කුඩා මී ගවයකු, එළුවකු ගාලේහි එක් දිනක් රඳවා ගැනීමේ ගාස්තුව	2,500 0

12 - 68/6

මොනරාගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ගාස්තු පැනවීම

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස 26 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 5/2 (vii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. කේ. එම්. ජනක පුෂ්ප කුරුප්පු,
සභාපති,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 26 දින,
මොනරාගල ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වගන්තිය යටතේ ඌව පළාතේ පළාත් සභාවේ පාලන පාලන අමාත්‍යවරයා විසින් සාදා 2013 ජුනි මස 28 දින අංක 1816/32 අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 යටතේ මොනරාගල ප්‍රාදේශීය සභාව පිළිගෙන 2013.11.29 දින අංක 2942 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ දැන්වීමක් පළකර ඇත. ඉහත සඳහන් දැන්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව මොනරාගල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2026 වර්ෂයට අයකර ගැනීමට;

මොනරාගල ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*විස්තරය*	*මුදල*
		රු. ශත
01.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩි එකකට අවුරුද්දකට (චිත්‍රපට දර්ශන, ප්‍රචාරක දැන්වීමක් හැර) (ස්ථාවර යකඩ රාමුවක් සහිත විශාල පරිමාණයේ හා මධ්‍ය පරිමාණයේ)	250 0
02.	ප්‍රචාරක දැන්වීමක් (බැනර් ප්‍රදර්ශනය කිරීම) වෙනුවෙන් එක් දැන්වීමකට වර්ග අඩි එකකට දින එකකට වැඩි දින 14 ක් නොඉක්මවන විට	30 0
03.	දින 14 කට වැඩි මුත් දින 30 නොඉක්මවන විට වර්ග අඩි එකකට	50 0
04.	දින 30 කට වැඩිමුත් මාස 06 ක් නොඉක්මවන විට වර්ග අඩි එකකට	100 0
05.	ලී රාමුවක් සවිකරන ලද කණුවල හෝ මහා මාර්ගයේ යම් තැනක ප්‍රදර්ශනය කරන දැන්වීම් සඳහා සෑම වර්ග අඩි 1 කට දින 14 ක් සඳහා	100 0
05.1	මාස 03ක් නොඉක්මවන විට වර්ග අඩි 01කට	100 0
05.2	මාස 03 ඉක්මවන එහෙත් අවුරුදු 01ක් නොඉක්මවන විට වර්ග අඩි එකකට	100 0
06	සංඛ්‍යාංක නාම පුවරු (ඩිජිටල් නාම පුවරු) වර්ග අඩි එකකට	200 0

12 - 68/7

මොනරාගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා ඉල්ලුම්පත්, සහතිකපත් ගාස්තු හා වෙනත් අයකිරීම් සඳහා ගාස්තු පැනවීම

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් 2025 සැප්තැම්බර් මස 26 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 5/2 (viii) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. කේ. එම්. ජනක පුෂ්ප කුරුප්පු,
සභාපති,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 26 දින,
මොනරාගල ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

යෝජනාව

මොනරාගල ප්‍රාදේශීය සභාව මගින් පිළිගන්නා ලද අතුරු ව්‍යවස්ථා හා අනෙකුත් පනත්වලින් මෙම සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර 2026 වර්ෂය සඳහා මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් පහත උපලේඛණයේ සඳහන් සහතික දීමේ දී, අයදුම්පත් නිකුත් කිරීමේදී හා සේවා පහසුකම් සිදුකිරීමේදී පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2026 වර්ෂයේ අයකර ගැනීමට මොනරාගල ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

අයකිරීම් විස්තරය :	*මුදල (රු.)*
01. ගොඩනැගිලි අයදුම්පත්‍ර :	
(i) නිවසක් සඳහා	350 0
(ii) ව්‍යාපාර ස්ථානයක් සඳහා	600 0
(iii) ඉඩම් අනුකොටස් බෙදීමේ අයදුම්පත්‍ර	250 0
02. වරිපනම් හා සම්බන්ධ අයදුම්පත්‍ර :	
(i) වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ අයදුම්පත්	350 0
(ii) වරිපනම් තක්සේරු ලේඛනයේ පිටපත් ලබාදීම සඳහා ගාස්තු	200 0

අයකිරීම් විස්තරය :	*මුදල (රු.)*
03. වීථිරේඛා හා සම්බන්ධ අයදුම්පත්‍ර :	
(i) වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතිකපත් අයදුම්පත්‍ර ගාස්තු	100 0
(ii) වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික පත්‍ර ගාස්තු	1,000 0
(iii) වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතිකපත්‍ර සංශෝධනය සඳහා ගාස්තු	200 0
04. පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු (වර්ෂ 03 කට)	4,500 0
04.1. පරිසර ආරක්ෂණ බලපත්‍ර පරීක්ෂණ ගාස්තු	3,500 0
05. පුස්තකාල සාමාජිකත්ව ගාස්තු	150 0
06. වෙනත් සහතික හා අයදුම්පත්‍ර ගාස්තු (වෙළඳ බලපත්‍ර අයදුම්පත්‍ර, ප්‍රසම්පාදන අයදුම්පත්‍ර)	150 0
07. ප්‍රාදේශීය සභාව මගින් නඩත්තු කරන මාර්ග පළුදු කිරීමේ ගාස්තු අය කිරීම (ඇස්තමේන්තු ගත මුදල මත තීරණය කරනු ලැබේ.) (ඇස්තමේන්තු මුදල තැන්පතුවක් ලෙස තබාගෙන පසුව නිදහස් කිරීම)	
08. කොම්පෝස්ට් පොහොර කිලෝ 01ක්	35 0
09. ප්‍රාදේශීය සභාවට අයත් ග්‍රාමීය මාර්ගවල වැලි/ ඛනිජ ප්‍රවාහන අවසරපත්‍ර ගාස්තු :	
මුදල (රු.)	
09.1. වැලි කියුබ් 01 සිට 50 දක්වා	100 0
09.2. වැලි කියුබ් 51 සිට 100 දක්වා	125 0
09.3. වැලි කියුබ් 101 සිට 200 දක්වා	150 0
09.4. වැලි කියුබ් 201 සිට 300 දක්වා	200 0
09.5. වැලි කියුබ් 300 සිට ඉදිරියට	300 0 බැගින්
09.6. වැලි කියුබ් 100 ට වැඩි නම් මාර්ග ආරක්ෂණ ආපසු ගෙවන තැන්පත් මුදල 10,000 0 ගෙවිය යුතුය	
10. දැව ප්‍රවාහන ලොරි රථයක් සඳහා	2,000 0
11. මගී ප්‍රවාහන හා භාණ්ඩ ප්‍රවාහන සේවා මත රථවාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු	
11.1. ත්‍රීවිල් රථයකට	1,200 0
12. හරිත උයන සඳහා ගාස්තු අය කිරීම	
12.1. මංගල උත්සවයක් සඳහා ඡායාරූප ගැනීමට	2,000 0
12.2 උපන්දින උත්සවයක් සඳහා	1,000 0
12.3. වෙනත් උත්සව සඳහා	1,500 0
12.4. පෙර පාසල් ළමුන්ගේ උත්සව සඳහා	1,000 0
13. ගලි සේවා ගාස්තු :	
13.1 (බල ප්‍රදේශය තුළ)	
13.1.1 ගලි බවුසර සේවා ගාස්තු (එක් ගලි බවුසරයක් සඳහා)	8,500 0
අමතර වැඩිවන ගලි බවුසර සේවා ගාස්තු	6,000 0 බැගින්
13.1.2 ගලි ට්‍රැක්ටර් බවුසර් සේවා ගාස්තුව (එක් ගලි බවුසරයක් සඳහා)	5,000 0
අමතර ගලි ට්‍රැක්ටර් බවුසර් සේවා ගාස්තු	3,300 0 බැගින්
13.2 බල ප්‍රදේශයෙන් පිටත;	
13.2.1 ගලි බවුසර සේවා ගාස්තු	8,500 0
අමතර බවුසර සේවා ගාස්තු	7,000 0
ධාවන කුලිය කි.මී. 01 කට	300 0
(එක් ගමන් වාරයක් සඳහා ආරම්භක ස්ථානය ප්‍රාදේශීය සභාව වන අතර, ගමනාන්තය ගලි අපවහන මධ්‍යස්ථානය)	

	රු. ශත.
13.2.2 ගලි ට්‍රැක්ටර් බවුසර් සේවා ගාස්තුව	4,700 0
අමතර ගලි ට්‍රැක්ටර් බවුසර් සේවා ගාස්තුව	3,700 0
ධාවන කුලිය මීටර් පැයකට	750 0
එක් ගමන් වාරයක් සඳහා (යන සහ එන)	
ආරම්භක ස්ථානය ප්‍රාදේශීය සභාවවන අතර, ගමනාන්තය ගලි අපවහන මධ්‍යස්ථානය)	
14. මෝටර් ග්‍රේඩරය මීටර් පැයකට අයකිරීම්	8,000 0
15. බැකෝ ලෝඩර් යන්ත්‍රය (මීටර් පැයකට අයකිරීම්)	6,000 0
16. මාර්ග තලනය (මීටර් පැයකට අයකිරීම්)	
16.1 යන්ත්‍ර ක්‍රියාකරු සමඟ (දින 1 ක් සඳහා)	8,000 0
17. ජල බවුසර් ගාස්තු :	
බල ප්‍රදේශය තුළ	
17.1 අවමංගල්‍ය, ආගමික හා රාජ්‍ය ආයතනවලින් සංවිධානය කරන කටයුතු හැර අනෙකුත් සියලුම උත්සව කටයුතු සඳහා ගාස්තු	
17.1.1.ජල බවුසර ගාස්තුව (හිස් බවුසරය)	2,000 0
(එක් දිනකට වඩා ජල බවුසර තබා ගන්නේ නම් අමතර සෑම එක් දිනකටම රු. 500 0 බැගින් ගෙවිය යුතුය.)	
17.1.2 ඉදිකිරීම් හා වෙනත් කටයුතු සඳහා ගාස්තු :	
17.1.2. 1.ජල බවුසර ගාස්තුව (හිස් බවුසරය)	2,000 0
17.1.2. 2. ප්‍රවාහන ගාස්තුව (මීටර පැය)	750 0
(එක් දිනකට වඩා ජල බවුසර තබා ගන්නේ නම් අමතර සෑම එක් දිනකටම රු. 1,000 0 බැගින් ගෙවිය යුතුය.)	
(බල ප්‍රදේශයෙන් පිටත)	
17.2 සියළුම උත්සව කටයුතු සඳහා	
17.2.1. ජල බවුසර ගාස්තුව	2,000 0
17.2.2. ප්‍රවාහන ගාස්තුව (මීටර් පැය 1ක් සඳහා)	750 0
(එක් දිනකට වඩා ජල බවුසර තබා ගන්නේ නම් අමතර සෑම එක් දිනකටම රු. 500 0 බැගින් ගෙවිය යුතුය)	
17.2.1. ඉදිකිරීම් හා වෙනත් කටයුතු සඳහා ගාස්තු :	
17.2.1.1 ජල බවුසර ගාස්තුව	3,500 0
17.2.1.2. ප්‍රවාහන ගාස්තුව (මීටර් පැය 1ක් සඳහා)	750 0
(එක් දිනකට වඩා ජල බවුසර තබා ගන්නේ නම් අමතර සෑම එක් දිනකටම රු. 1,000 0 බැගින් ගෙවිය යුතුය)	
18. ස්කිට් ස්ටීල් ලෝඩර් (බොක් කැට් යන්ත්‍රය) මීටර් පැයක් සඳහා	5,000 0
(ප්‍රවාහනය සපයා ගත යුතුය)	
19. ටොන් 01 ප්‍රමාණයේ බේබි ගල්රෝල දිනක් සඳහා (යන්ත්‍ර ක්‍රියාකරු සමඟ)	8,000 0
(පැය 08ක දිනකට, ඉන්ධන සහ ප්‍රවාහනය සපයා ගත යුතුය.)	
20. ට්‍රැක්ටර් එන්ජීම සමඟ වල් කපන යන්ත්‍රය (මීටර පැය සඳහා)	4,000 0
20.1. ට්‍රැක්ටර් ප්‍රවාහනය (මීටර පැය 1 සඳහා)	750 0
21. ක්‍රීඩාපිටි සඳහා ගාස්තු අය කිරීම	
21.1 ක්‍රීඩා හා අලෙවි ප්‍රවර්ධන නොවන කටයුතු සඳහා අය කිරීම් (ප්‍රධාන ක්‍රීඩාපිටිය)	
21.1.1. දිනකට ක්‍රීඩාපිටිය වෙන් කිරීම සඳහා ගාස්තු	4,000 0
21.1.2 දින 01-02 සඳහා දේපළ ආරක්ෂණ තැන්පතු මුදල	20,000 0
21.1.3 ප්‍රාදේශීය සභා විදුලි සැපයුමෙන් විදුලිය ලබා ගන්නේ නම්	
1.1.3.1. ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා පමණක් දිනකට	1,000 0
1.1.3.2. ශබ්ද විකාශන යන්ත්‍ර සහ විදුලි සැරසිලි සඳහා දිනකට	2,000 0

21.2 අලෙවි ප්‍රවර්ධන හා ආදායම් ලබන විවිධ කටයුතු සඳහා අය කිරීම් (ප්‍රධාන ක්‍රීඩාපිටිය)

		රු. ශත.
21.2.1.	දිනකට ක්‍රීඩාපිටි වෙන් කිරීම සඳහා ගාස්තු	6,000 0
21.2.2.	දේපළ ආරක්ෂණ තැන්පතු මුදල	25,000 0
21.2.3.	ප්‍රාදේශීය සභා විදුලි සැපයුමෙන් විදුලිය ලබා ගන්නේ නම්	
1.2.3.1.	ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා පමණක් දිනකට	1,000 0
1.2.3.2.	ශබ්ද විකාශන යන්ත්‍ර සහ විදුලි සැරසිලි සඳහා දිනකට	2,500 0
1.2.3.3.	ශබ්ද විකාශන යන්ත්‍ර සහ විදුලි සැරසිලි සහ වෙළඳ කුටි සඳහා දිනකට	3,000 0

21.3. ක්‍රීඩා හා අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා අය කිරීම් (අනෙකුත් ක්‍රීඩාපිටි)

21.3.1.	දිනකට ක්‍රීඩාපිටි වෙන් කිරීම සඳහා ගාස්තු	2,000 0
21.3.2	දේපළ ආරක්ෂණ තැන්පතු මුදල	5,000 0
21.3.3	දින දෙකකට වඩා වැඩිවන සෑම දිනකටම අමතර තැන්පතු මුදල	1,000 0

(මෙම භූමියට සහ අවට පරිශ්‍රයට හා ඊට අයත් දේපළවලට අලාභ හානියක් සිදුවුවහොත් කාර්මික නිලධාරි මහතාගේ අලාභය පිළිබඳ ඇස්තමේන්තුවට යටත්ව අය කිරීම් සිදුකර තැන්පතු මුදල ආපසු ගෙවනු ලැබේ.)

22. ප්‍රජා ශාලාව වෙන් කිරීම සඳහා ගාස්තු (දිනකට)

22.1. ප්‍රජාශාලා ගොඩනැගිල්ල

22.1.1.	රැස්වීම්, දේශන, පුහුණු ආදී අලෙවි ප්‍රවර්ධන නොවන වැඩසටහන් සඳහා	5,000 0
22.1.2.	රැස්වීම්, දේශන, පුහුණු වැඩසටහන් සඳහා වරුවකට	2,500 0
22.1.3.	මංගල උත්සව සඳහා	10,000 0
22.1.4.	වෙනත් උත්සව (අලෙවි ප්‍රවර්ධන නොවන)	6,000 0
22.1.4.	අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා	10,000 0

(මංගල උත්සව, වෙනත් උත්සව සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා තැන්පතු මුදල 10,000 0)

23.	ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව කුළියට දීම දිනකට	3,000 0
24.	පොදු වෙළඳ සංකීර්ණය අයත් භූමිය කුළියට දීම දිනකට	3,500 0
25.	සති පොළ භූමිය කුළියට දීම දිනකට	5,000 0
26.	නව බස්නැවතුම්පළ භූමිය කුළියට දීම දිනකට, රැස්වීම් සඳහා	3,000 0
	ප්‍රවර්ධන කටයුතු සඳහා	4,000 0
27.	පෙර පාසල් උද්‍යාන භූමිය කුළියට දීම දිනකට	2,000 0
28.	හොරොම්බුව හන්දිය හිස් ඉඩම කුළියට දීම දිනකට, රැස්වීම් සඳහා	3,000 0
	ප්‍රවර්ධන කටයුතු සඳහා	5,000 0
29.	කුඹුක්කන පොළ භූමිය කුළියට දීම දිනකට	3,000 0
30.	ප්‍රාදේශීය සභාව සතු කොඩි කණු කුළියට ලබා දීම (එක් දිනකට)	50 0

(දිනකට වඩා කොඩි කණු තබා ගන්නේ නම් එක් කොඩි කණුවකට අමතර දිනකට රුපියල් 20 0 බැගින් ගෙවිය යුතු අතර, කොඩි කණුවක් අස්ථානගත වුවහොත් එයට සමාන කොඩි කණුව හෝ එදිනට පවතින මිල ගණන් ගෙවිය යුතුය.)

31. අවමංගල්‍ය රථය සඳහා ගාස්තු අය කිරීම :

දුර ප්‍රමාණය කිලෝමීටර් (යන එන දුර ඇතුලුව)	*අය කරන ගාස්තුව*
1km - 5km අතර දුර සඳහා	රු. 2,000 0
5km -10km අතර දුර සඳහා	රු. 3,000 0

දුර ප්‍රමාණය කිලෝමීටර් (යන එන දුර ඇතුලුව)	*අය කරන ගාස්තුව*
10km - 15km අතර දුර සඳහා	රු. 3,500 0
15km - 20km අතර දුර සඳහා	රු. 4,000 0
20km - 30km අතර දුර සඳහා	රු. 5,500 0
30km ට වැඩි රු. 5,500 0 සහ ඊට අමතරව වැඩි වන 1km සඳහා රු. 100 0 බැගින් (යන එන දුර සමඟ)	
අනෙකුත් ප්‍රවාහන කටයුතු වෙනුවෙන් 1km ක් සඳහා රු. 200.00 බැගින් (යන එන දුර සමඟ)	
කම්කරු කුළිය රු. 1,000 0	

ආදාහනාගාර ගාස්තු පැනවීම :

විස්තරය	*අය කරනු ලබන මුදල රු.*
සහා බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම	12,500 0
සහා බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම	14,500 0
අළු තැන්පත් කිරීමේ කුටියක් වෙන්කරවා ගැනීම	5,000 0
සුසාන භූමියේ මිහිදන් කිරීම සඳහා	2,500 0

12 - 68/8

මොනරාගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා කසල බදු අය කිරීම සඳහා ගාස්තු පැනවීම

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් 2025 සැප්තැම්බර් මස 26 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 5/2 (ix) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. කේ. එම්. ජනක පුෂ්ප කුරුප්පු,
සභාපති,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 26 දින,
මොනරාගල ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුසාංගික විධිවිධාන) පනතේ 02 වගන්තියේ (1) උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 02 වගන්තියේ (1) උපවගන්තියෙන් උඟව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදා අංක 1816/43 හා 2013 ජුනි 28 දින අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කසළශෝධන අතුරු ව්‍යවස්ථා 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) වගන්තියේ 1 උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගෙන අංක 2942 හා 2013 නොවැම්බර් මස 29 දින අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (අ) කොටස දැන්වීමක් පළ කර ඇත. කසල ශෝධන අතුරු ව්‍යවස්ථාවේ I උපවගන්තියේ මෙම අතුරු ව්‍යවස්ථාව බල පැවැත්වෙන බල ප්‍රදේශ වලින් II උපවගන්තියේ සඳහන් ගාස්තුවක් පනවා අයකිරීමට මොනරාගල ප්‍රොද්ශීය සභාවට යෝජනා කරන්නීය.

I. උපවගන්තිය

මොනරාගල ග්‍රාම නිලධාරී වසම, වැලියාය ග්‍රාම නිලධාරී වසම, මාගන්දනමුල්ල, හොරොම්බුව, හිදිකිවුල ග්‍රාම නිලධාරී වසම, නක්කල ග්‍රාම නිලධාරී වසම, විහාරමුල්ල ග්‍රාම නිලධාරී වසම, හුලංදාව ග්‍රාම නිලධාරී වසම, මුප්පනේ ග්‍රාම නිලධාරී වසම, මදුරකැටිය ග්‍රාම නිලධාරී වසම.

II. උපවගන්තිය

		මුදල (රු.)
i.	කසළ එකතු කරන සීමාවේ ඇති සේවක සංඛ්‍යාව 10ට වැඩි වෙළඳසැල් හා හෝටල් සඳහා (මාසික ගාස්තු)	2,000 0
ii.	සංචාරක හෝටල් සඳහා (මාසික ගාස්තු)	3,000 0
iii.	පුද්ගලික ආරෝග්‍යශාලා හෝ වෛද්‍ය මධ්‍යස්ථානවලින් ජනනය වන සායනික කසළ හැර අනෙකුත් සාමාන්‍ය කසළ සඳහා (මාසික ගාස්තු)	2,000 0
iv.	ඇඟළුම් සහ අනෙකුත් මහා පරිමාන කර්මාන්ත සඳහා	20,000 0

12 - 68/9

මොනරාගල ප්‍රාදේශීය සභාව

2026 වර්ෂය සඳහා පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු, ආවරණ අනුමැතිය ලබාදීම, සැලසුම් හා සංවර්ධන කටයුතු සඳහා ගාස්තු පැනවීම

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් 2025 සැප්තැම්බර් මස 26 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී යෝජනා අංක 5/2 (x) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යූ. කේ. එම්. ජනක පුෂ්ප කුරුප්පු,
සභාපති,
මොනරාගල ප්‍රාදේශීය සභාව.

2025 සැප්තැම්බර් මස 26 දින,
මොනරාගල ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

යෝජනාව

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ මොනරාගල නාගරික ප්‍රදේශය සංවර්ධිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 49 වන වගන්තිය, 52 වන වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2235/54 හා 2021 ජූලි 08 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන ඉදිකිරීම් අවසර පත්‍ර ලබාගැනීම සඳහා පෙරසැරි ගාස්තු, සේවා ගාස්තු හා ආවරණ අනුමැතිය ලබාදීම සඳහා ගාස්තු සැලසුම් හා සංවර්ධන කටයුතු සඳහා ගාස්තු පැනවීම 2026 වර්ෂය සඳහා මොනරාගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව, මොනරාගල ප්‍රාදේශීය
සභාවට යෝජනා කරන්නිය.

මූලික සැලසුම් නිරාකරණය, නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහාවන ගාස්තු		
සංවර්ධන කාර්යයේ ස්වභාවය	*පෙරසැරි ගාස්තු*	
1. ඉඩම් අනුබෙදුම් කිරීම සඳහා	*ඉඩමේ ප්‍රමාණය* *ව.මී.*	*පෙරසැරි ගාස්තු (බදු රහිත)* *රු. ශත.*
	ව.මී. 150 - ව.මී. 500 ව.මී. 501- ව.මී. 1,000 ව.මී. 1,001 - ව.මී. 5,000 ව. මී. 5,001 - ව.මී. 10,000 ව.මී. 10,000ට වැඩි	2,000 0 3,000 0 7,500 0 10,000 0 රු. 10,000 - ව.මී. 10,000 0 ට වැඩි සෑම වර්ග මීටර 1000කටම හෝ ඉන් කොටසකට රු. 1,000.00 බැගින්
02. කුඹුරු ඉඩම් හා පහත් බිම් ගොඩකිරීම	I. ව. මී. 250 දක්වා II. ව.මී. 250ට වැඩි	2,500 0 2,500 - ව.මී. 250ට වැඩි සෑම වර්ග මීටර 100කටම හෝ ඉන් කොටසකට රු. 2,500 0 බැගින්
3.1. මායිම් තාප්ප / රැඳවුම් බැම් ඉදි කිරීම	දික් මීටර් 1ක් සඳහා	100 0

03.2 අත්තිවාරමක් සහිත මායිම් වෙන් කිරීම	දික් මීටර 1කට	50.00
04. සන්නිවේදන කුළුණු/ ඇන්ටනා කුළුණු/ සම්ප්‍රේෂණ කුළුණු ඉදි කිරීම		රු. 30,000/=
05. ඉන්ධන පිරවුම්හල්/ වාහන සේවා ස්ථාන	I. දුම් පරීක්ෂා කරන ස්ථාන II. ඉන්ධන පිරවුම්හල් III. වාහන සේවා ස්ථාන IV. වාහන සේවා ස්ථාන හා දුම් පරීක්ෂා කරන ස්ථාන	රු. 2,500 0 රු. 7,500 0 රු. 50,000 0 රු. 75,000 0
6. කසළ රැස් කිරීමේ අංගන/ බැහැර කරන ස්ථාන/කොම්පෝස්ට් අංගන/ සෞඛ්‍යාරක්ෂිතව කසළ යොදා ඉඩම් ගොඩකිරීම හා අදාළ වෙනත් සංවර්ධන කටයුතු	භූමි ප්‍රමාණය වර්ග මීටර 4,000 දක්වා	රු. 50,000/=
	භූමි ප්‍රමාණය වර්ග මීටර 4,000 වැඩි	රු. 50,000/=ට වැඩිවන සෑම වර්ග මීටර 4,000ට හෝ ඉන් කොටසකටම රු. 10,000.00 බැගින්
07. ජලය ආශ්‍රිත ගොඩනැගිලි සහ ජලය ආශ්‍රිත සංවර්ධනයන්		50,000 0
08. ළමා නිවාස/ වැඩිහිටි නිවාස/ පුනරුත්ථාපන මධ්‍යස්ථාන	I. ව.මී. 400 දක්වා II. ව.මී. 401-500 III. ව.මී. 501 - 750 IV. ව.මී. 751 - 1000 V. ව.මී. 1000 ට වැඩි	රු. 2,500 0 රු. 5,000 0 රු. 10,000 0 රු. 20,000 0 රු. 20,000 0 - ව.මී. 1000ට වැඩිවන සෑම ව.මී. 100ක් සඳහාම හෝ ඉන් කොටසකටම රු. 500.00 බැගින්
09. ඉහත 1 සිට 11 දක්වා සඳහන් නොවන වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා	*ගෙබිම් ප්‍රමාණය*	*ගාස්තුව*
	I. ව.මී. 400 දක්වා II. ව.මී. 401- ව.මී. 500 III. ව.මී. 501 - ව.මී. 750 IV. ව.මී. 751 - ව.මී. 1000 V. ව.මී. 1000 ට වැඩි	රු. 5,000 0 රු. 10,000 0 රු. 25,000 0 රු. 50,000 0 රු. 50,000 0 - ව.මී. 1000ට වැඩිවන සෑම ව.මී. 100ක් සඳහාම හෝ ඉන් කොටසකටම රු. 500 0 බැගින්
10. ගෙබිම් ප්‍රමාණය වෙනස් නොවී අනුමත සැලසුමේ සිදුකරනු ලබන අභ්‍යන්තර වෙනස් කිරීම	ව.මී. 1,000ක් දක්වා ව.මී. 1,000ට වැඩි	5,000 0 10,000 0
11. මූලික සැලසුම් නිරාකරණය අළුත් කිරීම	i. වසරක වලංගු කාලය ඉක්මවීමට පෙර අයදුම් කරන්නේ නම් මූලික සැලසුම් නිරාකරණ සහතිකය සඳහා ගෙවූ මුදලින් 25%ක මුදලක් ii. වසරක වලංගු කාලය ඉක්මවා ගොස් වසරක් තුළ අයදුම් කරන්නේ නම් මූලික සැලසුම් නිරාකරණ සහතිකය සඳහා ගෙවූ මුදලින් 50%ක මුදලක් iii. වසරක වලංගු කාලය ඉක්මවීමෙන් පසු අයදුම් කරන්නේ නම් මූලික සැලසුම් නිරාකරණ සඳහාවන සම්පූර්ණ ගාස්තුව	
12. මූලික සැලසුම් නිරාකරණය සහතිකයේ සහතික කරන ලද පිටපතක් සඳහා	රු. 10,000 0	
13. මූලික සැලසුම් නිරාකරණය වෙනත් පාර්ශවයකට පැවරීම	රු. 25,000 0	

14. කඩිනම් සේවය - (සියළුම අවශ්‍යතා හා අදාළ අනෙකුත් ලේඛන සම්පූර්ණ කරන ලද දින සිට වැඩ කරන ලද දින 07ක් තුළ)	සාමාන්‍ය ගාස්තුව මෙන් හතර ගුණයක් අය කළ යුතු වේ.
15. පරිපාලන වියදම්	රු. 5,000 0
16. ආගමික කටයුතු හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිවලට අදාළ ගාස්තු	රු. 5,000 0 පරිපාලන ගාස්තුවකට යටත් වේ.

සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම හා කාලය දීර්ඝ කිරීම සඳහා වන පෙරසැරි ගාස්තු				
සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු*			
1. ඉඩම් අනුබෙදුම් සඳහා	*ඉඩමේ ප්‍රමාණය ව.මී.*		*පෙරසැරි ගාස්තු*	
	ව.මී. 150 - ව.මී. 300		කැබලි 1 ක් සඳහා රු. 1,000/=	
	ව.මී. 301- ව.මී. 600		කැබලි 1 ක් සඳහා රු. 800/=	
	ව.මී. 601- ව.මී. 900		කැබලි 1 ක් සඳහා රු. 600/=	
	ව.මී. 900 ට වැඩි		කැබලි 1 ක් සඳහා රු. 500/=	
2. මායිම් තාප්ප / රැඳවුම් බැම් ඉදි කිරීම	දික් මීටර් 1ක් සඳහා		රු. 100/=	
3. සන්නිවේදන කුළුණු/ ඇන්ටනා කුළුණු/ සම්ප්‍රේෂණ කුළුණු ඉදි කිරීම	රු. 40,000/=			
4. ඉන්ධන පිරවුම්හල්/ වාහන සේවා ස්ථාන/ දුම් පරීක්ෂා කරන ස්ථාන	ව.මී. 1 කට		රු. 100/=	
5. කසළ බැහැර කිරීමේ අංගන/ තාවකාලිකව රැස්කර තබන ස්ථාන/කොම්පෝස්ට් අංගන/ සෞඛ්‍යාරක්ෂිතව කසළ යොදා ඉඩම් ගොඩකිරීම	හෙක්. 1 දක්වා		රු. 25,000/=	
	හෙක්. 1ට වැඩි		රු. 25,000/=ට වැඩිවන සෑම හෙක්. 1කට හෝ ඉන් කොටසක් සඳහා රු. 5,000/= බැගින්	
6. නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි	*ගෙබිම් ප්‍රමාණය (ව.මී)*	*නේවාසික*		*නේවාසික නොවන (ව.මී. 1 කට)*
		(ව.මී. 1කට)	*(ව.මී. 1කට)*	
		තනි පුද්ගල	මහල් නිවාස	
	ව.මී. 400 දක්වා	රු. 20/=	රු. 25/=	රු. 25/=
	ව.මී. 401-1000	රු. 22/=	රු. 27/=	රු. 27/=
	ව.මී. 1001-1500	රු. 25/=	රු. 30/=	රු. 30/=
	ව.මී. 1501-2000	රු. 25/=	රු. 32/=	රු. 32/=
	ව.මී. 2000 ට වැඩි	වැඩිවන සෑම ව.මී. 90 ක් සඳහාම රු.2,000/= බැගින්	වැඩිවන සෑම ව.මී. 90 ක් සඳහාම රු. 2,000/= බැගින්	වැඩිවන සෑම ව.මී. 90 ක් සඳහාම රු. 2,000/= බැගින්

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු*	
7. වාණිජ පරමාර්ථයෙන් සිදු කරනු ලබන i. පිහිනුම් තටාක(තටාකයේ ඩෙක් සමඟ) සහ ii. සූර්ය පැනල සඳහා වන ගාස්තු	*වර්ග ප්‍රමාණය (ව.මී)*	*ගාස්තුව*
